# විශ්ව ශක්තීන්
# පැලෑටි සහ පෝෂණය




BDS
BIODIVERSITY
SECRETARIAT

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

විශ්ව ශක්තීන් පැලෑටි සහ පෝෂණය
විමලා දේවනාරායන

# විශ්ව ශක්තීන්
# පැළෑටි සහ පෝෂණය

# UNIVERSAL ENERGIES
# PLANTS AND NUTRITION

විමලා දේවනාරායන

ප්‍රකාශනය :-
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය,
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

සියළුම හිමිකම් ඇවිරිණි

ප්‍රථම මුද්‍රණය :-
2014

ISBN 978 - 955 - 98583 - 1 - 7

සම්පාදනය :-
විමලා දේවනාරායන

සම්බන්ධීකරණය :-
ටී. එම්. අනුරුද්ධ තෙන්නකෝන්,
පරිසර කළමණාකරන නිලධාරී,
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

කවරය නිර්මාණය :-
චන්දිමා ආරියරත්න

මුද්‍රණය :-
ආර්. එස්. එන්ටප්‍රයිසස්,
221/1, නීලම්මහර,
බොරලැස්ගමුව.
072 2488167

මෙම ග්‍රන්ථයේ අඩංගු සියළුම තාක්ෂණික විෂය කරුණු
පිළිබඳ වගකීම ලේඛකයා සතු ය.

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

වර්තමානයේ නවීන තාක්ෂණයේ අහිතකර බලපෑම් ඉස්මතුවත් ම සමස්ත ලෝකයම පරිසර හිතකාමී ක්‍රමවේදයන් යොදාගැනීම වෙත වැඩි නැඹුරුතාවක් දක්වීමට පෙළඹී ඇත. අතීතයේ යල් පැනගිය දැනුමක් ලෙස බැහැරකල පාරම්පරික දැනුමට වර්තමානයේ ඉහළ පිළිගැනීමක් ලැබී ඇත්තේ එය වඩාත් පරිසර හිතකාමී බව ලොවට ම එළි දක්වමිනි.

ඉතා දිගු ඉතිහාසයකට හා සංස්කෘතියකට හිමිකම් කියන අප සතු උරුමයක් ලෙස පාරම්පරික දැනුම හැඳින්විය හැක. කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් සහිත රටක් වශයෙන් දුරාතීතයේ පටන් පැවත එන දේශීය කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පාරම්පරික දැනුමක් අප සතුව ඇත. ගොවිතැන් කටයුතු සඳහා භූමිය තෝරාගැනීමේ සිට අස්වනු කල්තබා ගැනීමේ ක්‍රම දක්වා ම විවිධ වූ පුළුල් පරාසයක පාරම්පරික දැනුම් සමුදායක් අපට හඳුනාගත හැක. වඩා වැදගත් වන්නේ ඒ දැනුම සියල්ල ම පරිසරයට හිතකාමී දැනුමක් වීමයි.

කාබනික ගොවිතැන කෙරෙහි වැඩි ඉල්ලුමක් ලොව පුරාම වර්ධනය වෙමින් පවතින අතර අපට ම ආවේණික හා අතීතයේ පටන් අපට උරුමව පවතින දේශීය කෘෂිකර්මාන්තයේ මූලික සිද්ධාන්ත වන්නේ මෙම කාබනික ගොවිතැන් ක්‍රමයම ය. එහිදී විශ්ව ශක්තියේ යොදාගැනීම් සුලභව භාවිතා වේ.

1992 වසරේ එළිදකින ලද අන්තර්ජාතික ජෛව විවිධත්ව සම්මුතියේ 8 (ජේ) වගන්තියේ පරිදි පාරම්පරික දැනුම පිළිබඳව ජාත්‍යන්තර අවධානය යොමු කරන අතර එම සම්මුතියේ කටයුතු වලට අදාලව 2020 වසර වනවිට සපුරාගත යුතු ඉලක්ක පිළිබඳව සඳහන් "අයිචි ටාගට්" යටතේ ද පාරම්පරික දැනුම සංරක්ෂණය හා නැවත සමාජ ගත කිරීම් හඳුනාගෙන ඇත.

අන්තර්ජාතික ජෛව විවිධත්ව සම්මුතියේ මෙරට ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මගින් පාරම්පරික දැනුම සංරක්ෂණය හා නැවත සමාජගත කිරීමට අදාලව දියත්කර ඇති වැඩසටහන් අතරින් මෙම "විශ්ව ශක්තීන් පැළෑටි හා පෝෂණය" පිළිබඳ ග්‍රන්ථය එළිදැක්වීම කාලෝචිත ප්‍රයත්නයක් ලෙස මම සලකමි. එමගින් හරිතවත් දේශයක් ගොඩනැගිම සඳහා නව මංපෙත් විවර වනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

- සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.)

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

මිනිසාගේ අවශ්‍යතා සඳහා ශාක යොදා ගැනීම මානව වංශ කථාවේ ආරම්භයේ සිට ම පැවත එන්නකි. ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කරන ජාතියක් වශයෙන් ශ්‍රී ලාංකේය අප සහ ශාක අතර ඇත්තේ සමීප සබඳතාවයකි. එසේ ම අප සතු දිගු ඉතිහාසය හා සංස්කෘතිය ද ශාක හා සම්බන්ධ අපගේ බැඳීම තව තවත් තහවුරු කරයි.

කෘෂිකාර්මික කටයුතු සඳහා විශ්ව ශක්තිය යොදා ගැනීම අතීතයේ පටන් පැවත එන්නක් වන අතර වර්තමානයේ ප්‍රචලිත වන කාබනික ගොවිතැනේදී එය වඩාත් සැලකිල්ලට බඳුන්වන විෂයක් වී ඇත. වඩාත් පරිසර හිතකාමී ලෙස කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට විශ්ව ශක්තිය යොදාගැනීම වඩාත් වැදගත් වන අතර එමගින් අප හා සංස්කෘතිය අතර ඇති බැඳීම ද ශක්තිමත් කරයි.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව අංශය මගින් ප්‍රකාශයට පත් කරන "විශ්ව ශක්තීන් පැළෑටි හා පෝෂණය" ග්‍රන්ථය මගින් වඩාත් පහසුවෙන් ජනතාවට විශ්ව ශක්තිය යොදා ගැනීමේ අවස්ථාවන් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන අතර ඉදිරි පරම්පරාවට අප සංස්කෘතික උරුමයන් දායාද කිරීමේ ජාතික මෙහෙවරට ද මං පෙත් විවර කරන බව ප්‍රකාශ කරමි.

- අබ්දුල් කාදර් (පා.ම.)

පරිසර හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍ය

## ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය සංස්කෘතියේ වෘක්ෂලතාවන්ට හිමි වන්නේ සුවිශේෂීය ස්ථානයකි. ආහාර බෝග ලෙස මානව පෝෂණයට වැදගත්වන ශාක මෙන් ම දේශීය වෛද්‍ය ක්‍රමයේ දී ඔසු ලෙස යොදා ගැනෙන ශාක අතීතයේ පටන් සෘජුවම මානව පැවැත්මට විවිධ ආකාරයෙන් භාවිතා වී ඇත.

ශාක හා සම්බන්ධ පාරම්පරික දැනුම සැලකීමේ දී එය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පැතිරී ඇති බව පැහැදිලි ය. මානව අවශ්‍යතා සඳහා ශාක යොදා ගැනීම මෙන්ම පාරම්පරික දැනුම මගින් ශාක ආරක්ෂා කරගැනීමට පියවර ගැනීමත් අප සංස්කෘතියේ ඇති සුවිශේෂීය ලක්ෂණයකි.

ශාක හා සම්බන්ධව ඇති සංස්කෘතිකමය සබඳතාව සැලකීමේ දී පාරම්පරික ගොවිතැන් ක්‍රම සඳහා විශ්ව ශක්තිය යොදා ගැනීම කැපී පෙනෙන සාධකයකි. විශ්ව ශක්තිය පදනම් කර ගනිමින් සිදු කරන පාරම්පරික කෘෂි කර්මාන්තය මගින් ජෛව විවිධත්වයේ පැවැත්ම ආරක්ෂා වීමත්, පරිසරයේ සමතුලිතතාවය නොවෙනස්ව පැවතීමත් ඉතා වැදගත් ලක්ෂණයන් ලෙස හැඳින්විය හැක.

නව සමාජ ආර්ථික ප්‍රවණතා හමුවේ පාරම්පරික දැනුම සමාජයෙන් වියැකීයාමේ අවදානමක් පවතින අතර එම දැනුම නැවත සමාජගත කිරීමේ වගකීම අප සතුව ඇත. පරිසර හිතකාමීව සහ පරිසරයේ සමතුලිතතාවයට හානි නොවන ආකාරයේ භාවිතයක් පාරම්පරික දැනුම තුල අන්තර්ගත අතර වර්තමානයේ ඉස්මතුව ඇති පාරිසරික ගැටළු බොහොමයක් සඳහා පිළියම් ලෙස එම දැනුම යොදාගත හැක.

අන්තර්ජාතික ජෛව විවිධත්ව සම්මුතිය මගින් පාරම්පරික දැනුම සංරක්ෂණය සහ නැවත සමාජ ගත කිරීම

සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම සහ ජාතික පාරිසරික ප්‍රතිපත්තිය මගින් ද පාරම්පරික දැනුම සංරක්ෂණයට සහ නැවත සමාජගත කිරීමට අදාල කටයුතු ක්‍රියාත්මක කිරිම ප්‍රමුඛව හඳුනාගෙන ඇත.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මගින් පාරම්පරික දැනුම සංරක්ෂණය සහ නැවත සමාජගත කිරීමට අදාල වැඩසටහන් රැසක් දියත් කර ඇති අතර "විශ්ව ශක්තීන් පැළැටි හා පෝෂණය" පිළිබඳ මෙම ග්‍රන්ථය පාරම්පරික දැනුමට අදාල වෙනත්ම ක්ෂේත්‍රයක් පිළිබඳව පුළුල් කථිකාවතක් ගොඩනගන බව මාගේ හැඟීම වන අතර ජෛව විවිධත්වයෙන් පිරිපුන් අනාගතයක් ඇති කරලීම උදෙසා මෙම ග්‍රන්ථය වැදගත්වන බව ප්‍රකාශ කරමි.

- බී. එම්. යූ. ඩී. බස්නායක (ලේකම්)

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# කර්තෘගෙන් වචනයක්

ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණය, විශ්ව ශක්තීන්, පරිසර පද්ධති, මනෝ සංකල්ප, කෙම් පහන් ක්‍රම, ආගම හා බැඳී තිබුණි. මේ නිසා පෙරදිග ධාන්‍යාගාරය යැයි විරුදාවලි ලබමින් උසස් සංස්කෘතීන් බිහිවිය. විදේශීය ආක්‍රමණයන් නිසා වාණිජ කරණය, නවීකරණය සමඟ ක්‍රියාත්මක වූ වතු වගා ක්‍රමය දිවයිනේ විවිධ ප්‍රදේශ කරා පැතිරිණි. කෘත්‍රිම කෘෂි රසායනික සංයෝග යෙදීමෙන් මානව සංහතියට රිදවන සෞඛ්‍ය හා සමාජ ගැටළු රාශියක් මතුවෙමින් පවතී. එමඟින් මහත් ව්‍යසනයන් සිදුවීම අනුවේදනීය කරුණකි. ජලය, ජලජ ශාක, ධීවර සම්පත්, වන ජීවීන් මෙන්ම සංවර්ධන ක්‍රම නිසා වාතය ද, පාරිසරික සම්පත් ද ගොවිබිම් ද විනාශයට යයි. නූතන සමාජය පිළියම් ලෙස නව විසඳුම් සොයමින් සිටී.

ඉපැරණි ක්‍රම ඇතත් යල් පැනගිය දේ ලෙස ඒවා සමාජයෙන් ගිලිහෙමින් ඇත. ලෝකයේ සෑම රටකම පාරම්පරික ක්‍රම සහ විධි එක හා සමානය. කායික (Physical), විශ්වීය (Ether), දිව්‍යමය (Astral), ආධ්‍යාත්මික (Spiritual), ආගමික (Religious), පසුබිමක ජීවත්වීම නිරායාසයෙන්ම සිදුවිය. විශ්මිත ග්‍රහ වස්තු රාශි චක්‍රය සිසාරා යමින් විශාල ශක්ති ප්‍රමාණයක් පරාවර්තිත රශ්මිධාරා මඟින් විශ්වයට මුදාහරී. මේ දිව්‍යමය දියර හෙවත් ඊතර පෘථිවියට ගලාවිත් පැළෑටි වර්ධනය කරයි.

මෙම ශක්තීන් විදාරණය කර විද්‍යාඥයෝ විශ්ව ගවේෂණයට අවශ්‍ය මංපෙත් හෙළි කළහ. මව සහ දරුවා, යනුවෙන් හැඳින්වෙන කැසියෝපියා (Casiopia) තාරකා පද්ධතිය නිසා තාරකා විද්‍යාව ද, ජ්‍යොතිෂ විද්‍යාව ද වැඩිදියුණු වී රාජ්‍ය ගෞරවයට හා සම්මානයට ලක්විය. කෘෂි විද්‍යාව, වෛද්‍ය

විද්‍යාව හා පෝෂණ විද්‍යාව එක් වූ විද්‍යාත්මක සංකල්ප දියුණු රටවල ප්‍රචලිත වෙමින් පවතී.

වර්තමානයේ උද්ගතව ඇති පාරිසරික හානිය වළක්වා කෘෂි පද්ධතිය තුළ සමතුලිතතාවය රැකගන්නට විද්‍යාත්මක තොරතුරු අනාවරණය කරමි. ජෛවගතික ගොවිතැනේ වාර්ෂික වගා ලිත්වලට අනුකූලව කෘෂි කටයුතු කිරීම සඳහා අනාගත පරපුර වෙත දැනුම ගෙන යාමට මේ කෘතිය "විශ්ව ශක්තීන් පැළෑටි සහ පෝෂණය" මග පෙන්වනු ඇතැයි සිතමි. විශ්ව ශක්තීන් විශාල ප්‍රමාණයක් උරා ගන්නා කාබනික හා ජෛවගතික වගා ක්‍රමවලට අවතීර්ණ වීමට ඔබට-මම මෙයින් ආයාචනා කරමි. දැනටමත් අපේ පාසල් දරුවන්ගේ, දෙමාපියන්ගේ, ගොවි මහතුන්ගේ, උපදේශක මහතුන්ගේ සහ විශ්ව විද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතන තුළින් ද රජයෙන් ද ලැබෙන සහයෝගය අගය කරන්නෙමි. ස්වභාවධර්මය හා සමාජය අතර සුසංයෝගී අන්තර් සම්බන්ධතා ප්‍රවර්ධනය කළ යුතුය. අපි මන්දපෝෂණය දුරලා ප්‍රතිශක්තිකරණය ඇති කර බුද්ධි වර්ධනය දියුණු කරන පරිසර හිතකාමී මාවතකට පිවිසෙමු. වස විස නැති නිරෝගිමත් ශ්‍රී සෞභාග්‍යයෙන් පිරි දේශයක් ගොඩනැංවීමට අපි සැවොම එක්වෙමු.

- ආචාර්ය විමලා දේවනාරායන.

# පෙරවදන

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය වන ශ්‍රී ලංකාව ඉන්දියානු උප මහද්වීපයේ ගිනිකොණ දිගට වන්නට පිහිටා ඇත. මෙය වර්ග කි.මී. 65607 කින් සමන්විත දිවයිනකි. භූගෝලීය පිහිටීම අනුව, ඔක්තෝම්බර් - ජනවාරි සහ අප්‍රේල් - ජූලි යන මාස තුළ ලැබෙන ඉහළ වර්ෂාපතනය හේතුවෙන් නිවර්තන කලාපීය දේශගුණයක් වසර පුරාම පවතී. මෙහි සාරවත් පස හේතුවෙන් සාම්ප්‍රදායිකව කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවිකාව වන අතර, අතීතයේ දී ද "පෙරදිග ධාන්‍යාගාරය" යන විරුදාවලිය දැරිය.

කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රධාන වශයෙන්ම දේශීයව ලබාගත හැකි කාබනික අමුද්‍රව්‍ය මත රඳා පවතී. පැරණි පොත පතෙහි කොහොඹ වැනි ශාකවල කොළ, පොතු, ඇට, මුල් භාවිතයෙන් පළිබෝධ මර්ධනය සහ කෙම් ක්‍රම හා ගොම පොහොර මිශ්‍රිත කොම්පෝස්ට් පොහොර භාවිතය වැනි ස්වභාවික ක්‍රම පිළිබඳව සඳහන් වී ඇත. කාබනික වගාව සාර්ථක වගාවක මූලික පදනම ලෙස හැඳින්විය හැක.

විමලා දේවනාරායන මහත්මිය කෘෂිකර්මාන්තය දියුණු කර ගැනීමට වඩාත් වැදගත් වන විශ්ව ශක්තිය, භාවිතයට ගත යුතු ආකාරය සහ එහි වැදගත්කම පිළිබඳව "විශ්ව ශක්තීන්, පැළෑටි සහ පෝෂණය" යන කෘතිය ඉතා සියුම් ලෙස යොදා ගන්නා ආකාරය විද්‍යාත්මකව විග්‍රහ කර ඇත.

කෘෂි ජෛව විවිධත්වය දේශීය ආහාර හා මානව පෝෂණය යන්නෙන් විග්‍රහ වන්නේ රටට, ජාතියට ඉතාම වැදගත් කාරණයක් ලෙසය. කෘෂි භෝග වගාව මානව සත්වයාට හිතකර ආකාරයට ක්‍රියාත්මක කිරීමට ක්‍රමෝපායයන් සහ ඒ තුළින් නිෂ්පාදනය වන ආහාරත්, මානව සත්වයාගේ පෝෂණය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳවත්, විග්‍රහ කිරීම ශ්‍රී ලාංකික

කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ට සහ ආහාර පරිභෝජනය කරන්නන් හට ඉතා වැදගත් වන්නා වූ විග්‍රහයකි. විශ්ව ශක්තීන් අනුව දේශගුණික ලක්ෂණ ඇතිවන ආකාරයත් ඒ අනුව ජ්‍යොතිෂ විද්‍යානුකූල නැකැත් වලට වගාවන් සිදු කරන්නේ කෙසේද යන්නත් පිළිබඳව විමලා දේවනාරායන මහත්මිය ඉතා පැහැදිලි ලෙස විස්තර කර ඇත. එමෙන්ම ආදී මිනිසා පාරම්පරික සිරිත් විරිත් භාවිතා කර ඇත්තේ මෙම විශ්ව ශක්තීන්ට අනුකූලව බව ද පෙන්වා දී ඇත. ඇයගේ මෙම උත්සාහය ශ්‍රී ලාංකීය ජන සමාජයේ යහපත් ආකල්ප සංවර්ධනයට බෙහෙවින් ඉවහල්වනු ඇත. මෙතුමියගේ උත්සාහය තව තවත් සාර්ථක කරගැනීමට ඇයට ශක්තිය, ධෛර්ය, බලය ලැබේවා'යි කාරුණික සිතින් ප්‍රාර්ථනා කරමි.

එම්.ආර්.එස්.ආර්. මුහන්දිරම්.
ගන්නෝරුව කොහොඹ පළිබෝධ පාලක අධ්‍යක්ෂ හා
කාබනික වගා ව්‍යාපෘති උපදේශක.

# බැති සිත

''විශ්ව ශක්තීන් පැළෑටි සහ පෝෂණය'' ලිවීමට මා පෙළඹ වූ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ විධායක අධ්‍යක්‍ෂ ඩී.එම්.ආර්.එස්. දිසානායක සහ කොහොඹ පළිබෝධ පාලක අධ්‍යක්ෂ, අපි වවමු - රට නගමු කාබනික වගා ව්‍යපෘතියේ උපදේශක එම්. ආර්.එස්.ආර්. මුහන්දිරම් යන විද්වතුන් දෙපළට ප්‍රථමයෙන්ම මගේ ගෞරවාදරය පිරිනමන්නෙමි.

1. මහාචාර්ය රිචඩ් තෝන්ටන් ස්මිත්, ලීඩ්ස් විශ්වවිද්‍යාලය.

2. සම්මාන මහාචාර්ය පී.ඒ.ජේ. පෙරේරා, වෛද්‍ය පීඨය, පේරාදෙණිය, විශ්වවිද්‍යාලය.

3. මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, සමාජ විද්‍යාපීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

4. ආචාර්ය කීර්ති මොහොට්ටි, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය හා විකල්ප කෘෂි කාර්මික ක්‍රම පිළිබඳ කමිටු සාමාජික, ජාතික විද්‍යා පදනම.

5. පරිසරවේදී, විශ්වගවේෂී එන්. අඹේපිටිය

යන විද්වත් මඩුල්ලට මගේ භක්තිය හා ගෞරවය දෙවනුව පුද කරමි. විශ්ව ශක්තීන් හා ගැටෙමින් මිනිසා සහ පාරිසරික අන්තර් සම්බන්ධතා සියුම් ලෙස අධ්‍යයනයට හා විමංශනයට ලක් කරමින් පෙර අපර දෙදිගම විවිධ පොත්පත් පරිශීලනයෙන්

මා රැස්කළ පාරම්පරික හා විද්‍යාත්මක තොරතුරු නිර්මාණයක් ලෙස ගැළපීමට දුන් සහයෝගය සදා අගය කරමි. පහත සඳහන් මහත්ම මහත්මීන්ට ද විශේෂ ගෞරවාදරය පුදකරමි.

1. අධ්‍යක්ෂ, රංජිත් ද සිල්වා ඇතුළු ගැමි සේවා සෙවණ කාර්ය මණ්ඩලය, ජෛවගතික වගා ලිත සකස් කිරීමේදී දුන් සහයෝගය ගැන විශේෂ අවංක ආදර ස්තුතිය පුදකරමි.

2. සිංහල භාෂා රීති - ඩී. ජී. ඉන්ද්‍රානි මහත්මිය

3. චිත්‍ර - චන්දිමා ආරියරත්න

4. පරිගණක යතුරු ලියනය- නීල් ප්‍රසාන්ත

5. පරිගණක පිටු සැකසීම - ටෙලි-පික්ස් ඕෆ්සෙට්, මහනුවර.

6. ඒ.එන්.ජී. දේවනාරායන සහ මාගේ දරුවන්ට ද අවංක ආදරය හා ස්තුතිය පුද කරමි.

**විමලා දේවනාරායන,**
169, ක්‍රිස්ටෝපර් පාර,
පේරාදෙණිය.

2011.03.31

# පටුන


පිටු අංක

1. ආදී මානවයා සතු දැනුම 1-24

2. දේශීය ආහාර තාක්ෂණය 25-42

3. අසිරිමත් විශ්වය හා ජ්‍යොතිෂ විද්‍යාව 43-58

4. ජ්‍යොතිෂය හා බැඳුණු කෘෂි තාක්ෂණය 59-72

5. විශ්ව ශක්තීන් හා පැළෑටි 73-116

6. කෘෂි ජෛව විවිධත්වය දේශීය 117-134

ආහාර හා මානව පෝෂණය.

7. කෘෂි කටයුතු සඳහා අවශ්‍ය 135-180

සාධක තුන සහ සතර මහා ධාතු

8. වගාලිත් 181-214

9. ජ්‍යොතිෂ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා 215-260

බැඳුණු විධිමත් පෝෂණය

# රූප සටහන්


| | | |
|---|---|---|
| 1. | සෞරග්‍රහ මණ්ඩලය | 44 |
| 2. | සතියේ දින හත | 46 |
| 3.1 | රාශි චක්‍රය | 77 |
| 3.2. | රාශි චක්‍රය | 78 |
| 4. | සූර්ය ශක්තිය ස්මිත්, 2009 | 80 |
| 5. | ත්‍රිවිධ මානවයා ස්මිත්, 2009 | 81 |
| 6. | ත්‍රිවිධ ශාකය ස්මිත්, 2009 | 82 |
| 7. | පාරිසරික ගොවිතැනේ පදනම. ස්මිත්, 2007 | 133 |
| 8. | මූල ධාතු හතර | 136 |
| 9. | මූල ධාතු හතර සහ රාශි චක්‍රය | 137 |
| 10.1. | ස්වභාවික පැළෑටි හා විශ්ව ශක්තීන්. | 138 |
| 10.2. | කෘතිම රසායන පොහොර යෙදූ පැළෑටියක විශ්ව ශක්තීන්ගේ සංයෝජනය. | 139 |
| 10.3. | ජෛවගතික කෘෂි පොහොර යෙදූ පැළෑටියක විශ්ව ශක්තීන්ගේ සංයෝජනය. | 140 |
| 10.4. | විශ්ව ශක්තීන් සහ භූගෝලීය සාධක මිනිසාගේ ආහාර සමඟ සංයෝජනය | 141 |

| | | |
|---|---|---|
| 11. | ගැඩවිලි දියර පොහොර (ස්මිත් 2007) | 179 |
| 12. | ජෛවගතික දියර පොහොර (ස්මිත් 2007) | 180 |
| 13.1. | පුර සඳ චක්‍රය | 203 |
| 13.2 | ඇනොමලිස්ටික් චක්‍රය | 205 |
| 13.3. | තාරකා චක්‍රය | 206 |
| 13.4. | ඩ්‍රැකොනික් චක්‍රය | 207 |
| 13.5. | නිවර්තන චක්‍රය | 211 |
| 14. | රාශි චක්‍රය සහ මිනිසා අතර සම්බන්ධය | 249 |
| 15. | විශ්ව ශක්තීන් සහ මිනිසා අතර අන්තර් සම්බන්ධතා | 250 |
| 16. | ජ්‍යොතිෂ මිනිසා | 251 |
| 17. | විශ්වය සහ මිනිසා | 252 |
| 18. | රාශි චක්‍රය සහ සිරුරේ කොටස් | 253 |
| 19. | නව ග්‍රහ මණ්ඩලය | 257 |
| 20. | ජීවිතයේ ප්‍රධාන අවස්ථා හතරක් | 259-260 |

# ආදී මානවයන් සතු දැනුම
# Ancient Human Wisdom

## ආදී මානවයාගේ සම්භවය

ආදී මානවයා වසර මිලියන 4 කට පෙර අප්‍රිකාවේ හා ආසියාවේ වානර විශේෂයකින් උපත ලබා ලෝකය පුරා ව්‍යාප්ත වූ බව මානව විද්‍යාඥයින් විසින් පැහැදිළි කරනු ලබයි. මේ සම්බන්ධව චාල්ස් ඩාවින් වාදය ගැන කවුරුත් අසා ඇති. ලයිබීරියාවේ චිම්පන්සියෙකු ඔලිව් අත්තක් කඩා ගල් ලෙනට ගෙනවිත් ඔලිව් ඇට තලා කෑ බැව් වාර්තා වෙයි. ජාවා දූපතේ වඳුරන් විශේෂයක් ගල් කැට ජලයට විසිකර කකුළුවන් තලා කෑ බැව් ද වාර්තා වෙයි. ජපන් දූපතක මැකක් නැමති වඳුරු වර්ගයක් අල ශුද්ධ කර මුහුදු ජලයෙන් සෝදා කන බව කියයි. චිම්පන්සියා කුඹින් වැනි කුඩා සතුන් කෝටුවක දවටා කයි. නමුත් ආයුධ තැනීම ඔවුනට කළ නොහැකිය.

වඳුරාට ඕනෑම දෙයක් අතින් ඇඩිව අල්ලා ගෙන පාවිච්චි කළ හැකිය. දිග වලිගය නිසා අතු අග පැන යාමේ දී ශරීරය සමබරව තබාගනී. මෙය කලල රූපික ක්‍රියාකාරිත්වයක් සේ හඳුන්වයි. ශරීර අවයවයන් වෙනස්වීමත් සමග බුද්ධි වර්ධනය සිදුවිය. දෑත් නිදහස් වූ නිසා උපකරණ භාවිතයට හුරු විය. මෙම මානවයාට ගලකට ගලක් ගසා මුවහත් කිරීමට හැකි විණ. ගල්ලෙන් හා ගස්බෙන තුළ සැඟවී ආරක්ෂා විය.

ලැව්ගිනි නිසා පිළිස්සුණු ආහාරවල රස උරගා බැලීමෙන් පසු ආහාර පළහා කෑමට හුරුවී යැයි ද මතයකි. මානවයා කෙමෙන් සතුන් ඇති කිරීමටත් පැළෑටි එක් කිරීමටත් පරිසරයට අවතීර්ණ විය.

පරිවර්තනය නිසා සහජ හැකියාවන් දියුණු වෙත්ම පරිසරය ජය ගැනීමටත්, දිගුකල් ජීවත්වීමටත් හැකිවිය. බුද්ධිමත් මිනිසුන්ගේ විශේෂ ලක්ෂණය වන්නේ සංවලිත හා හලි සහිත අර්ධගෝලයන් ගෙන් යුක්ත විශාල මොළයක් සහ අත් තිබීමය. අත් ශ්‍රමයේ උපකරණය හා බලය විය. පාද අයෙකුට ආවේණික ලක්ෂණයක් වන ආයත චක්‍රය නිසා කෙළින් සිට ගැනීමේදී හා ගමන් කිරීමේදී විශාල ආධාරකයක් විය. රෝම කූප දක්වා සිරුර හොඳින් වැඩීම සිදුවිය.

තරුණ අවධියේ දී ඓන්ද්‍රිය වර්ධනය ප්‍රමාද වුවත් පසුව වේගවත් වර්ධනය මිනිසාට ආවේණික ලක්ෂණයකි. ශරීර ව්‍යුහය හා පරිසරය තුළ ඇතිවන සහසම්බන්ධකම් මීට හේතු විය. කල්යාමේදී සංවර්ධනයේ ගුණාත්මක බවට ශ්‍රමය ද, වෙනත් අය සමග ආවාහ විවාහ සම්බන්ධකම් ද භූගෝලීය සාධක ද හේතුවිය. දඩයම් කිරීමට හා ආයුධ නිපදවීමට දක්ෂ මේ සංචාරකයින් අපේ මුතුන් මිත්තන් සේ සලකයි. ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින්ස් වරුන් ද, නවසීලන්තයේ මැයොරි ද, ඇමෙරිකාවේ රතු ඉන්දියන් වරු ද මින් සමහරකි.

වානරයන්ට හා මිනිසාට සමානව වැඩෙන්නට වූ මානවයාට (Homo erectus) විශාල මොළයක් ඇතිව ඍජුව ඇවිදීමට හැකිවන සේ ශරීරයත්, උරහිසත්, දිගු පාදත් තිබිණ. කෙලින් සිටගත් මානවයාට තරමක් මේරූ දැනුමක් ලැබිණි. ගලකට ගලක් ගසා වඩාත් තියුණු ලෙස මුවහත් කිරීමට හැකි විණි. අඹ ගෙඩියක හැඩයට ගල් පොරවත්, බුලත් කොළයක හැඩය ඇති හෙල්ලත් සමඟ මානවයා දඩයමට අවතීර්ණ විය. ආහාර සොයා ගැනීමට, ආරක්ෂාව සලසා ගැනීමට, ගින්දර සොයා ගැනීමට ඉන්පසු හැකිවිය.

## දඩයම් යුගය

'පුරාණ ගල්' නැමති ග්‍රීක වචන දෙකක් එක්වීමෙන්, (Paleolithic Period) වචනය සෑදී තිබේ. බුද්ධියෙන් දියුණුවක් ලැබූ පසු ආයුධ පාවිච්චි කර දඩයමින් ජීවත් වූ බව පිළිගනී. වඳුරා යමක් අතින් ගෙන පාවිච්චියට පුරුදු වී ඇත. ඍජු සංචාරණය නිසා පරිවර්තනය වීම තීරණාත්මක පියවරක් බව එංගල්ස් කියයි. මිනිසාට මේ පරිවර්තනය නිසා සහජ හැකියාවන් ලැබිණි. මොළය හොඳින් වර්ධනය වූ අයට වැඩි කල් ජීවත්වීමේ හැකියාව ලැබිණි. තරුණ අවධියේ දී ඓන්ද්‍රිය වර්ධනය ප්‍රමාද වුවත් පසුව වේගවත් වර්ධනය මිනිසාට ආවේනික ලක්ෂණයක් බව කියයි. ලෝකය පුරාම දුනු, ඊතල සහ ආයුධ භාවිතය ක්‍රමවත් වීම මේ බුද්ධි වර්ධනය නිසා සිදුවිය.

පිරිමි දඩයමේ ගිය අතර ස්ත්‍රීහු සහ ළමෝ හබක වැනි ක්‍රම භාවිතා කර කුඩා සතුන් අල්ලා ගත්හ. ධාන්‍ය, ගෙඩි, මල්, අල, කොළ වර්ග සොයන්නට විය. මී පැණි, බඹර පැණි වටිනා ඖෂධයක් සේ අදත් භාවිතා කරයි.

මානව විද්‍යඥායින්ට අනුව අප්‍රිකාවේ උපත ලද නූතන මිනිසා (Homo Sapiens) බුද්ධි මට්ටමින් උසස් විය. මේ විශාල බුද්ධි වර්ධනය නිසා සමේ පැහැයද ඇති විය. මහෙන්ජදාරෝ, හරප්පා, ඉන්දු යුරේෂියන් සභ්‍යත්වය, ලෝකයේ දියුණුම ශිෂ්ඨාචාරයන් විය. ආයුධ පරිහරණයට හා එක්ව වාසය කිරීමට වසර මිලියන ගණනාවක්ම ගත විය. මානව විද්‍යාඥයින් මෙම කාලසීමාවන් යුග වශයෙන් වෙන් කරයි. තරුණ අවධියේදී ඓන්ද්‍රිය වර්ධනය ප්‍රමාද වුවත් පසුව වේගවත් වර්ධනය මිනිසාට අවේනික ලක්ෂණයකි.

බුද්ධි මට්ටමක් තිබූ මානවයා සතුන් කන බොන දේ බලා ඒ අනුව ආහාර සොයා ගියේ රාත්‍රී කාලයේ තරු මං සළකුණු ඔස්සේ ගස්වල අතු කඩා දමමිනි. මළවුන් ඇදහීම එකම ආගම විය. පසුව කෙමෙන් ඇට කටු හා ඇත් දළ උල් කර, ගලක උලා උල් කටු සාදා මස් කපන තල, සූරණ ගල් කටු සෑදීය. මේ අතර බෙලි කටුද තිබුණි. ගස් බෙල්ලන් ඔවුන්ගේ ප්‍රියතම ආහාරයක් සේ සැලකීය. නූතන ගල් යුගයේදී ගලකට ගලක් ගැසීමෙන්, උණ පතුරු හෝ ලී එකට ඇතිල්ලීමෙන් ගින්දර සොයාගෙන ඇති බව පිළිගනී.

පළමුවෙන්ම ලැව් ගිනි තුළින් පිළිස්සුණු මස් ආහාරයට ගත් බවට මතයකි. ඇට කටු වලින් ආභරණ පැළඳි බව චිත්‍ර වලින් හඳුනා ගනිමු. දුඹුරු, රතු, ගුරු වර්ණ භාවිතකර වර්ණ ගැන්විය. නූතන ගල් යුගයේදී පොරෝතල, සූරන ආයුධ, ඇඹරුම් ගල්, ඊතල තුඩු, පිහියා තල, පනා, ඉදි කටු, කපන කියත්, හා ආභරණ භාවිතා කළ බව කියයි. පනා සාදා ඇත්තේ ඇටකටු වලිනි. බල්ලා දඩයම් සොයා දුන් හොඳම මිතුරා ද ආරක්ෂකයා ද විය. ගල් පහන් ද, ගල් ආයුධ හා චිත්‍ර ද හමු වූ වග වාර්තා වෙමින් පවතී. ඊතල තද ලී වලින් සාදා ඇතැයි  කියති.

ඉර, හඳ, තාරකා විශ්මය ජනක බලපෑම් එක්කළ නිසා දේවත්වයෙන් සැළකීය. දඩමස් සොයා පියමන් කළේ තරු රටා ඔස්සේය. සඳෙහි කලා අනුව ගැබ් දැරීමට ද පැළ හා ඇට සිටුවීමට ද ආරම්භ කළහ. උපකරණ සෑදීමේදි ද, නිවාස ඉදි කිරීමේදි ද විශ්වයේ පවතින විවිධ ජ්‍යාමිතික රටා භාවිත කර උසස් නිර්මාණ සාදන්නට විය. ස්ත්‍රීන්ගේ ලෙන්ගතුකම නිසා උසස් සමාජ ගොඩ නැඟුනේ යැයි මානව හා සමාජ විද්‍යාඥයින්ගේ මතයයි. සතුන් මෙන් එක ගෙයි විසීම වෙනුවට සදාචාරවත් ලෙස විවාහ සිදුවිය. දේශ සංචාරය නිසා අළුත් පරිසර පද්ධති හිදුනා ගැනීම, අළුත් අය සමඟ පදිංචි වීම නිසා වර්ණ කුළමල භේද ආරවුල් ද ඇති විය. හැඩි දැඩි අය නායකත්වය දැරීම නිසා ඒවා විසඳිණ.

වලිගයක් ඇති සතුන්ට බුද්ධියට වඩා ඇත්තේ හුරුවක් සහ ඉව පමණි. මිනිසාට මේ සියල්ලම ඇත. සියුම් පතුරු, ආයුධ

සත්ව ඇටකටු හා පබළු ආයිත්තම්, ඇඳුම්, වාසස්ථාන සඳහා පරිසරය ග්‍රහණය කරන්නට විය. විවිධ ආයුධ වර්ග ද කෘෂි උපකරණ ද සකස් කළහ. දඩයම් කිරීමට හා ආයුධ නිපදවීමට දක්ෂ මේ සංචාරකයින් අපේ මුතුන් මිත්තන් සේ සළකනු ලබයි.

සතුන් මෙල්ල කිරීමට මෙන්ම හීලෑකර පට්ටි පවත්වාගෙන යාමට සරු බිම්ද ග්‍රහණ වලට, නියං සාගත වලට, ගංවතුර වලට, වසංගත රෝග වලට, බිය වූ නිසා පහත රට සරු තෙත් බිම් මෙන්ම උස් බිම්වලද ජනාවාස ඇතිවිය. නිවර්තන මෝසම් වැසි වනාන්තර මෙන්ම සංවහන වැසිද, අන්තර් ජල වහන රටාද, දිග වියළි කාලය ද නිසා කෘෂි කර්මාන්තය දියුණු විය. ගෘහ නිර්මාණ ශිල්පය, කර්මාන්ත, කලා මෙන්ම පරිපාලනය සඳහා ද දායක විය. ඒ හා සමඟ රෝග නිර්ණයද, ඔසු පැළ භාවිතයද, විවිධ කෙම් පහන් ක්‍රම හා ශාන්තිකර්ම වලට ද අවතීර්ණ විය. මුව හා රයිනෝ අං ගලගා බීමටද, කුඩැල්ලන් ලවා අපිරිසිදු ලේ ඉවත් කිරීම, හාවුන් හා කිරි ඉබ්බන් හඡ්න ද, කිරි නිෂ්පාදන ද, මී පැණි, කොළ කැඳ වැනි අධි පෝෂණීය ආහාරද සොයා ගත්හ. කස්තුරි, රන් රිදී භෂ්ම ද, විවිධ පාෂාණ වර්ගද, භාවිතා කර රෝග සුව කළහ.

ඖෂධ දියර නෑමද, ජනප්‍රිය අංගයක් විය. අවතාර වලට බියවූ මානවයා අයෙක් මියගිය විට මිහිදන් කිරීමට ක්‍රම සෙවීය. රැක්අත්තන විෂ උරන ලී භාවිතයට ද අවතීර්ණ විය.

ඉන්පසු නුවණැති මිනිසා (Homo Niandathal) බිහි වී ඇත. ඔවුන් අයෙකු මියගිය විට වල දැමීම පළමුවෙන්ම කරන ලදැයි කියති. සොයා ගන්නා ලද බිම්බතු වලින් ඒ බව අනාවරණය වී ඇත. පිරමීඩ හා ස්තූප මළවුන් සිහිකරන ස්මාරකයන්ය. පැලියෝලිතික සමයේදී දේශගුණය හා ස්වාභාවික පරිසරය අනුව මොවුන් වෙනත් රටවලට විසිර ගියහ. සතුරන්ගෙන් සැඟවීමට පාරු හා සියුම් පතුරු ආයුධ සෑදීමටත්, නිරීක්ෂණයටත්, චිත්‍ර ඇඳීමටත් දක්ෂ විය. මිටි සිරුරක් තිබිණි. මැමත් හා රයිනෝ දඩයම් කළහ.

## ශිලා යුගය

ආදී මානවයාට පරිසරය ජය ගැනීමට අධික වෙහෙසක් දැරීමට සිදුවිය. ඉවෙන් ද සතුන්ගෙන් ද පරිසරයෙන් ද උගත් දෑ එකම දැනුමයි. මැන බැලීමට තිබු මිම්ම ජීවත් වීමයි. රුදුරු වග වලසුන් හා පොර බැදීමට, අකුණු, චණ්ඩ මාරුත, සර්ප දෂ්ඨ, වසංගත, වැහි කුණාටු, දැඩි හිරු රැස්, ග්‍රහණ භූමිකම්පා වලින් සැඟවීමට ගල් ගුහා පිහිට විය. ඒවා දේව කෝප සේ සැලකීය. නිරුවත් දඩයම් රූප ගල් ගුහා වලින් හමුවී ඇත.

ගල් යුගයේ අවසානයේ ගස්වල පට්ටා වලින් වස්ත්‍ර වියා ඉණ දවටා ඇත. කොළ හා හම් පාවිච්චි කළ බවද වාර්තා වේ.

## එඬේර යුගය

කෙමෙන් සතුන් ඇති කිරීමේ අවශ්‍යතාවය දැනිණි. වානරයින් වැනි සතුන් සමග දැඩි සම්බන්ධකම් පැවැත් විය. හිතවතුන් අතර මස්, මාළු, පළතුරු, ධාන්‍ය හුවමාරු විය. සත්ව ඇටකටු ගල් පතුරු විවිධ හැඩතල කපා වළං සාදා ආහාර පිසීම ආරම්භ කළහ. දිය කඩිති වලින් පිපාසය නිවාගත් මානවයා කෙමෙන් සතුන් හීලෑ කර ලේ, මස්, කිරි, හම් ලබා ගත්හ. එළු, ගව, බූරු, බැටළු, අලි ඇතුන් සහ අශ්ව වැනි සතුන් හීලෑ කර ප්‍රවාහන හා කෘෂි කටයුතු දියත් කළහ. නියං උවදුරු වල දී තෘණ භූමි සොයමින් යන්නට විය.

සංචාරකයන් වීමෙන් පරිසරය හා හොඳින් බැඳිණි. ඉබාගාතේ නොයා නිවාස ඉදිකර ජලාශ්‍රිත දියළු පස් සොයා එම භූමිවල ගොවිතැන් කිරීම හා සත්ව ගාල් ඉදි කෙරිණි. මාලු ඇල්ලීමට බිලි කොකු සාදා ඇත. හැඩි දැඩි දක්ෂයා කණ්ඩායම් නායකයා විය. ගංගාධාර වල පදිංචිවීමෙන් පසු එළි මහනේ ජීවත් වීම නිසා සමාජ රටාවල උසස් දියුණුවක් ද ඇතිවිය. සංස්කෘතියට අලුත් අංග එක්විය. ස්ත්‍රීන්ගේ ලෙන්ගතුකම නිසා සමාජ ගොඩ නැගුනේ යැයි මානව හා සමාජ විද්‍යාඥයින් ගේ මතයයි.

ස්ත්‍රීන්ගේ තනි නොතනියට අසල් වැසියන් සමඟ සම්බන්ධකම් දැඩිවිය. මේ කුඩා රංචු පසුව විශාල කණ්ඩායම් බවට පත්විය. සංචාරය නිසා සමාජයක් ගොඩ නැගිණ. ජාති, ගෝත්‍ර, කුලභේද ඇතිවිය. භූගෝලීය හා

අභ්‍යන්තර හේතු නිසා විවිධ ශාරීරික වෙනස්කම් ඇතිවිණි. ශරීරයේ හැඩය මෙන්ම පැවතුම් ද වෙනස් විය. විද්‍යාඥයින් අංග ලක්ෂණ හඳුනා ගැනීමේ දී දඩයම් දත්වල පවා හැඩරුව පරීක්ෂා කර බැලූ වග ලියා ඇත. සතුන් මෙන් එකිනෙකා අතර ඇතිවූ සහ සම්බන්ධකම් නිසා වර්ගයා බෝවීම වෙනුවට පවුලක් ලෙස සදාචාරවත් ලෙස ආවාහ විවාහ එඬේර යුගයේ දී ඇති විණැයි සිතිය හැක. සංචාරය නිසා අන් අය මුණ ගැසීම, නවාතැන් ගැනීම එයට මුල් වන්නට ඇත.

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී එසේ වීමට හේතු වුයේ බුද්ධි වර්ධනයක් නොවූ නිසාය. වලිගයක් ඇති සතුන්ට බුද්ධියට වඩා ඇත්තේ හුරුවකි. බල්ලකු නිදන්නට පෙර රවුම් කීපයක් කැරකී බලයි. මෙසේ ඉව හා පුරුද්ද මානවයාට ද උපතින් හා පරිසරයෙන් ලැබිණ.. බල්ලාත් බළලාත් අයහපත් චුම්භක බලවේග ඇති තැන්වල නොනිදයි. මානවයා මේ සතුන් අනුකරණය කරමින් බොහෝ දේ උගත්හ.

**ගොවි යුගය**

කෘෂිකර්මය : (Agriculture) : Agri යනු එකඟවීමයි. Culture යනු සංස්කෘතියයි.

මේ තුළ හැදියාව, සිරිත් විරිත්, ශිෂ්ඨත්වය, අභිවර්ධනය, වගාව, නිර්මාණ, පෝෂණ මාධ්‍ය, රසංඥතාවය, ප්‍රබුද්ධ බව ගැබ්වී තිබුණි. අත්තමට කෘෂි කටයුතු වලට සහභාගිවීම නිසා ආවාහ විවාහ වැඩි විය. නව සමාජයක් බිහි විය. වියළි

කලාපයේ වරින් වර නියං සාගත ඇති විය. ඔවුන්ට ඉතා දුෂ්කර මාර්ග හරහා ආහාර, ජලය හා සරු බිම් සොයා යාමට එය හේතුවකි. මේ නිසා උස් බිම්වල පදිංචි විය. අං සහ දළ වැනි ප්‍රහාරක අවි නැති පාඩුව තියුණු ගල් පතුරු සහ මුගුරු නිසා මැකිණි. පිට කොන්ද කෙළින් කර හිසේ බර අඩුකරගත් මානවකයා කෙමෙන් පරිසරය ග්‍රහණය කර ගන්නට ඇත. සොබා දහමේ ආධාරකයක් නොවීය. සොබා දහමට විරුද්ධව ගෙනගිය අතිශය බියකරු සංග්‍රාමයක ප්‍රතිඵලයකි, කලක් ජීවත් වීම.

ක්‍රි.පූ. 12000 ත් 14000 ත් අතර ධාන්‍ය වගාව කළ බව අනුමාන කරයි. ගල් ගුහා වලත්, කුඩා පැල්පත් වලත් විසූ බව කියයි. මළවුන් ඇදහීම තදින්ම බලපා ඇති නිසා මළමිනී හැර දමා යාමේ සිරිතක් ද විය. හිස් කබල් වල කුහර සාදා ඇතැයි පිළිගැණිනි. ඒවා පස් යට හෝ ගල් ගුහා වල, පර්වත කුහර වල තැබූ බව වාර්ථා වී තිබේ. මේ යුගයේදී ඇටකටු වලින් සෑදූ බිළි කොකුද හමුවී ඇත. දේශගුණය, කඳු, හෙල්, ගංගා, මිටියාවත් හා වෘක්ෂලතා මිනිසාගේ දියුණුවට හා ශීලාචාර වීම සඳහා බලපෑහ. මහේන්ජදාරෝ, හරප්පා, ඉන්දු යුරේසියන්, හොවැංහෝ සභ්‍යත්වයන්ගේ උපත මෙසේ සිදුවිය.

සාර භූමිය (Fertile Cresent) යනු සභ්‍යත්වයේ නිජ බිම (Cradle of Civilization) යි. කෙටි වැසි සමය තුළ ධාන්‍ය වගාව ඉතා උසස් අයුරින් කෙරිණි. දැඩි හිරු රැසින් යුත් වියළි ඍතුව තුළ ධාන්‍ය වේලා ගබඩා කිරීමට හැකි විය.

නිවර්තන කලාපීය මේ දේශගුණය සංවර්ධනයට ලොකු පිටුවහලකි. අවුරුදු 30000 කට පෙර ආදිවාසීන් භාවිතා කළ ගල් යුගයේ ගල් ආයුධ සොයා ගෙන ඇත. මිනිසා කොඳු ඇට පෙළ කෙළින් කරගෙන හොඳින් ඇවිදින්නට පුරුදුවීමත් සමග බුද්ධි වර්ධනය කෙමෙන් සිදු වන්නට ඇත. ඉන් පසු මේ අය සිතා මතා යමක් කළ හැකි බුද්ධිමත් අය බවට පත්විය. ධාන්‍ය, පළතුරු, ගව, එළු, බැටළු රංචු, මාලුබිම් වලින් විශාල අස්වැන්නක් ලැබිණි.

නයිල් මිටියාවතේ අතිශයින්ම සරු පිටාර තැනි නිසා මෙසේ සිදුවිය. සිරියස් හා ප්ලේඩිස්, තරු පායන නිසා කාලීන බව ද ඉර, හඳ, තරු මුල් වූ ඇදහිලි ක්‍රමද විභේදයන්ගේ සංකලනයකි. බඩු හුවමාරු ක්‍රමය, වෙළදාම, නගර නිර්මාණය, සංස්කෘතියේ උසස්ම අගයන් විය. නව නිර්මාණ, ජල කළමනාකරණය, සත්ව පාලනය, සත්ව ආහාර හා මිනිස් පරිභෝජනයට සුදුසු ආහාර වැඩියෙන් ගබඩා කිරීම සිදුවිය. චිත්‍ර කලාව, ආගම, කාර්යාල, රාජ්‍ය පාලනය, වාණිජ, නීති, කෘෂි, ජ්‍යොතිෂ සහ තාරකා විද්‍යාවන් බිහි විය. ගංගාවන් උතුරා යාම නිසා වරින් වර බාධක ද සිදු විය. වලං සෑදීම, මාළු ඇල්ලීම, රෙදි විවීම, යකඩ උපකරණ සෑදීමේ සිට විවිධ කර්මාන්ත දක්වා දියුණු විය.

භූගෝලීය සාධක වලට අමතරව පරිසර පද්ධතිය මිනිසාගේ අවශ්‍යතා අනුව සම්බන්ධීකරණය විය. අන්තරීක්ෂ කිරණ වල බලපෑම ද තදින් ක්‍රියාත්මක විණි. පරිසරය ජයගැනීමට දැරූ විශාල උත්සාහය නිසාද දැනුම දියුණු විය.

මිනිසා සතුන්ට වඩා ස්වාභාවික තත්වයන් ප්‍රයෝජනයට ගනිමින් අවශ්‍යතාවයන් අනුව වෙනස් දෑ කළේය. සියළුම දුෂ්කරතා මැඩ ගැනීම උත්සාහයන්ගේ ප්‍රතිඵලයකි. සමාජ සංවිධානය, ශ්‍රමය, ඇඳුම, උපකරණ, අවිච, ගින්දර, ප්‍රවාහනය ඒ අතර වැදගත් වේ. මං මාවත් නොමැති කල අහසේ තරු රටා හා කොළ අතු කඩා එල්ලීම නිසා ගමනාගමනය පහසු විය. මෙසේ කිසියම් ක්‍රමවේදයක් සෙවීමේ දී බුද්ධිය දියුණු වෙන්නට ඇත. අධික වර්ෂාව, ග්‍රහණ, භූමිකම්පා, සුළි සුළං, වසංගත, නියං උවදුරු වලදී ආරක්ෂාව පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නට සිදු විය. ආහාර හා පෝෂණය අධික වූ විට සතුන්ට වඩා වේගයෙන් මිනිසා පරිසරය ජයග්‍රහණයට අවශ්‍ය කරුණු සම්පාදනය කළේය.

## ආදී මානවයාගේ වර්ධනය

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටි යක්ෂ, නාග, දේව ගෝත්‍රිකයින් ද ඉන්දීය සංක්‍රමණිකයන් ලෙස අනුමාන කරයි.

නොදියුණු ගෝත්‍රිකයන් යනු සතුන් වගේම දිවි ගෙවූ කොටසකි. දේව යනු උසස්ම උපතක් ලැබූ අය සේ සලකයි. ග්‍රහලෝක මෙන්ම දේව වන්දනා ද සෑම ජාතියකටම පොදු දේවල් විය. මේ අය රත්නපුර, සබරගමුව, රාවණා ඇල්ල වැනි ප්‍රදේශ වලද සිටින්නට ඇතැයි කියති. යක්ෂයින් ඉතා නපුරු වර්ගයක් විය. නාග ගෝත්‍රිකයන් යාපනය, කැළණිය, රුහුණු යන ප්‍රදේශවල සිටි බැව් ප්‍රචලිතය. මහා නාග, චෝර නාග, ඉළ නාග වැනි නම් වංශ කථා වලින් අසා ඇත්තෙමු.

නාගදීප, නා ගොඩ, නාකුළුගමුව, නා ඔටුන්න, නා කන්දල, නයිවල, නාග ගෝත්‍රයින්ට සම්බන්ධය. අද පවා නයි නැටවීම, රිළවුන් නැටවීම, විෂ ගල ඇල්ලීම අප සමාජයේ ඇත. බුදුන් වහන්සේ වැඩි බවට කිසිදු සැකයක් නැත. විශේෂයෙන් කැළණියේ නාග දමනයට වැඩි බව බුදු රුව ගල, බුත්තල, බුන්දල, බදුල්ල ඒ හා සම්බන්ධව පවතී. බින්තැන්නේ අදත් වැදි ජනතාව ගොවිතැනත්, දඩයමත් දෙකම කරති. උතුරු මැද, ඌව, නැගෙනහිර ඇතැම් අය සිංහල දෙමළ අය හා මිශ්‍රව ඇතැයි අනුමාන කරයි. ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, අප්‍රිකාව, ලංකාව කිසියම් සහසම්බන්ධතාවයක් තිබුණාද? වන්නි බණ්ඩාර, රොඩී, කින්නර, වැනි සුළු ගෝත්‍රිකයන් ද සිටි බව නිශ්චිතය. ඊට අද පවතින සමාජය සාක්ෂි දරයි. භාෂාව, සිරිත් විරිත්, කලා ශිල්ප, ඇඳුම්, පැළඳුම් වලින් ලාංකිකයන් විවිධ ජාතීන් හා මිශ්‍රව ඇතැයි ඇතැම් අය සලකති.

අධි පෝෂක ගුණ ඇති කුකුලල, ගෝනල, ඉන්නල, තලගොයි බිත්තර, මස් හා මී පැණි වලට අමතරව ධාන්‍ය මංගල අවස්ථාවල දී භුවමාරු විය.

ආදී මානවයින්ද ඉන්දියාවෙන් එන්නට ඇතැයි සැක පහල කරයි. ආර්යයන්ගේ පැමිණීම නිසා හෙළදිව තුළ විශාල සංස්කෘතිකමය වෙනසක් සිදු විය. වැද්දන්ගේ පරම්පරාව යන්නේ මවගෙනි. කුල දේවතාවන්, මළ අය ඇදහීම, ඉර, හඳ පිදීම ආගම විය.

භාෂාව ආර්ය කුලයට අයත් යැයි පිළිගනී. වලහාට (හතේරා) කියන අරුත හතුරාය. වලසුන් සමග පොර බැදීමට ඉතාම දක්ෂයින්ය. වැද්දන්ගේ ශරීර කුඩාය. වඳුරු ස්වරූපයක් ගනී. කථාවට අකමැති ලැජ්ජාශීලී අය සේ හඳුන්වයි. සාමකාමීය. ඉක්මණින් කිපෙන සුළුය. ඥාති විවාහ කරයි. බහු භාර්යා සේවනය ද ඇත. නයයි පොලඟයි වගේ, රොඩියයි කින්නරයයි වගේ කියමන් අදත් සමාජයේ ඇත. විජයගේ ලංකා ගමනෙන් පසු කුවේණිය සමග විවාහ වීමෙන් උපන් ජීව හත්ථ සහ දිසාල දරුවන්ගෙන් ආදිවාසීන් පැවතෙන බව ද කියයි.

වරින් වර ඉන්දියාවේ බටහිරින් හා නැගෙනහිරින් ආ අය නිසා උතුරේ සහ ගිණිකොණ ජනාවාස ඇති වූ වග ප්‍රසිද්ධය. මීට වසර 2000 පෙර ද විශාල ගව හා එළු පට්ටි රැක බලාගත් එඬේරුන් ධාන්‍ය වගා කළ බවත් සංචාරකයින්ව සිටි බවත් සඳහන් වේ. අංජනම් දේවිය, හනුමන්තා සහ පන්දම පේන කීමට අදත් භාවිත කරයි.

රාවණ රජු ලංකාවට පැමිණීමත් සමඟ මේවා ව්‍යවහාරයට එක්විය. හනුමා, සීතා දේවිය, දඬු මොණර යන්ත්‍රය ගැන ද ප්‍රසිද්ධ රස කතා ඇති බව කවුරුත් දනී.

රාවණා ඇල්ල, සීතාවක, සීතා එළිය, රාවණා ගුහාව, රූමස්සල කන්ද, රාස්ස ගල, රාස්සපාන, රාම සැරය අදත් භාවිතයේ ඇත. අනුකරණය හා අධීක්ෂණය නිසා නොයෙක් දේ ඉගෙන ගන්නට විය. පාංශු ඛාදනය වැඩිවිය. සුළඟ හා

සතුන්ට වඩා මිනිසා විසින් කැලෑ එලිකර හේන් වගා කිරීමෙන් නිසරු බවක් ඇතිවිය.

මේ නිසා ඔවුන්ට අලුත් තෘණභූමි හා ජලාශ්‍රිත ප්‍රදේශ සොයා යාමට සිදුවිය. මළමිණී වලට, භූතාත්ම වලට තිබූ බිය නිසා ගල්ගුහා සහ කොළ අතු සෙවිළි කළ කටු මැටි පැල්පත් අතහැර ගියහ. මෙය මිනිසාගේ දියුණුව සඳහා හේතු විය. වනාන්තර නිසා කාබනික ද්‍රව්‍ය අධික විය. පසේ ව්‍යුහය, ජලය රඳවා ගැනීම, ඛණිජ අයන වැඩිවීම, ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය උසස් මට්ටමක තිබිණ. විලෝපිතයන් නිසා කෘමි වසංගත පාලනය විය.

උෂ්ණත්ව පාලනය, පාංශු ඛාදනය, නායයාම නිසා හෙල් මළු වලද දියලු පසෙහි මෙන්ම වී ගොවිතැන ද ජනාවාස ද ඇති විය. වී වගාව ද ව්‍යාප්ත විය. ගංගා ඩෙල්ටාවල ජදිංචිවී සිටි අය පසුව ගංගා දිගේ රට තුලට පිවිසිණ. වාරි කර්මාන්තය නිසා ද වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි, සංකල්ප නිසා ද කෘෂිකර්මය ක්‍රමයෙන් දියුණු විය. මිනිසා ස්වයංපෝෂණය වීමත් නිරෝගීව ශක්තිමත්ව සිටීම නිසාත් විශාල දියුණුවක් ඇති විය. මානසික සංවර්ධනයද උපරිමයට සිදුවිය. වැද්දන්ට අමතරව රොඩී, කින්නර, අහිකුණ්ඨික, නිත්තෑවෝ කියා කණ්ඩයාම් සිටි බව වාර්තා වේ.

මාතලේ, යටවත්ත, කුරුණෑගල, පැල්වැහැර, නුවර, දුම්බර ප්‍රසිද්ධ වන්නේ පැදුරු වියීමටත්, නියඳ වලින් ලණු, බුරුසු සෑදීමටත්ය. රොඩී මිනිසුන් අත වින කිරීමට ද, රබන්

කරකැවීමට ද දක්ෂයන්ය. උඩුකය වසා හෝ යන්තම් රෙදි පටක් බෙල්ලේ ඔතා පපුව වසා ගත්හ. රහසේ අදහස් හුවමාරු කිරීමට දක්ෂයින් විය. පෙට්ටියක් බැඳගත් කදකට ආධාර ඉල්ලා ගෙන්ගෙට ඇවිදියි. මිහිඳු හිමියන් මිහින්තලා ගලට වඩින විටද දේවානම් පියතිස්ස රජු දඩයමේ ගිය බවත්, දඩයම රජුන්ගේ විනෝද ක්‍රීඩාවක් ලෙසත් ප්‍රසිද්ධය. කුහුඹුවන්, මී මැස්සන්, කුරුල්ලන්, බීවර ජනපද මෙන් නොව මිනිසා පරිසරය තුළ විශේෂයෙන් භූගෝලීය සාධක බලපාන බව පිළිගනී.

ආදි කාලීන සමාජය වර්ධනය වූයේ උපකරණ සෑදීම මතයයි කියයි. මේ නිසා හැඩි දැඩි විශාල සතුන් මෙල්ල කිරීම පහසු විය. කුඩා සතුන්, ගෙඩි හා පලා වර්ග එකතු කිරීම, ආහාර පිසීම, පිරිසිදු කිරීම ස්ත්‍රීන්ට සීමා විය. විශේෂ වැදගත්කමක්, අත්දැකීමක් නිර්මාණ ශක්තියක් ලොකු සතුන් මැරීමට අවශ්‍ය විය. හේතුව පසු පහරදීමේදී දඩයම්කරු මියයාම හෝ තුවාලවීම සිදුවන නිසාය.

සතුන් පැනයාමද වැළැක්වීමට හබක ඇටවීමට සිදුවිය. කාලගුණික විපර්යාසයන් නිසා මානවයාට ගිනි මැල සහ ඇඳුම්, ආහාර සේම අවශ්‍ය විය. මිනිසාගේ උසස් වර්ධනයද මේ අවශ්‍යතාවයන්ට හේතු විය. මහියංගණයේ වැදි පෙරහැර අතිශයින්ම ප්‍රසිද්ධය. වැදි පෙරහැරේ ප්‍රධාන අංගය සටන් මූර්තිමත් කිරීමය. සිංහල දෙමළ අයට අමතර වඩිග නමින් ද පිරිසක් සිටී. දකුණේ වඩිග පටුන ශාන්තිකර්මය ඒ හා බැඳේ. අහිකුණ්ඨිකයින්ට සමානය.

දැනට සොයාගෙන ඇති බිම්බතු වලින් අවුරුදු දහස් ගණනකට පෙර මිනිසුන් සිටි බව පිළිගනි. කුඩා ඇස්, නෙරාගිය බැම් මේ බව කියයි. පුලින්දයන් සේ හැඳින්වෙන "සබර" නමින් කොටසක් සමනළ අඩවියේ අදත් ඇති බව කියයි. සබරගමුවේ නිවිතිගල, වැද්දාගල නමින් ගම් ඇත. ඔවුන්ගේ අදහස යක්ෂ, නාග, දේව ගෝත්‍ර 3 ක මිනිසුන් ඊට කලින් මෙහි සිටි බවයි. දඹාන මූලස්ථානය වශයෙන් සැලකේ. බදුල්ල, පොළොන්නරුව සහ දිඹුලාගල දක්වා ව්‍යාප්ත වූ වග කියයි. ආදීම මිනිසාගේ දණහිස් නැවී තිබුණ නිසා හිසේ බර ගතිය හා කොඳු ඇට හොඳින් කෙළින් තැබීමට බැරි නිසා ගස් නැගීමට අපහසු විය. පසුව මී පැණි බඹර වද ගඩා ගෙඩි මල් වලට තිබුණ අසීමිත ආශාව නිසා ගස් නැගීමට ද හැකි විය. ගසේදී පවා සතුන් පලවා හැරීමට හැකි කමද ලැබුණි. වද කපන්නේ රාත්‍රී කාලයටයි. පන්දම් වලට සතුන් පලවා හැරීම පහසු විය. වානරයාගේ මොළය උසස් ලෙස වර්ධනය වී තිබුණි.

මේ නිසා පරිණාමයේදී ඉතා සංකීර්ණ මොළයක් ඇතිවිණැයි සිතිය හැකිය. ශ්‍රම ක්‍රියාකාරීත්වයට පැහැදිලිව කතා කිරීමට මස් ආහාරයට ගැනීමද එක හේතුවක් විය.

## ආදි වාසීන් සිටි බවට සාධක

- පුත්තලම, පොම්පරිප්පු, ඉබ්බන්කටුව - විශාල මැටි භාජන හමුවී ඇත.
- මුදුන්ගොඩ ලෙන, බින්තැන්න, ගල්ඹය - චිත්‍ර අඟුරු වලින් හෝ ඇඟිලි වලින් අඳින්නට ඇත.

- රඹුක්කන, පදියගම්පල - ගල් ඇඳ හෙවත් ඩොල්මන් ගල්ගේ දැකිය හැක.
- බලංගොඩ කැනීම් වල දී මළ සිරුරු 13 ක් සොයාගෙන ඇත.
- කුරුවිටින් වසර 40000 කට පැරණි සිංහයින් 3 දෙනකු හමු වූ වග කියා ඇත.
- රත්නපුර පතලකින් පැරණි හිපපොටේමස් දතක් ද හමු වී ඇත.
- රත්නපුර, කුරුවිට - බට දොඹලෙන
- හොරණ, බුලත් සිංහල - පාහියන්ගල
- ගිනිගත්හේන - කිතුල්ගල බෙළිලෙන
- අනුරාධපුරය - ගුරු ගල් හින්න
- සිගිරිය - අලි ගල්ගේ, පොතාන ලෙන
- දඹුල්ල - ඉබ්බන්කටුව
- කුවේනි කපු කැටීම - වස්ත්‍ර නිපදවීමේ තාක්ෂණය
- බැල්ලගේ පැමිණීම - සතුන් හීලෑ කළවග
- සිරස වත්ථු හා ලංකාපුර නගරය - දියුණුව තිබීම
- රාමායනය - දඬුමොණර යන්ත්‍රය, ගුවන්ගත වීමේ තාක්ෂණය
- මහා වංශය, දීප වංශය - ඓතිහාසික තොරතුරු

- බලංගොඩ - බලංගොඩින් වාර්ථා වී ඇති පරිදි මළවුන දෙකට නමා මිහිදන් කළ වග කියයි.
- කඳ කුමරු වැදි ළඳක වූ වල්ලීට පෙම් බැඳි කතා පුවත.
- මහියංගණය හා කතරගම පෙරහැර වලට සහභාගි වීම.
- දළදා මාළිගාවට මී පැනි සැපයිම
- වල්ලී ලෙණ - කඳ කුමරු වැදි ලඳක වූ වල්ලීට පෙම් බැඳි කතා පුවත හා සම්බන්ධය

## උපකරණ

- ප්‍රාග් ඓතිහාසික යුගයේ දී භාවිත කළ උපකරණ - ගල් පතුරු, සත්ව ඇටකටු හා ඒවායින් ඉදිකටු සෑදීම
- අතට ගත හැකි ලී මුගුරු, ඊ තල, ගල් පතුරු (මස් ඉරා ගැනීමට, හම ඉවත් කිරීමට)
- ඉතා සියුම් කුඩා උපකරණ ක්ෂුද්‍ර ශිලා මෙවලම් නමින් හැඳින්වේ.
- චන්ද්‍රවංක, ත්‍රිකෝණ, ත්‍රිපීසියම, හැඩැති ගල් වලින් සැදූ උසස් ගණයේ ජ්‍යාමිතික මෙවලම්
- හෙල්ල, ගල් පොරව, ලබු කැටය, ඇට වලින් සැදූ ආභරණ
- ඊතල, උල් කටු, බෙලි කටු, පසුව කැත්ත, පිහිය, විසිකැත්ත, පොරව, කෙටේරිය, දෑ කැත්ත, උදැල්ල
- මැටි භාජන - බෙලි ලෙනෙන් මතු වූ ධාන්‍ය සහිත මැටි භාජන

- වල් දෙල් ඇට බැදීමේ උපකරණ
- දැල්වීමට කැකුණ ඇට තැලූ සිදුරු සහිත ගල් වංගෙඩි, කුඩා ගල් උඳුන්
- යකඩ භාවිතයට පසුව හුරුවීම නිසා වැඩ පහසු විය.
- දුන්න හා කුඩා පොරව අනන්‍යතාවය පිළිඹිබු කරයි.

## ඇඳුම්

ගස්වල පට්ටා, හම්, කොළ අතු, පසුව අත් යන්ත්‍ර වලින් වියන දළ රෙදි විදේශ වලින් ගෙන ආ වෙළඳ භාණ්ඩ.

## නිවාස

ගල් ලෙන්, ගස් බෙන, මැටි, ලී පතුරු එක්කර හැදූ ගෙය ඉලුක් මානා වලින් සෙවිලි කරගත්හ.

ගල් ලෙන්, කටු මැටි, වරිච්චි ගෙවල්, ගස් උඩ බැලුම් ගෙවල් (හේන් ආරක්ෂා කිරීමට හා වන සතුන්ගෙන් ආරක්ෂා වීමට) විවිධ ජ්‍යාමිතික හැඩතල සහිත නිවාස දක්වා වර්ධනය විය.

## දුනු ඊතල හා දඩයම් උපකරණ

- ලෝකයේ පැරණිම දුනු ඊතල ඩෙන්මාර්කයේ එල්ම් ගසෙන් සාදන ලදැයි කියති.
- ඇස්කිමෝ වරුන් දුනු සතුන්ගේ හම් වලින් සාදා, සත්ව නහර වලින් ගැට ගසා ඊයේ මූණත පිතිමුව අඟින් යොදාගත් බව කියති.

- වේල්සයේ රොබින් දක්ෂ දුනුවායකු බව අසා ඇත.

- ඇමරිකාවේ රතු ඉන්දියන් වරුද කුඩා දුන්නක් භාවිත කර ඇත.

- යුද කටයුතු වල්දී ද දුනු ඊතල යොදා ගත් බව සඳහන් වෙයි.

- ලංකාවේ වැද්දන් විසින් ඊතල භාවිත කළ බවත් රජුන්ට මස් සැපයූ බවත් කියති. මහ කැකුල ගස් ද, කොබ්බෑ වැල් ද දුනු දිය සඳහා නියඳ, නුග, හැර වැල් හෝ වෙලන්කොඩි ගස්වල පොතු භාවිත කළ බව කියති. කල් පැවැත්මට තිඹිරි ගෙඩිය දෙකට පලා දුනු දියේ ඇතිල්ලූ වග කියයි. ලෝ කුරුවා ගෙන් පැතලි දිග ලෝහයක් ගත් බව ද සඳහන් ය. දුන්නේ දිග පාවිච්චි කරන්නාගේ අත හා ශක්තිය අනුව තීරණය විය. කැලෑවල දී කෙටි දුනු භාවිත කළැයි පිළිගනී. මෙය ඉතා සරල එකකි.

  වැද්දන් ඊතල වලින් සතුටු නොවූ බව රොබට් නොක්ස් ලියා ඇත. ඊතල ගඟ අද්දර ගලක ගාමින් මුවහත් කළ බවට ද මතයකි. නිවසින් පිටව යන විට දොරකඩ දුන්නක් තියා යන්නට පුරුදු විය. අද පවා පොරවක් කරේ පාවිච්චි කරන්නේ එය වැදි සංකේතය සේ සලකන නිසාය.

- කතරගම දෙවියන්ට දෙවොල සෑදීමට ඊතලය වැටුන තැන සොයා ගන්නා ලදී.

- දඩයම් ඇටවුම් - හබක, ලූල් දැමීම, මඳු ගැසීම, උගුල්, රිලා හබක, රැහැන් ඇද ලාටු ගෑම, තඩි බැඳීම
- දුනු සෑදීමට ගන්නා ලී - ගැටවලා, කොබ්බෑ, යබර, තිඹිරි, පාඬුරු, රත්මල්
- ඊ දඬු වලට - ගැටවලා, වෙලං
- දුනු දියට - නුග, අරලු, නියඳ කෙඳි, හම් පටි
- මසුන් මැරීමට - පුස්සුලු මුල්, කලවැල්, තිඹිරි ගෙඩි, දලුක් කිරි, කරඳ පොතු
- ලෑබ සෑදීමට - නුග කිරි, දලුක් කිරි
- කරේ එල්ලා ගත් පොරව හා හෙල්ල වැදි සංකේතයන්ය.
- වණ අසිරියෙන් කුල්මත්ව සිටි ආදිවාසීන් වනය හැර යන්නට අකමැති විය. ක්ෂුදා ගින්න කැලය වෙනුවෙන් ඉවසා සිටින්නට ඇත.

## වැද්දන්ගේ ව්‍යාප්තිය

දඹාන, රත්නපුරය, ගිරාඳුරුකෝට්ටේ, මහියංගනය, සොරබොර වැව, වටවන යන ප්‍රදේශ හරහා සිදු විය.

## ආහාර සංරක්ෂණය

අඩි 3 ක් පමණ උස උඩු මැස්සේ අතුරා මස්, මාලු, ධාන්‍ය වර්ග වියළා ගත්හ. මී පැණි, බඹර පැණි ලබු කටු වලට පුරවා තැබූහ.

## ආහාර

කුරක්කන්, අමු, මෙනේරි, බඩඉරිඟු, බතල, වට්ටක්කා, මඤ්ඤොක්කා, ගිරිතල, කටුවල, වැඩියෙන් වගා කර තිබුණි.

මී පැණි - පිළිස්සුම් වලට, සියලුම තුවාල වලට, ඇදුමට, දියවැඩියාවට, කැස්සට, වමනයට, පාචනයට, ඉදිමුමට මී පැණි දිව ඔසුවක් විය.

මී ඉටි පත්තු බැඳීමට උපකාරී විය. අධික ශක්ති වර්ධකයක් මෙන්ම විෂබීජ නාශකයකි. අද පවා බෙහෙත් වලට මී පැණි ප්‍රතිවාප ලෙස එක්කරයි.

බුලත් විටට - පුවක්, බුලත්, හුණු, දුම්කොළ පාවිච්චි විය. දවට, ගල් සියඹලා, ඕපුල්ල, පුවක් වෙනුවට ද, දෙමට, කල වැල් පොතු බුලත් වෙනුවට ආදේශක විය.

## ඇදහිලි ක්‍රම

ලෙඩ රෝග වලට පැළෑටි ඖෂධ විය. විවිධ ඇදහිලි ක්‍රම තිබිණ. යකුන් ඇදහීම එකම ආගම විය. සියලු විපත් තම මළ යකුන් නිසා සිදුවන වග සිතන්නට ඇත.

වැදි මන්තර බලගතු බවට මතයක් පවතී. යකුන් පිදීමට කිරි කොරහ කියන විශාල ශාන්තිකර්මය කරයි. පාරම්පරික ඇදහිලි ක්‍රම හා විශ්වාස පරම්පරා වලින් පැවතෙන ඒවාය. කිරි කොරහ නැටීම මහා ශාන්ති කර්මයයි. දෙවි දේවතාවුන් පිදීම ද කරයි. සමන් දෙවියන් හා මහ ලොකුවෝද තවමත්

පිදුම් ලබයි. මහියංගනයේ සමන් දේවාලයේ, ඇසල උත්සවය හා සම්බන්ධ පෙරහැර අදත් පවත්වයි. කතරගම වල්ලී දේවිය සම්බන්ධ පුද පූජා විධි අදටත් ඒ අයුරින්ම සිදුවෙමින් පවතී.

## සමාජ ගැටලු

- වන සතුන්ගෙන් වන හානි
- ජනයා හීනව යාම
- මුල්‍ය ධනය නැතිකම
- වන පරිභෝජනය සඳහා අවහිරතා
- නාගරීකරණය
- ස්වයං පෝෂණ මාර්ග වැලකීම
- නියං උවදුරු
- රංචු ලැදිකම
- මේවාට විසඳුම් සෙවීමට වැද්දන්ගේ අදහස් පරිදි සංවර්ධන කටයුතු සැළසුම් කළ යුතුය.

# දේශීය ආහාර තාක්ෂණය
# Traditional Nutrition Technology

ගල් යුගයෙන් ආරම්භ වූ මානව පරිණාමයේ මුල් අවධිය දූඩි හිරු රැසින් හා වන මෘගයන්ගෙන් සැඟවී ගල්ලෙන තුළ සිරවී සිටීම, අතිශයින්ම කටුක විය. ශුද්‍ර ශිලා, මෙවලම් ආහාර සකස් කරගැනීම සඳහා භාවිත විය. ගින්දර සොයාගැනීමෙන් පසු මස්, ඇට වර්ග, අල වර්ග, පල හා කෑමට පටන් ගත්හ. මාංශ භක්ෂකයින් සර්ව භක්ෂකයින් වීම නිසාද, ඝන වනාන්තරයට අවතීර්ණ වීමට ශක්තිය ලැබිණි. මස්, කිරි, හම් සඳහා සත්ව පාලනයට අලුත් තෘණභූමි සෙවීමට සංක්‍රමණය විය. සරුසාර පිටාර තැනිවල ගල්ලෙන් වෙනුවට කුඩා නිවාස ඉදිවිය. ගම්මාන පිහිටුවීය. ගංවතුර නිසා උස්බිම් වලද, ජනාවාස ඇති කෙරිණි. හේන් වගාව නිසා පාංශු ඛාදනය වී පසෙහි ඛණිජ ලවණ විනාශ වී නිසරු වූ විට සරු බිම් සොයා ගියේය. සැඩ සුළං, කුණාටු වැහි, භූමි කම්පා, ගිනි විපත්, අකුණු නිසා ස්ථිර වාසස්ථාන සමග ගෙවත්තක අවශ්‍යතාව මතුවිය. ගොඩමඩ ගොවිතැන් සරුවිය. උස්බිම් වල පළතුරු, ධාන්‍ය හොඳින් වැඩිණි. නියං කාලවලට ධාන්‍ය රැස්කර වියළා ගබඩා කළහ. සත්ව පාලනය නිසා පවුල සුරක්ෂිත විය. කෙමෙන් පෝෂණ ක්‍රියාවලිය ද විවිධාංගීකරණය විය. ස්වයංපෝෂණය නිසා ආයුධ නිෂ්පාදනයට ද, උපකරණ සෑදීමට ද, කලාශිල්ප දියුණුවට ද, නිවාස ඉදිකිරීමට ද කාලය ඉතිරි විය.

දක්ෂයින් ජ්‍යාමිතික හැඩරුව ගත් නිවාස ඉදිකළහ. සෑදූ උපකරණ විවිධ අවශ්‍යතාවයන් නිසා භාවිත කරන ලදී. පවුලක් තුළ වර්ගයා බෝවීම නවතා වෙනත් පවුල් වලින් ආවාහ විවාහ සිදුවීම තුළ සාරධර්ම දියුණු විය. මේ නිසා ද රෝග පාලනය සිදුවිය.

පෝෂණ ඌණතා හා වසංගත රෝග වලදී ඉර, හඳ, පෘථිවියට, ගස්ගල් වලට පුද පූජා තැබීය. බලි බිලි, තොවිල් පවිල් එක්විය. කෙමෙන් නව සංස්කෘතියක් බිහිවිය. පළතුරු, කිරි නිෂ්පාදන, මුව මස්, තලගොයි මස් හා බිත්තර, මී පැණි, ගෝනල, කුකුලල, මගුල් තුලා සඳහා හුවමාරු විය. පළතුරු කිරි නිෂ්පාදන විවිධ තෙල් වර්ග, ආහාර රසවත් කිරීමට යොදා ගති. රසකාරක වර්ණකාරක, සුවඳකාරක, ඖෂධීය ගුණයෙන් අධික නිසා රෝග මර්ධනය ඉබේම සිදුවිය. ගැබිණියට, කිරි මවට, කුඩා දරුවන්ට ආහාර වල හොඳම කොටස් දීමට පුරුදු විය. බල්ලන්ට, බළලුන්ට දී ආහාර විෂවී ඇත්දැයි බැලීය. හකුරු පැණි සොයාගත් පසු රසකැවිලි සෑදීම ආරම්භ විය. මන්දපෝෂණය දුරලීමට, කිරි ඉබ්බන්, හාවුන්, හෂ්ණ, දීමට පුරුදු විය. බෙලි, ඉරමුසු, පෙනළ, බෙලිමල්, කොළ තම්බා බීමට පුරුදු විය. එළුකිරි නිසා ක්ෂය රෝගය වැළඳෙන අවස්ථා අඩුවිය. කඩල, පලා වර්ග, වී වැනි ධාන්‍ය වර්ග, වට්ටක්කා, කොමඩු, තක්කාලි, මුරුංගා, වැනි ආහාර පෝෂණ අවශ්‍යතා මැනවින් සම්පූර්ණ කළේය.

හවස මුත්‍රා සාම්පලයක බහාලූ මුං ඇට උදේ පැළකර පසුව, පැළ මතු නොවන්නේ නම් වඳ බවද, පැළ මතුවී මල් එල දරන්නේ නම් දරුවන් ලැබෙන වග දැනගන්නට හැකිවිය.

හිරු එළියට මෙන්ම සඳ එළියට උඩුකය නිරාවරණය කර වෙහෙසවී වැඩ කළ නිසා අස්ථි විකෘතිතා පවා අඩුවිය. ගලන දොලේ, වන වදුලේ, සංගීත රාවයට, ඇල් ගෙවිලියන්ගේ මිහිරි ගී රාවයන් එක්විය. ගර්භණී මව්වරුන්ට දරු ප්‍රසූතිය පහසු කිරීමට උළුහාල් තැම්බූ ජලය පෙවීය. සර්ප දෂ්ඨ වලදී නර මූත්‍රා, කරපිංචා කැඳ, එළඟිතෙල් දීමෙන්, අධික ලෙස විෂ බැස්සවීය. ආහාර සංරක්ෂණ විධි සොයන්නට විය. ආහාරවල විෂහරණ ක්‍රමද, භාවිත කළහ. උදා :- මඩු කොකු හාල්පාණු වතුරෙන් තම්බා ශුද්ධ කර පිසීමට ගනී. සිංහල අවුරුද්දට උයන හත්මාළුවට ගැමි ගෙවල්වල විශේෂ ස්ථානයක් හිමිවේ. පානීය ජලය සඳහා උල්පත් ජලයද පැලෑටි පෝෂණය සඳහා වැසි ජලයද, අකුණු ජලයද, ඛණිජ ලවණ වැඩි බව, ගැමියන් දනී.

''මොණර මාළු උඩහල්ලේ තියෙම්මා - අපට මාළු අල කොළමයි කුඩම්මා ''

ගැමි දරුවන්ගේ කවි සංකල්පනා පෝෂණය ගැන යමක් දැන සිටි නිසා මතුවිය.

මේ පාරම්පරික ක්‍රම විශ්වය පැළෑටි හා මිනිසා එක් කළේය. වස විස නැති ගොම, කොළ, පිදුරු, පොහොර විය.

පෘථිවි පෘෂ්ඨය ආවරණය කළ කොළරොඩු තට්ටුව වාෂ්පීකරණය සෝදාපාළුව වලක්වා සරුබිමක් සකස් කළේය.

ඇමෙරිකාව, ජර්මනිය, එංගලන්තය වැනි තාක්ෂණයෙන් දියුණු රටවල් මේ පෝෂණ ක්‍රියාවලිය නැවත භාවිතයට ගැනීම වාසනාවකි. කාබනික හා ජ්‍යොතිෂය අනුව ජෛවගතික කෘෂිකාර්මික ක්‍රම භාවිතය නැවත ආරම්භ කර ඇත. ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීමට දරන උත්සාහය අගය කළ හැකිය.

මානවයාගේ ආහාර අවශ්‍යතාවයන් සඳහා පරිසරය හා ගැටෙන්නට සිදුවිය. වන සතුන් හා කුරුල්ලන් පසු පස හඹා යමින් ආහාරයට සුදුසු දෑ ඉවෙන් මෙන් තොලගාන්නට විය. අමු මස්, මාළු, අල, ගෙඩි, කරල්, මල්, කොළ ආහාරය විය. ශාක පස් පංගුව ඖෂධ අතර ප්‍රධාන විය. රෑ සඳඑළිසින් ඔකඳ වී තරු මං ඔස්සේ දඩයම් සොයා පියමං කරන්නට විය. හෙල්ල, ගල් පතුරු, දුනු ඊතල, භාවිතයට කෙමෙන් යොමු වෙද්දී ගල් හා සත්ව ඇටකටු වලින් නිමැ වූ උල් කටු, ඉදි කටු ආහාර ශුද්ධ කර ගැනීමට භාවිත කරන ලදී. මේවා ක්ෂුද්‍ර ශිලා මෙවලම් ලෙස හඳුන්වා තිබේ.

ගල් යුගය පසුකළ දඩයම්කරු හෙල් තැනිතලා මිටියාවත් සොයා සංක්‍රමණය කළහ. දඩමස්, කොස් ආහාරයට ගෙන ඉතිරි කොටස මී පැණිවල දැමීම, අව්වේ වියළීම වැනි සංරක්ෂණ ක්‍රම වලටද අවතීර්ණ වූහ.

කෙමෙන් සර්ව භක්ෂකයන් වීම නිසා පරිසරය හා තදින් බැඳුණි. සතුන්ගේ හම්, කොළ අතු, පට්ටා ඉන දවටා සතුන්ගේ ඇටකටු, ඇට වර්ග, සායම් වලින් ආයිත්තම් කෙරිණි.

ගංගාධාර වලට පියමං කළ ආදිවාසීන් දරුණු අකුණු, වැහි, සුළං, ගිනි විපත්, නියං, නාය, භූමිකම්පා වලින් ආවරණය වීමට ග්‍රහ පූජා, දේව පූජා වැනි ශාන්තිකර්ම වලට යොමු විය. කිරි, ධාන්‍ය හා වාසස්ථාන අවශ්‍යතා නිසා පහත් බිම්වල මෙන්ම උස් බිම්වලද ජනාවාස ඇතිවිය. මේ එඬේර යුගය වැදගත් සන්ධිස්ථානයකි.

පිරිමින් දඩයමේ ගිය අතර ගැහැණුන් හා ළමුන් වෙනත් ආහාර ද්‍රව්‍ය රැස් කරන්නට පෙළඹුණි. හිරු සඳු හා ගස් ගල් වලට පුද පූජා තියමින් නොඉඳුල් අස්වැන්න පූජා කරමින් නිවාස ඉදි කළහ. කෙමෙන් ගම්මාන බිහිවිය. හැඩි දැඩි දක්ෂයා නායකත්වයට පත්විය. ස්ත්‍රීන් ආහාර පිළියෙල කරද්දි පිරිමින් හා ළමුන් කුඩා බෙර වැනි සංගීත භාණ්ඩ වාදනයටත් ලොකු සතකු මරා මස් පිච්චෙන තුරු ඒ වටා නටන්නටත්, ගයන්නටත් විය.

වඳුරන්, ගස් බෙල්ලන්, කටුස්සන්, තලගොයි, මස්, බිත්තර, කුකුලල, මී පැණි වැනි ප්‍රධාන පෙලේ ආහාර වලට කෙමෙන් පලවැල, පොරි, අග්ගලා, අතුරුපස එක්විය. මුව, ගෝණ වැනි ලොකු සතුන්ට ඉල්ලුම වැඩිවිය. ගල් තලාවල මස් තීරු කර වේලා, මී පැණි වල බහා තැබීමට පෙළඹුනි.

ධාන්‍ය කරල්, මී පැණි, රස කැවිලි, පොල් පැණි, කිතුල් පැණිවල දැවටිණි. කෙමෙන් හේන් ගොවිතැන් සඳහා වන පෙත් එළි කිරීමෙන් පාංශු ඛාදනය සිදුවිය. මේ නිසා අන් සාර භූමි කරා සංක්‍රමණය වීමට සිදුවිය. ඛනිජ ලවණ ඌනතා ද දක්නට ලැබුණි. ගොවි යුගයේදී සතුන් හීලෑකර ගව, එළු

පට්ටි තෘණ කැවීම සඳහා දියළු සරු තැනි හා ජලාශ සොයා සංචාරය කළේය. වළං සෑදීමෙන් පසු ආහාර පිසීම ක්‍රමවත් කෙරිණි. කුරක්කන්, තලප, ආනම් හා රොටී ප්‍රධාන ආහාර විය.

වසංගත රෝග වලදී මළවුන් හා යකුන් ඇදහීම සංස්කෘතික අංගයක් විණි. ඉර, හඳ, පෘථිවියට, ගස්, ගල් වලට පුද පූජා තැබීම ආරම්භයයි. බලි බිලි, තොවිල් පවිල් ද එක්විය. බෙර ගසමින් නිරුවතින් නටමින් වරෙක දෙස් දෙවොල් නගමින් වරෙක දෙවියන් යදිමින් කළ ශාන්තිකර්ම වලට අමතරව වෛද්‍ය ක්‍රම අත්හදා බැලීය. කිරි කොරහා නැටීම ආදිවාසින් අතර බෙහෙවින් ජනප්‍රිය අංගයකි. රෝග මර්දනය සඳහා ගෝන අං, රයිනෝ අං ගලගා බීමට ප්‍රිය කළහ. වඳුරු හදවත් වියළා බුලත් විටට කන්නට ආශා විය.

කෙම් පහන් ක්‍රම අත්හදා බලන්නට විය. උල්පත් හා අකුණු ජලය තුළ ඇති අධි පෝෂණය නිසා එම ජලය එක්කරන්නට විවිධ ක්‍රම භාවිතා කෙරිණි.

## පෝෂණ ක්‍රියාවලිය

රෝගාතුර වීමේදී ආහාර වෙනුවට කැඳ, තලප, ආනම්, ආහාර දුන්හ. රස කාරක, වර්ණ කාරක හා සුවඳ කාරක එක්විය. කහ, ලුනු, කරපිංචා, සේර, දුරු, කරාඹු නැටි, කුරුඳු දෙහි, එැණු වර්ග, ගම්මිරිස්, එනසල්, උළුහාල්, ඉඟුරු, සියඹලා, පොල්, අබ, අසමෝදගම්, ගොරකා හා මින්චි ප්‍රධාන තැනක් ගත්හ. මේ සියළුම දෑ රස ගුණ පිරි ඖෂධ වර්ගය.

උළුහාල් දියවැඩියා රෝගීන්ට දිව ඔසුවක් විය. දරු ප්‍රසූතිය ඉක්මන් කිරීමට උළුහාල් තැම්බූ ජලය දෙන ලදී. ආහාර වේල් අතර ප්‍රධාන තැනක් ගත් මුං ඇට, බෙලි මල්, බෙලි, වෙරළු, නාමල් රේණු, කජු, වඳ බව නැති කළේය. හවස මූත්‍රා සාම්පලයක බහා ලූ මුං ඇට උදේ පැලකර පසුව පැල මතු නොවන්නේ නම් වඳ බවද, හොඳින් වැඩී මල් එල දරන්නේ නම්, වඳ නැති බවද, සොයා ගත්හ. බිම්මල් අධි පෝෂණයෙන් යුතු වග "වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන්" යන ගැමි කවියෙන් නිරූපිතය. "වෙදතුම කලකට නොඑන්න දිනකට ඇපලයක් ගන්න" ආහාර හා පෝෂණය ගැන දැඩි අවධානයක් ගත්බව මෙයින් පෙනෙයි.

මන්දපෝෂණ දරුවන්ට උදලු තැටිවල හෝ යකඩ තැටිවල ගොටුකොල වැනි රොටී සාදා දීමද, කිරි ඉබ්බන් බස්නය ගැනද අසා ඇත්තෙමි. නව ජනාවාස සමග ආහාර සම්පාදනයේද, නිෂ්පාදනයේද, පිළියෙළ කිරීමේද නව ක්‍රම පැදිණි. ගින්නේ පලහා කෑ ආහාර කෙමෙන් පෝෂණය හා රෝග මර්දනය සඳහා ක්‍රමවත් අයුරින් සකස් විය.

ආහාර පිළියෙළ කිරීම විවිධාංගීකරණය

- අමුවෙන් ගැනීම - අල වර්ග, ගෙඩි වර්ග, දඩමස්,
- ගින්නෙන් පලහා ගැනීම - අල වර්ග, කොස් ඇට, බැදි දෙල් ඇට, දෙල්, මඤ්ඤොක්කා, මස්, මාළු
- උනාළු පල්ලේ දැමීම - දෙල්, බිම්මල්, වියළි මාළු, අල වර්ග, දෙල්, මඤ්ඤොක්කා

- මී පැණි වල බහා තැබීම - දඩ මස්, කොස්, රෝස්ට් කළ ධාන්‍ය
- ජලයේ බහා තැම්බීම - ධාන්‍ය, අල වර්ග, ගෙඩි වර්ග, කොළ වර්ග
- කඩ පිම්මේ තැම්බීම - පිට්ටු, හැලප, පුෂ්නාප්ප, බෙහෙත් වර්ග
- ග්‍රිල් කිරීම - රත්වූ යකඩ දැලක් උඩ පිසීම
- භාජනයක් තුල භාජනයක් තබා තැම්බීම (ඩබල් බොයිල් ක්‍රමය) - පුඩිං, වටලප්පන්, හුළං කිරිය පිටි
- භෂ්ම කිරීම - මකර ධ්වජය, ස්වර්ණ වංග පංචකය වැනි ඖෂධ සහ කහ පිළියෙළ කිරීම. ආවරණය මැටි වලින් වසා තබයි.
- තාච්චියේ බැදීම හෙවත් රෝස්ට් කිරීම - කොස් ඇට, විළඳ, බඩ ඉරිඟු පොරි, ධාන්‍ය වර්ග, වල් දෙල් ඇට
- ගැඹුරු තෙලේ බැදීම - සුදු බුත්සරණ කොල සුදු පිටි තවරා බැදීම, ආස්මී.
- තෙම්පරාදු කිරීම - සාමාන්‍ය ව්‍යංජන
- ස්ටු කිරීම - තෙල් උතුරන විට ජලය සමග මදගින්නේ ආහාර පිසීම
- ගසේ තිබියදී පිසීම - පොලොස්

- පැනිවල දැමීම - කඩ පිම්මේ තැම්බූ ආහාර (ලාවලු), උඳුවැල්. කැවුම්.
- පැණි හා හකුරු - කිතුල්, පොල්, තල් (සූකිරි)
- ලුනු දැමීම - ජාඩි, අඹ, දෙහි, බිලිං, අමුමිරිස්.
- අච්චාරු දැමීම - විනාකිරි, ලුණු, එැණු, අබ, (පොලොස්, පැපොල්, කෙසෙල්මුව, කොහිල)
- පුවක් කොලේ ඔතා තැබීම - පොල් පැණි හෝ කිතුල් පැණි (වැලි හකුරු)
- වැලියට දැමීම - වැලිකොස් ඇට, දෙහි, ඉගුරු, අල වර්ග
- රාක්කවල තියා දුම් ගැස්සවීම - උම්බලකඩ
- කැප්පෙටියා හෝ පිදුරු දමා වලක් තුළ වසා තබා දුම්පෑම (කෙසෙල් කැන්)
- ගිනි කබලක් උඩින් තබා පිසීම - ආප්ප, මාලු ඇඹුල් තියල්
- පියන වසා උඩින් වතුර ඉසිමින් පිසීම - කිරි රොටී
- සෙක්කු වලින් මිරිකා ගැනීම - පොල්තෙල්, මී තෙල්.
- පැසක් තුල තැම්බූ මිශ්‍රණ මිරිකා ගැනීම - මී තෙල්, දොඹතෙල්, කැකුණ තෙල්, තල තෙල්

- කාස්ට් අයන් තහඩුවල පිසීම - කොළ රොටී වර්ග, මන්ද පෝෂණය දුරලීමට යකඩ අවශෝෂණය සඳහා පිසගනී.

- මල් කපා පැසවීම - මීරා, රා (ආහාර පිපීමට රා මණ්ඩි)

- හිරු එළියේ වියළිම - විශේෂයෙන් ගල්වන බෙහෙත් වර්ග අව්වේ කැකෑරීම. බෙහෙත් ඇඟ ගල්වා අව්වේ සිටවීම. තැම්බූ කොස් දෙල් වැනි දේ කැකුලෙන් වේලීම. ගොරක (ධාන්‍ය වර්ග සියල්ලම) මඤ්ඤොක්කා, බතල, කරවිල, කෙසෙල්බඩ, (පිට්ටු, වැලිතලප) සෑදීමට.

- සඳ එළියේ තැඹිලි වලට බෙහෙත් බඩු දමා පින්නේ තැබීම, කක්කල් කැස්සට පිනි එකතුකර බත් පිසීම.

- සඳ එළියේ ජලයේ දමා ගැනීම - මුං ඇට, උඳු පෙඟෙන්නට වසා තැබීම. මුහුන් සමග ආප්ප, පුෂ්නාප්ප, හකුරු ආප්ප මිශ්‍රණ.

- මුදවීම - දිය මිත්ත කොළ ඉස්ම, කිරි

- තැටිවල කරකවමින් සකසා ගැනීම - මෝරු

- කඩ පිම්මේ තම්බා නැවත අව්වේ වියළා ගැඹුරු තෙලේ බැඳ පත් පැණි කිරීම - මල්ලාලු ඉතාම රසවත් ආහාරයකි

- තෙල් වර්ග භාවිතය - එළඟි තෙල්, පොල් තෙල්, තල තෙල්, අබ තෙල් සහ ඔලිව් තෙල්

- අධි පෝෂණ ඖෂධීය ආහාර - සියලුම කැඳවර්ග, තලප (කිතුල්, කුරක්කන්) හුලං කිරිය, පාචන අවස්ථා වලදි විශේෂයෙන් කැඳ පිසීමට ගනී. වැටීම්, තැලීම්, ගිනිගැනීම්, වලදී බිත්තර සුදු මඳ අමුවෙන් දීම හෝ බිත්තර කෝපි දීම. තුවාල වලදී එළඟි තෙල්, මීපැණි ගැල්වීම හා පෙවීම.

- අෂ්ඨ පාන වර්ග - අඹ, ජම්බු, දොඩම්, මිදි, උගුරැස්ස, ඇටි කෙහෙල්, ඕළු ඇට, මී පැණි

- පානීය ජලය - දිය කඩිති වලින් දිය බී පිපාසය නිවාගත් මානවයා ගලායන ජලය, උල්පත් ජලය, වැසි ජලය, අකුණු ජලය තුල අධිපෝෂණ ඛණිජ අන්තර්ගත බව සොයා ගැනීමෙන් පසු ජලය රැස් කිරීමට උත්සුක විය. පසුව වාරි මාර්ග කටයුතු සඳහා ජල සම්පාදනය විය. ජලය පිරිසිදු කිරීමට කුඹුක්, බූ දැලියා, කොට දිඹුලා, සබුක්කු, ඉඟිනි ඇට, කපු, හිගුරු මල්, කුඹුරු ඇට භාවිත විය.

- මැටි භාජන - ගුරුලේත්තු, කල්දේරම්, පැන්තාලි, කළය ද භාවිත කැරිණි.

  රෙදි සේදීමට, පැලවලට සුදුසුවන්නේ වැසි ජලය නිසා පියසි වලින් වැසි ජලය එක්කරන්නට විය.

- වර්ණක යෙදීම - විවිධ වර්ණ භාවිතය - දරුවන් අමුත්තන් හා දානමය කටයුතු වලදී නෙත පිනවීමට

- තැම්බුම් හොදි - සියලුම ලෙඩුන් සඳහාද, කායම් හොද්ද දරු ප්‍රසූති වලින් පසුද දෙනු ලැබීය.

- ඇතැම් අල වර්ග හා මාළු විෂ මැරීම සඳහා පොල් වතුරෙන් හා ලුණු වතුරෙන් සෝදා ගනී.

- ඉඩම්වල සරු බව සෙවීමට කටුස්සන්ගේ පැමිණීම, උඳුපියලිය ඉබේ වැවෙන්නට හැරීම ශුභ යැයි කියති.

ආහාර විෂවීම.

- බිම්මල් - කළු තිත් සහිත බිම්මල් විස සහිතයි. (රිදී හැන්දකට ලූනු ගෙඩියක් සමග කපා දැමූ විට වර්ණය වෙනස් වෙයි. පිසීමෙන් පසුද, ඇනු නිල් හෝ කළු පැහැ ගැනීම අහිතකරය.)

- පිළුනුව පුස් සැදුන ආහාරද, සතුන් කෑ ආහාරද, අධික විෂ සහිතය.

- තඹ වැනි ලෝහ භාණ්ඩ වල ඇඹුල් වර්ග කරවිල පිසීම නුසුදුසුය.

- ඇළුමිනියම් භාජන වල ආහාර හා ජලය පුරවා තැබීම හා පිසීම අතිශයින් හානි කරය.

විෂ හරින ක්‍රම

- හාල් පානු වතුරෙන් තම්බා පිසීම - මඩු කොකු

- ලුණු කහ මිශ්‍ර ජලයෙන් සේදීම - පලා වර්ග
- තම්බා ජලය පෙරා දැමීම - මඤ්ඤොක්කා, මඬු කොකු
- අධික කහට - දෙහි දමා සේදීම (කෙසෙල්)
- අඹ - හුනු යන්තම් ගා සෝදා අධික ඇඹුල් ඉවත් කිරීම කරයි.
- සර්පයින් කෑ විට කරපිංචා කැඳ, නර මුත්‍රා සහ එළඟිතෙල් දෙන ලදී.
- ආහාර විෂ වීමකදී අමු පොල් කිරි වලට ලුණු, දෙහි හා රතුළූනු දමා දීම හෝ පේර කොල ඉස්ම පෙවීමද කළේය.
- ආහාර වැඩියෙන් ගැනීමේදී - ලුණු ස්වල්පයක් බොන්නට දීම.
- ජලය පිරිසිදු කිරීමට - ඉගිනි ඇට, කපු, හිගුරු මල්, කුඹුරු ඇට තලා දැමීම.
- ඉස්සන්, වැලිකොස් ඇට වැනි දේ පිසීමේදී මුරුංගා කොළ දමයි.
- කුඹුක්, බූදැලියා, කොට දිඹුලා, සබුක්කු, ජලාශ අසල සිටුවීම නිසා ළිං ජලය පිරිසිදු වෙයි.
- බිලින් - ඇඹුල් ඇරිමට ඉස්ම මිරිකා ඉවත් කිරීම.

## රස කැවිලි

හැලප, කැවුම්, කොකිස්, ආස්මී, උඳුවැල්, මුංගුලි වැනි විවිධ රස කැවිලි

## උපකරණ

මැටි, තඹ, යකඩ හැලි වලං, ඉඳි ආප්ප, පිට්ටු සඳහා ලී වලින් හෝ මැටි වලින් සෑදූ උපකරණ, කාස්ට් අයන් තහඩු, (ඇලුමිනියම් උපකරණ අහිතකරය)

- තිසාවැව කැනීමේදි ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වළං හමු වී ඇත.

## සංස්කෘතික අංග

- සතෙකු පිළිස්සෙන තුරු ඒ වටා බෙර ගසමින් නැටීම. කිරි කොරහ නමින් විශේෂිත පූජා විධි නැටුමකි. කවි සිංදු ගායනා, ගොවි නැටුම්, බුම්මැඩිය හා බෙර ගැසීම්, කලගෙඩි නැටුම්, කුළු නැටුම්, වැලිතලප සිංදුව. උදා: කැකුළු සහල් පිටියෙන්ද - තම්බා කඩ පිම්මෙන්ද ...... (තුංදොස් සමනයට නිර්දේශ කරයි)

- නෙළුම්, කුරක්කන්, තලමල් කවි, මේ අතර විරහ කවිද, ගී සිවුපද සඳ මුල්කර කියා ඇත.

## ජල කළමනාකරණය

- දිය කඩිති, ඇළ දොළ, ගංගා, ඔය, දිය ඇලි, වැව් ආශ්‍රිත ගම්මාන හා මිනිස් කටයුතු සම්බන්ධීකරණය

## වැට සකස් කිරීම

- දඬු වැට සකස් කිරීම - කැලේ කපා එකතුවන ලී දඬු අසුරා සකස් කරන ලදි.
- ගස් වර්ග - ගුරුල්ල, බෝම්, දෙමට, ගංසූරිය, කොහොඹ, නික, ආඩතෝඩා, බාඳුරා වැල්, දිවුල්, කැක්ටස් වැනි කටු පඳුරු, වැට මුරුංගා, කදුරු

## සෞභාග්‍යය සඳහා

අඹ, බෙලි, දෙහි, දෙළුම්, පැගිරි, කහ, කොහොඹ, හඳුන්, සමන් පිච්ච, සේපාලිකා, දිවුල්, මුරුත, පිහිඹිය වැනි ගස් වර්ග.

## විශේෂ අවස්ථා

- පුරිඳුරු බඹ ඉසුරු
  නවග්‍රහ සිව්වරම් ඉරු
  හැර සිය උව දුරු
  රකිත් සිරිලක සෙතින් නිර තුරු

දෙවියන් බුදුන් ටත්
ලොව අගපත් රජුන් ටත්
අන් සව් සතුන් ටත්
අහර මුල් වේ පණ රැකෙන් ටත්

නොයිඳුල් අස්වැන්නෙන් කරන අළුත් සහල් මංගල්‍ය
සව් සිරිදෙයි අළුත් සහල් මංගල්ලේ

- සිංහල අවුරුද්දට හිසතෙල් ගා නෑමෙන් පසු හත් මාළුවක් උයයි. අධි පෝෂණය සඳහාය.

- කීර්ති ශ්‍රී රාජසිංහ රජු වැංජන 32 ක් බත් සමග ආහාරයට ගත් බව රොබට් නොක්ස් කියයි.

- දළදා මාලිගාවේ දවල් දානයට ද වැංජන 32 ක් නියම කර ඇත. අද දක්වා මේ අයුරින්ම කරයි.

  (මහනුවර රජ ගෙදර සූප ශාස්ත්‍ර පොත)

- සළු වඩන හා දිය වඩන නිළමේවරුන් අත සේදීමට හා පිසීමට ආදි කාලේ සිටම සේවය කර ඇත.

- විජය ලංකාවට එන විට වෙළඳුන් ගෙන ආ සහල් කුවේණිය ආශාවෙන් පෙන්වූ නිසා විජයගේ පිරිස බත් මාළු සියල්ලෝම අනුභව කළ බවක් මහා වංශයේ සඳහන් බව කියයි.

- උඩරට, පහතරට, උතුරුකරේ පිසීමේ ක්‍රම වලද විවිධත්වයක් ඇත.

- දුටු ගැමුණු රජු දානයට වෙන් නොකර ගම්මිරිස් කෑ නිසා ඒ වරදට මිරිසවැටිය චෛත්‍ය බැන්ද වග කියයි.

- වසර 2500 පෙර තිබු භාණ්ඩ දැනුදු භාවිතයේ ඇත. මැටි භාණ්ඩ, හැඳි ආන, පෙට්ට ගම, වංගෙඩිය, පැදුරු ආන, දුම් මැස්ස, ලබු කැටය, කැට පෝලය, බීරංගය, පොරව

- තිසා වැව කැණීමේදි ඉපැරණි වළං හමුවී ඇත.

- බුදු දහමට අනුව ආයු, වර්ණ, සැප, බල හා ප්‍රඥාව වැඩීම පිණිස ආහාර සකස් කෙරිණ.

- පූජනීය ගස් වර්ග - බෝ, නුග, කොලොන්, මී, තල්, කෙසෙල්, වැටකේ, සල්, සපු, නා

- ඛණිජ ලවණ අධික මුල් වර්ග හිසේ රෝග සඳහාද, රසදිය අධික කොළ හා නැටි වර්ග ලේ හා හදවත් රෝග සඳහාද, ගෙන්දගම් අධික මල් ගෙඩි, සුවඳ, පරාග ආහාර මාර්ගයේ දෝෂ සඳහා ද ප්‍රජනන ක්‍රියා වලිය සඳහා ද යොදා ගැණිනි.

- ධාන්‍ය වර්ග - වී, තල, උඳු, මුං, මෑ (පස් පුලුටු) දිය ගොඩ මාංශ හා මාළු, පලා, එළවලු, පලතුරු විවිධ ශාන්තිකර්ම සඳහා ද භාවිත විය.

- සූර්ය මංගල්‍යය හා අළුත් සහල් මංගල්‍යය.

# අසිරිමත් විශ්වය හා ජ්‍යොතිෂ විද්‍යාව
# Enchanting Universe and Astrology

දැඩි හිරු රැසින්, අකුණු, වැසි, කුණාටු වලින්, භූමි කම්පා වලින් වන මෘගයින්ගෙන් අතිශයින්ම පීඩාවට පත්වූ ආදි මිනිසා නිදහසේ ආහාර සොයා පිය මං කරද්දී හිරු සඳ පූජනීය වස්තූන් සේ සැළකීය. සෙවණ දුන් ගස් ගල් වලට පුද පූජා තැබීය. ආහාර රැස් කිරීම මූලික පරමාර්ථය වූ නිසා පරිසර පද්ධති තුළ අන්තරීක්ෂ සාධකද, භූගෝලීය සාධකද, වායු ගෝලීය සාධකද, හොඳින් නිරීක්ෂණය කරන්නට විය. සඳෙහි කලා ගැනද සිසිලස ගැනද අවබෝධ විය. රෑ දහවල් කය වෙහෙසා වැඩ කළ නිසා සෞඛ්‍ය සම්පන්න විය. වඩදිය බාදිය අනුව ධීවර කටයුතු හා මුහුදු ගමන් සකස් විය. එල දැරීම, ගැබ් ගැනීම, ඇට වැපිරීම සඳේ කලා අනුව සකස් විය. සඳ ගමන් අනුව ස්ත්‍රීන්ගේ ඔසප් චක්‍රය, දරු උපත්, පෝෂණ හා වර්ධන ක්‍රියාවලිය ගැන සංසන්දනාත්මකව බලන්නට විය. සතුන්ගේ මඳ කිපෙන කාලසීමාව, පැළෑටි වර්ධනය, දළු, මල් හා එල දැරීම, අක්‍රිය වීම සහ කාලානුරූපි බව ක්‍රමානුකූලව සිදුවන වග දැනිණ. පැළෑටි භූ කේන්ද්‍රයට සාපේක්ෂව වායු ගෝලය හරහා අන්තරීක්ෂ කිරණ උරාගෙන වර්ධනය වනු දැක කැලෑ කපා හේන් හා ගොඩ මඩ ගොවිතැන් ආරම්භ කළේය.




රූපය 1. සෞරග්‍රහ මණ්ඩලය (අසිරිමත් විශ්වය)

අහසේ තරු රටා වලට අනුගාමීව පරිසර පද්ධති තුළ ඇති වූ වෙනස්කම් හඳුනාගෙන ගස්, ගල් හා පැපිරස් පතුරු වල සිට ඕලා කොළ දක්වා වාර්තා තැබිය. සත්ව හා මිනිස් රූප යොදා රාශි චක්‍රය නිර්මාණය කළේය. රාශි චක්‍රය සහ මිනිසා සම්බන්ධ කර ජ්‍යොතිෂ මිනිසා නිර්මාණය කර වෛද්‍ය වෘත්තියට මුල පිරුවේය. හිරුගේ උත්තරායනයට පිවිසීම පෘථිවියේ මංගල සමයයි. අන්තරීක්ෂ කිරණ උරාගෙන වර්ධනය වනු දැනෙන විට කැලෑ කපා වැට නියර සාදා යල මහ, කන්න වගා කළේය. අයෙකු උපන් දා සිට මියෙන තුරුම හඳහන් බලා සියළුම මිනිස් කටයුතු සකස් කෙරිණ. නිවසට බිම තෝරා ගැනීමේ සිට පදිංචිය දක්වා ද, කෘෂි කටයුතු වලට බිම හා වැට සකස් කිරීමේ සිට කිරි සහල් මංගල්‍ය දක්වාද නැකැත් භාවිත කෙරිණ.

ක්‍රි.පූ. 150 දී පෙටොසිරස් සතියේ දින 7 ට ප්‍රධාන ග්‍රහ තරු 7 ආදේශ කර පුද්ගලාරෝපණය කළේය. මාස 12 ද නම් කළේය. පෙබරවාරි පූර්ණ මාසය ලෙසද මාර්තු හරිත මාසය ලෙසද මැයි කුසගිනි මාසය ලෙසද සැලකීය. ඉන්පසු ලිත් භාවිතයටද අවතීර්ණ විය. මිනිස් සිරුරද, ධර්ම, කාම, අර්ථ, මෝක්ෂ කියා වෙන්කර ජීවිත අපේක්ෂාවන් 4 ලෙස හැඳින්විය.

බුදුන් වහන්සේ මීට අමතරව උතු, බීජ, කම්ම, ධර්ම සහ චිත්ත යන නියාම යැයි සියලුම වස්තූන්ගේ පැවැත්ම නියාම 5 කට අයත් බවත් ස්වභාව ධර්මය විශ්ව නීතිය සේ හැඳින්විය.




රූපය 2. සතියේ දින හත

මේ විශ්ව රිද්මය හෙවත් සීමා බන්ධන අනුව හා අන්තරීක්ෂ රටා පාදක කර ගනිමින් සියල්ල පවතී. සෘතු වින්‍යාසය මේ අනුව සිදුවන බව පැහැදිලි විය.ආපෝ, තේජෝ, වායෝ, පඨවි, භූත 4 ට රාශි චක්‍රය අනුව ද, නැකැත් 27 ට ආකාශ යැයි තවත් භූතයක්ද එක් කළේය.

මේෂ සිංහ ධනු - තේජෝ භූතය - පලතුරු හා ඇට

වෘෂභ කන්‍යා මකර - පඨවි භූතය - මුල්

මිථුන තුලා කුම්භ - වායෝ භූතය - මල්

කටක වෘශ්චික මීන - ආපෝ භූතය - කොළ

කෘෂිකටයුතු සඳහා යොදා ගැනීමට විද්‍යාඥයින් විසින් අනුමත කරන ලදී. දිවා රෑ දෙකම පැළෑටි වර්ධනය සිදුවේ. රිවි කිරණ පැළෑටි ලම්බාකාරීව හා ගසේ කඳ වැඩීමට සලස්වයි. නිසි අයුරු ග්‍රහ කිරණ ව්‍යාප්ත නොවූ විට පැළෑටි

පටක තුළ අසාමාන්‍ය වැඩීමක් සනිටුහන් කරයි. හිරුඑළිය නොලද විට විෂ සහිත ඇල්කලොයිඩ් වල උපත සිදුවේ. මේවා වටිනා බෙහෙත් නිෂ්පාදනයට ගනී.

| | | |
|---|---|---|
| සඳු | - | මුල්ද |
| බුධ | - | මල් සහ කොළද |
| සිකුරු | - | කොළ හා මල් පෙතිද |
| ගුරු | - | ගෙඩි ද |
| ශනි | - | ඇටද |
| අඟහරු | - | පරාගධානි හා පරාගද |

සාදන අයුරු විවිධ විද්‍යාඥයින් විසින් සොයාගෙන ඇත. පුර හඳ, අව සඳ, පුර අටවක, අව අටවක, ආගමික කටයුතු සඳහා වෙන්කර ඇත. 4, 9, 14 වක තිථී මිනිස් කටයුතුවලට අශුභ සේ සලකයි. බුද, සිකුරු, සඳු, ග්‍රහ කැලඹීම් සහිත කුජ නෝඩ අවස්ථාවකට ආ විටද, චන්ද්‍ර සූර්ය ග්‍රහණවලදී ද, සඳු උපරිම සමීපයට ගිය විට ද පැය 24 ක් පෙර හා පසු කෘෂි කටයුතු නොකිරීමට නිර්දේශ කරයි. සඳු පෘථිවියෙන් දුරට ගිය විටද, සඳ අළුත් රාශියකට යන විටද, පැය 4 ක් කෘෂි කටයුතු නොකරයි.

## මිනිසා පරිසරයට අවතීර්ණ වීම

වැසි සමය හඳුනාගත් මිනිසා කෙමෙන් ආහාරයට සුදුසු දෑ රැස් කරන්නට විය. පරිසර පද්ධති තුළ අන්තරීක්ෂ සාධකද, භූගෝලීය සාධකද, වායුගෝලීය සාධක ද හොඳින් අධ්‍යයනය කළේය. යල මහ කන්න වගාවන් ජ්‍යොතීෂ විද්‍යානුකූල කෘෂි කර්මයේ ආරම්භයයි.

## විශ්ව ගවේෂණය

දහවල් කල හේනේ කුඹුරේ වැඩ කළ ගොවියා හඳ එළියේ අස්වැන්න පාගා බැත සකස් කළේය. පුර හඳ, අව හඳ දෙකෙහිම මල් පිපෙන වග පැළෑටි වැඩෙන වග හඳුනා ගත්හ. දහවල් 12 ට වී මල් පුබුදින විට රාත්‍රියට රෑ දේවි, කුමුදු මල් පිපෙන වග දුටුවේය. මිනිස් කටයුතු කාලානුරූපව හැඩ ගැසින. පුර හඳට ගස් කැපීම නොකලේ එලේ වැඩිවන විට ගුල්ලන් විදින නිසයි. හඳට පුදින ගොයම බොල්වන වග සොයාගත් පසු කාල සීමා ගැන පරීක්ෂාකාරී විය.

## රාශි චක්‍රය, ග්‍රහ තාරකා හඳුනා ගැනීම හා භාවිතය

ග්‍රහ වස්තු හා තරු රටා හඳුනාගත් පසු සත්ව හා මිනිස් රූප යොදා පුද්ගලාරෝපණය කර රාශි චක්‍රය ගොඩනැංවීය. උදා: ධනු රාශිය - දඩයක්කාරයා, කුම්භ රාශිය - ජලය ඉසින මිනිසා, කන්‍යා රාශිය - ධාන්‍ය මිටක් ගත් ස්ත්‍රියකට සම කළේය.

හිරු සඳු දෙදෙනාද බුධ, සිකුරු, ගුරු, කුජ, ශනි මෙන් ග්‍රහයින් සේ සලකා රාශිවල පිහිටුවිය. ඊට අමතරව ඡායා ග්‍රහයින් වන රාහු, කේතු ද පසුව නැප්චූන්, යුරේනස්, ප්ලූටෝ ද ඇතුළත් කර ඇත. ඉන් පසු නැකැත් තරු 27 ක් ද භාවිත විය. ග්‍රහයින් රාශි චක්‍රයේ තරු රටා ඉදිරියේ යමින් රාශි ගතවන අයුරු පෙන්විය.

සඳ, තරු රටා සියල්ල පසු කරමින් විවිධ රශ්මි මාලාවන් ගෙන් නිකුත් වන කිරණ ජල මාධ්‍යයක මුදාහරින බව දැන ගත්හ. සියළුම ග්‍රහ තාරකාවන් රශ්මි කදම්භයන් මුදාහරී. මෙය හොඳ ආධාරකයක් විය. පෘථිවි තලය කැපීයන ප්‍රධාන දිශා 4 ට අයත් ප්‍රදේශ කෘෂි චක්‍රය නමින් හඳුනාගන්නා ලදී. $0^0$ ලක්ෂ්‍යය මාර්තු 21 වසන්ත විෂුවය, මේෂ රාශියේ ආරම්භයයි. $180^0$ සැප්තැම්බර් 22 සරත් විෂුවය තුලා රාශියේ ආරම්භයයි. $90^0$ ජුනි 21 ගිම්හාන සූර්ය නිවෘත්තිය කටක රාශියේ ආරම්භයයි. $270^0$ දෙසැම්බර් 22 සිසිර සූර්ය නිවෘත්තිය මකර රාශියේ ආරම්භයයි.

පෘථිවිය සූර්යා වටේ භ්‍රමණය වීමෙන් දිවා රෑ සිදුවන්නාක් මෙන්ම පරිභ්‍රමණය නිසා ද පෘථිවිය $23\frac{1}{2}^0$ ඇලව ගමන් කිරීම නිසා ද මේ විශ්මයජනක සංසිද්ධීන් සිදුවන බව අවබෝධ විය. ඍතු විපර්යාසයන් සිදුවන බව හඳුනාගත්හ. ඊට හේතුව සූර්යාගේ ගුරුත්ව බලයයි. වසන්ත හා සරත් විෂුවයන්හිදී දිවා රෑ එක සමානය. ගිම්හාන සූර්ය නිවෘත්තියේදී දවස දිගය. සිසිර සූර්ය නිවෘත්තියේ දී දවස කෙටිය.

ගැමියන් යමක් දැන සිටි නිසාදෝ මේ කාලය අවච්චා කාලය සේ හඳුන්වයි. ඔක්තෝබර් 22 සිට දෙසැම්බර් 21 වනතුරු කාල පරාසයයි. සූර්යාගේ උත්තරායන ගමන දෙසැම්බර් 21 න් ආරම්භ වී ජුනි 21 න් අවසන් වෙයි. ජනවාරි 14 සූර්‍යයා මකර රාශි ගතවූ විට පැළෑටි වර්ධනය උපරිම සීමාවකට එයි. සිසිරයෙන් පසුව එන වසන්ත කාලයේ සිටම නොවෙනස්ව පවති. වසන්ත-සිකුරු, සිසිර-ශනි, ග්‍රීෂ්ම-කුජ, වර්ෂා-සඳු, සරත්-බුධ, හේමන්ත-ගුරු, වෙන් කරන ලදී.

රාහු කේතු $0^0$ -$180^0$ අතරට පැමිණීමේදී මුදාහරින රශ්මි අහිතකර බවද දැනගත්හ. රාහු කාලය පැය 1½ ක් ලෙස දිවා රාත්‍රී දෙකටම බලපාන බව පෙන්වා ඇත. රාහු මකරාගේ හිස මෙන්ද කේතු මකරාගේ වලිගය මෙන්ද සලකන අප රටේ ඈත අතීතයේ සිට රාහු කාලය සියළුම වැඩ සඳහා නොගනී. සා, අද, සියාවස, නැකැත් 3 න් උපන් අයට රාහු දශාව වර්ෂ 18 ක්ද, අස්විද මා මුල නැකැත් 3 න් උපන් අයට කේතු දශාව වර්ෂ 7 ක් සේද සලකන ලදී. මේ අතර එක් එක් ග්‍රහයින් හිරුවටා යන ගමනට විවිධ කාලසීමාද ජ්‍යොතිෂ විද්‍යාඥයන් විසින් ගණනය කර ඇත. රවිට වර්ෂ 6, සඳුට වර්ෂ 10, කුජට වර්ෂ 07, බුධට වර්ෂ 17, ගුරුට වර්ෂ 16, සිකුරුට වර්ෂ 20 ක් ද, ශනිට වර්ෂ 19, රාහුට වර්ෂ 18, කේතුට වර්ෂ 7 කි. ග්‍රහයින් 3 දෙනා බැගින් වෙන්කර දශා ශේෂය ඉතිරි කරයි. ග්‍රහයින් හිරු වටා යන්නට ගතකරන කාලය අනුව මේවා තීරණය වේ. මේ අනුව ජීවිත රටාව ගැන විස්තර බලන්නට හැකි විය. කේතු අඳුරු ග්‍රහයෙකි.

ඈත අතීතයේ සිටම සඳෙහි 4 වක, 9 වක, 14 වක රිට්ටා දිනද, පෝය 4 ද වැඩ නොකරයි. ආගමික වැඩ සඳහා වෙන් කර තිබේ. දරුවකු උපත ලබන විටම නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවන ලග්නයටද ග්‍රහයින් ද සඳු සිටි නැකත ද එයින් අදාල ග්‍රහයාට අයත් කාලසීමාවද ගණන් බලා හඳහන් සාදයි. අතීත, වර්තමාන, අනාගත කාලය සම්බන්ධ අසනීප, අධ්‍යාපනය, ධනය, වාසනාව උරගා බලන උරගලක් වගේ ජීවිතය පුරාම එයට අනුකූලව දිවි ගෙවීමටද බලපායි. කෘෂිකාර්මික කටයුතු වල්දී ද සුදුසු ඉඩමක් තෝරා ගැනීමට ලිඳ කැපීමට, වැට බැඳීමට, ශුද්ධ කිරීමට හා වගා කිරීමට ශුභ නැකැත් යොදාගත්හ.

දරුවන් නිවසට හෝ එළියට වැඩීමට, හිස කෙස් කැපීමට, ඉඳුල් දීමට, ගැහැණු දරුවකු නම් කන් විදීමට හා මල්වර මිගුලටද නැකැත් සාදයි. දෙපක්ෂයේම මගුල් තුලා සඳහා ඉතාම ශුභ නැකැත් යොදාගත්හ. රැකියා හා අධ්‍යාපන අවශ්‍යතාවන් සඳහාද එසේමය. කෙමෙන් විකාශනය වූ අන්තරීක්ෂ කිරණ හා මිනිස් කටයුතු වල සම්බන්ධය නිසා ජ්‍යොතිෂය විද්‍යානුකූල විෂයක් සේ පෝෂණය විය. තාරකා විද්‍යාවට අනුකූලව කෘෂි විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ගණිත සංකල්ප සමග දියුණු වී රජ පවුල් වලින්ද සම්මත විය.

## විද්‍යාත්මක සොයා ගැනීම්.

දළ ග්‍රහ වළල්ලක් තුළ විශ්මිත ග්‍රහ වස්තූන් ගෙන් ගහණ පෙදෙසක පෘථිවි ගෝලය පිහිටා ඇත.

සූර්යයා වට කරගත් සෞරග්‍රහ මණ්ඩලය එක චක්‍රාවාටයකි. ඉර හඳ, බුද, සිකුරු ආසන්න ග්‍රහයින්ය. මේ ග්‍රහයින් පැළෑටි වල නිෂ්පාදනයන්ගේ ප්‍රමාණය වැඩි කරයි. දුරස්ථ ග්‍රහයින් වන කුජ, ගුරු, ශනි ගෙන් විහිදෙන කිරණ වලින් පෝෂණය, සුවඳ, මල් හා එල දරණ සමය තුළ වර්ධන වේගයද නිෂ්පාදන ක්‍රියාවලියද වැඩිකර අභිජනනයට දායක වෙයි. රාශි චක්‍රයද, ග්‍රහ තාරකාද, නැකැත් තරුද එක්ව මිනිස් කටයුතු කෙරෙහි විශාල බලපෑමක් ඇතිකරයි. සතුන්ට හා පැළෑටි වලටද එසේමය. එම රටා හඳුනාගත් ජ්‍යොතිෂ විද්‍යාඥයන් රාශි 12 මිනිස් සිරුරට ආදේශ කර ජ්‍යොතිෂ මිනිසා **(Meganthropus)** නිර්මාණය කළෝය.

මෙසේ මිනිසා හා විශ්වය බද්ධ කළහ. උත්තේජකයන් හා නිල ස්ථානත් පහසුවෙන් හඳුනා ගත් නිසා ප්‍රතිකාර ක්‍රම, සුදුසු වෙලාව, සත්ව කොටස් හා විවිධ ඔසු පැළ යොදා රෝග සුව කිරීමද ආරම්භ කළහ. මේ අතර මහින්දාගමනයත් සමග උත්තර භාරතීය සංකල්ප විකාශනය විය. මිනිසාට අවශ්‍යතාවයන් සපුරාලීමට දිව්‍යඥාණය පහළවිනැයි පිළිගැණින. සියළුම වස්තූන් ගෝලාකාර බවත් හිරු වටා ගමන් කරන බවත් සඳ උප ග්‍රහයෙක්ව හිරුගේ පරාවර්තිත ආලෝකය අපට දෙන බවත් තහවුරු විය. පෘථිවිය $23\frac{1}{2}^0$ ඇලව ගමන් කිරීම නිසා සායන හා නිරායන කියා ක්‍රම දෙකක් භාවිතය කරයි. ප්‍රධාන ග්‍රහ තරු 7 සතියේ දින හතට ආදේශ කර පුද්ගලාරෝපණය කර රවි, සඳු, කුජ, බුධ, ගුරු, සිකුරු, ශනි, යනුවෙන් හඳුන්වා ඇත.

අඟහරුවාදා, සෙනසුරාදා, ඉරිදා විෂ දිනයන් සේ හැඳින්විය. ගස් වැල් මල් වලින් බරවී කුරුලු කෙවිල්ලන්ගේ ගීත නාදයෙන් මුසපත්ව පාරාදීසයක සිරි උසුලන අප්‍රේල් 14 න් හිරු මේෂ රාශි ගතවීම සැණකෙළි වලට මුල පුරා ඇත.

මෙලෙස කෙමෙන් හිරු සඳු සහ වෙනත් ග්‍රහ ලෝකද තාරකාවන්ද මිනිසාට, සතුන්ට, ගස්වලට අතිශයින්ම බලපාන වග තේරුම් ගත් නිසා කෘෂි තාක්ෂණයද ක්‍රමවත් විය. කාලීනව මිනිස් කටයුතු සංවිධානය විය. විවිධ පරිසර හා පුද්ගලික හේතු මත මාස 12 ද සකස් කරන ලදී. උදාහරණ පෙබරවාරි සෞභාග්‍ය උදාකරන මාසයයි. ජනවාරි මුහුණු දෙකින් දෙපැත්ත බැලිය හැකි ඉර උදාව හා ඉර බැසීම හා සම්බන්ධව දෙවි කෙනෙකු ආරෝපනය කර ඇත.

සියලුම ඉගැන්වීම් වලට අනුකූලව විශ්ව ශක්තීන් විශාල ප්‍රමාණයක් දිව්‍යමය ආශිර්වාදයක් සේ වායු ගෝලයේ ඉහළ ස්ථරයන් හරහා පෘථිවියට ගලාවිත් නව ජීවයක් දෙයි. බුදුන් වහන්සේ සියල්ල වෙනස් නොවී පරිවර්තනය වෙන වග දේශනා කල සේක. පෘථිවි තද ගතියද, වායෝ - වාතය හා ආලෝකයද, ආපෝ - ජලය හා සීතලද, තේජෝ - උණුසුම ද ඇති බව කවුරුත් පිළිගනී. මෙලෙස විශ්වයේ ඇතුලත හා පිටත ඇති ශක්ති කදම්භ සියල්ලම එකට බැඳී නොවෙනස්ව පවතී.

මේ විශ්ව නීතියට අනුව සීමා බන්ධන තුළ සිරවී සිටියත් ජ්‍යොතිෂය විද්‍යානුකූලව හඳුනාගෙන ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කර ඇත. දිවා රෑ දෙකම පැළෑටි වර්ධනය

සිදුවේ. රිවිකිරණ පැළෑටි ලම්බාකාරීව හා ගසේ කඳ වැඩීමට සලස්වයි. ග්‍රහ කිරණ නිසි අයුරු ව්‍යාප්ත නොවූ විට පැළෑටි පටක තුළ අසාමාන්‍ය වැඩීමක් සනිටුහන් කරයි. මීට අමතරව ආකර්ශනය ද රූපාකාරය ද ග්‍රහ වස්තුන්ගෙන් උරාගනී. කාබනික ව්‍යුහය සහ අන්තරීක්ෂ බලපෑම් අතර ඇත්තේ විශාල සම්බන්ධයකි. ග්‍රහ වස්තුන්ගේ වෘත්තාකාර බව සහ රිද්මානුකූල ගමන් නිසා කාලානුරූපව මිහිපිට සියල්ලෙහි ස්වරූපය සිදුවෙයි. කැලෑ එළිකිරීම නිසා වාෂ්පීකරණය, පාංශු ඛාදනය හා නග්නීකරණය සිදුව හානිකර තත්වයක් ඇති වී තිබේ.

හිරු එළිය නොලද විට දීප්තිමත්, කලු, දම්, හා ලෝහිත පැහැයෙන් යුතු ගෙඩි වර්ග ද ඇල්කලොයිඩ වල උපතද සිදුවේ. විෂ වර්ගවල දෑඩි සැර ගඳ හා විකෘතිතා සිදුවේ. සෙවණැලි අයින්කර ග්‍රහ කිරණ පතිත වීමට සැලැස්වීම පෙර සිටම සිදු විය. සඳු, බුධ, සිකුරුගේ නෝඩ අවස්ථාවල්දී වැඩ කිරීමෙන් වැළකී සිටීමට පැරන්නන් පවා පුරුදු වී සිටියහ. නයිට්‍රජන් අධික වූ විට මේ පැළෑටි මොළයට අහිතකර මත්ද්‍රව්‍ය සාදයි. මේවා අධික මිල ඇති බෙහෙත් සෑදීමට ගනී. කඳුලැස්ස, බාඳුරා වැනි පැළෑටි සතුන්ගෙන්ද නයිට්‍රජන් උරාගනී. නයිට්‍රජන් අධික වූ විට කෘමීන් හා කුඩිත්තන් වර්ධනය වී පැළ විනාශ කරයි.

අධික හිරු එළියෙන් මේ තත්වය වෙනස් කළ හැකියි. පෘථිවිය මතුපිට පස අන්තරීක්ෂ කිරණ සිලිකා මාධ්‍යයෙන් උරාගෙන පැළෑටීන්ගේ වැඩීම සඳහා නැවත මුදාහරී.

කාබනික පොහොරටත් වඩා ජ්‍යොතිෂය අනුව ජෛවගතික කෘෂිකාර්මික කටයුතු සඳහා සකස් කරනු ලබන පොහොර උසස්ම ගණයේ පැළෑටි නිෂ්පාදනයට යොදා ගනී. පසෙහි ඇති කැල්සියම් වායු ගෝලයෙහි අන්තර්ගත ශක්තීන් උරාගෙන පැළෑටි වර්ධනයට දායක වෙයි. පස සියළුම ශක්තීන් එක්තැන් කරන මාධ්‍යයකි. මිනිසා හා සතුන් බැහැර කරන දේ ද පැළෑටි වර්ධනයකි. ගොම ඊතර සහ තාරකාමය බලවේගයන් ගන්නා හොඳම මාධ්‍යයකි. නයිට්‍රජන් අන්තරීක්ෂ බලවේග සහ ජීව මූලයන් එක් කරන මැදිහත්කරුවකු වී කොළ වලට හරිත වර්ණය ලබාදෙයි.

ෆොස්පරස් - හොඳ මල් ද සීනි පරිවෘත්තියද, ඇල්බියුමින් අධික ඇට සහ ගෙඩිද, පොටෑසියම් - මුල් වර්ධනය සඳහා ද දායක වෙයි. මෙවැනි පැළෑටි තුළ ඇති අත්‍යවශ්‍ය නයිට්‍රජන් සංයුතීන් ඇමයිනෝ අම්ල නිපදවා, පැළෑටි ප්‍රෝටීන් බවට පත් කරයි. මල් සුවඳ මිනිස් සිරුරට අවශ්‍ය පෝෂණ ක්‍රියාවලිය ක්‍රමවත් කරයි. අධි පෝෂණයට කාබනික හා ජෛවගතික කෘෂිකාර්මික නිෂ්පාදන නිර්දේශ කරයි. ප්‍රෝටීන් පරිවෘත්තිය අකාර්මික වීමෙන් යූරික් අම්ලය සයනයිඩ් බවට පත්වේ. නයිට්‍රජන් ධන හා සෘණ තුලන දෙකම අහිතකරය. හිරු එළිය අධික ලෙස ලැබීමෙන් මෙය මර්දනය කළහැකි බව සොයාගෙන තිබේ.

පැරසිලස් - පැළෑටි වලට ග්‍රහයින්ගේ බලපෑම ලවණ, රසදිය, ගෙන්දගම් ග්‍රහ වස්තූන්ගෙන් නික්මෙන විද්‍යුත් චුම්බක කිරණ මගින් පැළෑටි තුළ නිෂ්පාදනය වන අයුරු පෙන්වයි.

ගෙන්දගම් මුදු මොළොක් මල් පළතුරුවල සුවඳ, වර්ණය, පරාග, පැළෑටි හා කොළ තුළ විසුරුවා හරියි. ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා ලැබීම සඳහා පෝෂණ ක්‍රියාවලිය විශ්ව රීතින්ට අනුකූලව සමබර කර ගැනීම අප සතුය. ග්‍රහ කිරණ දුර්වල වූ විට රෝගාබාධ වලට ලක්වීම පොදු ලෝක සිද්ධාන්තයකි. වාත, පිත, සෙම පළමුවෙන් හඳුනාගන්නා ලදී. ධන්වන්තරී වැනි උතුම් ඍෂීන්ගෙන් වෛද්‍ය ක්‍රම උත්තර භාරතයෙන් ලැබී තිබේ. අප ආදිවාසීන් සතු දැනුම පෝෂණය විය. දුර්වල ග්‍රහ කිරණ වලින් රෝගාබාධ, හදිසි අනතුරු, පවුල් ආරවුල්, අකල් මරණ අඩු කිරීම සඳහා නොයෙක් ශාන්තිකර්ම සොයා ගන්නා ලදි.

## ශාන්ති විධි

- නව ග්‍රහ ශාන්ති
- යන්ත්‍ර මන්ත්‍ර
- බෙර ගැසීම
- යාග හෝම හා බලි බිලි
- වෘක්ෂ වන්දනා
- සතුන් මරණයෙන් නිදහස් කිරීම
- මැණික් පැළඳීම
- ඖෂධ දියර නෑම

- හිරු රැස් හා උණු දිය නෑම
- සෙත් පිරිත් ගායනය
- විවිධ තෙල් වර්ග භාවිතා කරමින් පහන් දැල්වීම
- සතුන්ට, දුගී මගී යාචකයින්ට ආහාර පාන, වස්ත්‍ර, ඖෂධ දන්දීම

# ජ්‍යොතිෂය හා බැඳුනු කෘෂි තාක්ෂණය
# Astrology in Agricultural Technology

## පරිසරය හඳුනා ගැනීම.

ආදි කාලයේ සිටම මිනිසා තම පරිසරය අධ්‍යයනය කරමින් පරිසරයේ ක්ෂණික වෙනස්වීම් වලට තුඩුදුන් සෞරග්‍රහ මණ්ඩලය ගැන තොරතුරු සොයා බලන්නට විය. සූර්යග්‍රහණ, චන්ද්‍රග්‍රහණ අවස්ථා වලට බියවී ගල් ගුහාවල, ගස් බෙනවල සැඟවී සිටියහ. මේ නිසා සූර්ය චන්ද්‍ර වන්දනා ද සෙවණ දුන් හිතකර ගස් වලට පුද පූජා කරන්නට ද පෙළඹිණි.

දිවා කල ආහාරය සඳහා පරිසරයට අවතීර්ණ වෙමින් රාත්‍රී කාලයේ දී තරු රටා හා සඳ ගමන් නිරීක්ෂණය කරමින් දඩයමේ ගියහ. උදම්, භූ චලන, චන්ද්‍ර හා සූර්ය ග්‍රහණ ඇති විට පොළොව කම්පාවීම නිසා පැළ සිටුවීමට අහිතකර බව සොයාගත් පසු එම දවස කෘෂි කටයුතු අත්හැරීමට පෙළඹුණි. සඳු පෘථිවියට ආසන්න වූ විට සීත සෘතුව කෘෂි වසංගත වලට ගොදුරු වන නිසා අලු ඉසීමෙන්, දාස්පෙතියා, අබ, මිංචි වැනි සැර සුවඳ ඇති මල් වවන්නටත් පෙළඹුණි. පැළ අගුල් වැටුනා වගේ අවස්ථාවල දී කෘෂි කටයුතු දවසක් පමණ අත්හරින්නට සිදු විය. යල මහ කන්න දෙක ක්‍රමවත්ව වගා කරන්නට පෙළඹුණි. අධික හිරු රැස් ඇස්වලට, හමට පීඩාකාරී බවද දැනෙන්නට විය. මේ සඳහා හේනේ පැලක අවශ්‍යතාවය මතුවිය.

වන සතුන්ගෙන් බේරීමට ගස් උඩ බැලුම් ගෙවල් සාදා ගොවිපළ රැක ගන්නට සිදුවිණ. ධාන්‍ය වර්ග, ඔසු පැළ, පලතුරු, පළා වර්ග, දැව, දර වැනි අත්‍යවශ්‍ය දේ සඳහා ගෙවත්ත නිර්මාණය විය.

## සඳ ගමන් නිරීක්ෂණය

සඳ ගමන්, ගස්, ගල්, ලී පතුරු වල ලකුණු කරගත් ආදී වාසීන් කෙමෙන් දින 29 1/3 ක කාලය පුරහඳ හා අව හඳ චක්‍රයක් සේ හඳුනා ගන්නට විය. නව සඳට හා පුර සඳට දින 3-4 කට පසු එන උපරිම වර්ෂාව බලා දින 3-5 කට පසු පැළ සිටුවීම කළේය. මෙය ස්ත්‍රීන්ගේ ඔසප් චක්‍රයට සමාන බවද පැළෑටි වර්ධනයට, දරු උපත් වලට බලපාන බවද දැනගත්තේය.

පුර සඳට දින දෙකකට පෙර ඇට වැපිරීමටත්, පොහොර හා බෙහෙත් විසිරීමට ශුභ බවත් සොයා ගත්හ. නව සඳට මුල් අල්ලා ගැනීම වේගවත්වී වල් පැළ නෙලීමට ද ඉතා ශුභ බව හඳුනා ගති. සඳ කෙමෙන් ඈත්ව යන ගිම්හාන කාලය අල වලට හොඳ අස්වැන්නක් ලබාදුණි. නමුත් ඇට වැපිරීමට, පැළ ගලවා සිටුවීමට නුසුදුසු විය. විශේෂයෙන් හඳ මෝරන විට ආලය, ආදරය උත්සන්න වීමත්, ප්‍රජනන ක්‍රියාවලිය, වර්ධන වේගය, මානසික රෝග, අනතුරු හා උපත් අධික බවත් ඒත්තු ගැන්විණි. සඳ ගමන් වලට අනුකූලව කෘෂි තාක්ෂණය දියුණු විය.

## කෘෂි චක්‍රය හඳුනා ගැනීම.

පෘථිවියේ භ්‍රමණය නිසා දිවා රෑ දෙකද, පරිභ්‍රමණය නිසා ඍතු විපර්යාසද නොවෙනස්ව සිදුවීම නිසා කෘෂි චක්‍රය සේ එය හැඳින්විය. මාර්තු 21 හා සැප්තැම්බර් 22 රෑ දාවල් සමාන වීමද ස්වභාවධර්මයේ කාලානුරූපී බව හා කෘෂිකාර්මික කටයුතු සඳහා තිරසාර නැකැත් සෑදීමට ද ක්‍රමවත්ව කෘෂි කටයුතු නිමා කිරීමටද උපකාරී විය. සූර්යාගේ උත්තරායනයට හා දක්ෂිණායනයට පිවිසීම නිසා නැකැත් ශාස්ත්‍ර විධිවල ක්‍රමවත් බවක් ඇතිවිය. උත්තරායන ගමන දෙසැම්බර් 22 සිට ජුනි 22 දක්වා ජීවීන්ගේ හා පැළෑටීන්ගේ ප්‍රාණවත් බවත් වේගවත් වර්ධනයත් සනිටුහන් කරයි. රවි ජනවාරි 15 දා මකර රාශි ගත වන්නේ පැළෑටි වර්ධනය උපරිම තලයකට ගෙනයමිනි.

මිනිවි, සුදු එළු, ඉගුරු වැනි සුවඳ වර්ග අන්තරීක්ෂ බලවේග වැඩියෙන් උරාගනී. ගස් වැල්, මල් හා එල බරින් පිරීයයි. ලංකාවේ නැකැත් ක්‍රමවල අද්විතීය බලවේග උරගා බැලූ හොඳම වේලාව සිංහල හා හින්දු අලුත් අවුරුද්දයි.

සමීපස්ථ ග්‍රහයින්ගේ අධික කිරණවලට හසු වූ විට පූස්, කුඩිත්තන්, අකාල එලදාව පරාග වර්ධනයට බාධා වීම වැලකීමට දාස්පෙතියා, අබ, මිංචි, සේර වැනි සැර සුවඳ වර්ග වවා ඇත. නිවාස අසලින් ඇත් බානක් යන්නට ඉඩ තියා නිවාස ඉදිකරන්නට විය. සත්ව ගාල් හා සොහොන් බිම් ඇත් කෙරිණි.

කැළෑ එලිකර ආලෝකය ලබා ගන්නට පුරුදු විය. ග්‍රහ වස්තූන් ගෙන් නික්මෙන විද්‍යුත් චුම්භක කිරණ මගින් පැළෑටි තුළ නිෂ්පාදනයන්ගේ ක්‍රියාවලිය සිදුවිය. ගෙන්දගම් මුදු මොළොක් මල්වලට සුවඳ, වර්ණය, පරාග මෙන්ම පැළෑටි හා කොළ තුළද විසුරුවා හරියි. වර්ෂා හා වසන්ත සමයන්හි දී මෙන්ම ගිම්හානයේ මුල් අවධියේ රසදිය නිසා වැඩීම වේගවත් කරයි. ලවණ නිසා ශිශිර සෘතුවේ දී කැටි ගැසීම වැනි ක්‍රියාවලියන් සිදුවේ. පැළෑටි මිනිසා ඉදිරියේද එක්තරා විද්‍යුත් ශක්තියක් උරාගන.. එල නොදරන ගස්වලට තඹ කම්බි බැඳීම, ඇණ ගැසීම, පොල් ලෙලි එල්ලීම කරයි. සංගීතයට, කටහඬට, කෙම් පහන් ක්‍රම වලටද සංවේදී වෙයි.

අකුණු වැහි වසිද්දී යකඩ උපකරණ එළියට ඇද දමන අයද සිටී. වැසි ජලය උල්පත් ජලය අධික ඛණිජ ලවණ ඇති බව සොයාගත්හ. විද්‍යානුකූල පර්යේෂණ අත්හදා බැලීමට පෙර මිනිසාට ඉවෙන් මෙන් මේ කරුණු අවබෝධ වී ඇත. තද හිරු රැසින් වී මල් පුදින අයුරුද, සඳ රැසින් කුමුදු, කඩුපුල්, පුදින වගත් හඳුනාගත් මිනිසා ඉර හඳ දෙකම එකසේ ප්‍රයෝජනයට ගන්නට විය. දඩයමේ යාමට මෙන්ම ගොයම් පාගා බැත පෑහීමට හඳ සහිත රාත්‍රිය තෝරා ගන්නට විය. විශේෂයෙන් රාත්‍රී කාලයේදී එල දැරීම, ගැබ් ගැනීම වැඩි බව නොරහසකි. මෙම ක්‍රියාවලිය ප්‍රහර්ෂණය. උපරිම සතුටයි.

## මහින්දාගමනයෙන් පසු ඇති වූ ක්‍රමාණුකුල ජ්‍යොතිෂ හා කෘෂිකාර්මික ප්‍රගතිය.

මේ අතර මහින්දාගමනයෙන් පසු බුදු දහමත් සමග ආර්‍ය ශිෂ්ඨාචාරය ප්‍රචලිත විය. විශේෂයෙන් ජ්‍යොතිෂ විද්‍යාව හා ගෘහ නිර්මාණ ශිල්පය, වෛද්‍ය ක්‍රම, නිවැරදි පෝෂණය ගැන අවධානය යොමුවිය. ඒ සමගම රාශි චක්‍රය හඳුනාගත හැකිවිය. මිනිසුන්ගේ හා සතුන්ගේ සවරූපය ගත් තාරකා පද්ධති විමසීමට ලක්විය. දැඩි විශ්වාසයකින් බැඳුන නිසා නිරීක්ෂණ කිරීමටත් උගත් අයගෙන් කරුණු අසා දැන ගැනීමටත් උත්සුක විය. විශ්මිත ග්‍රහවස්තු ගැන කුතුහලය අවදි විය. රාශි චක්‍රය ආරෝපණය කර ජ්‍යොතිෂ මිනිසා **Meganthropus** නිර්මාණය කර වෛද්‍ය උපදෙස් මත නිවැරදි පෝෂණය හා රෝගීනට සාත්තු සප්පායම් කිරීම ආරම්භ විය. ඔසු පැළ වගාවට විශේෂ තැනක් හිමිවිය.

දිවා රෑ දෙකෙහිම මිනිස් කටයුතු සඳහා යොදා ගැණිනි. සියළුම අවස්ථාවන්හි දී ගමේ නැකැත් කරුගෙන්, පන්සලෙන්, ගම් ප්‍රධානියාගෙන්, වෙල් විදානෙගෙන් පිහිට පැතීය. එළිමහනේ සඳ එළියේ එකසේ කය වෙහෙසා වැඩ කළ නිසා නිරෝගී සම්පන්න පරපුරක් බිහි විය. ලෙඩ වූ විට වෙද මහතාගේ ජ්‍යොතිෂ සංකල්ප මත ඖෂධ හා ගුප්ත ශාන්ති විධි නිසා ඉක්මන් සුවය ලැබිණි. අධික පෝෂණ තත්වයේ ආහාර ද සකස් විණි. ආගමික වත් පිළිවෙත් කිරීමටද අවධානය යොමු කෙරිණි.

ග්‍රහ ගති මතු කරන ජ්‍යොතිෂ මිනිසාගේ සවරූපය හඳුනාගත් පසු ක්‍රමවත්ව වෛද්‍ය ප්‍රතිකාර කිරීමද, රෝග නිර්ණයද ආරම්භ කර ඔසු පැළ යෙදූ ප්‍රතිකාර ක්‍රම හඳුනා ගත්හ. ජ්‍යොතිෂය, ආගම හා බැඳුන වෛද්‍ය ක්‍රම ප්‍රසිද්ධියට පත් කෙරිණි. බුදු දහමට අනුව ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන භූත 4 ට සාපෙක්ෂව සියල්ල වෙනස් නොවී එකට බැඳී පවතින බව පැහැදිලි කෙරිණි. නැකැත් තරු 27 ද මීට අමතරව ආකාශ භූත ගණයට අයත් යැයි හදාරා ඇත. මීට සමගාමීව පඨවි භූතයට මුල් ද, වායෝ භූතයට මල් ද, ආපෝ ධාතුවට කොළ ද, තේජෝ ධාතුවට පලතුරු සහ ඇට වර්ගද වෙන්කර තිබේ. මේ අතර සිතේ හා ස්නායු පද්ධතියේ රෝග සඳහා ඛණිජ ලවන ඇති මුල්ද, පෙනහළු හා හෘද රෝග සඳහා රසදිය අධික කොළ හා නැටි වර්ග ද, ආහාර මාර්ගයේ දෝෂ හා ප්‍රජනන ක්‍රියාවළිය සඳහා මල්, ගෙඩි, පරාග, සුවඳ වර්ගද යොදා ගැනීමට නිරායාසයෙන්ම පුරුදු විය.

ලූනු චින්තනයට බාධා කරන නිසා ළදරු ආහාර වලින් ඉවත් කෙරිණි. වයස මාස 10 න් පසු පිරිමි ළමුන්ටද, 11 න් පසු ගැහැණු ළමුන්ටද ඉඳුල් දීම නැකතට කුල සිරිත් අනුව සිදු කෙරිණි. මෙවැනි ජීවිතයේ වටිනා හැම අවස්ථාවකම ජ්‍යොතිෂය හා පන්සල මුල්විය. නිවාස ඉදිකිරීමටද, කෘෂිකාර්මික කටයුතු වලටද, ජීවිතයේ දරුවකු පිළිසිඳ ගැනීමේ සිට මිණිය වැළලීමටද ශුද්ධ නැකැත් භාවිත විය.

විශ්වීය සාධකද, වායු ගෝලීය සාධකද, භූගෝලීය සාධකද එක්ව මිනිසාට සතුන්ට මෙන්ම ගහ කොල වලටද බලපාන

බව කාටත් හේතු සාධක සහිතව අවබෝධ විය. සිකුරා සෞභාග්‍යට හා හලා හල විෂටද, බුධ බුද්ධි වර්ධනයටද, ගුරු ආගමික කටයුතු වලට සහ දිගු කාලීන ගස්වලටද, ශනි දුකටද, ඇට වර්ග වලටද බලපාන වග සොයාගත්හ. මෙයින් සියළුම ග්‍රහ වස්තු තාරකා මණ්ඩල මිනිස් සංහතිය සතුන් හා ගහ කොළ කෙරෙහි බලපාන වග පැහැදිලි කෙරිණි. විශේෂයෙන් ප්‍රජනනය, සංසේචනය හා වර්ධනය ගැන මිනිසා අධ්‍යයනය කරන්නට පටන් ගත්හ. විශ්ව රිද්ම රටා ද, අන්තරීක්ෂ රටාද මැන බලන්නට බුද්ධිමත් මිනිසා පුරුදු පුහුණු විය. කොත්මලේ ගණිතයා ගැන කවුරුත් දනී. ඔහු ග්‍රහයින් ගේ බලපෑම පුළුන් ගිනි දල්වා රජුට පෙන්විය. සියල්ල පවතින්නේ අන්තරීක්ෂ රිද්ම රටා පාදක කර ගනිමිනි. අහසට නෙත් යොමා කාලගුණික, දේශගුණික විපර්යාසයන් නිරීක්ෂණය කරන්නට ද පෙළඹුණි. සතුන්ගේ හැසිරීම් රටාද මැන බැලුවේය.

## ඔසු පැළ භාවිතය

ග්‍රහ කිරණ නිසි අයුරු ව්‍යාප්ත නොවූ විට පැළෑටි පටක තුළ අසාමාන්‍ය වැඩීමක් සනිටුහන් කළ බව අවබෝධ විය. කළුවර අඳුරු මුලු වල විෂ සහිත පැළෑටි හා විෂ වර්ග සෑදීම සොබා දහම අනුව සිදුවෙයි. උදා: අත්තන, වහ කදුරු, කහ කනේරු, අන්නාසි ගැට විෂ සහිත බව මෙයින් හැඟෙයි.

''මල්ලක් කදුරු කන්නෙමි විගස දොර අරූ'' යන ජන කවිය එය සනාථ කරයි. අන විත කිරීමටද ''ගත්ත බාඳුරා සැම මුල් හීරුස්ස'' යන්න ගැමි වහරින් කියවෙයි. කදුරු

ගෙඩි තලා ජලාශ වලට දමා මාළු, ඇල්ලීමට වැදි ජනයා සමත්ව සිටි බව සඳහන් වෙයි. මිනිස් පරිභෝජනයට සුදුසු බිම්මල් රස ගුණ ඇති ප්‍රිය ආහාරයක් සේ සැලකීය.

මොළයට අහිතකර ඇල්කලොයිඩ අද වෙළඳ පොලේ මිල අධික බෙහෙත් නිෂ්පාදනයට ගනී. කංසා, අබින් මත් ද්‍රව්‍ය වලටද, බෙහෙත් වලටද භාවිත කරයි. කංසා මස් මොළොක් කිරීමට ගත් නිසා ඒවාද වවා ඇත. අත්තන ශාඛය ''යකාගේ හොරණෑව'' කියා හඳුන්වයි. රුක් අත්තන මිනී පෙට්ටි සැදීමට භාවිත කර ඇත. ක්වීනින් මැලේරියා මර්ධනයට යොදා ඇත. නයිට්‍රජන් අධික වූ විට පැළෑටි හා බිම්මල් වලට කෘමීන් හා කුඩිත්තන් ආකර්ෂණය වන බව දැන සිටියහ. මේ බිම්මල් වලින් (Trehalose) නැමති වටිනා බෙහෙතක් නිපදවයි.

හිරු රැස් පැළෑටි ලම්භාකාරීව හා ගසේ කඳ වැඩීමට සලස්වයි. සඳ මුල්ද, බුද මල් සහ කොළද, සිකුරු කොළ මල් සහ පෙතිද, ගුරු ගෙඩිද, ශනි ඇට වර්ගද, අඟහරු පරාගදානි හා පරාග පෝෂණයටද දායක වන වග අඳුනා ගැනීමෙන් පසු ග්‍රහ කිරණ උකහා ගැනීමට මිනිසුන් විවෘත එළිමහන් බිම් සොයන්නට පෙළඹුණි.

කාබනික ව්‍යුහය සහ අන්තරීක්ෂ බලපෑම් අතර විශාල සහසම්බන්ධයක් ඇත. ග්‍රහ වස්තුන්ගේ වෘතාකාර බව සහ රිද්මානුකූල ගමන් නිසා කාලානුරූපව මිහිපිට ඇති සියල්ලෙහි ස්වරූපයද සිදුවෙයි. පැළෑටි වල විකෘති ඇති වන බව හඳුනා ගත් පසු කුඩා අඩි පාරවල්, සංරක්ෂණ වැටි,

අගල් දැමීමට නිතැතින්ම පෙළඹුනි. ජලය හොඳින් බැසයාමත් පොහොර පස් රැඳීමත් මේ නිසා ඉබේ සිදුවිය.

මිනිසා හැම විටම කෘෂිකාර්මික කටයුතු වලදී ග්‍රහ ලෝකවල බලපෑමට අවනත විය යුතු බව දැන සිටියහ. යල මහ කන්න වැසි සමයන් අළලා වගා කිරීම මේ සීමාවන්ගේ ආරම්භයයි. හඳ දින 1 1/2 සිට 3 දක්වා සියළුම ග්‍රහ තාරකාවන්ගේ ඉදිරියෙන් යමින් පෝෂ්‍ය පදාර්ථ උරාගෙන එම විශ්ව ශක්තීන් ජල මාධ්‍යයක මුදා හරී. ජනශ්‍රැති වලද සඳ ගැන නිතරම සඳහන් වී ඇත. සඳ සියළුම ශක්තීන් එක්කර ගන්නා මාධ්‍ය කරුවෙකි. ගොමද ඊතර සහ තාරකාමය ශක්තීන් උරාගන්නා හොඳ මාධ්‍යයයි.

මේ නිසා ඈත අතීතයේ සිටම ගව, එළු, කුකුළු ගාල්වල අපද්‍රව්‍ය පොහොර සඳහා ගැණිනි. අළු ඉසීමෙන් පැළ ආරක්ෂා වීය. සතුන්ගෙන්ද පරිසරයේ ඇතිවන වෙනස්කම් පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකියි. ඇටි කුකුළන්, ගෙම්බන් වැසි සමය ගැන කියයි. රැහැයියන් නියං සමය ගැන කියයි. මී මැස්සන් කඩිසරව හැසිරෙන සමය සිටුවන පැළ නිරෝගීව වැඩෙන කාලයයි. පොහොර, මඩ හා අළු මිශ්‍රණ ගස්වලට දැමීමට මේ දින තෝරා ගෙන ඇත. අතින් හාන ලද බිමද පස් බුරුල් කළ බිමද පහසුවෙන් වර්ධන වේගය වැඩි කරන නිසා ගැමියන් නිතරම පස් බුරුල් කිරීමද වපුරන්නට පෙර සී සෑමද කර ඇත.

1 වන කාර්තුවේදී ක්ෂීණ සඳු අල හා මුල් වලට අධික ශක්ති ප්‍රභවයක් දෙන වග දැන සිටි නිසා නව සඳට

සම්ප්‍රදායානුකුල ඇට වැපිරීමට, අනවශ්‍ය පැළ ඉවත් කිරීමට, වල් නෙලීමට හොඳම කාලයයි. ඇට යහන් කිරීමේදි කෙසෙල් හා හබරල කොළ භාවිත කරයි. අවශ්‍ය තෙතමනයට උදේ දියේ දැමීමෙන් හිරු කිරණද හවස යහන් කිරීමෙන් සඳ රැස් වලද ශක්තීන් උරාගනී. 3 වන කාර්තුවේදී ඇට වැපිරීම හා ධාන්‍ය මේරීම සිදුවෙයි.

පුර සඳට දින 2-3 කට පෙර ඇට තේරීමද, ඇට වැපිරීමද කරයි. නව සඳට දින 3-4 කට පසු උපරිම වර්ෂාව බලා හිඳින්නට සිදුවෙයි. සඳේ 3 වන කාර්තුවේදී ද පුර සඳට දින 3-4 කට පසු උපරිම වර්ෂාපතනය ප්‍රයෝජනයට ගෙන සම්ප්‍රදායානුකුල ඇට වැපිරීම හා ධාන්‍ය වගාව සිදුකරයි. පුර හඳට කෘමි හා වෙනත් ජීවීන්ගේ අධික ක්‍රියකාරී බව නිසා කපන ගස් ඉක්මනින් විනාශ වේ. එලය වැඩි නිසා ගුල්ලන් විදී. හදිසි අනතුරු, ලේ ගැලීම, අසීරු දරු උපත්, නිදි බර ගතිය, අපරාධ, මානසික රෝග, කෙස් කැපීම අධික වෙයි.

සඳ 4 වන කාර්තුවේදී දැව කැපීම, විශේෂ ධාන්‍ය වර්ගවල අස්වනු නෙලීම, සත්ව පාලනයේ විශේෂතා සිදුකළ හැකිය. උතුනියාම යන විශ්ව නියාමය සුළඟ, ගින්දර, ගස්වැල් හා ග්‍රහ ලෝක ආශ්‍රිතව පවතී. විශ්ව නීතියට පිටුපා යා නොහැක. මේ අනුව මිනිසාට හැඩ ගැසීමට සිදුවෙයි. පෝය කියා හඳේ විශේෂ අවස්ථා 4 ක් ආගමික කටයුතු කිරීමට වෙන් කරන ලද්දේ වැඩ කිරීමට අශුභ නිසාය. විශ්ව ශක්තීන් මිනිසාට දිව්‍ය ආශිර්වාදයක් සේ හැඟේ. වායු ගෝලයේ

ඉහළ ස්ථර හරහා පෘථිවියට එන ශක්ති කදම්භයන් නව ජීවයක් දෙයි.

## විශේෂ අවස්ථා

- ඇට් කුකුළන්, ගැඩවිලුන් ගොවියාගේ මිතුරන්ය. ගැඩවිලුන් පසට නයිට්‍රජන් වැනි ඛණිජ ලවණ එක්කරයි.
- දරුණු සතුන්ගෙන් ආරක්ෂාවීමට දිඩු වැට, ගිණි මැල දැල්වීම, හූ කීම, අත්පුඩි ලෑල්ල, ටකය, කැක්ටස් වර්ග, තල් අතු, අන්නාසි, වැනි කටු පඳුරු වැටට එක් කෙරිණ.
- උදාහරණඃ නයින්ට අඳු කොළ, රිලවුන්ට කුඩු මිරිස්, ඉබ්බන්ට අමු පැපොල්, පොදුවේ කිරිබත් වැනි දෑ දැමීම කවුරුත් අත්හදා බලයි
- බිම් සකස් කිරීමේදී තැනිතලා, ගංගාධාර ගංවතුරෙන් යටවූ නිසා උස්බිම් සොයා ඇදෙන්නට විය.

  හෙල් මළු වල අධික පොහොර තැන්පත් වීමත් ග්‍රහ කිරණ විශාල ප්‍රමාණයක් ඇද ගැනීම නිසාත් උස්බිම්වල පළතුරු රස ගුණ වැඩියෙන් ඇති නිසා ජනාවාස සඳහා උස්බිම් පරිභෝජනය අධික විය.

- ගෙවතු වලද හෙල්මළු වලද කුඩා පතුරු හා පසුව කරඩි වැනි කුඩා උදළු වලින් පස යන්තම් පහුරු ගා ධාන්‍ය, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, වැනි ධාන්‍ය වර්ග ඉසීම කළහ. මේ කැකුලන් ඉසීම මොණරාගල හා කුරුණෑගල දී මම දුටුවෙමි. ඒ බත් රසයෙන් ඉහළයි. ගුණයෙන් ද උසස්ය.

- මඩ බිම් සතුන් ලවා පාගවා හී හාමින් අස්වද්දන්නට පෙළඹිණ.

- ශෂ්‍ය මාරුව, මිශ්‍ර බෝග වගාව, පස සංරක්ෂණය, මිත්‍ර බෝග, ඖෂධ පැළෑටි, සුවඳ වර්ග වැවීම ගෙවත්තක නිරායාසයෙන්ම සිදු විය.

- වැට බැඳීමටද ජලය හා පොහොර රඳාගත් සෙ.මී. 6 ක පමණ ඝනත්වයෙන් යුත් පෘථිවි තලය ග්‍රහ කිරණ හොඳින් උරාගෙන පැළෑටි වර්ධනයට පහසු කරයි. හේන් වගාව නිසා මේ තත්වය වෙනස් විය.

- ගුරුල්ල, බෝම්, දෙමට, දවට, සියඹලා, ආඩ තෝඩා, වැටකේ, මයිල, පිහිඹිය, නික, හා කල වැල් වැට සකස් කිරීමට ගන්නා ලදී.

- නිරක්ෂය අසළ පිහිටීමද, වාෂ්පීකරණය, මෝසම්, සංවහන, වාසුළි, හා පිළි වාසුළි නිසා සවභාවික විශාල වනාන්තර ඇති විය. ඊට සමගාමීව කෘෂි කටයුතු ක්‍රමවත්ව සකස් කෙරිණ.

- තැනිතලා, උස් බිම්, ජල උල්පත්, ගංගා ධාර, දිය ඇළි, නිසා කල්යල් බලා වැඩ කිරීමට පහසු විය. වාරිමාර්ග ජල විදුලි බලය දක්වා තාක්ෂණය දියුණු විය.

- මිනිසා මෙසේ කායික, තාරකාමය, දිව්‍යමය, ආධ්‍යාත්මික, ආගමික බලවේගයන්ගේ සංකලනයන් බවට පරිවර්තනය වෙමින් සිටී.

- අමාවකට සර්පයින් කෑ විට විෂ බැස්සවීම අසීරු යැයි කියති. සර්ප වෙදකම පරිසරය තුළින්ම ජ්‍යොතිෂ විද්‍යා ක්‍රම භාවිතයද සමග විකාශනය විය. මන්ත්‍ර බලයෙන්ද විෂ බස්සවයි. බෙහෙත් ඔරු රැක් අත්තන ලීයෙන් සාදා බෙහෙත් ගිල්වා විෂ බස්සවයි

- නාගයින් සම්බන්ධ ඇදහිලි ක්‍රම භාවිතා විය. වටිනා වස්තු සැඟවූ නිදන් වලටද, ජල කළමනාකරණ කටයුතු වලදි ද නාග රූප සම්බන්ධ කර ඇත. නාග පොකුණ හොඳම උදාහරණයකි. විශාල ගස් ප්‍රමාණයක් වන්දනීය විය. නුග, බෝ, අදත් වන්දනීයයි.

- වැවයි දාගබැයි එක්වූ විශාල සංස්කෘතික දියුණුවක් අප රට තුළ ඇති විය.

- පැරකුම් සමය ස්වයංපෝෂණය නිසා ස්වර්ණමය යුගය සේ සලකයි. ආහාර විදේශ රටවලට පවා යවා ඇත.

## වෘක්ෂ වන්දනාව

- මහින්දාගමනයට පූර්ව යුගයේ සිට හෙලදිව වත් පිළිවෙත් වල හා යාතු කර්ම වලදී ගස්වලට විශේෂ තැනක් දෙන ලදී. උදා: බෝධි වෘක්ෂය. වෙසමුණි හා කම්මාර දෙවිවරුන්ගේ විමාන ලෙස නුග ගසද, වැසි දෙවියාට තල් ගසද, අටවිසි බුදුවරුන් බුදුවූ ගස්ද, පූජනීයත්වයට පත්විය. කුඹුක්, මී, නුග, කොළොන් වැනි ගස් භූමි සීමා සේද සැළකීය.

- ගොක් කොළ, කෙසෙල් හා පුන් කලස් උත්සව අවස්ථා උදෙසා ද සැරසිලිවලටද ගන්නා ලදී.

- පොල්, පුවක් මල්, කොළ, ගෙඩි සංස්කෘතික අවස්ථා සඳහා දනුදු භාවිත කරයි.

- වැටකේ සහ තල්ගොබ පණිවුඩ ලිවීම සඳහාත්, කේන්ද්‍ර ලිවීම සඳහාත් භාවිතා කරන ලද.

- සල්, සපු, නා, කොලොන් වලටද ඓතිහාසික වටිනාකමක් ඇත. (රජ බිසවක් ස්වාමීන්වහන්සේ නමක් නිසා කොලොන් මල් උයනක් සැදූ බව සඳහන් වේ)

- නවග්‍රහයින් සඳහාද, නැකැත් 27 සඳහාද, ඖෂධ නෑම සඳහාද, ගස් හා පැළෑටි වෙන් කෙරිණි.

- උද්‍යාන අලංකරණය, තෘණ විද්‍යා රටා මැවීමද රාවණාගෙන් සීතා උගත් බව රාමායණයේ කියා ඇත.

# විශ්ව ශක්තීන් හා පැළෑටි
# Universal Energies & Plants

## ඓතිහාසික විකශනය

ආදිකාලයේ සිට මිනිසා පරිසර පද්ධතීන් සුරැකීමට උත්සුක විය. මේ නිසා විශේෂයෙන් පරිසරයේ ක්ෂණික වෙනස්වීම් වලට තුඩු දුන් සෞරග්‍රහ මණ්ඩලය ගැන තොරතුරු සොයා බලන්නට විය. ගැලීලියෝ දුර දක්නය සෑදීමටත් පෙර සිටම නිවසේදී සාදා ගත් රළු උපකරණ භාවිතා කරමින් තාරකා හා විශ්ව ගවේශණයට යොමු විය. සිරියස්, ටෝකන් සහ පෙල්ඩිස් තාරකා බටහිර රටවල කෘෂිකාර්මික කටයුතු සඳහා ඉමහත් පිටුවහලක් විය.

බටහිර ක්ෂතිජයෙන් සීරියස් තරුව පායද්දී මිසර වැසියන් උද්දාමයෙන් බලා සිටියේ නයිල් මිටියාවත සරු කෙතක් කරන්නටය. මෙසේ මහෙන්ජදාරෝ, හරප්පා සභ්‍යත්වයන් බිහි විය. උත්තර භාරතීය සංකල්පයන් නිසා ශ්‍රී ලංකාවේද විශිෂ්ඨ සංස්කෘතින්ගේ උපත සිදු විය. පෙර අපර දෙදිගම විද්‍යාත්මක ගවේශනයන් නිසා ජ්‍යොතිෂ විද්‍යාත්මක පදනමක් මත කෘෂිකාර්මික කටයුතු සමග වෛද්‍ය විද්‍යාව පෝෂණය විය. මිනිසාගේ දෛනික කටයුතු වලට නව ජීවයක් ලැබිණි.

ඈත අතීතයේ ග්‍රහ වස්තූන් දේවත්වයෙන් සැලකීමට හේතු වූයේ විශ්මිත ලෙස පරිසරය වෙනස් කළ බැවිනි. ලෝකය

පුරා ජ්‍යොතිෂය, විද්‍යානුකූල විෂයයක් ලෙස පෝෂණය විය. බැබිලෝනියාවේ හා ඊජිප්තුවේ සතර මහා ධාතු (Elements) වලට අයත් ස්වාභාවික බලවේගයන්ගේ දායකත්වය නිසා දර්ශනවාදය, වෛද්‍ය විද්‍යාව හා ආගම ද මෙයට සමගාමීව ජ්‍යොතිෂ විද්‍යාව ද සම්බන්ධීකරණය විය. තාරකා විද්‍යාව සමඟ දියුණු විය. විශ්ව හා මානව දයාවේ සිද්ධාන්තයන් ලෙස මේ විද්‍යාවන් ආගමානුකූල පසුබිමක වර්ධනය විය.

මෙලොතිසීස් විද්‍යාව අනුව තාරකා හා රාශී චක්‍රය ශරීරයේ ද ආධිපත්‍ය පවත්වන වග සොයා දැන ගත්තේය. මිනිසාගේ ඇතුළත ස්වරූපය පාලනය වන්නේ විශ්වයට සාපේක්ෂව තාරකාවන්ට අනුරූපවය "The stars and Zodiac dominate parts of the body" යන මතය බෙත්ලෙහෙමේ, මව සහ දරුවා, "The woman with the child" කැසියොපියා තාරකා පද්ධතිය නිසා වෙනස් විය. දෙවියන් විසින් ලෝකය මවන ලදී. "The god created the world" යන්න වෙනුවට විද්‍යානුකූල පර්යේෂණ ක්‍රියාත්මක විය. තාරකාවන්ගේ රිද්ම රටාවන්ට සාපේක්ෂව මිනිසාගේ ස්වරූපය පාලනය වේ. "Stars governed man's inner nature corresponding to the universe." විවිධ විද්‍යාඥයින් විසින් මේ අන්තරීක්ෂ රිද්ම රටා ගැන ලියන්නට විය.

ජ්‍යොතිෂ නිබන්ධ "Astrological Treatises" නමැති පොත ලිවීමෙන් පසු ග්‍රහ තාරකාවන්ගේ බලපෑම කවුරුත් අවිවාදයෙන් පිළිගත්තේය. බුදුරජාණන් වහන්සේ මීට අමතරව උතු නියාම (Seasonal Law), බීජ නියාම (Bio

Logical Law), කම්ම නියාම (Ethical Law), ධම්ම නියාම (Universal Law) සහ චිත්ත නියාම (Psychological Law) කියා සියළුම වස්තූන්ගේ පැවැත්ම නියාම 5 කට අයත් යැයි දේශනා කළ සේක. මේ අනුව විශ්ව නීතිය (Universal Law), විශ්ව රිද්මය (Universal Rhythm) හෙවත් සීමා බන්ධන (Limitation Law) අනුව සියල්ල පවතින වග පිළිගනී. විද්‍යාඥයින්ගේ මතය කාලය (Rhythm), ස්වරූපය (Form), ග්‍රහයින්ගේ සාපේක්ෂ පිහිටීම (Space Configuration) බවය. සියල්ල පවතින්නේ අන්තරීක්ෂ රිද්ම රටා (Universal Rhythm) පාදක කර ගනිමින් බව අවිවාදයෙන් පිළිගනී.

## සූර්ය දෙවොල්

බ්‍රිතාන්‍යයේ ස්ටෝන් හෙන්ජ් (Stone henge) සූර්‍ය නිවෘත්ති හා ග්‍රහ අවස්ථා නිර්ණය කළේ පාෂාණ මත පැළෑටීන්ගේ වර්ධනය සනිටුහන් කිරීමෙනි. ඇමරිකාවේ පීරූ ප්‍රදේශයේ මායන් දෙවොලද ඉන්කා ශිෂ්ඨාචාරයේ පසුබිමද මිසර හා පීරූ පිරිමීඩ වල සිංහ තාරකා පන්තිය පොළොවට ලම්බාකාර වනසේ සාදා ඇත.

ඒ අසිරිමත් ලොව දිනූ මතක සටහන්ය. ජයිපූර්වල සූර්යය චක්‍රය මිනිත්තු තුනකින් නිවැරදි ලෙස කාලය සටහන් කර ජ්‍යොතිෂය උසස් විද්‍යාවක් ලෙස මිනිස් කටයුතු කෙරෙහි යොදා ගෙන ඇත. මායන් වරුන් විසින් සිකුරු ග්‍රහයාගේ රිද්ම රටා අළලා පළමුවෙනි වගා ලිත සම්පාදනය කරන ලදී.

## රාශි චක්‍රය

ග්‍රහතාරකා සම්බන්ධ කර රාශි චක්‍රය ගොඩනගා ඇත. අසාමාන්‍ය කොටස් 12 කට වෙන්කර රාශි 12 ක් සහ තාරකා 12 ක් නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවන අයුරු බලා සකසා ඇත. මේෂ - බැටළුවා, වෘෂභ - ගොනා, මිථුන - යුවල, කටක - කකුළුවා, සිංහ - සිංහයා, කන්‍යා - කන්‍යා මරිය මව්තුමිය හෝ ධාන්‍ය ගෙන යන යුවතිය, තුලා - තරාදිය, වෘශ්චික - ගෝනුස්සා, ධනු - දඩයක්කාරයා, මකර - මකරා, කුම්භ - ජලය ඉසින මිනිසා, මීන - මාළු ජෝඩුව, මේ සංකේත යොදා ඇත්තේ ඔවුන් හඳුනාගත් තාරකා පද්ධති අනුවය. ඉන්පසු මිනිස් සිරුර ද, රාශි චක්‍රය ද, ත්‍රිකෝණ 4 කට බෙදා වෙන් කළෝය. ඒවා ජීවිත අපේක්ෂාවන් 4 ක් සේ වර්ග කර ඇත. ධර්ම (Duty), අර්ථ (Wealth), කාම (Sensual) සහ මෝක්ෂ (Liberation) කියා. මිනිසාගේ පැවැත්මට විශ්වයේ බලපෑම කොතෙක් දුරට පාදක වී ඇති දැයි රාශි චක්‍රය (Animal cycle) ගොඩ නැංවීමේදී සීනෝ පෙන්වා දී ඇත.




රූපය 3.1 රාශි චක්‍රය




රූපය 3.2 රාශි චක්‍රය

15 වන සියවසේ දී ග්‍රහ වස්තූන් ආරෝපණය කර ජ්‍යොතිෂ මිනිසා නිර්මාණය කළ බව ක්‍රිස්ටි මරේ සහ ඈන් සැන්ඩර්ස් විස්තර කරයි. ජිනදාස හෙට්ටිගොඩ මහතා ද මීටම අදාල සරල සටහනක් සඳහන් කර ඇත. මේ නිසා වෙදකම් කිරීමේ විවිධ අවස්ථා ද රෝග නිර්ණය ද, සත්ව කොටස් සහ ඔසු පැළ යෙදූ ප්‍රතිකාර ක්‍රමද, පහසු වී ඇත. ක්‍රි.ව. යට පෙර මෝසස් තිරිඟු මෙන්ම බෙහෙත් පැළ වගා කළ බව බයිබලයේ පවා සඳහන් වෙයි.

## පැළෑටි වර්ධනය

පැළෑටි තුළ ආකර්ශනයද (Magnetic Forces) රූපාකාරය ද (Morphological Growth Process) ග්‍රහ වස්තූන්ගෙන් ලබා ගන්නා බව වාර්තා වී ඇත. කාබනික ව්‍යුහය හා අන්තරීක්ෂ බලපෑම් අතර විශාල සම්බන්ධය නිසා ග්‍රහ වස්තූන්ගේ වෘත්තාකාර බව සහ රිද්මානුකූල (Rhythm) ගමන් නිසා කාලානුරූපිව මිහිපිට ඇති සියල්ලෙහි ස්වරූපය සිදුවෙයි. මීට අමතරව දැඩි විකෘතිතා ද සිදුවේ. විෂ සහිත වීම නොවැලැක්විය හැකිය. පස සියළුම ශක්තීන් එක්තැන් කරන මාධ්‍යකරුවෙකි. මිනිසා හා සතුන් බැහැර කරන අපද්‍රව්‍ය ද පැළෑටි වර්ධකයකි. කාබනික හා ජෛවගතික කෘෂි කටයුතු සඳහා යොමු වීම ජාතියේ වාසනාවකි. මේ නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් ඇත. මිළ අධික වීමට හේතුව පෝෂණ ගුණයෙන් අධික වීමය.




රූපය 4. සූර්ය ශක්තිය ස්මිත්, 2009




රූපය 5. ත්‍රිවිධ මානවයා - ස්මිත්, 2009




රූපය 6. ත්‍රිවිධ ශාකය - ස්මිත්, 2009

අද අමෙරිකාව, එංගලන්තය, ජර්මනිය, නෙදර්ලන්තය, චීනය, වැනි උසස් තාක්ෂණයන් ඇති රටවල් ග්‍රහ ගමන් අළලා කෘෂි සංවර්ධන ව්‍යාපාර දියත් කරයි. අප රටේ ද පාරම්පරික දැනුම අවදි කිරීම කාලීන අවශ්‍යතාවයකි. එහි විද්‍යානුකූල බව දැනගැනීම නිසා ස්ථාවරතාවය ද, විශ්වාසය ද, රැකේ. ජ්‍යාත්‍යන්තර පිළිගැනීම වන්නේ කාබනික හා ජෛවගතික කෘෂිකාර්මික කටයුතුවලදී මේ සඳහා විශේෂයෙන් සකස් කළ ජෛවගතික ගොවිතැනේ වගාලිත් (Biodynamic Planting Calendars) භාවිතා කිරීමය. විවිධ විද්‍යාඥයින් විසින් විශ්වය පැළෑටි සහ මිනිසා අතර අන්තර් සම්බන්ධකම් මෙසේ නිරීක්ෂණය කර තිබේ.

## පැළෑටි, ජීවීන් හා විශ්වය අතර සම්බන්ධකම්

- සිබ්ලි, 1828 දී භෞතික සහ ගුප්ත විද්‍යාවට පිවිසීම "The key to physics and the occult science" පොතෙහි ජ්‍යොතිෂය ආගම හා බැඳුනු වෛද්‍ය ක්‍රම ගැන සඳහන් කර ඇත. සූර්යාගෙන් ජීවයද, සිඳුගෙන් ප්‍රේමය ද, චමත්කාර බව හා අලස බවද, මෙසේ සියලුම ග්‍රහ තාරකාවන්ගෙන් විවිධ සංකල්පයන් උකහා ගන්නා බව, ලෝකයේ සියලුම ජාතීන් විශ්වාස කරන්නට මේ නිසා පෙළඹුනි.

- ස්වාන්ටේ ඇරනියස්, (1859-1927) සිය කෘතීන් වලද විශ්ව නීතිය (Planetary Law) ප්‍රකාශ කරමින් සඳෙහි බලපෑම, කාලගුණය, පැළෑටි, මිනිසා හා සතුන් කෙරෙහි පවතින අයුරු "Astrology and Diet" පොතෙහි කළ

විවරණයට නොබෙල් ත්‍යාගයකින් පිදුම් ලැබුවේ සංඛ්‍යානමය විමර්ෂණ තුළින් අවබෝධ කරදුන් නිසාය.

- සර් විලියම් හර්ෂල් (1738 - 1822) "Astro Medical Text" හිද, මේ පිළිබඳව විස්තර කර ඇත.

- ක්‍රානිච්, 1976 දී පැළෑටි සහ සියළු දේ ලම්බාකාරව වැඩීම සහ ග්‍රහයින් අතර ඇති සම්බන්ධය පෙන්වීය.

- ලියනාඩෝ ද පීසා, (1170-1250) විසින් තන්තු සහිතව අනුපිළිවෙලට පැළෑටි වර්ධනය සිදුවන වග සොයා ගන්නා ලදී. ඔහු ග්‍රහ වස්තුවල ස්වභාවය නිසා මෙසේ සිදුවන වග කියයි. එය පැළෑටි තන්තුවල අනුක්‍රමිකතාවය (Fibonacci sequence) නමින් හඳුන්වයි. පැළෑටි, මල්පෙති හා ඇටවල අනුක්‍රමිකතාවය 3/8, 5/13, 8/21, 13/34 (ස්වර්ණමය අනුපාතයට) අනුව දකුණට හා වමට සෑදී ඇති අයුරු සොයා ගත්තේය.

- ප්ලේටෝ, (ක්‍රි.පූ. 429 - 348) තරයේම විශ්වාස කළ දෙයකි දෙවියන් වහන්සේ ජ්‍යාමිතික හැඩරුව (Geometrical Patterns) දී ඇති බව මේ නිසා ඔහු පැළෑටිවල ජ්‍යාමිතික හැඩරුව ගැන විශේෂයෙන් අධ්‍යයනය කර කෘෂි කටයුතු වලට යොදා ගන්නා අයුරු පෙන්විය.

- බිල් මොලිසන් 1970 දී ස්වයං පෝෂණ හා සම්පූර්ණ කෘෂි පාරිසරික ක්‍රම සංවර්ධන (Perm Culture) අනුව ගෙවත්තක් නිර්මාණය කිරීම ඉතා වැදගත් බව

අවධාරණය කළේය. සදෘශ්‍ය වන වගා (Analogue Forestry) වැනි පාරිසරික සම්පත් ආරක්‍ෂා කරන ක්‍රමානුකූල වගාවන් ද අනුගමනය කිරීම, ග්‍රහ කිරණ හොඳින් පොළවට වැටීමට කුඩා අඩි පාරවල්, ගල් වැටි, පස් කඳු, අගල්, කාණු සහ සංරක්ෂණ වැටි යෙදීමත් අත්‍යවශ්‍ය බව හඳුන්වා දී ඇත.

- කොලිස්කෝ, (1893-1939) ඛණිජ ලවණ භාවිතා කර නක්ෂත්‍ර කාලය අනුව පැළෑටි වර්ධනය වර්ග කළේය. වාර්ෂික පැළෑටි (Annuals) සඳු හා බුධට අනුව ද ද්වි වාර්ෂික පැළෑටි (Biennials), පඳුරු සිකුරු හා කුජට අනුව ද, සදාකාලික හා (Perenials) තද අරටු සහිත ගස් ගුරුට අනුව ද, කේතුධර හා ඝන පොත්ත සහිත ගෙඩි ඇති ගස් ශනිට අනුව ද, වැඩෙන බව එළිදරව් කළේය.

- ප්‍රාන්ස් රුළිං, $0^0$ - $180^0$ අතර සූර්යයා, සඳු හෝ වෙනත් ග්‍රහයෙකු සප්තමයක (Opposition) සිටින විට ශක්තිමත් ඝන බීජ වැපිරීමට යහපත් බව සොයා ගත්තේය.

- ජෝකිම් ෂූල්ස්, 1948 දී පැළෑටිවල වැඩීම කුජ, ගුරු, ශනි යන දුරස්ථ ග්‍රහයින්ට අනුකූලව වර්ග කළේ ඵල දරන කාලය අනුවය.

ඔහු විශ්වයේ ඇති විවිධ වස්තුවල ස්වරූපය අනුව පැළෑටිවල ජ්‍යාමිතික හැඩරුව සිදුවීම ගැන විශ්ලේෂණය කළේය.

- ජෝර්ජ් ඇඩැම්ස්, 1965 දී පැළෑටිවල ජ්‍යාමිතික හැඩරුව ලොවට හඳුන්වා දී ව්‍යාපෘති දියත් කළේය.

- එම්පිඩෝකල්ස්, ක්‍රි. පූ. 420 දී ආපෝ, තේජෝ, වායෝ සහ පඨවි මූල ධාතු 4 යම් දෙයක් විනාශ නොවී තවත් දෙයකට පරිණාමය වන අයුරු සහ සියළු දේවල පැවැත්මට හේතුවන බව විදාරණය කළේය.

- බුදුරජාණන් වහන්සේ ද සියල්ල වෙනස් නොවී පරිවර්තනය වන බව දේශනා කළ සේක.

- ක්ලෝඩියස් ටොලමි, (100-178) ටෙට්‍රා බයිබ්ලියොස් "Tetra Biblios" ග්‍රන්ථයෙහි විකිරණ අන්තර්ගතය (Ambient Power) අනුව ග්‍රහ ගති හිතකර හා අහිතකර (Benefics & Malefics) යනුවෙන් වෙන් කළේය. පැළෑටිවල සංයුතීන් ශරීරයේ විවිධ අංශවල රෝග සඳහා යොදා ගන්නා අයුරු ද, පැහැදිලි කළේය. වගා කටයුතු සඳහා ග්‍රහ කිරණ යොදා ගන්නා අයුරු කියා දුන්නේය. ඉන්පසු ඒවා මෙසේ වර්ග කළේය.

  - තේජෝ ගණය - මේෂ, සිංහ, ධනු

    (Fruit Trigon) - පලතුරු හා ඇට

  - පඨවි ගණය - වෘෂභ, කන්‍යා, මකර

    (Root Trigon) - මුල්

- ➢ වායෝ ගණය - මිථුන, තුලා, කුම්භ

  (Flower Trigon) - මල්

- ➢ ආපෝ ගණය - කටක, වෘශ්චික, මීන

  (Leaf Trigon) - කොළ

- අපේ ජ්‍යොතිෂ පොත්වල නැකැත් තරු 27 ද මෙම ධාතු 4 ට ද, ආකාශ යැයි තවත් ධාතු ගණයකට ද වෙන්කර ඇත.

  මෙයින් බලාපොරොත්තු වන්නේ යම් දෙයක ස්වරූපය හැඳින ගැනීමය. මේ නැකැත් තරු 27 මුල්කර අප රටේ නැකැත් චාරිත්‍ර විධි අනුගමනය කරයි.

- එක්සොඩස්, ක්‍රි. පූ. 370 වේදී මේ මූල ධාතු සම්බන්ධ කර පළවෙනි වගාලිත් සකස් කළේය.

- ඊ. ෆයිෆර්, 1936 දී ග්‍රහයින්ගේ බලපෑම ලවණ, රසදිය හා ගෙන්දගම්, ග්‍රහ වස්තූන්ගෙන් නික්මෙන චුම්බක කිරණ මිගින් පැළෑටි තුළ නිෂ්පාදනය වන වග මැනවින් විග්‍රහ කළේය. මේ නිසා මිනිසාගේ හා සත්ව සංහතියේ පැවැත්මට උපකාරී වීමට ගොවියාට අනුබලයක් ලැබිණ. ඔහු විසින් විශ්ව සංචලනය අනුව පැළෑටි වර්ධනයේ අවස්ථා 3 ක් මෙසේ විදාරණය කරයි. පැළෑටියක විවිධ අවස්ථා ගෙන්දගම් (Sulphur), රසදිය (Mercury) සහ ලවණ (Salt) වර්ධනය සඳහා අනුගත වන අයුරු මෙසේ පෙන්වා දී තිබේ.

- පැරසිල්සස්, (1490-1541) ස්විස් ජාතිකයෙකි. ඔහු "Astrological Treatises" පොත ලිවීමෙන් පසු ග්‍රහ තාරකාවන්ගේ බලපෑම අවිවාදයෙන් පිළිගන්නට විය. පැරසිල්සස් වෛද්‍යවරයකු හා රසායන විද්‍යාඥයෙක් නිසා ඔහුගේ තීරණය වූයේ තාරකා විද්‍යාව හා ජ්‍යොතිෂ විද්‍යාව වෛද්‍යවරුන් විසින් ප්‍රගුණ කළයුතු වගයි.

  ඔවුන් බුධ ග්‍රහයා වෛද්‍ය සංකේතය (Medical Emblem) සේ හැඳින්වූ වග මරේ විසින් රචිත ප්‍රායෝගික ජ්‍යොතිෂඥයා "The Practical Astrologer" නැමති පොතෙහි සඳහන් කර ඇත.

  ඔහුගේ සංකල්පය වූයේ පැළෑටි සතු ජීවය රඳා ඇත්තේ "The Soul of the Plants Resides in the seven planets" ඒ තුළ බවය. සිතෙහි හා ස්නායු පද්ධතියේ රෝග සඳහා ඛණිජ ලවණ ඇති මුල් ද, පෙනහලු හා හෘද රෝග සඳහා රසදිය ද, ආහාර මාර්ගයේ දෝෂ හා ප්‍රජනන ක්‍රියාවලිය සඳහා මල්, ගෙඩි, පරාග සහ සුවඳ වර්ග ද යොදා ගැනීම ලෝකය පුරා ප්‍රචලිත විය. රාබු ගස කදිම උදාහරණයක් සේ සැළකිය. පැරසිල්සස් පැළෑටිවලට ග්‍රහයින්ගේ බලපෑම, ලවණ (Salt), රසදිය (Mercury) සහ ගෙන්දගම් (Sulphur), ග්‍රහ වස්තූන්ගෙන් නික්මෙන විද්‍යුත් චුම්බක කිරණ මගින් පැළෑටි තුළ නිෂ්පාදනය වන වග මෙසේ පෙන්වයි.

- ලවණ (Salt) චින්තනයට බලපාන වග පෙන්වීය. ළදරු ආහාර වලින් ලුනු ඉවත්කර ඇත්තේ මේ නිසාය. ලවණ නිසා මුල්වල අවක්ෂේපණය (Precipitation) හා ස්පටිකරණය (Crystallization) සීත සෘතුව පුරා ක්‍රියාත්මක වේ. සියල්ලෙහිම ළඟට ඇදගන්නා ස්වරූපය හෙවත් හැකිළීම සිදුවේ.

  පැළෑටි තුළ කැටිගැසීම (Freezing) සංඝණීකරණය (Condensation) අධික වන වග ද සනාථ කළේය.

- ඛණිජ ලවණ මනා ලෙස සංකලනය නොවූ විට, සංවේදීතාවය වැඩිවෙයි. පටක තුළ අසාමාන්‍ය වැඩීමක් ද, කෘමි උවදුරු ද, රෝගාබාධ සිදුවන වග කියයි. තද අරටුව සහිත ගස්වල විකෘතිතා ඇති කරයි.

- ගෙන්දගම් (Sulphur) ශක්තියට බලපාන වග පෙන්විය. ගෙන්දගම් නිසා මෘදු මොළොක් මල් හා පළතුරුවල සුවඳ, වර්ණය, පරාග, පැළෑටි හා කොළ තුළ විසුරුවා හරින වග පෙන්වා ඇත. ද්‍රාවණය (Dissipation) සහ උත්කර්ෂණය (Sublimation) සිදුවන බව පෙන්වා දෙයි. ගෙන්දගම් වලින් කැරට් වලට වර්ණය හා සුවඳ ලැබී ඇත. මෘදු මොළොක් මල්වල, පළතුරු වල, මේ සුවඳ කැපී පෙනේ. වල් පැළ, මල් රේණු, වර්ණ හා තෘණ වර්ග හොඳ උදාහරණයන් ය. එමෙන්ම පොහොරවල ද, පයිනස් ගෙඩිවල ද, අධික සැර ගතියක් ඇත. මෙසේ ගෙන්දගම් අධික වූ විට අප්‍රසන්න ගඳ හා සැරගතිය, ගස පුරා විසිරෙන ලාටු ගතිය ඇති කරයි.

- රසදිය (Mercury) ඉන්ද්‍රියන්ගේ දැනීම කෙරෙහි බලපාන වග පෙන්විය.

පැළෑටි රසදිය නිසා ස්වසනය (Respiration) හා අවශෝෂණය (Assimilation) හා පරිවෘතිය (Transport Function) යන ක්‍රියාවලියන් සිදුවන වග ද, විශේෂයෙන් කොළ සහ කඳෙහි වැඩීම වර්ෂා සහ වසන්ත සමයේදී මෙන්ම ගිම්හානයේ මුල් අවදියේ වේගවත් වන වගද නිර්ණය කළේය. පැරසිල්සස් කියන්නේ ලවණ, රසදිය හා ගෙන්දගම්, අවකාශය පුරා පැතිර පවතින ඊතර ද්‍රව මාධ්‍ය නිසා සමතුලිතතාවය රැකෙන බවය. තුල්‍යතාවයක් නැති විටක පුපුරායාම, දැවීම, කුණු වීම, වියළීම හෝ හැලියාම සිදුවෙන වග අවධාරණය කරයි.

ගැඩවිලි පණුවන් පසට පෝෂණ කොටස් එකතු කරමින් පස් බුරුල් කරමින් පසේ ව්‍යුහයට දායක වන නිසා ගැඩවිලි දියර සකස් කිරීමට පෙළඹිණ. පැළෑටි මිනිසුන් ඉදිරියේදි විද්‍යුත් ශක්ති විභවයක් උරාගනී. කටහඬට විවිධ කෙම් පහන් ක්‍රමවලට සංගීතයට අනුවේදනිය වෙයි. තාමත් අපේ ගම්බද අය එළ ගැන්වීමට පොල් ලෙලි ඇල්ලීම, තඹ කම්බි බැඳීම, ඇණ ගැසීම කරයි. පැළෑටි මිනිසා ඉදිරියේදී ද එක්තරා විද්‍යුත් ශක්තියක් උරා ගනී. සංගීතයට, කටහඬට, විවිධ කෙම් පහන් ක්‍රමවලට, අනුවේදනීය වෙයි.

## පැළෑටීන්ගේ ආකර්ශණය

- ග්‍රෝහ්මන්, 1962 දී විශ්ව තරංගවල බලපෑම පසට උරාගෙන පැළෑටි ව්‍යුහයට උදව් දෙමින් රස ගුණ පිරි ආහාර නිපදවීමට උපකාරි වීම හඳුන්වා දුන්නේය. ස්ටයිනර් සමඟ එක්ව ඔහු තීරණය කළේ පැළෑටි පෘථිවි මතු පිට තිබෙන ඇස් වගේ කියාය. ගිම්හානයේ දී ඇස් ඇර බලා සීත සෘතුවේ දී ඇස් වහගන්නා වග ඔහු විමසිල්ලෙන් බලා ඇත. පැළෑටි සතු ආකර්ෂණීය බව (Magnetic Forces in Plants) ගැන විවරණයක් කළේය.

  සෑම පැළෑටියක්ම විවිධ ග්‍රහ වස්තූන්ගේ කිරණ උරාගනී. මීට අමතරව පැළෑටි තුළ ආකර්ෂණය ද (Magnetic Forces), රූපාකාරය ද (Morphological growth process) ග්‍රහ වස්තූන්ගෙන් උකහා ගන්නා බව වාර්තා වී ඇත. කාබනික ව්‍යුහය සහ අන්තරීක්ෂ බලපෑම් අතර ඇත්තේ විශාල බැඳීමකි. ග්‍රහ වස්තූන්ගේ වෘත්තාකාර බව සහ රිද්මානුකූල (Rhythm) ගමන් නිසා කාලානුරූපීව මිහිපිට ඇති සියල්ලෙහි ස්වරූපය සිදුවේ. සුවදායක පත්‍ර ඔසු හා ආහාර සඳහා ද පැළෑටීන්ගේ වර්ධනය ග්‍රහ තාරකා රිද්මයන් (Epiphenomena) හා සැසඳිය යුතුය.

- ග්‍රහ කිරණ නිසි අයුරු ව්‍යාප්ත නොවූ විට පැළෑටි පටක තුළ අසාමාන්‍ය වැඩීමක් සනිටුහන් කරයි. උදා: ඇල්කලොයිඩ (Alkaloids), කළුවර අඳුරු මුළුවල

මෙවැනි විෂ සහිත, ඇතැම් විට නයිට්‍රජන් අධික පැළෑටි උපදී. මේවායින් අධික මිළ ඇති ඖෂධ මෙන්ම මොළයට අහිතකර මත්ද්‍රව්‍ය නිපදවයි. මොර්ෆීන් (Morphine), ක්වීනින් (Quinine), ඇට්‍රෝපීන් (Atropine), සොක්‍රටීස් මරණයට පත් කළ හෙම්ලොක් (Hemlock), කොකේන් (Cocaine) ඉන් කිහිපයකි. තිල් මොණර ස්ස, කඳුලැස්ස, බාඳුරා නයිට්‍රජන් සතුන්ගෙන් උරා ගනී. නයිට්‍රජන් අධික වූ විට පැළෑටි තුළ කෘමීන් සහ කුඩිත්තන් වර්ධනය වී පැළ විනාශ කරයි. අඳුරු තිත් සහිත බිම් මල් ආහාරයට නුසුදුසු වූවත් ට්‍රෙහලෝස් (Trehalose) නමැති සීනි නිපදවන වටිනා ඖෂධයක් සේ සලකයි.

- රවිගෙන් පැළෑටි ලම්බාකාරීව වැඩීම (Vertical Growth) හා මීට සමගාමීව මල්, කොළ, පෙති, සෑදීමට උපකාරි වීම සිදුවේ. රවි නිසා ජලවාංගිවල රවීගේ සම්භවය කැපී පෙනෙයි. මල් පෙති, ඇට, ඇත් දළ වල චක්‍රාකාර හැඩය ද, ග්‍රහ තාරකාවන් ගේ චුම්බකත්වය හා රූපාකාරය නිසා සිදුවිය. පටක හා තන්තු වැඩීමේ අනුක්‍රමිකතාවය (Fibonacci Sequence) නමින් හඳුන්වයි.

  ලම්බාකාරව හිරු දෙසට සියල්ල ඇදගනී. මේ අතර පැළෑටි වර්ධනයට විශ්ව රිද්ම රටා සියල්ල උරා ගනී.

- සඳුගෙන් මල් ද, මුල් අල්ලා ගැනීමේ ස්වභාවය ද, පෙතිවල සමමිතික බව ද වාර්ෂික පැළෑටිවල ජ්‍යාමිතික

හැඩ ගැන්වීමද සිදුවේ. සඳුගෙන් දෙයාකාරයක සමමිතික රටා ද, බුදගෙන් පෙති 3 ක් ද, සිකුරුගෙන් පෙති 5 ක් ද සැදෙයි. මේ ජීව විද්‍යාත්මක ගවේෂණ නිසා මිනිසා සතුන්, පැළෑටි හා විශ්වය අතර සහ සම්බන්ධතා මන්දපෝෂණය පිටු දැක්මට සංවර්ධන කටයුතු දියත් විය.

➢ කුජගෙන් ඇන්තර (Anther), පරාගධානි (Pollen), පරාගනය (Cross polination), සුවඳ, සර්පිලාකාර හැඩය, ග්‍රහයින්ගේ සාපේක්ෂ වර්ධනයේ පිහිටීමට අනුරූපීව සිදුවීම සමඟම පෙති නටුවට සම්බන්ධ කිරීම ද සිදුවෙයි.

➢ බුධගෙන් කොළ සහ මල්වල වැඩීම සිදුකරයි.

➢ ගුරුගෙන් ගෙඩි ද, පළතුරුවලට අධික පෝෂණය, රසය හා ගුණය පිරෙන බව සොයාගෙන ඇත.

➢ සිකුරුගෙන් පෙති 5, මල් කැකුළු, මල්, පෘථිවි කේන්ද්‍රයට සාපේක්ෂව වර්ධනයේ වැදගත්කම සපුරයි.

ඇපල් ගෙඩියක මදය තුළ රූපාකාරය පුදුමය. කොළ, මල් සහ පෙති හටගැනීමටද උදව් වේ.

➢ ශනිගෙන් ඇට, පයින් ගෙඩිවල කොරපොතු වැනි සිවිය පිහිටන වග හඳුනාගෙන ඇත. කාබනික ව්‍යුහය හා අන්තරික්ෂ රටා අතර පුදුම සහගත සම්බන්ධයක් ඇති නිසා විද්‍යුත් චුම්බක ක්ෂේත්‍රයට අනුකූලව පැළෑටි සහ

සතුන් ප්‍රතිචාර දක්වයි. බිම්මලක සිට විවිධ හැඩතල මැන බැලූ විද්‍යාඥයන්, ජීව විද්‍යානුකූල දැනුම් සම්භාරයක් ලොවට දී ඇත.

සූර්ය්‍ය ලප නිසාද විශේෂයෙන් කුඩා දරුවන්ගේ අක්ෂි රෝග, හැසිරීම් රටා රෝගාබාධවල වර්ධනයක් ඇති බව ද අවධාරණය කරයි. ජලයට යමක් විසිකළ විගස සෙනසුරුගේ වළලු වල සවරූපය කැපී පෙනෙයි.

විද්‍යාඥයින් අධි පෝෂණය සඳහා ජෛවගතික කෘෂිකාර්මික නිෂ්පාදන නිර්දේශ කරන්නේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහාය. ඔවුන්ගේ මතය ප්‍රෝටීන් පරිවෘතිය අකාර්මික වීමෙන් යූරික් අම්ලය සයනයිඩ් බවට පත්වන වගය. නයිට්‍රජන් සෘණ හා ධන තුලන දෙකම අහිතකර බව පැහැදිලි කරයි. හිරු එළිය දැඩි ලෙස ලැබෙන විට විෂ සහිත පැළෑටි නිපදවීම මර්ධනය වේ. අපේ පැරණි අය කැලෑ කපා ගිනි තියා ග්‍රහ කිරණ පොළොවට වැටීමට ඉඩ සලස්වා ඇත්තේ මේ නිසා විය හැකිය.

ජර්මනියේ මැද මිදුල (Mid Guard) සහිත ගෙවල් ග්‍රහ කිරණ හොඳින් වැටීමට සලස්වන වග කියයි. ඇත් බානකට යන්නට ඉඩ තියා වැට අයින ඉඩ හැරීමට පැරණි අය වෙහෙසක් ගත්තේ පුස් වගී වැඩීමට තියෙන අවස්ථාව වැලැක්වීමටය.

මාරියා තුං (1902-2002) ජෛවගතික කෘෂි කටයුතු සඳහා ඇගේ ජීවිතයම ගත කළ ගෙවිලියකි. ඇය ආපෝ, තේජෝ, වායෝ, පඨවි ධාතු එක්කර විශ්වය හා පැළෑටි සම්බන්ධ

පාරම්පරික දැනුම් සම්භාරයක් තියුණු ලෙස විමර්ෂණය කළාය. ඇය සතු මේ අගයන් ලොව මවිතයට පත් කරන්නට සමත් විය. ජර්මන් ජාතිකයින්ට ප්‍රාතිහාර්යක් වූ ඇය ලෝකයේ උසස්ම විද්‍යාඥවරියක් ද විය. ඇගේ පුත් මාතියාස් හා එක්ව ලොවට දායාද කළ එක් දෙයකි තරු රටා අනුව වගා කිරීම.

"Working with the Stars" කියා ලියූ පොත් සහ වගා ලිත. ඇය මුල්, මල්, කොළ, පළතුරු ප්‍රධාන කොටස් 4 ට විශ්ව රිද්ම රටා මැව්වාය. ඇය සඳේ රිද්ම රටා අනුව වගා කිරීම "Moon Sign Planting" නිර්දේශ කළාය. 1972 දී ඉතා සරුසාර පෝෂණීය රාබු වගාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස ජෛවගතික පොහොර නිෂ්පාදනය හඳුන්වා දුන්නීය. ඇය ලොවට අළුත් විද්‍යාවක් බිහිකළ ශ්‍රේෂ්ඨ විද්‍යාඥවරියකි. ඇය සඳේ කලා, නෝඩ, ග්‍රහණ, සංවර්‍ත ගැන විශිෂ්ඨ අධ්‍යනයක් කළාය.

ෆ්‍රාන්ස් රැළිනී, වොච්ස්මත්ගේ විශ්ව රිද්ම රටා හොඳින් ග්‍රහණය කළ නිසා මුල්, කොළ, මල්, පළතුරු ධාතු 4 ට අනුගාමීව කෘෂි කටයුතු නිර්දේශ කළාය.

ලිලී කොලිස්කෝ (1893 - 1939) සඳේ චක්‍ර 5 ද මැනවින් මේ හා සසඳා ඉන් පැළෑටි වර්ධනය වේගවත් කිරීමට ඇය කාබනික පොහොර නිෂ්පාදනයට ද විශේෂ තැනක් දුන් නිසා සියළුම විද්‍යාඥවරුන්ගේ සහාය ඇයට ලැබිණි. ඔවුන්ට ද ඇගේ පර්යේෂණ ප්‍රාතිහාර්යයක් විය. නිරෝගී

නිෂ්පාදන සඳහා විශ්ව තරංග ඇදා ගැනීමේ රහස ලොවට කියා දුන්නාය.

වගා ලිත් භාවිතය තුළින් විශ්වයේ ඇති ශක්තීන් පැළෑටිවලට ඇතුල් කරගැනීමට ඇය සමත්විය. ග්‍රහයින්ගේ රාශී ගතවීම ගැන අවබෝධය ඉතාම ප්‍රයෝජනවත් විය. ග්‍රහ ගමන් අනුව අස්වැන්න නෙලීමට, පැළ ගලවා සිටුවීමට, වගා කටයුතුවලට, කප්පාදු කිරීමට, රැස්කිරීමට කාලය වගා ලිතට අනුකූලව කරන්නට මැනවින් උපදෙස් දුන්නීය. අළුතින් හාන ලද කුඹුර, පස් බුරුල් කළ බිමේ වර්ධන වේගය වැඩිවන වග අවධාරණය කළාය. කාලගුණික විපර්යාසයන් හඳුනා ගැනීමට වගා ලිත් බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ගස් ගල්වල, පැපිරස් පතුරුවල, සොහොන් කොත්වල, ඕලා කොළවල ද ලියා තැබූ පාරම්පරික දැනුම ද විවිධ ඍෂිවරුන්ගේ ඉගැන්වීම්ද මැනවින් ප්‍රගුණ කළාය.

මාරියා තුං සඳුගේ හෝ වෙනත් ග්‍රහයෙකුගේ සප්තමයකදී ශක්තිමත් ඝන බීජ වැපිරීමට සුදුසු බව අනුමත කළාය. සිළිකා 50% මිශ්‍රණය ඉසීමටද මෙම කාලය නිර්දේශිතය. ගුණාත්මකභාවය, රෝග නැසීම, දිළීර මර්ධනය, බීජවල තෙත් ස්වභාවය රඳවාගැනීම, ඇගේ බලාපොරොත්තු සපුරාගැනීමට හැකිවිය. ජර්මන් ජාතිකයිනට සඳු හා සම්බන්ධ කාබනික පොහොර භාවිතය ගැන මාරියා තුංගේ සංකල්ප ප්‍රාතිහාර්යයක් විය. විශ්ව රටා ඇඳා ගැනීම පැලයක ස්වරූපය, ප්‍රමාණය හා රස පිළිබඳ රහස අනාවරණය විය.

ඈ ලියූ පොත් සමඟ තාරකා අනුව වගා කිරීම් (Woking with the stars) ලෝකය පුරා ජනප්‍රිය විය. ඇය අස්වැන්න නෙලීමට මුල් සහ පළතුරු දින ද අනුමත කළාය. ඇය කෘෂිකර්මයට අළුත් විද්‍යාවක් එක් කළ ලෝකයේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥවරියකි. ලිලී කොලිස්කෝ පුරහඳ චක්‍රය ගැන විශේෂ ගවේෂණයක් කළේය. පෙරදිග පුරහඳ චක්‍රය ගැන විශේෂ ගවේෂණයක් කළේය. පෙරදිග පුරහඳ හා අව හඳ චක්‍ර 2 ට පමණක් අවධානය යොමු කළ අතර, ඔහු වගා කටයුතු සඳහා සඳෙහි බලපෑම චක්‍ර 5 කට බෙදා වෙන් කළේය. මාරියා තුං මෙන්ම ඇමෙරිකාව, ජර්මනිය හා එංගලන්තය සඳ ගමන් අලලා වගා කිරීමට මුල්තැන දී තිබේ. ජ්‍යොතිෂය ගැන තිබූ වැරදි මත බිඳ හෙළීමට තාරකා විද්‍යාත්මක ගවේෂණ සමත් වී ඇත.

ඔවුන් වැදගත් දෙයක් හැටියට සලකන්නේ මිත්‍ර බෝග (Companion planting) වගාවයි. නුසුදුසු අවස්ථාවල ඉන්දන පැළවලට බාධක සිදුවේ. විශේෂයෙන් බටහිර රටවල ද මූල ධාතු 4 ට අනුකූලව පැළෑටි, මිනිසා හා සතුන් වැඩෙන වග විශ්වාස කරයි. කෘෂි කටයුතු වලදී මිනිසාට හා සතුන්ට අවශ්‍ය පෝෂණ ක්‍රියාවලිය වගා ලිත් තුළින් ග්‍රහ කිරණ නිසි අයුරින් ව්‍යාප්ත වන අවස්ථා තෝරා ගැනීමෙන් සමතුලිතභාවය රැකගත හැකිය. පෞරුෂ වර්ධනයට හොඳ රුකුලක් ද ලැබිය හැකිය. ජල රාශි සාරවත් එලබර නිසා සශ්‍රීක බව මල් ගණයට අයිති නමුත් කොළ දිනවල වගා කලොත් ප්‍රතිඵල ඉතා සතුටුදායක බව ඇය කියයි.

- රුඩොල්ෆ් ස්ටයිනර්, (1860-1925) කායික හා මානසික ආබාධිතයන්ට විශේෂයෙන් ඖෂධීය නිෂ්පාදන සඳහා ඔසු පැළ වගාවට ද ප්‍රමාණයට (Quantity) වඩා උසස් තත්වය සුරැකීමටද, (Quality) උවදුරු ගැනද සොයා යන්නට විය. ඔහුද ශනි, සඳු, සප්තම වලින් උපරිම ප්‍රයෝජන ගන්නට විය. සිලිකා හා රසායනික ද්‍රව්‍යවල සමබරතාවය ශාක වැඩීමට යෝග්‍ය බව අවධාරණය විය. ග්‍රහයින්ගේ හා කැල්සියම්වල සම්බන්ධතා අතර අන්තර් ක්‍රියාවලිය ඔහු විසින් හොඳින් අවබෝධ කරගන්නා ලදි. 1924 දී කොබර් විච් හිදී කරන ලද දේශන 8 ක් ලෝක ප්‍රසිද්ධ විය. ඔහු ජෛවගතික කෘෂිකාර්මික කටයුතුවල නිර්මාතෘවරයාය.

ගොවීන් විසින් ස්වාභාවිකව පවත්වාගෙන ආ දැනුම් සම්භාරයට ආලෝකය හා බුද්ධිය එක් කළේය. ඔහු අනුගමනය කළේ ද ග්‍රීක දර්ශනවාදීන් මෙන්ම අපෝ, තේජෝ, වායෝ, පඨවි ධාතු 4 ට සමගාමීවය. මධ්‍යකාලීන ගෙවතු වගාවන් ඔහු ඉහළින්ම අගය කළේය. අභිචාර විධි අගය කරමින් ආගමික සබඳතාවයන් එකහෙළා අනුගමනය කරන්නට විය. අභිචාර විධි අගය මැන බැලුවේය. මීළඟට අවධානය යොමු කළේ රාශි චක්‍රය, තාරකා මණ්ඩලය හා පැළෑටි වර්ධනයේ දැකිය හැකි පුදුමාකාර සම්බන්ධකම් ගැනය. විවිධ විද්‍යාඥයින් විසින් සඳ ගමන් අනුව වගා කටයුතු ගැන කළ නිරීක්ෂණ වලට අවනත විය.

ග්‍රහ කිරණ වලට ඕනෑම දෙයක් අවනත වන වග මොහු පිළිගත් බව උණ චක්‍රය (Fever curves) සහ ස්ත්‍රීන්ගේ ඔසප් චක්‍රය (Menstrual Cycle) විශ්වයේ ආශ්චර්යමත් සංසිද්ධීන්ගේ ප්‍රභවයන් හේතුවන බව නිගමනය කළේය. ඒවා අංශක ගණන්වලින් වෙනස්වන අයුරු ඔහු පැහැදිලි කළේය. මෙසේ වන්නේ විශ්වයේ ඇදෙන ගුරුත්ව බලයයි.

ඉන් නිකුත්වන බලවේග (Ambient Power) වලින් අපව ද, පැළෑටි ද ඇඳ බැඳ දමයි. ඔහු හෝමියෝපති ක්‍රමයට ඈට පැළවීම වේගවත් කිරීමට හා කෘමි උවදුරු මර්ධනයට, ද්‍රාවන ඉසීමට නිර්දේශ කළේය.

වනාන්තර, බඩවැටි, බිම්මල් පිපෙන තෘණ භූමිවල මිනිස් කටයුතු, වායුගෝලීය සහ භූගෝලීය සාධක හොඳින් පවත්වන වෙලාව බලා නිම කිරීමට ගොවීන් පෙළඹී විය. කෘෂි කටයුතු ක්‍රමවත් නම් ස්වයං පෝෂණය ඇති කරයි. මින් බුද්ධිය වර්ධනයද විවිධ කලා කුසලතා ද ගෘහ නිර්මාණ ශිල්පයද සියළුම විද්‍යාවන්ගේ දියුණුවද ඇති විය. කාර්මික විප්ලවය නිසා සියල්ල වෙනස් විය.

- කෘෂි හා කෘෂි රසායන, පලිබෝධ නාශක ඉසිමින් ධාන්‍ය වගාවටත්, වෙළඳ බෝගවලටත් කෙමෙන් පරිවර්තනය විය. මේ නිසා ගෙවතු වගාවන් අත්හැර දැමීමට සිදුවිය. ස්වභාවික පරිසරයෙන් මිනිසා ඈත් විය. ස්වභාවික සම්පත් විනාශවීම නිසා විපරිත දේශගුණික තත්වයන් ද උදා විය. ඉන්පසු විශාල පරිසර හානියක් සිදුවෙමින් පවතී. (Environmental Pollution). දැව කපා දැමීම නිසා ජීවින්ට ද, වන වගාවන්ට

ද හානි විය. පසෙහි ඛණිජ ලවණ විනාශ විය. ජලාශවලට විෂ ද්‍රව්‍ය එක්විය. පරිසර හානිය නිසා සමතුල්‍යතාවය නැති විය. පළමුවෙනි ලෝක සංග්‍රාමය නිසා ඇති වූ පාඩු පිරිමැසීමට දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු නව මං පෙත් සෙවීමට සිදුවිය. කාබනික ගොවිතැනට අවතීර්ණ වීමට රුඩොල්ෆ් ස්ටයිනර්ට ඇල්බට් හෝවාඩ් (1873 -1948) ආශීර්වාදයක් විය. ඔවුන්ගේ සංකල්පය වූයේ විද්‍යාවෙන් මිනිසාට පිහිටවීමට හැකි බවය. පොහොර නිෂ්පාදනයට විද්‍යා දැනුම අත්‍යාවශ්‍ය විය.

ඔවුන්ගේ නිගමනය කෘෂි රසායන සංයෝග මඟින් ජීවීන්ගේ පැවැත්මට හානිය නැති කිරීමට ස්වාභාවික බලයට අයත් සතර මහා භූතවල පිහිට පැතිය යුතු බවය. විසිවෙනි සියවසට ආපෝ, තේජෝ, වායෝ, පඨවි, භූත 4 ට අනුව වගා කටයුතු විද්‍යානුකූල ස්වරූපයකින් ආරම්භ විය. ආධ්‍යාත්මික ගුණ වගා කළ මනෝ සංකල්පයන්ට අනුව ඉපැරණි වගා ක්‍රම එළිමහනට ගෙන ආවේ ඉමහත් හරසරිනි. චීනය ද කාබනික ගොවිතැන නිසා සියළුම අවශ්‍යතාවයන් සපුරාගත් රටකි. ජෛව විවිධත්වය කැටි කරන මගක් ලෙස කාබනික හා ජෛවගතික වගා ක්‍රම නව ලොවට මූල ධාතු 4 විශාල ආශිර්වාදයකි. රුඩොල්ෆ් ස්ටයිනර්ගේ මේ ඉපැරණි මතක සටහන් අවදි කිරීම ලොවට සෙතක් විය. අප රටේ පවුල් සංස්ථා තුළ හිරවී සිටි අය සංස්කෘතික හා සමාජමය විප්ලවයක් ඇති කළේ කෘෂි කටයුතුවලට සහභාගීවීම නිසා විය හැකිය. වැඩ බෙදාගැනීම, ආහාරපාන බෙදාගැනීම, සතුට, ආවාහ-විවාහ සිරිත් විරිත්, මානසික හා ශාරීරික සංවර්ධනය යළි

ඇති විය. බටහිර වැසියන් අවදි කළේ ඔහුය. 1924 දී ජෛවගතික කෘෂි සංවර්ධන නව මුහුණුවරකින් දියත් විය. 1950 දී කෘෂිකාර්මික විධිමත් ශාස්ත්‍රීය නිබන්ධන එළිදැක්විණි. 1957 දී කෘෂිකාර්මික සංග්‍රහය "Agricultural Treatment" නිබන්ධයෙන් පසු විශාල පෙරළියක් ඇතිවිය. අමෙරිකානුවන් ද පස, සෞඛ්‍ය හා කාබනික ගොවිතැන "Soil & Health, Organic Gardening & farming" පොත එළි දැක්විය.

ඉන්පසු මහා බ්‍රිතාන්‍ය, යුරෝපා මහාද්වීපය ස්වභාවික කෘෂි සංවර්ධන ක්‍රමවලට අනුගත විය. රුඩොල්ෆ් ස්ටයිනර් අප ගන්නා ආහාරවල පෝෂණ ගුණ, විශ්වයෙන්, විශ්ව ශක්තීන්ගෙන් කොටසක් ද ලබා ගත හැකි බව විවරණය කළේය.

බුදුරජාණන් වහන්සේ ද ආහාර හා පෝෂණය ගැන මෙසේ දේශනා කළ සේක. ආයුෂ (Long life), වර්ණ (Complexion), සැප (Comfort), බල (Energy) සහ ප්‍රඥා (Wisdom) වර්ධනය සඳහා ආහාර අවශ්‍ය බවය. නූතන විද්‍යාඥයින්ගේ මතය ආහාරවලට අමතරව උදේ 9 සිට 10 දක්වා හිරු එළිය, මිහිරි සංගීතය හා දැකුම්කළු පරිසරයක් ද අවශ්‍ය බවය. ඒවා සිරුර වැඩීම ක්‍රමවත් කරයි. අස්ථිවල මනා වර්ධනයට ද දායක වී අස්ථි විකෘතිතා වළක්වයි. බිළිඳුන්ගේ අක්ෂි ක්‍රමවත් වර්ධනයට හිරු එළියට අනාවරණය කරයි. හිරු එළියේ වේලෙන ආහාර වර්ග ද විටමින් D පරිවෘත්තියට බෙහෙවින් හිතකර බව කියයි. ශරීරයේ ක්‍රමවත් වැඩීමට

පොළොවෙන් ලැබෙන පෝෂක කොටස් ගැන දැඩි අවධානයක් යොමු කිරීම අගනේය. පැළෑටිවල අන්තර්ගත ඛණිජ ශක්ති වර්ධනය කරන අතර, ආහාර දිරවීමෙන් ඉන්ද්‍රිය පද්ධතිය තුළ දී ප්‍රෝටීන් ද ශක්ති බවට පරිවර්තනය වන වග ඔහු පෙන්වා දෙයි. සතුන්, ජීවත් වීම සඳහා පමණක් ආහාර ගනී. මිනිසා මානසික සංවර්ධනය සඳහා ද ආහාර ගත යුතුය.

ළදරු ආහාර වල ලුණු අතිශයින්ම අඩු කළ යුත්තේ මොළයේ ක්‍රියාකාරිත්වයට හානිවන බැවිනි. ඇතැම් ළදරු ආහාරවලට ඛණිජ ලවණ ද පාලනය කර ඇත. රුඩොල්ෆ් ස්ටයිනර්ගේ දේශන වලින් ග්‍රහ කිරණ පෝෂණ ක්‍රියාවලිය ශක්තිමත් කරන අතර කෘෂිකාර්මික කටයුතුවලින් පෝෂණයට මුල්තැනදීම කළ යුතුය. ඊට හේතුව ඔජෝ ගුණය අන්තරීක්ෂ ශක්තීන් උරාගෙන ආහාර මගින් මිනිස් සිරුරේ විවිධ ඉන්ද්‍රියන් කරා ගෙන යන බැවින් ජෛවගතික නිෂ්පාදන මෙම ක්‍රියාවලියේ දි සුවිශාල මෙහෙයක් ඉටුකරයි.

ලේ ධාතුවට ඛණිජ ලවණ තුලනයක් තිබීම අගනේ යැයි ඔහුගේ සොයා ගැනීම්වලට අනුව අවධාරණය කරයි. පෘථිවිය මතුපිට හා යට සූර්යා හා ග්‍රහ ශක්තීන් පැළෑටි තුළට ගබඩා කර ගන්නා අයුරු ඔහු පෙන්වා දෙයි. අධික පෝෂණ ගුණ හා කායික හා මානසික ශක්ති වර්ධක හා චිකිත්සක ආහාර තුළ අන්තර්ගතය. පළතුරු අන්තරීක්ෂ ශක්තියෙන් හා සන්නිවේදන කම්පනයන් බෙහෙවින් උරා ගනී. ඉපැරණි කියමනක් ඇත. "වෙදතුම කලකට නොඑන්න, දිනකට ඇපලයක් ගන්න" ඒ එහි තුළ අන්තර්ගත ඛණිජ ලවණ

ප්‍රමාණය අධික බැවිනි. රුඩොල්ෆ් ස්ටයිනර්ගේ මතය වන්නේ රසායනික පොහොරවලින් ප්‍රමාණය වැඩි කළත් ගුණාත්මක බව අඩු කරන බවය. කැල්සියම් වායුගෝලීය සාධක ආකර්ශනීය කරගනී. මේ නිසා සිලිකා මාධ්‍යයක් තුළදී මෙම ක්‍රියාවලිය සිදුවන නිසා හරක් අං වලට සිලිකා පුරවා පොහොරවල පත්ලෙහි තැන්පත් කරයි.

මේ ක්‍රමයට ග්‍රහ කිරණ අධිකව ලබාගැනීමට ජෛවගතික කෘෂි රටාවන් සමත් වී ඇත. සෑම පැළෑටියකම වර්ධනය තාරකාවන්ගේ රිද්ම රටාවන්ට අනුකූලව සිදුවේ. පැළෑටි, සතුන්, පස, මිනිසා එක්ව පරිසර පද්ධතීන් නිර්මාණය වෙයි. ස්ටයිනර්ගේ ඉගැන්වීම්වලට අනුකූලව ඇමෙරිකාව, ජර්මනිය, එංගලන්තය, චීනය, ඉන්දියාව, නෙදර්ලන්තය, ඕස්ට්‍රේලියාව වැනි දියුණු රටවල ජෛවගතික වගාලිත් භාවිතකර කෘෂිකාර්මික කටයුතු දියත් කරයි. මේ නිෂ්පාදන අධික පෝෂණ ගුණයෙන් යුතු නිසා වටිනාකමෙන් ද, මිලෙන් ද, ඉහළය. මීට හේතුව රසායනික සංයෝග සියල්ල වලක්වා ස්වාභාවික පරිසරයක වැඩෙන්නට සැලැස්වීම අවශ්‍ය බැවිනි. ළදරු ආහාර සඳහා විශේෂයෙන් නිර්දේශිතය. ශ්‍රී ලංකාවේ ද විවිධ ග්‍රහ ගමන් හා සඳ ගමන් අලලා නැකැත් සෑදීම ඈත අතීතයේ සිටම සිදුකරයි. මෙහිදී විශේෂ අවධානය යොමු කරන්නේ නැකැත් හා අභිචාර විධිවලටය. ජ්‍යොතිෂය අනුව ජෛවගතික වගාලිත් වල සියළුම ග්‍රහයින් සම්බන්ධ විවිධ අවස්ථා ඇතුලත් කර ආපෝ, තේජෝ, වායෝ සහ පඨවි භූත 4 ට අනුව වගා කටයුතු නිර්දේශ කර තිබේ.

- ජෙනිකින්, 1972 දී පරිස්සම් වීම සුව කිරීමට වඩා හිතකර බව අවධාරණය කළේය. (Prevention is better than cure)

  මේ අතර ප්‍රභාසංස්ලේෂණයේ දී මිනිසුන් හා සතුන් බැහැරලන අපද්‍රව්‍ය පැළෑටිවලද ව්‍යුහය හා ස්වරූපය ඇති කරන මුලද්‍රව්‍ය සේ හැඳින්විය. විශ්වයේ ඇතුළත හා පිටත ඇති ශක්ති කදම්භ සියල්ලම එකිනෙකට සම්බන්ධ නිසා විශ්ව නීතිය අනුව අප සොබාදහමට අයත් නීති පද්ධතිය තුළ සිර වී සිටින්නෙමුයි කීවේය.

- රේචල් කාසන්ගේ නිසල වසන්තය "Silent Spring" පොත නිසා පාරිසරික වගා ක්‍රමවලට ලෝකයා නැඹුරු විය.

- ඇල්බට් හොවාඩ්, 1972 දී පාරම්පරික ගැමි සංකල්ප අගයමින් ස්වාභාවික පොහොර නිෂ්පාදනයට දායක විය. ඔහු ද ආගමික පසුබිමක පෝෂණ තත්වයෙන් උසස් කෘෂි නිෂ්පාදන බිහිකරන්නට විය. ඔහුගේ අදහස වූයේ ද, උසස්ම වර්ගයේ කෘෂි ව්‍යාපාර ජෛවගතික වගා නිර්දේශ අනුව කළයුතු බවය. ග්‍රීක දර්ශණවාදීන් උගැන්වූ ලෙස මූල ධාතු 4 සම්බන්ධකර පොකුරු වතු වගා ක්‍රමය ක්‍රමවත් ලෙස සකස් කළේය. ඔහු ද මිනිසා (Microcosm) සහ විශ්වය (Macrocosm) අතර සම්බන්ධකම් වර්ධනය කිරීමට වෙහෙසිණි. ග්‍රහ බලපෑම් මත මිනිසාට ආවේණික ගුප්ත බලවේග වල ක්‍රියාකාරිත්වය සනාථ කළේය.

ගැමියන්ට ආවේණික පරිසර හිතකාමී වගා ක්‍රම දිරිගැන්විය. බඩවැටිවලින් කුරුළු කෙවිල්ලන්ට ආවරණ සැලැස්විය. ස්ටයිනර් මෙන්ම මූල ධාතුවලට අනුකූලව වගා ක්‍රම හා විධි ඇගයීමට ලක් කර තෘණ භූමි වලින් සතුන් පෝෂණය කර කිරි හා ගොම මිනිස් පරිභෝජනයට ගන්නට සැලැස්විය. පෙර අපර දෙකෙහිම ජෛව විවිධත්වයට අලංකාරයට සහ ජීවනයට මුල්තැන දුන්නේය. ශත වර්ෂයක කාලයක් විවිධාංගීකරණයට ලක්වෙමින් නව පර්යේෂණ කරමින් තාරකා විද්‍යානුකූලව ජ්‍යොතිෂ විද්‍යාත්මක සොයාගැනීම් සමඟ පරිසරය හා ගැටෙමින් විද්‍යානුකූල පිළිවෙත් අනුව ජෛවගතික අධි පෝෂණීය ආහාර නිෂ්පාදනයට යොමුවීම මිහිපිට කාගේත් වාසනාවකි.

නයිට්‍රජන් අන්තරීක්ෂ බලවේගයන් සහ ජීව මුලයක් එක් කරන මැදිහත්කරුවෙක් වී කොළ වලට හරිත වර්ණය දෙන්නේ ක්ලොරෆිල් (Chlorophyl) වලින්ය. ෆොස්ෆරස් - හොඳ මල්ද, සීනි පරිවෘත්තියද අලිබියුමින් අධික ඇට සහ ගෙඩි ද නිපදවයි. පොටෑසියම් - මුල් වර්ධනය සඳහාද දායක වේ. පැළෑටි තුළ ඇති අත්‍යාවශ්‍ය නයිට්‍රජන් සංයුතියන් ඇමයිනෝ අම්ල නිපදවා, පැළෑටි ප්‍රෝටීන් බවට පරිවර්තනය කරයි. මේ නිසා මල්, සුවඳ, මිනිස් සිරුරට අවශ්‍ය පෝෂණ ක්‍රියාවලිය ක්‍රමවත් කරයි. ස්ටයිනර්, ග්‍රෝහ්මන් වැනි විද්වතුන් අධි පෝෂණය සඳහා ජෛවගතික කෘෂිකාර්මික නිෂ්පාදන නිර්දේශ කරන්නේ මේ නිසාය.

ප්‍රෝටීන් පරිවෘත්තිය අකාර්මික වීමෙන් යූරික් අම්ලය සයනයිඩ් බවට පත්වේ. නයිට්‍රජන් ඍණ හා ධන තුලන

දෙකම අහිතකරයි. හිරු එළිය දැඩි ලෙස ලැබෙන විට විෂ සහිත පැළෑටි නිපදවීම මර්දනය වේ. මෙම විෂ වර්ග, මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට උපයෝගී කර ගනී. මිනිස් සිරුරට බෙහෙවින් අහිතකරය. මොළය විකෘති කර අපස්මාරය, අසාතය, මුළාව, නිර්වින්දනය, ස්නායු දුර්වල වීම, පුස් වර්ග වර්ධනය වීම නිසා මරණයද සිදුවේ. උදාඃ ඇට්‍රොපින් (Atropine), හැදීමට ගන්නා අත්තන ශාකය, යකාගේ හොරණෑව (Devil's trumpet) යනුවෙන් හඳුන්වන්නේ මේ නිසාය.

- නයිට්‍රජන් (Nitrogen)ඃ නයිට්‍රජන් අන්තරීක්ෂ බලවේගයන් සහ ජීව මූලයන් එක කරන මැදිහත් කරුවෙක් වී කොළවලට හරිත වර්ණය ලබාදෙන්නේ ක්ලෝරෝෆිල් (Chlorophyl) වලින්ය.

- කැල්සියම් (Calcium)ඃ විශ්ව රිද්ම රටා හා ආධ්‍යාත්මික පුනරාවර්ත සංකේත අතර සබැඳියාව එකට පුරුද්දන පාලමක් සේ ක්‍රියා කරයි. විශ්ව සංවේදීතාවයන් ජීවී ගතියෙන් පවත්වාගනී. මේ අතර කැල්සියම්, ඔක්සිජන් හා දිව්‍යමය දියරයන් පෘථිවියට ඇදගනී. පස මාධ්‍යකරුවෙකු සේ පැළෑටි හා සත්ව අපද්‍රව්‍ය එක්කරයි.

- ෆොස්ෆරස් (Phosphorous)ඃ හොඳ මල් ද, සීනි පරිවෘතිය ද, ඇල්බියුමින් අධික ඇට සහ ගෙඩිද නිපදවයි. පළතුරුවල රසය හා පෝෂණය දෙයි.

- පොටෑසියම් (Potassium): මුල් වර්ධනය සඳහා ක්‍රියා කරයි. පැළෑටි තුළ ඇති අත්‍යවශ්‍ය නයිට්‍රජන් සංයුතීන් ඇමයිනෝ අම්ල නිපදවා, පැළෑටි ප්‍රෝටීන් බවට පරිවර්තනය කරයි.

තද හිරු රැසින් වී මල් පුබුදින විට සඳ රැසින් කුමුදු පිපෙයි. මේ ක්‍රියාවලිය ප්‍රහර්ෂණයයි (Ecstatic). සෑම පැළෑටියක්ම විවිධ ග්‍රහ වස්තූන්ගේ කිරණ උරා ගනී. රවීගෙන් හිරු රැස් පැළෑටි ලම්බාකාරීව (Vertical Growth) හා ගසේ කඳ වැඩීමට සලස්වයි. සිදුගෙන් මුල් ද, බුධගෙන් මල් සහ කොළ ද, සිකුරුගෙන් කොළ, මල් සහ පෙති ද, ගුරුගෙන් ගෙඩි ද, ශනිගෙන් ඇට ද, අඟහරුගෙන් පරාගධානි (Anther) සහ පරාග ද (Pollen) සෑදෙන අයුරු විවිධ විද්‍යාඥයින් විසින් සොයාගන්නා ලදි. මීට අමතරව පැළෑටි තුළ ආකර්ශනය ද (Magnetic forces), රූපාකාරයද (Morphological growth process) ග්‍රහ වස්තූන්ගෙන් උකහා ගන්නා බව වාර්තා වී ඇත. කාබනික ව්‍යුහය සහ අන්තරීක්ෂ බලපෑම් අතර ඇත්තේ විශාල සම්බන්ධයකි.

- බිල් මොලිසන් 1928 දී කළ ස්වයංපෝෂණ හා පරිපූර්ණ කෘෂි පාරිසරික ක්‍රම සංවර්ධන (Perm Culture) අනුගමනය කළ හැකිය. දැඩි අඳුර හා ගස් වලින් හෝ නිවාස වලින් එන සෙවනැලිද ඉවත් කළ යුතුය. රාහු කේතු ඡායා ග්‍රහයින්ගෙන් එන අඳුරු  සෙවනැලි කෘෂිකාර්මික කටයුතු වලදී දැඩි සේ ඉවත් කරන්නේ මේ නිසාය. ලෝකයේ අනෙක් රටවල මෙවැනි නෝඩ

(Nodes) අවස්ථාවලදී පැය 12 ක් පෙර සහ පැය 12 ක් පසුව වගා කටයුතු වලින් වළකී. කුජ, බුධ, සිකුරු ගේ නෝඩ අවස්ථා බෙහෙවින් හානි කර නිසා පැය 24 ක් වැඩ නොකළ යුතු බව අවධාරණය කරයි. සුවදායක පත්‍ය ඔසු හා ආහාර සඳහා පැළෑටීන්ගේ වර්ධනය ග්‍රහ තාරකා රිද්මයන් (Epiphenomena) හා සැසඳිය යුතුය.

- ජාත්‍යන්තර පිළිගැනීම වන්නේ ජෛවගතික කෘෂිකාර්මික කටයුතු වලදී මේ සඳහා විශේෂයෙන් සකස් කළ ජෛවගතික ගොවිතැනේ වගා ලිත Biodynamic planting calendars" භාවිත කිරීමයි.

උසස්ම ගුණයේ පෝෂණ ක්‍රියාවලියක් සඳහා අප ගන්නා ආහාර මගින් කිරණ සමග ද්‍රව්‍ය හා ගෝලීය ආවේජනයන් (Rejuanations) මිනිස් සිරුර තුළට පරිවර්තනය කරගන්නේ, ජීරණ පද්ධතිය මඟිනි. පැළෑටි සත්ව හා අන්තරීක්ෂ කිරණ මගින් සිලිකා මාධ්‍ය තුළින් පසෙන් ලබා ගන්නා පෝෂණ ගුණයන් උරාගෙන වැඩේ. මිලි. මීටර් 05 ක ඝණත්වයෙන් යුතු පෘථිවි තුනී තීරුවක් අන්තරීක්ෂ කිරණ උරාගන්නා කොළ වදුල පෘථිවිය මතුපිට ඇත. පෘථිවිය මතුපිට පස, අන්තරීක්ෂ කිරණ සිලිකා මාධ්‍යක් තුළින් උරාගෙන පැළෑටීන්ගේ වැඩීම සඳහා නැවත මුදාහරී. සිලිකා පිරවූ හරක් අං සහ එළු අං පොහොර වල පතුලෙහි තැන්පත් කර ඒ මත මිශ්‍රණ යෙදීමෙන් මේ කාර්යය හොඳින් සිදුවන වග නිර්දේශිතයි. පසෙහි ඇති කැල්සියම් වායු ගෝලයෙහි අන්තර්ගත ශක්තීන් උරාගෙන පැළෑටි වර්ධනයට දායක වේ. පස

සියළුම ශක්තීන් එක්තැන් කරන මාධ්‍යයි. මිනිසා හා සතුන් බැහැර කරන දේද පැලෑටි වර්ධනයකි. ගොම, ඊතර සහ තාරකාමය ශක්තීන් උරාගන්නා හොඳම මාධ්‍යයි.

- ෂුල්ස් 1948 දී පැළෑටි වල වැඩීම කුජ, ගුරු, ශනි යන දුරස්ථ ග්‍රහයින්ට අනුකූලව වාර්තා කළේ එල දරන කාලය අනුවය. කොලිස්කෝ ඛණිජ ලවණ භාවිතා කර නක්ෂත්‍ර කාලය අනුව පැළෑටි වර්ධනය වර්ග කළේය. වාර්ෂික පැළෑටි (Annuals) සඳු හා බුධ ට අනුවද, ද්වි වාර්ෂික (Biennials) පැළෑටි සහ පිදුරු සිකුරු හා කුජට අනුවද සදාකාලික (Perennials) හා තද අරටු සහිත ගස් ගුරුගේ වර්ෂ 12 ක කාලය අනුව ද, කේතුධර හා ඝන පොත්ත සහිත ගෙඩි ඇති ගස් ශනීට අනුවද වැඩෙන බව කියයි. රවිගෙන් කඳ හා පැළ ඍජුව වැඩීම සිදු කරයි.

- ජෙනිකින් එංගලන්තයේ විසූ වෛද්‍යවරයෙකි. ඔහු මේ දුර්වලකම් මග හරවා ගැනීමට හිරු රාශි 12 තුළ හැසිරෙන කාල සීමා තුළ දී ඒ ඒ ලග්නවලට විශේෂිත ඛණිජ ලවණ වර්ග දැඩි වෙහෙසක් දරා සොයා ගෙන ඇත. එක් එක් ලග්න සඳහා ඔහු වෙන වෙනම ආහාර වට්ටෝරු සහ පෝෂණ ඌණතා සොයා ගන්නා ලදී. මේෂ රාශිය තුළ රවී සිටියදී උපත ලද අයට CELL SALT (Kali phosphoricum) පොටෑසියම් වැඩිපුර අවශ්‍ය බව ඔහු තීරණය කළේය. මේ ක්‍රමයෙන් අධ්‍යනය කිරීමද ඉතාම වාසිදායකය. බෙහෙත් පැළ සිටුවීම හා

සංරක්ෂණය මෙන්ම කේන්ද්‍ර සෑදීම තුළින්ද උපන් වේලාවේ සිට ඇති විය හැකි රෝගාබාධ හැකිතාක් දුරට වළක්වා ගැනීමට උපදෙස් දීමද කළ හැකිය. මීට අමතරව නිවාස ඉදිකිරීමේදී ග්‍රහ කිරණ හොඳින් වැඩෙන්නට සැලසීමද කළ යුතුය. ජර්මනියේ (Mid guard) නමින් හැඳින්වූ මැද මිදුල සහිත ගෙවල් පදිංචියට ඉතා සුභයැයි කියති. අකුණු වැළැක්වීමට නිරිත දිග සිට ඊසානට ඇති චුම්භක ක්ෂේත්‍රයන්ගෙන් අනතුර අවම කිරීමද කළ හැකිය.

නිවසේ අවට හා ගෙවතු අනුව මනාව බිම් සකස් කිරීම ක්‍රම් වසංගත වැළැක්වීම ද සෞභාග්‍ය දෙන නවග්‍රහයින්ට හා නැකත්වලට අදාල ගස් වැල් රෝපණය ද අනවශ්‍ය අනතුරු රෝග වලින් පරිස්සම් වීමට වගා කළ හැකිය. *Vinca rocea* මිනීමල්, Cactus වැනි විෂ වායු සහිත පැළ වර්ග ඉවත් කළ යුතුය. අප ආහාර ගත යුත්තේ ආයු වර්ණ සැප, බල, ප්‍රඥා, වැඩීම සඳහාය. රුඩොල්ෆ් ස්ටයිනර්ගේ මතය ග්‍රහ කිරණ හැකිතාක් දුර ආහාර නිෂ්පාදනයේ දී සැලකිය යුතු බවය. උදෑසන හිරු එළිය රිකට්ස් සහ බිළිඳුන්ගේ ඇතැම් අක්ෂි රෝග වැළැක්වීමට උපකාරි වේ. අව්වේ වේලාගත් ආහාර වර්ග බෙහෙවින් පෝෂණය සඳහා සුදුසු යැයි අදත් විශ්වාසයේ පවතී.

- රුඩොල්ෆ් ස්ටයිනර් කීවේ විශ්ව ශක්තීන් තුළ සඳ රැස් ජල මාධ්‍යක විසිරි යන බවය. පැළෑටියක පෝෂණ

පරිවෘත්තිය වර්ධන වේගය, ජලය උරා ගැනීම පුර හඳ දාට සීඝ්‍ර වේ.

ලංකාවේ පමණක් නොව රෝමන් අධිරාජ්‍යයේ පවා පුර හඳට ගස් කැපීමෙන් හා ධාන්‍ය ගබඩා කිරීමෙන් වැළකී සිටි. වර්ධනය වේගය වැඩිපුර අවශ්‍ය නිසා පුර හඳට දින 2 ට පෙර ඇට වැපිරීම කළ යුතුය. පැළ වගා නොකළ යුතුය. මාරියාතුං ගැමි සංකල්ප අගයමින් ලෝකයේ පළමුවෙනි වතාවට සඳ ගමන අලලා වගා කටයුතු සැලසුම් කිරීමට "Moon sign planting" අනුව නිර්දේශ කළාය. ඇය මේ ගැන විශේෂ අවධානය යොමු කරන්නේ සඳු සෑම තාරකා පද්ධතියක් ඉදිරියෙන් යමින් දින 1½ - 3 දක්වා කාලයක් තුළ එම තාරකා පද්ධතීන් සතු දිව්‍යමය බලයන් එක්රැස් කර පෘථිවියට මුදා හරින නිසාය. පැළෑටීන්ගේ රිද්මානුකූල වර්ධනයන් මුල්, කොළ, මල්, ගෙඩි හා ඇට විශ්ව ශක්තීන් හා සහසම්බන්ධකම් පවත්වන අයුරු මැනවින් පෙන්වා දුන්නේය. රුඩොල්ෆ් ස්ටයිනර්ගේ උගැන්වීමට අනුව දූරස්ථ ග්‍රහයින්ගේ කිරණ වලින් ගුණාත්මක බව (Quality) ද, සමීපස්ථ ග්‍රහයින්ගෙන් ප්‍රමාණය ද (Quantity) වර්ධනය වේ. මේ අතර පොළොවෙන් කැල්සියම්, පොටෑසියම් සහ සෝඩියම් උරා ගෙන පැළෑටි වලට අධික ශක්තියක් ලබා දෙයි. ගුණාත්මක බව නිසා පෝෂණය, සුවඳ මල් හා ඵල දරණ සමය තුළ වර්ධනයේ වේගය ද, නිෂ්පාදන ක්‍රියාවලියද වැඩි කිරීමට හා අභිජනනයට දායක වෙයි.

දුරස්ථ ග්‍රහයින් වන නැප්චූන්, යුරේනස්, ප්ලුටෝ යන ග්‍රහයින්ගෙන් දේශ ගුණික විපර්යාසයන් නිසා නිත්‍ය පැළෑටි වලට හානිද පැමිණේ. රසායනික පොහොර වලින් ප්‍රමාණය වැඩි කළත් ගුණාත්මක බව අඩුවේ. මෙය රුඩොල්ෆ් ස්ටනර්ගේ ඉගැන්වීම්ය. ඔහුගේ ඉගැන්වීම් වලට අනුව ජෛවගතික කෘෂිකාර්මික කටයුතු ඇමරිකාව, ජර්මනිය, එංගලන්තය, නෙදර්ලන්තය, ඔස්ට්‍රේලියාව වැනි දියුණු රටවල භාවිතා කරයි. සමීපස්ථ ග්‍රහයින්ගේ අධික කිරණ වලට හසු වූ විට පුස්, කූඩිත්තන් නියමිත කාලයට පෙර පළදාව සහ පරාග වර්ධනයට බලපාන වග පෙන්වයි. සඳේ කලා අනුවද සඳට ඇති දෘෂ්ටි අනුවද එක් එක් අංශ වල වැඩීම විවිධ පර්යේෂණ මාර්ගයෙන් පෙන්වා ඇත. සුවදායක පථ්‍ය ඔසු හා ආහාර සඳහා පැළෑටීන්ගේ වර්ධනය ග්‍රහ තාරකාවෙන්ගේ රිද්ම රටා හා සැසඳිය යුතුය. (Epiphenomena) උසස්ම ගණයේ පෝෂණ ක්‍රියාවලියක් සඳහා අප ගන්නා ආහාර මඟින් විශ්ව කිරණ සමඟ දිව්‍යමය හා ගෝලීය ආවේජනයන් (Rejuanations) මිනිස් සිරුර තුළට පරිවර්තනය කරගන්නේ ජීර්ණ පද්ධතිය මඟින් බව සොයා ගන්නා ලදී. පෘථිවි පෘෂ්ඨයේ මිලි මීටර් 5 ක මතුපිට ආවරණය අන්තරීක්ෂ කිරණ සිලිකා මාධ්‍යයෙන් උරාගෙන පැළෑටීන්ගේ වැඩීම සඳහා නැවත මුදාහරී. කාබනික පොහොර හා ජෛවගතික පොහොර මිශ්‍රණ මේ සඳහා උසස් ගණයේ ලා සැළකිය හැකිය. පසෙහි ඇති කැල්සියම් වායුගෝලයෙහි අන්තර්ගත ශක්තීන් උරාගෙන පැළෑටි වර්ධනයට දායක වෙයි.

## පැළෑටි පෝෂණය

ස්වභාවික පරිසරයක මෙසේ සිදුවූවත් කෘතිම ලෙස සාදන පොහොර ශක්තියෙන් හීනය. විද්‍යාඥයින් සෑහීමකට පත්වන්නේ ස්වභාවික පරිසරයක හැදෙන නිෂ්පාදන වලටයි. පැළෑටිවල ශක්ති ජනක කොටස් හීන වෙයි. නැවත නැවත පොහොර දැමීමට සිදුවෙයි. විශ්ව ශක්තීන් නිසා මිහිපිට ඇති ශාරීරික, ආධ්‍යාත්මික, ආගමික ගුණ වගාවන්ට ප්‍රබුද්ධතාවයක් ඇති කරයි. ශාරීරික සුවය මෙන්ම මානසික සුවය ද, රැකෙන්නේ ස්වභාවික පෝෂණ ව්‍යුහයක වැඩෙන පැළෑටි තුළය. අපේ මුතුන් මිත්තන් ග්‍රහලෝක දේවත්වයෙන් සැලකුවේ මේ නිසාය. අද භාවිතා කරන කෘෂි රසායන වගී සිරුරට හානි කරන වග ලෝකයම පිළිගෙන තිබේ. වගා ලිත් භාවිතයට දියුණු රටවල් අවතීරණ වන්නේ මේ නිසාය.

- රුඩොල්ෆ් ස්ටයිනර් ග්‍රහ කිරණ දුර්වල වූ විට රෝගාතුර වන බව කියයි. ශුභ කිරණ ඇති විට නිරෝගී වේ. පැළෑටි, සතුන්, මෙන්ම මිනිසා ද ග්‍රහ කිරණ වලට යටත්ය. මේ නිසා ලෝකය පුරා කෘෂිකාර්මික කටයුතු මෙන්ම හෙදකම ද එක සමානය.

බටහිර ඇලෝපති ක්‍රමය ද, හෝමියෝපති ක්‍රමය ද, යුනානි හා සින්දූරම් රස වෛද්‍ය ක්‍රමය ද, ආයුර්වේද ක්‍රම ද, ඔසු පැළ මෙන්ම රත්‍රං, රිදී, යකඩ, ගෙන්දගම් වැනි ලෝහ අලෝහ වර්ග ද, ගෝන, රයිනෝ අං කුඩු, බැටළු බඩවැල්, හරක් ඇට කුරවල ඇතැම් කොටස් ද, ශාක මෙන්ම සත්ව තෙල් ද, කස්තුරි ද, මී පැණි ද, වටිනා ඖෂධ සේ සලකයි.

විවිධ මැණික් වර්ග ද, වර්ණ රටා ද, එක් එක් ග්‍රහයාට අයත් ආහාර වර්ග ද, රෝග නිවාරණය සඳහා යොදා ගනී. තාරකා විද්‍යානුකූල වෛද්‍ය සංකල්පයන්ගේ (Astro Medical Significances) අපේක්ෂිතයන් වන්නේ නිරෝගි නව පරපුරක් බිහි කිරිමට අතදීමය. විවිධ ශාන්තිකර්ම හා ආගමිකවතාවත් ද මේ සඳහා දායක වේ. සියල්ලටම වඩා ජ්‍යොතිෂ විද්‍යාව හා බැදුණු පෝෂණ විද්‍යාව ගැන අවධානය යොමු කිරීම අගනේය. කොළ කැඳ, රණවරා වැනි කොළ තැම්බු වතුර අළුත් පළතුරු හා එළවළු ක්‍රමානුකූලව සකස් කර ගැනීම සඳහා දැනුවත් කළ යුතුය. ග්‍රහ කිරණ අනුව ආහාර සැකසීමට (Planetary Cooking) හොඳ ඉතිහාසයක් ඇත. 16 වැනි සියවසේදි පළවෙනි හෙන්රි රජ සමය මේ සඳහා ස්වර්ණමය යුගය යැයි සැලකේ. ඔහු බිසෝවරුන් සය දෙනෙකු සමඟ විවාහ වූවත්, වඳ බව නිසා දරු සම්පත් නොලද අයෙකි. මේ නිසා ආහාර සැකසීම ග්‍රහ කිරණ වලට අනුකූලව සැකසීමට අණ කළේය.

## ග්‍රහ දෘෂ්ටි

අන්තරීක්ෂ කිරණ පීරා ග්‍රහලෝකවල හා තාරකාවල විශ්මයජනක සංසිද්ධීන් පැළෑටි, මිනිසා හා සතුන් කෙරෙහි බලපාන අයුරු සොයා ගත්තේය. ජලයට යමක් ග්‍රහණය කරගත හැකිවාක් මෙන්ම පරාවර්තනය කිරීමට හැකි බව ඔහුගේ නිගමනයයි. ඉර සතු වර්ණාවලිය දේදුන්නකින්, ප්‍රිස්මයකින් හා ජල බිංදු තුළින් පෙනේ. රවිට හැඩතල මැවිය හැකිය. විශ්වය පුරා සෑම වස්තුවකම විවිධ හැඩතල

පිහිටා ඇත. රස විද්‍යාඥයින් ග්‍රහගති හා ඔවුන්ගේ ග්‍රහ දෘෂ්ටි හඳුන්වා දී තිබේ. සංවතී $0^0$ (Conjuntion) සප්තම $180^0$ (Opposition), ත්‍රිකෝණ $120^0$ (Trine) චතුරශ්‍ර $90^0$ (Square) ඉන් කිහිපයකි.

සප්තමයකදී ඇතිවන විශ්ව කම්පනය කෘෂි කටයුතුවලට ඉතාම ශුභ දායකය. ත්‍රිකෝණවල දී අධික වියළි බව හෝ අධික වැසි ඇතිවීම ග්‍රහ ගති අනුව සිදුවේ. චතුරශ්‍රයක දී නැප්චූන්, යුරේනස්, ප්ලූටෝ තද අකුණු වැහි කුණාටු, භූමි කම්පා, සැඩ සුළං, ප්‍රචණ්ඩ කැළඹීම් ඇති කරයි. මෙවැනිම තත්වයක් සමාන්තර වූ විටද සිදු වෙයි. පැළෑටි ග්‍රහ කිරණ උරාගන්නේ ඉතාම ආකර්ෂණීය අයුරින්ය. ජලයේ ශක්ති තරංග සර්පිලාකාරය. දිය සුළියක හැඩය ද එසේමය.

වේගයෙන් කරකැවෙන මන්දාකිණි, සුළඟ, දියවැල්, බෑවුම්, දිය කඩිති, ගොළුබෙලි කටු, කෙස්, මනි පත්‍ර, කොළ, මල් කැකුළු, නැටිවලට සම්බන්ධ වෙන ස්ථානවල හා සූරියකාන්ත ඇටවල හොඳින් කැපී පෙනේ. පැළෑටිවල විද්‍යුත් රසඥතාවයෙහි ද (Magnetic Forces) ඛණිජ ලවණ වලද ජීවය රඳා ඇත්තේ තාරකා තුළය. මේ නිසා ආදීතම මිනිසා (Crystal Heaven) අහස දිව්‍ය ලෝකයට සම කර පූජනීය වස්තූන් සේ සලකා පුද සිරිත් තවමත් පවත්වමින් සිටී.

# කෘෂි ජෛව විවිධත්වය, දේශීය ආහාර හා මානව පෝෂණය
# Biodiversity, Traditional Food and Nutrition

සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ මූලධර්ම වලින් සරු සාරවූ පරිසර පද්ධතීන්ගේ සමතුලිතතාවයන් බිඳ දමා සමාජ, ආර්ථික හා සෞඛ්‍යමය ගැටළු රැසකට මානව සංහතියම අද බිලිවෙමින් පවතී. දේශගුණය, භූ විෂමතාවය, උන්නතාංශය නිසා සරු පස, ජලය, ග්‍රහ කිරණ, මිනිස් ශ්‍රමය, සත්ව පාලනය සංකලනය වීමෙන් අධිපෝෂණ ක්‍රියාවලියක් එදා පැවතුණි. උරුමයෙන් ලද මධ්‍යම කඳුකරය, ඒ ආශ්‍රිත ජලාපවහන, ඝන වනාන්තර, තිරක්ෂයට ආසන්න නිසා, ක්‍රමවත් වැසි සුළං රටා, තැනිතලා, හෙල්මළු, ගංගාධාර, පිටාරතැනි නිසා ජීව විද්‍යාත්මක රසායනික සංයෝජනයන් තුළ සරු බීජ රෝපණයක් සිදුවිය. හේන් ගොවිතැනට කැලෑ කපා පිලිස්සීමෙන් හා පාංශු ඛාදනයෙන් පස නිසරු විය. නායයෑම් නිසා අධික භෝග නිෂ්පාදනය අඩාල විය. අක්‍රමවත් විය. සාම්ප්‍රදායික කෘෂි රටාවන් තුළ මනා කළමනාකරණයක් තිබිණි පෝෂණ ඌනතා, පළිබෝධ හානි වලක්වා පැළෑටි වර්ධනයට දායකවීමට විශ්ව ශක්තීන් යොදා පූජනීය අවිහිංසාවාදී කෙම් පහන් ක්‍රම භාවිත විය. කෘෂි වසංගත මර්ධනය විය.

විද්‍යාත්මක ගවේෂණ නොකළත් පරිසරය හඳුනා ගැනීමේ ඉව නිසා ස්වයංපෝෂණයද රැකුණි. පාරිසරික ගොවිතැනේදී

අන්තරීක්ෂ ශක්තීන්, අධ්‍යාත්මික ශක්තීන්, ජෛව භෞතික ශක්තීන් හා එක්ව මුදාහරින ශක්ති ප්‍රභවයන් ප්‍රබල නිසා ජෛව විවිධත්වය තුළ පැළෑටි ද සත්ව හා මානව සංහතිය තුළද සමතුලිතතාවය පාලනය විය. ඒ සමගම විවිධ සංස්කෘතීන්ගේ උපත සිදුවිය. නිර්මාණ කුසලතා වර්ධනය විය. අතීත ශ්‍රී විභූතිය මෙයට හොඳ නිදසුනකි. පැරකුම් යුගයේදී සහල් විදේශයන්ට යවන ලදී. පරිසර පද්ධති තුළ මානව හා සත්ව අවශ්‍යතා සපුරාලීමට ධාන්‍ය, කුළුබඩු, අල, පළතුරු, කිරි, මස්, මාළු, බිම්මල්, පලා වර්ග, විවිධ ශාක කොටස් හා ඖෂධ පැළෑටි පෝෂණ අවශ්‍යතා සපුරා ලීමට සමත් විය. සතුන්ට ද සරුසාරවූ නිල්වන් තෘණභූමි පමණක් නොව කුරුළු පාළු ද තිබිණි.

විදේශීය ආක්‍රමණයත් සමග ආහාර භෝග නිෂ්පාදනය වෙනුවට වෙළඳ භෝග හඳුන්වා දීමද නව තාක්ෂණික ක්‍රම භාවිතයද පාරිසරික කෘෂි පද්ධතිවලට විශාල තර්ජනයක් සිදුවිය. උඩරට ගෙවතු වගා මෙන්ම වියලි කලාපීය වැව් ගම්මාන ද නොසලකා හැරිණි. සියළුම රසායනික කෘතීම සංයෝජකයන්ට නිරාවරණය වීමෙන් චර්ම රෝගද අධිකවී තිබේ. ජලය, වායුව, ආහාර එක සේම දූෂණය වී පරිභෝජනයට අහිතකර පසුබිමක අපි සිටින්නෙමු. උෂ්ණ දේශගුණයක් සහිත සර්ම හා නිවර්තන කලාපීය රටවල රෝගීන්ගේ සංඛ්‍යාව අධික බව නිතර වාර්තා වෙමින් පවතී.

විවිධ රසායනික ක්‍රම යොදා ජලාශයන් විෂ උල්පත් බවට පරිවර්තනය වී ඇත. කල්පිටිය වැනි ප්‍රදේශවල නිල් දරු

උපත් පමණක් නොව රට පුරා වන්දීකරණය ද සිදුවෙයි. මෙය හොඳම උදාහරණයකි. රසායනික පොහොර, කෘමි හා වල් පැලෑටි නාශක ඉවත් කර පරිසර හිතකාමී කාබනික හා ජෛවගතික කෘෂිකර්මයට අවතීර්ණ විය යුතුමය.

පස සහ ගොවිපලේ පරිසරයට සමගාමීව සිදුවන ක්‍රියාවලියන් හඳුනාගැනීම ඉතාම වැදගත්ය. නව තාක්ෂණ ක්‍රමද හානියකින් තොරව භාවිතා කළ හැකිය. විවිධ සංරක්ෂණ ක්‍රම, වන වගාව, පසෙහි කාබනික ව්‍යුහය, ස්වයං පෝෂණ හා පරිපූර්ණ කෘෂි පාරිසරික ක්‍රම, සමෝධානික වගා ක්‍රම දියත්කිරීම භාග්‍යයකි. ජානමය වැඩිදියුණු කළ බීජ වෙනුවට සාම්ප්‍රදායික බීජ භාවිතයට නැඹුරු කළ යුතුය. ස්වභාවික ශාක සාර, සත්ව අපද්‍රව්‍ය භාවිතය අවශ්‍යමය. සියල්ලෙහි සංකලනයක් සේ ජෛවගතික කෘෂි ක්‍රමය හඳුන්වා දිය හැකිය. වැඩිවෙන ජනගහනයට නිෂ්පාදන ක්‍රියාවලිය ගැන පමණක් අවධානය යොමු කිරීම අහිතකරය. ජෛවගතික ගොවිතැනේදී ග්‍රහ කිරණ සම්බන්ධීකරණය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව පැහැදිලිය. සමීපස්ථ ග්‍රහයින්ගෙන් ප්‍රමාණය, ප්‍රජනනය, නිෂ්පාදනය වැඩි කරයි. දුරස්ථ ග්‍රහයින්ගෙන් සුවඳ, අධිපෝෂණය, මල් ඵල දරන සමයන්හිදී උපරිම වර්ධනය ලැබිය හැකි බව විද්‍යාඥයින් සනාථ කරයි.

නූතන විද්‍යාඥයින් විසින් අන්තරීක්ෂ කිරණ වල බලපෑම අචින්ත්‍ය බව සොයාගෙන ජෛවගතික කෘෂි නිෂ්පාදන ලෝකයේ උසස්ම ඒවා බව සනාථ කිරීම වාසනාවකි. ස්වභාවික සෞන්දර්යය වනජීවීන් කරදිය හා මිරිදිය මත්ස්‍ය

සම්පත් සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහිකිරීමට උපකාරී වනු ඇත. දැනට රජයෙන් හා විවිධ ආයතනවලින් මේ සඳහා දරන උත්සාහයන් අගය කළ යුතුය.

## හේන් ගොවිතැන

ආදි කාලයේ සිටම වැසි සමය බලා කැලෑ කපා ගිනි තියා දඩු වැට සකස් කර භෝග සිටුවන ලදී. ස්වාභාවික කැලෑ කපා දැමීම නිසා ජල උල්පත් සිඳී, පස නිසරුවී, පාංශු ඛාදනයට ලක් වූ පසු සරුබිම් සොයා යාම සිදුවිය. ස්ථිර වාසස්ථාන ඇතිවීමෙන් පසු ඒවා හැරදමායාම අසීරු කරුණක් විය. මේ නිසාම හේන් ගොවිතැනට සරු පස හා ජලය හිඟවිය. අධික හිරු එළියෙන් යටිරෝපණ පවා දැවී යන තත්වයක් උදාවිය. එහෙත් විශාල පරිශ්‍රමයක් දරා එදිනෙදා ආහාරයට අවශ්‍ය සියලුම දේ වවන ලද නිසා ඌණතා රෝග වලින් හානිකර තත්වයක් උදා නොවීය. පොහොර සංයෝජන නොදමා ස්වාභාවික කැලෑ වර්ධනයෙන්ම පෝෂණ ක්‍රියාවලියක් පැවැත්විණි. සුළඟ, ජලය, දේශගුණය, උන්නතාංශය, කාලගුණය, හිරු එළිය, වනාන්තර සේදී ආ සරු පස නිරායාසයෙන්ම එක්වීම නිසා හේන් ගොවිතැන සාර්ථක විය.

ගංවතුර උවදුරුවලදී කඳුකරයේද හේන් ගොවිතැන හා ස්ථිර වාසස්ථාන දියුණු විය. ශෂ්‍ය මාරුව හා මිශ්‍ර බෝග වගාවන් පවුලේ අවශ්‍යතාවයට අනුකූලව සිදු විය. නිදහස් නිවහල් නිරෝගී දිවියක වාසනාව හිමිකර ගත්හ.

## ගෙවතු වගා

සිරිලක ගෙවතු වල වඩාත්ම ඵලදායි ලෙස භූමි පරිභෝජනය ක්‍රමවත්ව සකසා ඇත. ජලය බැසයාමට තෘණ වර්ග වැවීම, පොල්ලෙලි ඇල්ලීම, වැටි දැමීම, කොළ රොඩු, පිදුරු, වියළි තෘණ, ලී කුඩු, සේර හා සැවැන්දරා වැනි ඖෂධ පැළැටි හා බඩවැටි වලින් ජෛව විවිධත්වය නිර්මාණය විය. ගොවියා කමත අයිනට දැමූ පිදුරු වැටියේ පිපෙන බිම්මල් අධික නයිට්‍රජනීය ආහාරයක් විය. පළතුරු පිරුණු ගෙවතු වල කුරුළු කෙවිල්ලන් මෙන්ම දරුවන් ද, කෙළි දෙළෙන් පැන යන අයුරු චමත්කාරය දැනවීය. අරුණළු සිපිමින් නිවස වටා මල් නෙලන දර්ශන මෙන්ම පැණි බොන සමනලුන්ද ඇහිඳ කන සතුන් ද අතිශයින්ම සුන්දර දසුනක් විය. රුස්ස ගස් කොළං, සුළං ආවරණ මෙන් ද, දැව හා දර සපයන වන වදුළු ද විය.

අළු, සත්ව අපද්‍රව්‍ය, විවිධ කොළවර්ග අංග සම්පූර්ණ පොහොර බවට පත්විය. අපේ ගැමියන්ගේ ඥාන ශක්තිය අති මහත්ය. කපන ලද වළක බහාලන ඉවත ලන දේ තම වගාවන්ට අධික පෝෂණයන් එකතු කරන පොහොර සකස් විය. විදේශ ආක්‍රමණ හා නාගරීකරණය නිසා මිශ්‍ර භෝග වගාවන් නොසලකා හැරිණි.

විවිධ රැකියා ආවරණ ලැබීම නිසාද ගෙවතු වගා අඩ පණ විය. කෙත්වතු උයන්වතු අපට අහිමි විය. විවිධාංගීකරණය නැතිවිය. පළතුරු දැව ඖෂධ වැනි විශේෂතා වෙනුවට තේ,

කෝපි, කොකෝවා ස්වාභාවික කුළුබඩු දුම්කොළ වතු බිහිවිය. ජෛව විවිධත්වයද සංරක්ෂණ ක්‍රමද කෙමෙන් අහෝසි විය. ගෘහ ආර්ථිකය මෙන්ම ජෛව විවිධත්වය ද මදක් ඇණ හිටිණ. අපනයන භෝග මිල අඩුවන විට දැව, ඖෂධ පැළෑටි ආදායම් මාර්ග විය. මෙම ගෙවතු වගා පරිසර පද්ධති ශ්‍රී ලංකා ආර්ථිකය බිඳ වැටෙන්නට නොදී තාමත් සරුසාර ලෙස රැක ගනී.

## හෙල්මළු වගා තාක්ෂණය

හෙල්මළු නමින් හඳුන්වන ඉතා අලංකාර කුඹුරු කඳු බෑවුම්වල දකින්නට ඇත. මේ දළ බෑවුම්වල ජලය හා පස සංරක්ෂණය නොසලකා හැරීම නිසා පෝෂණ ක්‍රියාවලියට බාධා අදත් සිදුවෙමින් පවතී. උස් කඳු මුදුන්වල පළතුරු අධික පෝෂණ ගුණවලින් මෙන්ම රසයෙන්ද නොඅඩුවේ. මීට හේතුව විශ්ව ශක්තීන් විශාල ප්‍රමාණයක් අන්තර්ගත වන නිසාය.

ජීව වැටි භාවිතයෙන්ද ශෂ්‍ය මාරුවෙන්ද පෝෂ්‍ය කොටස් පසෙහි රඳවා ගත හැකි විය. සමෝච්ඡ කානු පද්ධතියක් ගෙවතු තුළ ක්‍රියාත්මක වීම නිසා සෝදාපාළු අවමව ඇත.

පාරිසරික කෘෂි කර්මාන්තයේදී රසායනික සංයෝග භාවිත නොකළ නිසා පරිභෝජනයට ඉතාම සුදුසු විය. බුරුල් පස් කඳුවල අල වර්ග, හොඳින් එරෙයි. මේවා එළවළු හා පළතුරු මෙන්ම රසයෙන් හා ගුණයෙන් අධිකයි. පෝෂණ ඌනතා ද අවමයි.

## වැව් ගම්මාන

වියළි කලාපයේද වැව් ගම්මාන පරිසර පද්ධති කෙමෙන් අඩාල වුවත් සියුම් ජල සම්පාදන රටා නිසා කෘෂි කටයුතු තවමත් කෙරෙමින් පවතී. ලොව මවිත කරන ජල සම්පදාන රටාවක් හිමි නිසා එකල අපේ රටට ජනතා උරුමයන්ගේ ස්වර්ණමය යුගය උදා විය. පැරකුම් රජ දවස විදේශයන්ට සහල් යැවීමෙන් ස්වයංපෝෂණ රටාවක් පැවති වග සිතිය හැකිය. තවමත් නටඹුන් අතර ඔසු උයන් ද ඇත. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි සංකල්ප තුළ ඉතා විශිෂ්ඨ සංස්කෘතීන් ගේ උපත සිදුවිය. වියළි කලාපයේ තැනිතලා පස නිසරුවීමේ අවදානමට ලක්වීමේ ප්‍රවණතාවය අඩුය. ගොඩ මඩ ගොවිතැන් දෙකම සාර්ථක විය. විවිධ කොළ පොහොර අළු, සත්ව අපද්‍රව්‍ය, හා වනාන්තර සෝදා එන පොහොර නිසා පසෙහි කාබනික ව්‍යූහයට බාධා නොවීය. පළිබෝධ මර්ධනයද, කෘමි වසංගත ද ඉබේම පාලනය විය. අධි පෝෂණ ගුණයෙන් පිරි සහල්, ධාන්‍ය වර්ග නිසා ඌණතා රෝග දක්නට නැත. විශාල වැව් ජලාශද පූජනීය ස්ථාන මෙන්ම ගෘහ නිර්මාණ කුසලතා ද ප්‍රශංසනීය විය.

පරිසරය රැක ගැනීමට දැඩි වෙහෙසක් දැරීම නිසා පරිසර හානියක් නොවීය. සශ්‍රීක බව හොඳින් රැකිණි. හැමවිටම පරිසරය හඳුනා ගැනීම වැදගත්ම දේ විය. ශෂ්‍ය මාරුව හා මිශ්‍ර භෝග වගාවන්ට අමතරව සත්ව පාලනය නිසාද පෝෂණයෙන් සපිරි සමබල ආහාර රටාවක් ක්‍රියාත්මක විය. පසෙහි ව්‍යූහයට ද බාධක අවම විය. විවිධ ධාන්‍ය වර්ග

පළතුරු සුලභ විය. ප්‍රතිශක්තිකරණය ඉහළම තත්වයේ පැවතුණි. මෙම ස්වයංපෝෂිත බව සත්ව හා මිනිස් සංහතියේ තිර පැවැත්මට හේතුවකි. දේශගුණය ක්‍රමවත් ලෙස පාලනය කර ගැනීමට ශක්තියක් ඔවුනට ස්වභාවයෙන්ම උරුම විය. පසෙහි ආම්ලිකතාවයද ලවණ ද මනා කලමනාකරණයකින් පාලනය විය. වනාන්තර වලින් ජලය පෙරී පිරිසිදුවීම භාග්‍යයකි. දුව මෙන්ම පලතුරු, මී පැණි, දඩමස්, ඖෂධ සියල්ල වනාන්තර වලින් සපයන ලදී. බීමට, රෙදි සෝදා නෑමට, සතුන්ට ලැගීමට වෙනම ස්ථාන වෙන් කිරීම නිසා මනාසේ සෞඛ්‍ය ද පාලනය විය.

## පුරන් බිම්

අනාදිමත් කාලයක සිට පුරන් බිම්හි ද භෝග විවිධාංගීකරණය කළ නිසා ආහාර හිඟයක් නොවීය. ග්ලිරිසීඩියා, වල් සූරියකාන්ත (නත්තසූරිය) වැනි කොළ අතුරා කාබනික සංයෝග නිෂ්පාදනය කර ඉතා හොඳ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වයක් පවත්වා ඇත. ජලය හිඟ වූ කාලවලදී කන්න කීපයක් මාරුවෙන් මාරුවට වගා කරයි.

ගංවතුර නිසා ද පිටාර තැනිවල අධිපෝෂණය රඳවා ගෙන ඇත. සතුන් ඉපනැල්ලට මුදා හැරීමෙන් ද අපද්‍රව්‍ය රැස්කරගනී. ඉන් විශාල නයිට්‍රජන් ප්‍රමාණයක් ද ලබාගත හැකි විය. යාපනයේ ගොවීන් අපට ආදර්ශයකි. ගව, එළු, කුකුල්, තාරා වැනි සතුන්ගෙන් පවා විශාල පොහොර ප්‍රමාණයක් රැස්කර ගනී. අති දුෂ්කර ප්‍රදේශයක් වුවත්, ආහාර සම්පාදනය ඉහළ තත්වයක පවත්වා ගෙන යයි.

දිඩුවැටද මුරුංගා, දෙහි, දොඩම් වැනි දේ සිටුවීමෙන් කුඩා ඉඩම් පවා විධිමත් ලෙස පරිහරණය කරයි. ආටිසියන් ලිං වලින් ඇද ගන්නා ජලයද, ඊශාන දිග මෝසම්වලින් ලැබෙන මද වර්ෂාවෙන් යැපුනත්, ජල කළමනාකරණ ක්‍රම විශිෂ්ඨය. ආර්ථික රටාවන්ද සුරක්ෂිතය.

## ශුෂ්ක ප්‍රදේශ

ශුෂ්ක ප්‍රදේශවල පස ඉතා සරුය. කටුසර භෝගද, කජු, වටිනා දූව හා පලතුරු ද සුලභව ඇත. විවිධ ජල පාලන ක්‍රම අනුගමනය කරමින් කෘෂි කටයුතු කරයි. නව තාක්ෂණික ක්‍රම භාවිතයෙන් ජල සැපයුම උපරිමයකට ගෙන ඇත. ජෛව විවිධත්වය පාලනය කළ හැකි වන්නේ පස සහ කාලගුණය හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසුය. (Mulch) නමින් හඳුන්වන ආවරණ, පිදුරු, තණ කොළ, කොළ රොඩු, කෙසෙල් පතුරු හා කඳන් යෙදීමෙන් ජලය රඳවා ගැනීමට උත්සාහ දරයි. මැයි සහ අගෝස්තු මාස වලදී තද සුළං ඇතිවෙයි. වාෂ්පීකරණය අතිශයින්ම පීඩාකාරී වෙයි.

ඇතැම් අවස්ථාවල භූගත ජලය නැතිව යයි. අහස් වැසි බලා කෙටිකාලීන භෝග වගා කරයි. ආහාර හිඟ කාලසීමා ඇතිවුවත් ඈත අතීතයට වඩා පෝෂණ තත්වයෙන් උසස්ය. පස්වැටි, හෙල්මලු, ගල්වැටි, සැවැන්දරා සහ සේර වැටි, රනිල භෝග වැනි ආවරණ වගා සහ වසුන් යොදා තෙතමනය රඳවා ගනී. කොමඩු, තක්කාලි දෙහි පවුලට අයත් සියලුම ගස් වර්ග ආරක්ෂක ආහාර සේ සැලකිය හැකිය.

## පරිසරය හඳුනා ගැනීම

යල මහ කන්න දෙක ආදිකාලයේ සිටම ගොවීන් හොඳින් වගා කරයි. ජෛව විවිධත්වය සුරකින පස හා කාලගුණය මෙන්ම දේශගුණයද ගොවීන් ඉවෙන් මෙන් හඳුනාගෙන ඇත. සැප්තැම්බර්, ජනවාරි, මාසවල උපරිම වර්ෂාපතනයට මහ කන්නයේ වගා කරයි. මාර්තු හා මැයි මාසවල යල කන්නය කරයි. මැයි සිට අගෝස්තු දක්වා දිග නියං සමය වාෂ්පීකරණය අධිකය. ජලය හා පස සංරක්ෂණ ක්‍රමවලට යොමු කිරීමට සිදුවේ. ඔක්තෝබර් නොවැම්බර් මාසවල අධික වැසි සමයේදී පෝෂක කොටස් සේදී යාම නිසා වැඩි වෙහෙසක් ගන්නට සිදුවේ. මේ වැසි සමයන් කාලීනව සිදුවේ. නමුත් මේ අතර කාලනිර්ණය සඳහා පරිසරයද අනුපමේය සේවයක් සිදුකරයි. බෝ, කටුපිල, මඩතිය, කරඳ, ඇහැළ ගස්වල මල් පිපෙන්නේ වියළි කාලයක් ළඟ එන බව පෙන්වමිනි.

සුළං හමන දිශාව, චන්ද්‍ර කලා, වලාකුළු, උකුස්සන්, ඇටි කුකුලන් පැණි කුරුල්ලන්, කුහුඹුවන්, රැහැයියන් වැනි සතුන්ද ගොවියාට කාලගුණ අනාවැකි දෙයි. වැහි පිරිවටුවා නියං සමය ළං වන විට පහළ මට්ටමක කූඩු බඳී. වැසි සමය ළංවන විට ජලාශවලින් ඈත උස් ගසක කූඩු බඳී. මීමැස්සන් කඩිසරව හැසිරෙන කාලය අස්වැන්න වැඩිකරන කාලයයි. දූරුතු පින්න, බක්මහ අකුණු, නියඟලා මල්, නිකිණි පාළුවට ගොවීන් බියක් දක්වයි. දිවුල්, කරඹ, බෙලි අධික අස්වැන්න සුභ කාලගුණික තොරතුරු කියයි. ඈත අතීතයේ

අද මෙන් වගා ලිත් තිබුණේ නැත. පරිසරයෙන් අවබෝධ කළ දේ අනුව වගා කටයුතු මෙන්ම මිනිස් කටයුතු සකස් විය.

රවි උත්තරායනයට පිවිසෙනු බලා සියලු කෘෂි කටයුතු වල නියැළුණි. ගස්වැල්, මල්වල බරින් පිරෙන සමය අස්වනු නෙළන සමයයි. උදම්, භූ චලන, අකුණු, භූමිකම්පා, පෝය හතර, රාහු, රිට්ටා (4, 9, 14) තිථි කෘෂි කටයුතු වලින් බැහැරව ආගමික වතාවත් කරයි. නොඉඳුල් කොටසක් අස්වැන්න වලින් ත්‍රිවිධ රත්නය සහ දෙවියන් උදෙසා වෙන් කරයි. විවිධ පුදපූජා තබමින් සරු අස්වැන්නක් ඉල්ලා ආශිර්වාද ලබාගනී.

## පරිසර දූෂණය

රසායනික කෘත්‍රිම පොහොර, කෘමි, වල් පැළෑටි හා පළිබෝධ නාශක ඉසීම ආරම්භ වූදා සිට පහළ මට්ටමේ වැව් ජලාශවල ජලජ ශාක පරිභෝජනයට මාරක පහරක් එල්ල විය.

සමහර පැළෑටි වඳවී ගොස්ය. ඖෂධ පැළෑටි වූ නෙළුම්, ඕලු, කෙකටිය වැනි ජලජ ශාක වලට ජලයේ අඩංගු විෂ උරාගැනීම නිසා ඇතිවූ හානිකර බව අද ජාතියේ මහත් අවාසනාවක් බවට පත්වීම ඛේදවාචකයකි. බීමට තිබූ ජලයට හා පැළෑටි වලට පවා හානිකර බව අද අවිවාදයෙන් පිළිගනී. සත්ව හා මත්ස්‍ය සම්පත් වඳවෙමින් පවතී. ජෛව පළිබෝධ පාලනයට බාධා ඇතිවිණ. උඩරට හෙල්මළු වලද ගෙවතුවලද ඝන ශාක වැස්ම හා කොළ රොඩු ස්ථරය නිසා

විශ්ව ශක්තීන් නිරායාසයෙන් ඇද ගැනීම සිදුවිය. විෂ සහිත පස නිරාවරණය කිරීමෙන් චර්ම රෝග වැඩිවෙමින් පවතී.

ජලය, වාතය මෙන්ම, ජීවින් ද මානව සංහතියද එකසේ පීඩා විඳි යුදගිනි විපත් වලින්ද විශාල ජෛව සම්පත් විනාශයක් සිදුවිය. වාහන, කර්මාන්ත ශාලා සහ දුවිලි අධික මං මාවත් නිසාද පරිසර දූෂණය සිදුවේ. මල් සහ පළතුරු උයන් වලින් විහිදුන මිහිරි සුවඳ, සිසිල් මඳනළ, කුරුළු කෙවිල්ලන්ගේ සංගීත රාවය තණ තිල්ල උලා කන ගව රැළේ හඬ අභිබවා කර්මාන්තශාලා වලින් වාහන වලින් නැගෙන අමිහිරි හඬ දෝංකාර දෙයි. එළි මහනේ සෙල්ලම් කරන්නට නාගරීකරණය නිසා ඉඩකඩ මඳ වී ඇත. වෛරස්, දිලීර, පණු, හෘද, අක්ෂි, චර්ම රෝග දිනෙන් දින වැඩිවෙමින් පවතී න්‍යෂ්ටික අවි භාවිතය, සූර්ය සුළං, හිරු ලප නිසා ඕසෝන් ස්ථරය විනාශවීමද යහපත් සෞඛ්‍ය පවත්වාගෙන යාමට ඉමහත් තර්ජනයක්ව ඇත.

සෙම, වකුගඩු, ගල ගණ්ඩ, අධි රුධිර පීඩන වැනි සෞඛ්‍ය ගැටළු රාශියක් දිවයින පුරා පැතිරී ඇත. ඉපැරණි ආරක්ෂිත ක්‍රම ඉවත්ව ඇත. නව තාක්ෂණ රටා බිහිවී ඇත. පියවරෙන් පියවරට යන්ත්‍ර සූත්‍ර බිහි වී තිබේ. අධික ශබ්දය ද නැගෙන දුම ද අමිහිරි සුවඳ ද පරිසරය දූෂණය කරයි. මුදල් විශාල වශයෙන් අපතේ යාම සිදු වේ. වටිනා පැළෑටි වඳ වෙයි. ජලය බැසයන කාණු පද්ධති වැසී යාම නිසා මදුරුවන් ද කෘමි වසංගතද පැතිරී යයි. අංග විකල, සංකූලතා සහිත දරු උපත් අධිකය. ගොවීන්ගේ මිතුරන් වඳ වෙමින් පවතී.

## පෝෂණය

ඈත අතීතයේ සිටම අප රට තුළ ක්‍රමවත් ආහාර රටාවක් තිබුණි. කිරි, මස්, මාළු, මී පැණි වැනි සත්ව නිෂ්පාදන මෙන්ම ශාක නිෂ්පාදනයද මනා පාලනයක් තුළ පරිභෝජනය විය. නිරෝගීමත් ජනතාවක් සිටි නිසා ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රමද, පොත්පත්, ජ්‍යොතිෂ කටයුතු, ආගමික සිද්ධස්ථාන, සටන් ක්‍රම, ජන ක්‍රීඩා, වල උපත සිදුවිය. මන්ද පෝෂණයක් ඇති වූයේ බැමිනිටියාසාය වැනි දුර්භික්ෂ වලදී පමණි. වියළි කලාපවල මෙවැනි දැඩි නියංකාල සීමා පැවතුනි. සුළං මුවාවේ ඇති ප්‍රදේශ වලටද කිලිනොච්චි වැනි ප්‍රදේශවලද, ඇස් කහ වීම, බඩේ කැක්කුම, වමනය ආදී රෝග නිතර වාර්තා වේ.

කොළ තැම්බූ ජලය කොළ කැඳ, විවිධ පිට්ටු, රොටී වර්ග, ආනම්, මිහිරි සුවඳැති පෝෂණීය සහල්, ධාන්‍ය වර්ග, පිරිසිදු ජලය, පළතුරු, එළවළු, හකුරු, මී පැණි, පස්ගෝ රස, පැණි දෛනික ආහාර වේල්වලින් ඉවත්ව ඇත. ළදරු ආහාරවලට කිරි පිටි හා ධාන්‍ය පිටි ගැනීම නිසා මන්දපෝෂණය වාර්තාවීම අභාග්‍යයකි. කෘෂි, කෘමි, දිලීර, පළිබෝධනාශක වගේම රසකාරකද, කල්තබා ගැනීම සඳහා භාවිතා කරන සුරක්ෂිත ද්‍රව්‍යයද, අහිතකරය.

මිරිදිය මෙන්ම, කරදිය හා කිවුල් දිය ජලාශ තුළටද ගොවි බිම් සේදී එන ජලය ගලා ඒම අනාරක්ෂිතය. මේවායේ ඇති මත්ස්‍ය සම්පත් වඳ වෙමින් පවතී. බීමට පවා ජලය

ඇතැම් ප්‍රදේශවල නැත. කෘත්‍රිම රසායනික පොහොර, දිලීර නාශක, කෘමිනාශක, පැළෑටි නාශක සියල්ලම විෂ සහිතය. මේවායින් පස හා ජලය දූෂණය සිදුවේ. ආහාරවල ගුණාත්මක භාවය අඩුවේ.

## නවීකරණය

විදේශීය ආක්‍රමණ හා නවීකරණය නිසාත් කාන්තාවන් රැකියා සඳහා යාම නිසාත් ආහාර පිළියෙළ කිරීමේ ක්‍රම වෙනස් විය. අපේ ශරීරයට ව්‍යායාමයක් ගෙනදුන් ආහාර නිෂ්පාදන ක්‍රම හා නව තාක්ෂණික උපකරණ භාවිතය නිසා වැඩ පහසු විය. නමුත් කය වෙහෙසා වැඩ නොකිරීම නිසා අධික ස්ථුල බව කාටත් කරදරයක්ව ඇත.

ආහාර පිළියෙළ කිරීමේ අවම කාලයක් ගැනීමට ක්ෂණික ආහාර මිළට ගැනීමෙන් අඩු පෝෂණ ක්‍රියාවලියකට හුරුවී ඇත. විශේෂයෙන් කුඩා ළමයින්ට පචා දියවැඩියාව, අක්ෂි හා චර්ම රෝග අධිකව ඇත. මන්දපෝෂණය පමණක් නොව මනා පෝෂණයක් නැතිවීම ද හානිකරයි. ඉන් ප්‍රතිශක්තිකරණය අඩු වී යයි.

ගෙවත්තේ ඔසු පැළයක හෝ කොත්තමල්ලි කසායක රසය හා ගුණය වෙනුවට මුදල් ගෙවා හානිකර බෙහෙත් ගැනීමට සිදුව ඇත. අධික ලෙස පාහින ලද සහල්, සුදු සීනි, පාන් ආහාර වේලට එක්වීම ඛේදජනකය. අව්වේ වියලීම, සඳේ එළියේ පින්නේ මොරෙයියන් ඇදීම වැනි විශ්ව ශක්තීන් උරාගන්නා ධාන්‍ය වෙනුවට රසකාරක යෙදූ කල්තබා

ගැනීමට කෘතිම රසායනික මිශ්‍රණ සහිත ආහාරවලින් වෙළඳපළ පිරී ඇත. අටුකොටු හිස්වෙමින් පවතී.

## ජල සංරක්ෂණය

වියළි කලාපයේ භූගත ජලයද නියං කාලවලදී ඇතැම්විට සිඳී යා හැක. පාංශු ජල සංරක්ෂණය මිහිතලයේ පැවැත්මට අතිශයින්ම අවශ්‍ය වේ. වසුන් යෙදීම, වැටි හා කාණු දැමීම, සෙවණ ශාඛ වැවීම, මිත්‍ර හා මිශ්‍ර භෝග වගාව පොල්ලෙලි වැලලීම, විවිධ බැමි දැමීම. මුට්ටි හෝ කල වැලලීම සේර හා සැවැන්දරා වැනි ඖෂධීය ශාඛ, ඉපිල් වැනි පඳුරු මගින් ජල සැපයුම පවත්වා ගෙන යාම වාසනාවකි. ගැමියන් ළිං අසල සබුක්කු, බූදලියා, පාසි වර්ග, උඳුපියලි, බතල වැනි වැල් වර්ග වැවෙන්නට හරී.

## ශාක සංරක්ෂණය

- ජෛව භෞතික ක්‍රම - කොහොඹ, අළු, දාස්පෙතියා, රතු එැණු, මිංචි වැනි සැර සුවඳැති පැළෑටි, මිත්‍ර හා මිශ්‍ර භෝග වැනි කාබනික කෘමි මර්ධන යෙදීම. පැළ ආවරණ යෙදීම. කෘමි සතුන් හා වේයන් ඉවත් කිරීමට නිතර පිරිසිදු කිරීම.

- අන්තරීක්ෂ ක්‍රම - ග්‍රහ කිරණ වැනි විශ්ව ශක්තීන් උරාගැනීමට ජෛවගතික වගා ලිත් හා නැකැත් භාවිතය.

- ආධ්‍යාත්මික ක්‍රම - පිරිත් සජ්ඣායනා, කෙම්පහන් ක්‍රම, යන්ත්‍ර මන්ත්‍ර විධි, පුද පූජා, බලි බිලි.

## පළිබෝධ පාලනය

- වල් සූරියකාන්ත, දාස්පෙතියා, කලවැල්, රසකිඳ, හුලංතලා වැනි ශාඛ යූෂ හා දිවිකදුරු කිරි, මී තෙල්, කොහොඹ තෙල්, දුම්මල ගැල්වූ විලක්කු දැවීම.

## දිලීර රෝග මර්ධනය

- එැණු වර්ග, තම්පලා, මුරුංගා, පැපොල්, කුඩළු, නික, අළු භාවිතය.




රූපය 7. පාරිසරික ගොවිතැනේ පදනම ස්මිත්, 2007

## කෘමි රෝග මර්ධනය

- කොහොඹ, ඉඟුරු, සබන්, දුව අළු, කහඹිලියා, දුංකොළ, දාස්පෙතියා, රසකිඳ.

## පස සරු කිරීම

අස්වැන්න සරු කරන නූතන ක්‍රමවලට වඩා, පස සරුකරන පාරම්පරික ක්‍රම, පරිසර පද්ධති තුළ සමතුලිතතාවය ආරක්ෂා කරයි. වැඩි දියුණු කළ ප්‍රභේද හා රසායන ද්‍රව්‍ය කෙරෙහි ප්‍රතිරෝධතා දක්වීමට පෝෂණ කුසලතා වැඩි කළ යුතුය. ජෛවගතික විද්‍යාවට අනුකූලව විශ්ව ශක්තීන් ලබාගැනීමට වගා ලිත් හා නැකැත් භාවිතය හඳුන්වා දීම කාලෝචිතය. අධික මිලක් හා පෝෂණ රටාවක් ඇති ජෛවගතික නිෂ්පාදන වැඩිදියුණු කිරීමට ග්‍රහකිරණ අනුව කෘෂි කටයුතු දියත්කළ යුතුමය. මේ සඳහා ආශ්‍රිත ග්‍රන්ථ තොරතුරු සපයනු ඇත.

# කෘෂි කටයුතු සඳහා අවශ්‍ය සාධක තුන සහ මූලධාතු හතර
# Three Factors and the Four Elements

කෘෂි කටයුතු විද්‍යානුකූල සම්බන්ධීකරණයට සාධක තුනක් අවශ්‍ය බව කෘෂි විද්‍යාඥයින් අවධාරණය කරයි. ඒ විශ්වීය (Cosmic), වායුගෝලීය (Atmospheric) හා භූගෝලීය (Terrestrial) සාධක තුනය. මේ සාධක තුන ආපෝ, තේජෝ, වායෝ, පඨවි සතර මහා ධාතු හෙවත් භූත කොටස් සමග සම්බන්ධ විය යුතුය.

- තේජෝ ගණය - මේෂ, සිංහ, ධනු
  (Fruit Trigon) - පලතුරු හා ඇට
- පඨවි ගණය - වෘෂභ, කන්‍යා, මකර
  (Root Trigon) - මුල්
- වායෝ ගණය - මිථුන, තුලා, කුම්භ
  (Flower Trigon) - මල්
- ආපෝ ගණය - කටක, වෘශ්චික, මීන
  (Leaf Trigon) - කොළ

**විශ්වීය සාධක.**

සූර්ය කේන්ද්‍රයට සාපේක්ෂව සියලුම ග්‍රහ වස්තු කක්ෂ තලයට සමාන්තරව සර්පිලාකාර ගමනක යෙදෙයි. සාමාන්‍යයෙන් පැළෑටි භූ කේන්ද්‍රයට සාපේක්ෂව වායුගෝලය හරහා අන්තරීක්ෂ කිරණ උරා ගනී.



රූපය 8. මූල ධාතු හතර




| | | |
|---|---|---|
| 1. මිථුන, තුලා, කුම්භ | - වායෝ | - මල් |
| 2. කටක, වෘශ්චික, මීන | - ආපෝ | - කොළ |
| 3. සිංහ, ධනු, මේෂ | - තේජෝ | - පළතුරු හා ඇට |
| 4. වෘෂභ, කන්‍යා, මකර | - පඨවි | - මුල් |

රූපය 9. මූල ධාතු හතර සහ රාශි චක්‍රය




ස්වාභාවික පැළෑටිවල විශ්ව ශක්තීන්ගේ සංයෝජනය

ගෙන්දගම්    රසදිය    ලවණ.

සිකුරු - කොළ, මල්    බුධ - කොළ, නැටි

හඳ - මුල්,    රවි - නාරටිය.

රූපය 10.1. ස්වභාවික පැළෑටි හා විශ්ව ශක්තීන්



කෘත්‍රිම කෘෂි රසායනික පොහොර යෙදූ පැළයක විශ්ව ශක්තීන්ගේ සංයෝජනය.

N- නයිට්‍රජන් - කොළ තුළ හරිත වර්ණය
P- ෆොස්ෆරස් - සොඳ මල් (බුධ), සීනි නිෂ්පාදනය.
K- පොටෑසියම් - මුල්

බුධ, සිකුරු - කොළ, මල්
ගුරු - පලතුරු
සඳ - මුල්

රූපය 10.2. කෘතිම රසායන පොහොර යෙදූ පැළෑටියක විශ්ව ශක්තීන්ගේ සංයෝජනය.



සඳ - මුල්
රවි - ලම්භාකාර වර්ධනය
බුධ සහ සිකුරු - කොළ සහ මල් පෙති
ගුරු - පළතුරු
කුජ - ඇන්තර සහ පරාග
ශනි - බීජ

**රූපය 10.3. ජෛවගතික කෘෂි පොහොර යෙදූ පැළෑටියක විශ්ව ශක්තීන්ගේ සංයෝජනය.**



රූපය 10.4. විශ්ව ශක්තීන් සහ භූගෝලීය සාධක
මිනිසාගේ ආහාර සමඟ සංයෝජනය

දළ මේඛලාව තුළ හිරු, සඳු හා වෙනත් ග්‍රහවස්තු තාරකා පද්ධති වලට සම්බන්ධීකරණය වෙයි. රවිගෙන් ආලෝකයත් උණුසුමත් ලැබේ. මේ වාර්ෂික චක්‍රයේදී සූර්යයා ක්ෂිතිජයේ පහළම ලක්ෂයේ, ගිම්හාන සූර්ය නිවෘත්තිය තුළ කෙටිම දිනය ගෙවයි. සිසිර සූර්ය නිවෘත්තියේදී උසම ලක්ෂයේ දිගම දිනය ගෙවයි.

මේ අතර දිවා රාත්‍රී දිගින් සමවන වසන්ත විෂුවය හා සරත් විෂුවය ගෙවයි. මේ පෘථිවියේ ප්‍රධාන දිශා 4 යි. ලෝකයේ සෑම රටකම මේ දින 4 උත්සවාකාරයෙන් සමරයි. ආගමික පුද සිරිත් සඳහා විශේෂ ස්ථානයක් හිමිවෙයි. සතුන්ගේ සංක්‍රමණය, මද කිපීම, අංකුර ලෑම, වර්ධනය, මල්, පළතුරු වලින් ලතා බරවීම, අක්‍රීය වීම, සමකාලික කරණය, සිදුවෙයි.

විශ්වයේ මේ ආශ්චර්යමත් සංසිද්ධීන්ට අනුකූලව කෘෂිකටයුතු වේගවත් කිරීමට යොදා ගෙන ඇත. ඒ අසිරිමත් විශ්ව ගවේෂණය සඳහා විවිධ උපකරණ භාවිතා කළේ මේ උදාර ක්‍රියාවලියට සමගාමීව විශේෂයෙන් කෘෂි කටයුතු දියත් කිරීමටය. ගණිත වගු එක්කර තාරකා විද්‍යාව පෝෂණය විය. තාරකා විද්‍යානුකූලව සූර්යයා ගිම්හානය මිථුන රාශිය, ශරත් සමය කන්‍යා, සිසිරය ධනු සහ වසන්තය මීන රාශිය ඉදිරියෙන් සිටී, මේෂ රාශිය වසන්ත විෂුවය, තුලා රාශිය ශරත් විෂුවය, ස්ථිර ලක්ෂ්‍ය දෙකය. විශ්ව ශක්තීන් වායුගෝලය සිසාරා නන් අයුරින් මිහිකත සිප ගනී.

රුඩෝල්ෆ් ස්ටයිනර් ලඟ ඇති ග්‍රහයින්ගෙන් අධික ප්‍රමාණය. මහත, අභිජනනය සිදුවන වග අවධාරණය කරයි. දූරස්ථ

ග්‍රහයින්ගෙන් පෝෂණය, සුවඳ, මල්ඵල දරනා සමයන්හිදී පරිණත බව ශනි, කුජ, ගුරුගෙන් සිදුවන වග කියයි. දූරස්ථ ග්‍රහයින් සදාකාලික පැළෑටිවලට හානිකරයි.

බුද, සිකුරු, සඳු පෘථිවියේ කැල්සියම්, පොටෑසියම්, සහ සෝඩියම් පූරණය කරයි. වේගවත්ව ශක්තිමත් ලෙස පැළෑටි වර්ධනයට දායක වෙයි. ජූල්ස් ශරත් විෂුවයට සමීප පසළොස්වක සඳට අස්වනු නෙළන්නට ගුරු, කුජ සහ ශනි ග්‍රහයින්ගේ විවිධ තාරකා පද්ධතීන්ගේ සහ සම්බන්ධකම් විදාරණය කරයි. සෑම විටම ග්‍රහ තාරකාවන්ගේ හා ග්‍රහයින්ගේ බලපෑම පැළෑටි වර්ධනයට බලපායි. මි.මී. 5 ක පමණ පෘථිවි ස්ථරය සංවේදී පටකයකින් වැසී ඇත. ඉන් විශ්වය හරහා ගලාඑන සියළු ශක්තීන් උරාගනී. පැළෑටි මිනිසා, සතුන් පස එකසේ එකට එක්වෙයි. පෘථිවිය විශ්ව ශක්තීන් විශාල ප්‍රමාණයක් උරාගෙන පැළෑටිවලට මුදා හරී. කැල්සියම් වායුගෝලීය සාධක පෘථිවියට ඇඳා ගනී. පස මැදහත්කරුවෙකු වී විශ්වය හා වායුගෝලය අතර ගැටෙමින් පෝෂ්‍ය පදාර්ථ කැටි කරයි. කෘතීම රසායනික පොහොර වලින් ප්‍රමාණය වර්ධනය කරන්නේ කැල්සියම් පොටෑසියම් හා සෝඩියම් නිසාය. පෝෂණ ක්‍රියාවලිය අසම්පූර්ණය. හෙමින් යන සමීපස්ථ ග්‍රහයින් වාර්ෂික පැළෑටි වර්ධනයට ප්‍රබල ලෙස බලපෑම් කරයි.

ස්ටයිනර්ගේ සංකල්පයට අනුව පරිසර පද්ධති තුළ සමතුළිත භාවය හොඳින් රැකේ. සමීපස්ථ ග්‍රහයින් නිසා ප්‍රබල ගැටීමක් පුස් ශාකවල කුඩිත්තන් නියමිත කාලයට පෙර පරාගනය

හා එල දැරීම සිදුවෙයි. මෙවැනි සිදුවීම් සාමාන්‍ය දේවල්ය. විශ්ව ශක්තීන්, පැළෑටි නිර්මාණයේදී ජ්‍යාමිතික හැඩ රුව, වර්ණය දුරස්ථ ග්‍රහයින් සපයයි. සතර මහා භූත කොටස්, පෘථිවි තලයේ කැල්සියම් වලින් සිලිකා මාධ්‍යයක් තුළදී විශ්ව ශක්තීන් විශාල ප්‍රමාණයක් උරා ගනී. හරිතප්‍රද (Chlorophyl) අංශු මැග්නීසියම් මූල විපර්යාසයන්ට ලක්කර හිමොග්ලෝබින් අංශු යකඩ මූල සමඟ එකිනෙක සම්බන්ධ වෙමින් ගෝලාකාර වස්තුන්ගේ චුම්භක ක්ෂේත්‍ර ආකර්ශනය කර ගනී. ග්‍රහ වස්තු අධි බලැති කිරණ පැළෑටි තුළට ඇතුල් කරයි. සමනළයයි, මලයි හොඳම උදාහරණයකි. ග්‍රහ කිරණ පැළෑටි තුළට ගලා විත් හැඩතල නිර්මාණය කරයි. පැළෑටි හ්‍යුමස් පසෙන් උරාගෙන පෝෂණ ක්‍රියාවලිය සකස් කරගනී.

## තාරකා පද්ධති හා දීප්තිමත් තරු

අපේ මන්දාකිණිය තුළ සිය දහස් ගණන් තාරකා පද්ධති ඇත. ඉන් අපේ රාශි චක්‍රය, $9^0$ ක් උතුරටත්, $9^0$ ක් දකුණටත් දෝලනය වේ. තාරකා නිවි නිවී දිළිසෙයි. විශාල චුම්භක ව්‍යූහය නිසා උරාගන්නා ග්‍රහලෝක ආලෝක ධාරා පරාවර්තනය කරයි. රවිගෙන් විනාඩි 8 කදී පෘථිවිය මතුපිට වායුගෝලය උණුසුම් වෙයි.

සෑම ග්‍රහ වස්තුවක්ම ආලෝකය මෙන්ම ශක්තිය මුදා හරියි. නිහාරිකා, ග්‍රාහක, ධූමකේතුද ශක්ති ධාරා නිකුත් කරයි. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ටොලමි විසින් වසර 2000 කට පෙර මෙසපොටේමියානු ශිෂ්ඨාචාරයෙන් සොයාගත් ඉපැරණි

විශ්ව තොරතුරු රාශියක් අනාවරණය කරන ලදී. ග්‍රීක තාරකා විද්‍යාඥයින්ගේ සහ ජ්‍යොතිෂ විද්‍යාඥයින්ගේ ග්‍රහ සංකල්ප තුළ රාශි චක්‍රය ක්‍රාන්ති වලය මත පිහිටුවා $0^0$ මේෂ රාශිය, $180^0$ තුලා රාශිය, $90^0$ කටක රාශිය, $270^0$ මකර රාශිය කෘෂි චක්‍රය සේ හඳුන්වන ලදී. වසර 72 කට වරක් $1^0$ ක වෙනසක්ද පෙන්වයි. අනාදිමත් කාලයක සිට තාරකාවන් ජීවීන්ගේ පැවැත්මට බෙහෙවින් බලපෑ බව පිළිගනී.

වෘෂභ තාරකා පද්ධතිය තුළ ඇති සොයුරියෝ හත්දෙනා නමින් හඳුන්වන හත් දින්නත් තරු - ප්ලෙඩිස් (Pleids), සීරියස් (Serius), ටෝකන් (Toucan) වැනි තරු රටා පායනවිට ගංගාවන් උතුරා සරු පස පිටාර තැනි වල තැන්පත් වනු බලා වගා කටයුතු සාර්ථක ලෙස නිම කළහ, සදර්න් ක්‍රොස්, ඔරායන්, උතුරු තරුව කාගේත් මතකයේ රැඳෙයි. හයිඩ්‍රජන්, හීලියම්, අයන්, සෝඩියම්, කාබන් විකාශනය කරයි. මේ ශක්ති ධාරා රඳවා ගැනීමට විවිධ ක්‍රම ලොව පුරා ප්‍රචලිතය. පොහොර මිශ්‍රණයේ වල පතුලට හරක් අං, සිලිකා පිරවුම් යොදා මෙම ක්‍රියාකාරිත්වය පණ ගන්වයි. වගා ලිත් වල මෙම සංසිද්ධීන් වාර්තා කර කෘෂි කටයුතු දියත් කරයි. මීට අමතරව ගස් කොළං කපා කැළෑ හෙළිකර ආලෝක කිරණ ගලා එන්නට සලස්වයි.

සූර්ය ග්‍රහණ, චන්ද්‍ර ග්‍රහණ, දූරකය (Apogee) සමීපකය (Perigee), සඳ අලුත් රාශියකට යාම, පුරහඳ දවස, පෝය 4, චන්ද්‍ර නෝඩ, බුධ, සිකුරු, කුජ නෝඩ වලදී කෘෂි කටයුතු වලින් ඈත්ව සිටින ලෙස නිර්දේශිතය.

## පැළෑටි වර්ධනය හා නක්ෂත්‍ර චක්‍රය

කෘතීම රසායනික පොහොර වලින් ප්‍රමාණය පමණක් වැඩිකරයි. සමීප ග්‍රහයින්ගෙන් පෘථිවි පෘෂ්ඨයේ ඇති කැල්සියම්, සෝඩියම්, පොටෑසියම්, වැනි ලෝහමය මූලද්‍රව්‍යයන් ගේ සමතුලිතතාවය රකී. පුස්, කුඩිත්තන්, අකලට මල් එල දැරීම පරාග වර්ධනයද කරයි. සූර්යා නැතිව අපට ජීවත් විය නොහැක. ප්‍රභාසංශ්ලේෂණයක්ද සිදු නොවේ. වර්ණාවලියක් නැත. වර්ණ 7 ක් මුදාහරින බවට දේදුන්න හොඳම සාක්ෂියකි. හිරුළප පැළෑටිවලට මහත් ව්‍යසනයක් ගෙනෙයි.

සූර්ය ග්‍රහණ මිහිපිට ඇති සියළු දේට අහිතකර බලපෑම් ඇති කරයි. සූර්ය ශක්ති ප්‍රභවයන් මිනිසා පරිසරයට හැඩ ගස්වයි. දියලු පස් සහිත තෘණභූමි, සදාහරිත වනාන්තර, දේශගුණික විපර්යාසයන් සොබාදහමේ දායාදයන්ය. මල් පිපෙයි. පළතුරු ඉදෙයි. මීවද පැණි පිරෙයි. හිරු එළිය නොලදවිට ශීත කාන්තාර ඇතිවේ. අධිකවූ විට උෂ්ණ කාන්තාර ඇතිවේ. සූර්ය ශක්තිය අඩු ස්ථානවල පොලිතීන් සහ පොලිප්‍රොපිලීන් ආවරණ තුළ සූර්ය ශක්තිය ගබඩා කර ගනී. ලොකු කුඩා සියලුම ග්‍රහ තාරකාවන්ගේ කිරණ අවශෝෂණය කරගනී.

ගුරුත්ව බලය නිසා ඒවා විනාශ නොවී එකිනෙක සම්බන්ධව පවතී. සූර්යාට මුළු විශ්වයම ආලෝකමත් කළ හැකි වුවත්, ක්ෂිතිජයෙන් පහළ සිටින විට, පාරජම්බුල කිරණ පෘථිවි තලයට ළඟා විය නොහැක. ග්‍රහ වස්තු, සඳු, කුජ,

පෘථිවි, බුධ, සිකුරු, ගුරු, ශනි, නැප්චූන්, යුරේනස්, ප්ලූටෝ හා ග්‍රාහක සූර්යා වටේ ගමන් කරයි. චන්ද්‍රිකා තමන්ට අයත් ග්‍රහයා වටේ ගමන් කරයි. කුඩා ග්‍රහ වස්තු විශාල සංඛ්‍යාවක්, විවිධ වායූ වර්ග දූවිලි අණු වැනි විද්‍යුත් චුම්භක තරංගවල න්‍යෂ්ටික වියලන ස්කන්ධ ප්‍රතික්‍රියාව (Nuclear Fusion Reaction) නමින් හඳුන්වයි. ග්‍රහයින් සංචාරකයින්ය.

- $0^0$ - සංවතීය (Ocultation, Conjuction) : රවි සඳු වැනි ග්‍රහලෝක එක තලයකට ආවිට සැඟවීමක් සංවතීයක් සිදුවේ. එනිසා අඩු හා වැඩි වායු පීඩන, තෙතමනය, වර්ෂාව හා කුණාටු තත්වයක් ඇති කරයි. අධික ලෙස ශක්තිය මුදා හරී. අනෙක් ග්‍රහ කිරණවලට බාධා ඇති කරයි.

- $72^0$ - පංචාශ්‍රයකදී (Quintile) : අහස් යානා, නැව්,රථවාහන අනතුරු, ගිනි විපත් පිරිමින්ගේ මානසිකත්වය බිඳ වැටීම හා කුණාටු ඇතිවේ. ග්‍රහයින් සූර්යා දෙසින් පෘථිවියට හැරී දඟර පිම්මක් (Loop) ගනී. මෙවැනි දඟර ගමන් වලදී, පෘථිවියට අධික ශක්ති ප්‍රමාණයක් මුදාහරී.

  මේ රවුම් වර්ෂයකට එකක් පමණ විය හැකි වුවත් මනෝ විද්‍යාත්මක නැඹුරුවක් ඇති කරයි.

- $90^0$ චතුරස්‍ර **(Quadrate)** :

  පුර සඳ හෝ අවසඳ $90^0$ කට ආවිට චතුරස්‍රයක් සෑදේ. නෙප්චූන්, යුරේනස්, ප්ලූටෝ සඳ සමග චතුරස්‍ර වූ විට

කාලගුණික වෙනස්කම් ඇතිකරයි. සැඩසුළං, අකුණු වැසි හෝ මද වැසි ගෙනෙයි. නැප්චූන් භූමිකම්පා ඇතිකරයි. භූමිකම්පා නැති ප්‍රදේශවලට සාමාන්‍ය භූ චලන, සැඩ සුළං, චණ්ඩමාරුත, වේගවත් වැසි කුණාටු, ස්වභාවික විපත්, විනාශකාරී හදිසි විපත් ඇති කරයි. ප්ලූටෝ යමහල් විදාරණය කර ලාවා වැඩි කරයි. ප්‍රචණ්ඩ කැළඹීම් ඇතිකරයි. තවත් ග්‍රහයින් සාමාන්තර වූ විට මීටත් වඩා, කරදර ඇතිකරන්නේ විශේෂයෙන් ගොවියාටය.

- **$120^0$ ත්‍රිකෝණ (Trines) Δ** : ත්‍රිකෝණ අන්තර්මාධ්‍යකරුවන් සේ කාලගුණය කෙරෙහි බෙහෙවින් බලපායි. තාරකා පද්ධතීන්ට අදාළ මූල ද්‍රව්‍යයන්ට පසුබිම සකස් කරයි. සතර මහා භූතයන්ගේ ආවේගශීලි අවස්ථාවන් නිර්මාණය කරයි. අන්තරීක්ෂ මාධ්‍යකරුවන් සේ කාළගුණය කෙරෙහි බලපෑම් ඇතිකරයි.

  විවිධ කාළගුණික විපර්යාසයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වයන් ශක්තිමත් කරයි. සියළුම තාරකා පද්ධතීන්ගේ මූලද්‍රව්‍යයන්ට පසුබිම නිර්මාණය කරයි.

- **$0^0$ - $180^0$ සප්තම (Opposition)** : පූරහඳ හා සෙනසුරු $0^0$ - $180^0$ ට සිටිවිට කාලගුණික විපර්යාසයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වයන් ශක්තිමත් කරයි. සියලුම තාරකා පද්ධතීන්ගේ මූලද්‍රව්‍යයන්ට පසුබිම

සකස් කර සතර මහා ධාතුන්ගේ ආවේගශීලි අවස්ථාවන් නිර්මාණය කරයි. සප්තමයකදී, පෘථිවි පෘෂ්ඨය කම්පනය වේ. මේ ආතතිය කෘෂි කටයුතු වලට ඉතා ශුභයි. පැළෑටි වර්ධනයට ඉතාම ශුභදායකය. ශනි, චන්ද්‍ර දෙදෙනාගේම ශක්ති කදම්භයන් එකිනෙකට කාවැදී අධික බලයක් උද්ගත වෙයි.

මේ අධිවේගී කිරණ පැළෑටිවල වර්ධන වේගය තීව්‍ර කරයි. ඇට වැපිරීමට, ඇට සිටුවීමට, සිලිකා මිශ්‍රණය යෙදීමට හොඳම කාලයයි. ප්‍රරෝහණයට, ශක්ති වර්ධනයට අධික ජීවයක් ඇති කරන වග ෆ්‍රාන්ස් රූලිං අවධාරණය කරයි. තත්වයෙන් උසස් බව මෙන්ම කුඩා පුස් ද වර්ධනය කරයි. ශාක ශක්තිමත්ව හොඳින් වැඩෙයි. කෘමි හිංසා අවමය. හරිත වර්ණ එළවළු සාරය හා 501 මිශ්‍රණය ඉසීමට නොරිස් ජියස් (1989) දී යෝජනා කළේය. වැල් දොඩම්, ගෝවා, මිදිවල පුස් රෝග මර්ධනය කරයි. රුඩොල්ෆ් ස්ටයිනර් සිලිකා හා රසායන ද්‍රව්‍ය දෙකේ සමබරතාවය හෙළි කළේය. කැල්සියම් හා ග්‍රහ තාරකා අතර අන්තර් ක්‍රියා වර්ධනය කරයි.

## ග්‍රහ ලෝක

- පෘථිවිය (Earth) : $23^{1}/2^{0}$ ක් ඇළව ඇත. මේ හා සමග පෘථිවි පරිභ්‍රමණය නිසාත් සෘතු විපර්යාසයන් සාදයි. එය කෘෂි චක්‍රයයි. කෘෂි කටයුතු ක්‍රමානුකූලව සකස් කළ හැකිවී තිබේ.

- රවි (Sun) : හයිඩ්‍රජන්, හීලියම් වැනි විවිධ වායු වර්ග ඇත. මිහිපිට ඇති සියල්ලටම ජීවය ලැබෙන්නේ හිරුගෙනි. ප්‍රභාසංශ්ලේෂණය විශේෂයි. සූර්යාගේ වර්ණාවලිය අලංකාරය. දම් සහ නිල් අතර වර්ණය (Indigo), නිල් (Blue), කොළපාට (Green), දම්පාට (Violet), දොඩම් පැහැය (Orange), පැළෑටිවලට පාරජම්බුල කිරණ (Ultra Violet Radiations) මගින් වර්ණක ලබාදෙයි. ආර්ථික වාසි සඳහා විවිධ වර්ණ වලින් යුත් පැළ වගා කරයි.

- කුජ (Mars) : රතු, නිල්, කොළ, දුඹුරු වර්ණ ඇත. ඍතු විපර්යාසයක් පවතී. මේ වර්ණාවලිය පැළෑටි නිෂ්පාදනයන්ට වර්ණක දෙයි.

  ඇන්තර, පරාග හා පරාගධානි වර්ධනයට බෙහෙවින් බලපායි. කුජ නෝඩ පැළෑටිවලට හානිකරය. ෆෝබෝන් (Fourbourn) හා ඩයිමර්ස් (Dymers) ලෙස කුඩා හඳවල් දෙකක් ඇත. සීරියස් තරුව කුජ හා ගුරු අතර පිහිටා ඇත. ප්ලේඩිස් තරුව හත්දින්නත් තරු සහ සහෝදරියන් හත්දෙනා නමින් හැඳින්වේ. කුජ අධික වැසි ගෙනෙයි. ජල රාශිවලදී වට දඟර ගැසීම් නිසා රක්ත වර්ණයෙන් විශාල ශක්ති ප්‍රභවයක් මුදාහරී. කුජ කාබන්ඩයොක්සයිඩ් වායුව පිටකරයි.

- බුධ (Mercury) : පෘථිවියට ළඟින්ම සිටී. උදේට (Apollo) හවසට (Hermes) යනුවෙන් හඳුන්වයි. සුමේරියන්වරුන් විසින් දෙවියන්ගේ පණිවිඩකරු ලෙස හඳුන්වා දී ඇත.

පිට පෘෂ්ඨය දම් සහ අළු පැහැතියි. දූවිලි සහිත වලාකුළු විසුරුවා ගනී. පෘථිවියට අධික බලපෑම් ඇති කරයි. වෛද්‍ය සංකේතයයි. වෙද නලාවට යොදා ඇත්තේද බුධගේ සංකේතයයි.

➢ ගුරු (Jupiter) : දීප්තිමත් රන්වන් වර්ණයක් ඇත. දෙවියෙකු සේ සලකයි. උණුසුම්, වේගවත් චණ්ඩ මාරුත ඇති කරයි. නිරක්ෂය, අළුපාට තීරයකි. චන්ද්‍රිකා 16 කි. දූවිලි වළලු ඇත. ගුරු බලවත් නම් මිනිසුන් මෙන්ම සතුන්ද මහතින් වැඩේ.

ඇමෝනියා විසිරී දකුම්කළු වර්ණවත් පටි සෑදී ඇත. හයිඩ්‍රජන්, මීතේන්, ඇමෝනියා වායු ඇත. රෝස පාට වලාකුළු වලින් වැසීයයි. පැළෑටි මේ කාලගුණික රටාවන්ට අවනත වේ. රතු ලපය වේගයෙන් කැරකෙන කුණාටු වලාවකි.

➢ සිකුරු (Venus) : ඉරබට තරුව හා සිකුරු තරුව නමින් හඳුන්වයි. අතිශයින්ම චමත්කාරය. රෝමන්වරු දෙව්දුවක සේ අදහයි. වලාකුළු සහිතය. උත්පාදක ශක්තිය, කලා කෞශල්‍යය, ආදරය වගේම විෂ සහිත බවද ප්‍රචලිතය. වසන්තයේ දෙවඟනකි. මල්, පළතුරු, වැවීමට, සිකුරු බලවත් කාලය ඉතාම හොඳය. කැල්සියම් පාලනයට කදිමය. තුෂාරය සහිතය. සල්ෆියුරික් ඇසිඩ් අන්තර්ගත වේ. එක පිම්මකදී විශාල ශක්ති ප්‍රමාණයක් මුදා හරී. බැසෝල්ට්, කාබන්ඩයොක්සයිඩ් වායු ඇත. කොළ, සුදු, කහ වර්ණ ඇත.

- ශනි (Saturn) : මළානික කහ වර්ණ ධාරා ඇත. ශනිගේ වළලු 4 අලංකාර නිමාවකි. 1610 දී ගැලීලියෝ විසින් නිරාවරණය කරන ලදී. චන්ද්‍රිකා 18 කි. හරිතාගාර සංකල්පය නිසා පෘථිවි ගෝලය උණුසුම් කරයි. පීඩාකාරී වායු ධාරා වලින් කාලගුණික විපර්යාසයන් ඇතිවෙයි. පැළෑටි වර්ධනය පමා කරයි.

  සඳු උච්චයේ සිටින විට ශනිගෙන් පැළෑටිවලට විශාල වර්ධනයක් ලබාදෙයි. සියළුම තාරකාවලින් එන ආවේග දැරීමට ශක්තියක් ඇතිවේ. මීතේන් වායුව ඇත. නිල්පාටය.

- යුරේනස් (Herschel) : නමින් ප්‍රසිද්ධය. සඳවල් 15 කි. නිල් කොල වර්ණ ඇත. උත්තර ධ්‍රැවය සූර්යා දෙසට නැමී ඇති බව කියයි. හයිඩ්‍රජන්, මීතේන් වායු පටියකින් වැසී ඇත. වෙනත් චක්‍රාවාටයක සිටියත් අපට අධික අකුණු වැසි ගෙනෙයි. වේගවත් සුළං, ගංවතුර නිතරම ඇති කරයි. දිවා කල අධික රශ්මිය සැඩය. රාත්‍රිය අධික සිසිල්ය. කාලගුණය සැඩපරුෂය. විද්‍යුත් ශක්තීන් බලවත්ය. වෙනත් ග්‍රහයෙකු සමග ඍජු කෝණිකව සිටි විට අකුණු, ගර්ජනා ඇතිකරයි. පැළෑටිවලට විශාල පුනර්ජීවයක් ගෙනෙයි. $90^0$ ක දී අධික විද්‍යුත් ශක්තිය නිසා අකුණු කේන්ද්‍රයක් සාදයි.

- නෙප්චූන් (Neptune) : නීලවර්ණ තැටියකි. හයිඩ්‍රජන්, මීතේන්, ඇමෝනියා වායුවලින් සමන්විතය. අධික සේ

සිසිල්ය. දැඩි සුළං, ගංවතුර, අකුණු වැහි කුණාටු ගෙනෙයි. චුම්භක ක්ෂේත්‍රය පුළුල්ය. සංවත්යකදී භූමි කම්පා, දරුණු කුණාටු, දෙයි. ප්‍රචණ්ඩ මාරුත සහිත වැසි චතුරස්‍රයකදී ගෙන එයි. ක්ෂණික වෙනස්වීම් සහිතය. චුම්භක ක්ෂේත්‍රයේ දරුණු කැළඹිලි නිසා භූමිකම්පා ඇති කරයි.

මුහුදේ රළ තරංග උදම් නිසා සුනාමි තත්වයක් ඇති කරයි. පොළව කම්පා වෙයි. $72^0$ කදී පංචාශ්‍රයක සිටි විට මධ්‍ය කේන්ද්‍රයේ මාධ්‍ය හා විශ්ව ශක්තීන් කළඹා කුණාටු වැහි වස්වා අධික බලපෑමක් කරයි. මිනිසුන්ද සිව්පා සතුන්ද ඉවසිය නොහැකි තරම් කලබල වෙයි. සඳත් ඇත නම් මේ තත්වය දරුණු වෙයි. ඇට ඉසීමට සිටුවීමට අපහසුය. ගස් උසින් වැඩේ.

- ප්ලූටෝ (Pluto) : එක චන්ද්‍රිකාවක් ඇත. අඳුරට රජුය. ඇතැම් විට සූර්යාට ළංවෙයි. එය චන්ද්‍රිකාවක්ද කියා විද්‍යාඥයින් සැක කරයි. ප්ලූටෝගේ ඇතැම් ග්‍රහ දෘෂ්ඨී අධික හෙණ විදුලි ගෙනෙයි. වේගවත් සුළං හමයි. යමහල් විදාරණය කරයි. ප්‍රචණ්ඩ කැළඹීම් සහිතය. ගංවතුර ගෙනෙයි. කාලගුණය කෙරෙහි විශේෂ බලපෑම් කරයි. දැඩි සීතලක් ඇති කරයි.

- නැප්චූන්, යුරේනස්, ප්ලූටෝ දුරස්ථ ග්‍රහයින් වුවත් කෘෂි කටයුතු වලට විශේෂ පෝෂණ ක්‍රියාවලියක් දෙයි. ගිණි විපත් හා ආර්ථික විෂමතා ඇති කරයි. අකුණු මෙන්ම යමහල් විදාරණය කරයි. සිලිකා මාධ්‍යයක් තුළ මේ කිරණ පහසුවෙන් ක්‍රියාත්මක වේ.

- සඳු (Moon) : දේව ආශිර්වාදයකි. සුරංගනාවියක් සේ විශ්ව ශක්තීන් උරාගෙන බෙදාහරියි. පරාවර්තිත ශක්තීන් නැවත විශ්වයට මුදාහරියි.

රාශියෙන් රාශියට යමින් විශාල ශක්ති ප්‍රමාණයක් උරාගනී. මේවා සඳේ ආකර්ෂණයට හසුවෙයි. නැවත මුදා හරියි. ජල මාධ්‍යයකදී මෙය සිදුවේ. තත්පර එකහමාරකදී සඳ රැස් ගලාවිත් තත්පර දෙකකදී විසිරී යයි. මිනිසාගේ, සතුන්ගේ පැළෑටිවල, පසෙහි, කඳුවල සහ ජලයේ සඳේ ගුරුත්වාකර්ෂණය ඇත. සෙම, දරු උපත්, වර්ගයා බෝවීම, ඔසප් චක්‍රය, වර්ධනය, අනාගත වාක්‍ය කීම, සඳරැස් නිසා සිදුවේ. සඳ කම්පාවීමකදී පැළෑටි වර්ධනයට බාධා සිදුවේ. දිලීර වර්ධනය වේ.

සඳ විශ්ව සම්ප්‍රේෂණයක් සේ ක්‍රියාකරයි. මේ කාලය පැළෑටිවල අධික වර්ධනයක් සනිටුහන් කරයි. පසෙහි ඓන්ද්‍රිය ද්‍රව්‍යයන්ද වැඩිවෙයි. ජීවීන්ගේ ප්‍රචණ්ඩත්වය වැඩේ. පැළෑටිවලට සඳුගේ බලපෑම ප්‍රබලය. ඇතැම් අවස්ථාවල කිව නොහැකි සේ වෙනස් වෙයි. වෙනත් ග්‍රහ කැළඹීම් ඇති විට එසේ සිදුවේ. සාගර උදම් හෝ භූමි කම්පාවලට ගුරුත්ව බලය නිසා ඇතිවන ඇදගැනීම තදින් සිදුවේ. ගස්වල පොත්ත තුළ ජලය පිරෙයි. අස්වැන්න නෙලීම, පිරිමින්ගේ ශාරිරික හා මානසික ආවේගශීලීත්වය වර්ධනය කරයි. සඳුගේ කලා ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කරයි. පෝය 4 කෘෂි කටයුතු අතහැර ආගමික කටයුතු කරයි. සඳු මිනිසාගේ

මෙන්ම ආශාවන් හා සංවේදීතාවයන් උත්සන්න කරයි. ජුනි 21 සිට ජුලි 22 දක්වා සඳුගේ බලය අධික වෙයි.

ජූලි 15 සිට ඉදිරියට අනෙක් ග්‍රහයින්ගේ රශ්මි උරාගෙන තමන්ගේ ශක්ති වර්ධනය කරගනී. මැයි 1 සිට 10 දක්වා මේ ශක්තිය රවිගේ උත්තරායනයට පිවිසීමේ සිට වැඩිවේ. ප්‍රේමාන්විත චමත්කාර හැඟීම් උත්සන්න වේ. වර්ගයා බෝ කිරීමට සතුන් ගැබ් ගැන්වීමට හොඳම කාලයයි. කන්‍යා රවිය තුළ සැප්තැම්බර් 16 සිට 23 දක්වා අවිනිශ්චිත කාලයකි. තුලා රාශිය තුළදී සම තත්වයක් ඇති කරයි. දෙසැම්බර් 1 සිට 10 දක්වා මානසික වේදනාවන් අධික වෙයි.

උදම් සහ වායු දහරා කැළඹේ. අකුණු ඇති කරයි. රිද්මයානුකූලව සියල්ල සිදුවෙයි. බීජ ප්‍රරෝහණය උපරිමයි. මාසයකට දෙවරක් වර්ධනයට බාධක සිදුවන්නේ අධික වැසි නිසාය. නව සඳෙන් පසු වැසි අධිකය. පෘථිවියට ලංවීමේදී උදම් 30% කින් නගී. උදේට නැගෙනහිරටත් සවසට බටහිරටත් පැයක වේගයෙන් පැළ වර්ධනයට හානි කරන වායු ධාරා ගලා යයි. උදම්, චන්ද්‍ර සුළං, පෘථිවි කම්පන පෘථිවි පෘෂ්ඨයේ සෙලවීම් ඇති කරයි. අකුණු වලදී සහ අයනීකරණයේදී එය අධික වෙයි. මේ විශ්ව ශක්තීන් විවිධ රසායනික සංයෝග නොයෙදූ කාබනික ව්‍යූහයක් ඇති පසට හොඳින් උරාගනී. විශ්වයේ රැඳි විද්‍යුත් චුම්භක කිරණ ගමන් කරන මාධ්‍ය ඊතර, ගොම වලට හොඳින් උරා ගනී.

සඳ නම්‍යශීලී ඉලිප්සාකාර කක්ෂයක ක්ෂීණව තිථි 15 ක් ද මෝරමින් තිථි 15 ක් ද ගෙවයි. සූර්ය ශක්ති ප්‍රභවයන් විවිධ කෝණ වලින් විසි කරති. දින 27 කට වරක් සඳේ ඈතම ලක්ෂ්‍යය නම්‍යශීලී වෙයි. මාසයකට දෙවරක් $5^0$ උතුරටත් $5^0$ ක් දකුණටත් දඟර (Zigzag) ගමනක් යයි. මේවා දඟර (Wobbles) නම්. මේ නිසා නෝඩ ඇති වේ. මෙවැනි නෝඩයකදී නව සඳට හෝ පුර සඳට ග්‍රහණ සිදුවේ. මාරියාතුං වායු ධාරාවන්ට සහ වායුගෝලීය උදම්වලට බලපෑම් ඇති කර පැළෑටිවලට හානි පැමිණෙන වග අවධාරණය කළාය. බීජ ප්‍රරෝහණයට ද බාධා සිදුවේ. ශනි, සඳු සංයෝග සදාකාලික පැළවලට අතිශයින්ම සුදුසුය.

පෘථිවිය, හිරු හා සඳු අතරට ආවිට සංවර්තියක් (Conjunction) සිදුවේ. එමෙන්ම සඳ නොපෙනී යයි. හිරු රැසින් සඳ ආලෝකවත් නොවී ග්‍රහණ සිදුවේ. නෝඩ හා ග්‍රහණ දෙකම පැළෑටිවලට අහිතකරයි. හඳ මෝරන විට (Waxing) වර්ධනය, උපත් වැඩිවෙයි. ක්ෂීණ සඳු (Waning) වර්ධනය බාලකර කෘමි වසංගත ක්‍රියාකාරී කරයි. පුරහඳට දියර උරාගැනීම උපරිමයි. අවසඳට අඩු වෙයි. විවේකයකින් පසු එලබරින් ගස්වැල් පිරීයයි. උදාසීන බව මඟහැරීයයි.

## සඳේ කලා අනුව භෝග වගා කළයුතු අයුරු

- නව සඳ (Wane Moon) $0^0$ සිටින විට පෘථිවිය යටට ගැළපෙන මුල් හා අල වවන්න. ජලය අඩුවෙයි. බීට්, කැරට්, පාර්ස්ලි, අර්තාපල්, ලූණු, ටර්නිප්, වැල් අල, දේශීය අල, මඤ්ඤොක්කා වැනි අල වර්ග සුදුසුය.
- තුන්වෙනි කාර්තුවේදී පොතු හා මුල් ලබාගන්නා ගස්, පලතුරු පැළ වර්ග, ස්ට්‍රෝබෙරි ආදී ශාක වර්ග වවන්න.
- තුන්වෙනි හතරවෙනි කාර්තුවලදී සදාකාලික පැළ (Perennials) වවන්න. පොටෑසියම් උරාගැනීම උපරිමයෙන් සිදුවේ.
- පොහොර හදන්න. කාබනික පොහොර ගොඩ තුනී කරන්න. පෙරලන්න.
- තුන්වෙනි කාර්තුවේදී පැළවල නොතැවරෙන සේ පිදුරු, තණකොළ රොඩු (Mulch) යොදන්න.
- 4 වන කාර්තුවේදී පළතුරුවලට බෙහෙත් ඉසින්න.
- වල්පැළ උදුරා පැළෑටි තුනී කරන්න.
- පසු වියළි සෘතුවේදී තණකොළ කපන්න.
- ගස් කප්පාදු කරන්න.
- ඇපල්, ගෝවා, අර්තාපල් අස්වැන්න ගන්න.

- මල් ඇට වර්ග කල්තබා ගැනීමට සූරුකුම් යොදන්න.
- අල, මුල්, පොතු, කොළ ඖෂධ කුඩු හදන්න. රැස් කරන්න.
- ඇට මල්, පැළෑටි, පළතුරු වේලා ගබඩා කරන්න.
- සනමුල්, වර්ධනය පාලනය කළ යුතු පැළ සිටුවන්න.
- පුර හඳට (Waxing Moon) සඳ $180^0$ ක් දුරින් සිටියදී, අළුත් පැළ සිටුවන්න. විශාල ශක්ති ප්‍රමාණයක් උරා ගනී.
- වර්ධන වේගය, එල ගැන්වීම අධිකය.
- කෘමි වසංගත මර්ධනය කරන්න.
- ජලය විශාල ප්‍රමාණයක් උරාගන්නා නිසා පුර හඳට දින 2 කට පෙර ඇට වපුරන්න.
- විශාල බිම් ප්‍රමාණයක් වගාකළ හැකිය.
- ධාන්‍ය වර්ග, තෘණ භූමි, කොළ එළවළු, මල්, ලස්සනට, සුවඳට වවන පැළ වවන්න.
- රෝස, 1 වෙනි කාර්තුවල වවන්න.
- වියලි කාලයක් නම් පුරහඳට ආසන්නව ඇට වපුරන්න.

- අතු බද්ධ කරන්න. මේ කටයුතුවලදී ශනි සඳු සම්බන්ධකම් ඉතා හොඳය. ජනවාරි අගදී අතු බද්ධ කිරීමට කදිමයි.

- පැළ ගලවා සිටුවීමට, පෝච්චිවලට දැමීමට අගනා කාලයකි.

- 1 හෝ 2 කාර්තුවලදී පැළවලින් රිකිලි කපා පැළ කරන්න.

- පළතුරු, එලවළු ඉක්මණින් පරිභෝජනය කරන්න. සලාද වර්ගවල පෝෂණය රැඳේ. ඒවායේ තෙතබරිත බව හපන්නට පහසු කරයි.

- ලී වැනි තදගතිය හා අප්‍රසන්න වයනයක් නැතිවේ.

- පුරහඳට මිදි යුෂ මිරිකන්න. මිදි පොකුරුවල යුෂ පිරේවි.

- පැළැටි අවස්ථාව තෙල් ගැනීමට සුදුසුම කාලයයි.

- පොහොරවලට දිය ඉහින්න.

බුධ ග්‍රහයා වක්‍රවීමේදී හෝ පූර හඳට සඳුගේ දඟර ගමන් අතිශයින්ම පීඩාකාරීවේ. අනතුරු අධිකය. හිංසාකාරීය, භූමිකම්පා යමහල් විදාරණය, සමුද්‍ර ඛාදනය, මිනිසුන්ට දරුණු විපත්, ස්වභාවික සම්පත් විනාශය සිදුවේ. මරණ අධිකය. කාල් ජේනි ටෝබේ, අමෙරිකානු ගණිත හා ජ්‍යොතිෂ විශේෂඥයා මේ ගැන හොඳ විවරණයක් කර ඇත.

හිරු රාශි ගතවීමකදී සඳුගේ නෝඩයකට අසුවූ විට තියුණු ශක්තීන්ගේ වක්‍රාකාර චලනය වීම හේතුවන නිසා කරදරකාරි බවක් ඇතිවේ. සඳුගේ දඟර 3 ක් හෝ 4 ක් වසරක් තුළ දී සිදුවී සති 3 ක් පමණ පීඩනයක් ඇති කරයි. අනපේක්ෂිත විශ්ව ශක්තීන්ගේ කැළඹීම් නිසා මරණ සංඛ්‍යාව අධික වෙයි. මේවාට බියෙන් සැඟවිය නොහැක. නව සඳ ක්‍රාන්ති චලය කපා යන විට සූර්ය ග්‍රහණයක් සිදුවේ. පුරහඳ පෘථිවියෙන් සැඟවුනේ නම් චන්ද්‍ර ග්‍රහණයක් සිදුවේ. ක්‍රාන්ති චලයට උඩින් නගින නෝඩයක් සිදුවේ. යටින් බහින නෝඩයක් සිදුවේ. උදම්වලින් මුහුදු වෙරළේ ඇති සතුන්ගෙන් හා පැළෑටි හරිත වර්ණ පටක තුළින් දැකිය හැකිය.

ඒවා ආලෝක ධාර උරාගන්නා අපේ ඇස් මෙන් රශ්මි මාලා ග්‍රහණය කර ගනී. කෘෂි කටයුතුවලදී ඉතාම හොඳ ප්‍රතිඵල ගන්නට නම් සඳගමනට අනුව වගාකළ යුතුය. මාරියා තුං සහ ඇගේ පුතු මාතියාස් සඳගමන් අනුව වගා කටයුතු (Moon Sign Planting) නිර්දේශ කළහ. විද්‍යාඥයින් සහ කෘෂි විශේෂඥයින් ගේ අනුමැතිය ඉහළින්ම මේ සඳහා ලැබිණ.

ජී. වොච්ස්මත් 1945 දී විශ්ව සම්භවන ක්‍රියාවලීන්ගේ අන්තර් සම්බන්ධතාවයන් රාශි චක්‍රයට අනුකූලව පවතින අයුරු මැනවින් සොයා බැලුවේය. ඓන්ද්‍රිය ද්‍රව්‍යවලින් පෝෂිත පස චුම්භක ශක්තීන් පහසුවෙන් උරා ගනී. හෝමියෝපති ක්‍රමයට බෙහෙත් දියර මිශ්‍රණ වාර ගණනක් කලතන විට

විශ්ව ශක්තීන් ජල මාධ්‍ය තුළින් ඇතුල්වේ. අපේ ගැමියන් අඹ, දෙහි, අතු හා ඇණවලින් කලතමින් තෙල් වර්ග කහ දියර, සඳුන් දියර, වැලි, මෙසේ මතුරා ආරක්ෂා කර උවදුරු දුරුවීමට ඉසී. බීමටද දෙයි. හිසේද ගල්වයි. වර්ධන වේගය ද වැඩි කරයි. සඳු මකර රාශියේ සිටින විට ගස්වල පොතු විශාල ශක්ති ප්‍රමාණයක් උරාගනී. ජලය ජීවාණුහරණය කිරීමට පුරසඳ දිනට අපහසු වෙයි. පුරසඳට සතුන් පවා නොසන්සුන් වෙයි. වල්ගාතරු හෙවත් ධූම කේතු නිකුත් කරන වායු දහරා පැළෑටිවලට හානි කරයි. හැම ග්‍රහයෙක්ම එක ධාතුවක් පමණක් නිකුත් කරයි. සඳ සියළුම ධාතු මුදා හරී. සඳු ජල හා ඛණිජ ලවණ මාධ්‍යයක ක්‍රියාකරයි. බුධ ග්‍රහයා වක්‍රවීමේදී, පුරසඳුගේ දඟර ගමන් අතිශයින්ම පීඩාකාරී වේ.

අනතුරු, හිංසා ක්‍රියා, භූමිකම්පා, යමහල් විදාරණය, සමුද්‍ර ඛාදනය, දරුණු විපත්, ස්වභාවික සම්පත් විනාශය, සිදු කරයි. මරණ අධිකයි. සඳුගේ ඉදිරි ක්‍රියාකාරකම් විදහා දක්වන හොඳම සාධකය මී මැස්සන්ය. සිකුරු ආලෝකය දිගේ ද, බුධ උෂ්ණත්වය හරහා ද ශක්ති තරංග නිකුත් කරයි. සතුන් සියලුම ග්‍රහ වස්තූන්ට අනුකූලව හැසිරෙයි. ක්ෂීරපායි සතුන් රාශි චක්‍රයේ කිරණ හා වැඩියෙන් ගැටේ. අං තුළින් විශ්ව ශක්තීන් ඇතුල් වෙයි. මේ නිසා කිරි අද්විතීය බලයෙන් යුතු පෝෂ්‍යදායී ආහාරයක් බවට පත්වී ඇත. දින $1^1/_2$ සිට 4 දක්වා විශ්ව ශක්තීන් වෙනස් වන විට වර්ධනයද වෙනස් වෙයි. එය සඳුගේ රාශි ගතවීම හා බැඳේ. සඳු තමා ඉදිරියෙන් සිටින තාරකා පද්ධතියේ ස්වරූපය ගනී. උදා :- කන්‍යා

රාශිය නිකුත් කරන කිරණ හොඳ මුල් හා එල දරයි. තුලා රාශිය මල් දරයි. වෘශ්චික රාශිය කොළ වැඩීම වේගවත් කරයි. මේ දිව්‍යමය තාරකාවන්ගේ ගතිය විශ්වය පුරා පවතී. හ්‍යුමස් පස මේ අධි ශක්ති කිරණ බෙහෙවින් උරා ගනී.

මාරියා තුං (1902-2002) මේ ධර්මතාවයට අනුකූලව දින වෙන් කර ඇත. මුල් දිනවලදී ශක්තිමත් මුල්වලින් ගසේ උඩ කොටසේ වර්ධනය වැඩි කිරීමට ද කොළ දින ඇට වැපිරීමට ද, සාත්තු කිරීමට හොඳය. මුල් දින ඇට වැපිරීමට, සාත්තු කිරීමට, කප්පාදු කිරීමට, තද සුවඳ වහනය වීමට, අළුත්ගතිය කල් පවත්වා ගැනීමට හොඳය. ජල මුද්‍රා සරුය. එල බරය. සශ්‍රීකය. මේ නිසා පැළ ගලවා සිටුවීමට, පෝච්චිවල පැළ සිටුවීමට හොඳය.

සඳු මකර රාශියේ සිටියදී හොඳ ප්‍රතිඵලද, වෘෂභයේදී උසස්ම ප්‍රතිඵලද දෙයි. සඳු සිංහ රාශියේදී පස සකස් කිරීම ඉතාම ශුභය. ධනු, කුම්භ රාශි ගබඩා කිරීමට ශුභය. උදේට හා සවසට නෙළන හැම දෙයකම ජීවි ගතිය රැඳේ. සඳු අළුත් රාශියකට ඇතුල්වන විට පැය 4 ක් පෙර හා පසු කෘෂි කටයුතු අත්හරින්නට කියයි. ඊට හේතුව රිද්ම රටා කලින් කල වෙනස්වීමය. ෆොස්ෆරස් (Phosphorus) අවශ්‍යතාවයන් උදෙසා පුරහඳ ළංවන විට වැඩ කිරීම ප්‍රතිඵලදායක වෙයි.

## විශ්ව රිද්ම රටා

පෘථිවියේ ගමන් නිසා විශ්මිත ප්‍රාතිහාර්යයන් සිදුවේ. වොච්ස්මත් අන්ත දෙක මෙසේ විස්තර කරයි. මල් පිපීම හා

පරවීම මේ රිද්මයානුකූල ගමන් නිසා සිදුවේ. නිදි කුම්බා වැනි කොළ වර්ගද මෙසේ හැකිළේ. රාත්‍රියට සිරස්ව නින්දටත් දවල්ට තිරස්වත් සිටී. මේ නිරවද්‍යතාවය මල් දර්ශකයකින් (Flower Clock) මැන ගත හැක. පාන්දර 3.00 ට සාන්ද්‍රණයත් හවස 03.30 ට උපරිම ග්ලූකෝස් නිෂ්පාදනයත්, ශෛල දික්වීම හා පිෂ්ටය රැස් කිරීමත් සිදුවේ. බ්‍රවුන්, 1970 දී අර්තාපල්වල දවල් 12 සිට සන්ධ්‍යා කාලය දක්වා උපරිම පරිවෘත්තියක් සිදුවන වග කියා ඇත. විශේෂයෙන් උදෑසන අධික වර්ධනයක් සහ ඇතැම් අවස්ථාවල හිරු බැසයන තුරා එසේ වන වග අවධාරණය කරයි. මේ රිද්මයානුකූල සංචලන, භෞතික හැඩතලවලට ස්ථිර පදනමක් ඇත.

තුහිනයෙන් වැසුණු මල්වල ස්ඵටික හැඩ ගැසීම, සිසිල් වීමේදී ඇතිවන චංචල රේඛා, හිම පතුරු, මී වදවල හයපෙති රටා, දෛශික ඇඹරුම් රේඛා, දුරස්ථ ග්‍රහයින්ගේ චලන නිසා සිදුවන වග ස්ටෝල් කියයි. සඳෙහි මෙන් සෑම ග්‍රහ වස්තුවකටම ආවේණික නෛසර්ගික ගති ලක්ෂණ ඇත. කාලගුණික වෙනස්කම් ග්‍රහයින් නිසා සිදුවේ. වරෙක චක්‍රාකාරව ද, වරෙක ඍජුවද පැළෑටිවල වර්ධනයට මෙන්ම හානිද සිදුකරයි. දූව සඳහා ගස් කැපීමට රවි මිථුන රාශියේ සිටින විට ඉතාම ශුභයි. අංකුර බද්ධ කිරීමට හොඳම කාලයයි. අවම වර්ධනයක් සහ උපරිම අස්වැන්නක් දෙයි. මිහිපිට ඇති සියළුම වස්තු විවිධ විශ්ව රිද්ම රටාවන්ගේ ක්‍රියාකාරීත්වයට යටත්වේ. ගුරුත්ව බලය නිසා සියල්ලෙහි විනාශය නොවී මනා පාලනයක් සිදුවේ.

## වායුගෝලීය සාධක

- කාලගුණය : සුළඟ, දේශගුණය, හිරුඑළිය, වර්ෂාව, කෘෂි කටයුතුවලට බෙහෙවින් බලපායි. වරෙක මධ්‍යස්ථ වෙයි. වරෙක මැදිහත්කරුවෙකු වෙයි. වරෙක පවරයි. විශ්ව ශක්තීන් හා භූගෝලීය සාධක හා ගැටෙයි.

- තෙතමනය : ආර්ද්‍රතාවය, වර්ෂාව, හිමපතනය, ශීකර, හිම පියළි, තුෂාර, මීදුම.

- සුළඟ : වේගය, දිශාව, සෘතු කැළඹීම්, ස්ථානීය සුළං, මඳ පවන,

- වායු පීඩනය : වායු පීඩන මානයට හසුවන වෙනස්කම්

- සැහැල්ලු දේශගුණය : වලා ආවරණ, සූර්ය රශ්මි කෝණ, දවසේ දිග, ගොඩනැගිලිවලින් එන සෙවණ, ගස් හා කඳු ආවරණ

- උෂ්ණත්වය : රෑ දහවල් වෙනස, සෘතු විපර්යාස, තුහින, සීතල.

- රවි, සඳු අනෙක් ග්‍රහයින් සමග සංයෝගවීම :

| | |
|---|---|
| ➢ චන්ද්‍රවංක | ➢ ආරෝහණ අවරෝහණ |
| ➢ ග්‍රහ දෘෂ්ටි | ➢ සමීපකය සහ දූරකය |
| ➢ සංසිද්ධි | ➢ විශේෂ අවස්ථා |
| ➢ ග්‍රහ නෝඩ | ➢ චන්ද්‍ර නෝඩ |

## කාලගුණික සංඥා

ඊසාන දිගින් තද වැහි සහිත වාසුළි ඇති වේ. නිරිත දිග මෝසම් සුළං ආවරණයට නිරිත දිගට උස් ගස් කොළන් සිටුවයි. කුරුල්ලන්, සිව්පාවුන්, ගස්වැල් කාලගුණික විපර්යාසයන් කළින් හඳුනාගනී. එය කාලගුණ දර්ශක (Weather Indicators) වගේය. සිසිල් සුලඟින් විජලනය ඇතිවේ. එයින් සීනි නිෂ්පාදනයට අවශ්‍ය කාබන්ඩයොක්සයිඩ් ඉවත් කරයි. සුළං ආවරණ සඳහා බඩවැටි සහ කොළ වදුළු ද සාදයි. පඳුරුවලින් ද සුළං ආවරණය වෙයි. අතු රිකිලි ගරාදි හැඩයට සිටුවයි.

- ඇටි කුකුළන් වැස්ස අඟවයි.
- රැහැයියන් වියළි බව දනවයි.
- කුරුල්ලන් සිහින් නාද කරයි. ඉක්මන් කර කූඩු සාදයි. සුළං ආවරණ ඉදිකරයි.
- කුරුල්ලන් කූඩු සාදයි. වැහි පිරිවටුවන්, අධික වැසි සමය ළං වනවිට උස් ස්ථානවල කූඩු සාදයි. වියළි කාලයට පොළවට ආසන්නව කූඩු සාදයි.
- සෘතුමය මල් : මැයි, බිනර, සෞකෙන්ද, ගොඩමානෙල්, ඇහැළ, එරබදු, අට්ටික්කා, කහට, ඉඹුල් මල් වර්ග මධ්‍යස්ථ කාලගුණය හඟවයි.
- බෝ, කටුපිල, මඩතිය, කරඳ මල් වර්ග වියළි වායු ධාරා ගෙනෙයි.

- ස්වභාවික සංඥා : සුළං හමන දිශාව, සඳ කලා, වලාකුළු,
- වැහි ලේනා අධික කලබලයකට පත්වෙයි. වැසි සමය ළංවන විට
- උකුස්සන් ජෝඩු වශයෙන් ශබ්ද නගමින් ඉහළ අහසේ පියාසර කරයි.
- තටු විදහාගත් කුකුළන් නුහුරු ශබ්ද නගා දැඩි උණුසුම පෙන්වයි. වර්ෂාව ළඟනම් දවල් 11.00 සිට 02.00 දක්වා ගසක් යට වැතිර සිටී. තටු ඇතිතෙක් ඔසවා සිටී.
- සිව්පා සතුන් නොඉවසිලිමත් වෙයි.
- එළදෙණුන් හන්දි වේදනාවෙන් ඇඹරෙමින් කිරි දොවන්නට ඉඩ නොදෙයි. පසු පසට හැරෙයි.
- හෝහපුටු (Gnats), කෘමීන් වැනි සතුන් රිද්මයානුකූලව ක්‍රියාකාරී ලෙස උඩටම පියඹායයි. පහළට ආවිගස හැම දෙයම හපන්නට ගනී.
- මී මැස්සන් කලබලව විදින්නට ගනී. සුළඟ සහ ආර්ද්‍රතාවය උන්ට ඔරොත්තු නොදෙයි. කුණාටුවකට පෙර පාදවල තැවරුණු පරාග ඉවත්කර පියාඹා යයි. විශාල මී මැසි ජනපදයක් ඇතිවිට අධික හිරු එළිය සහිත වර්ෂයක් බලාපොරොත්තු විය හැක. පළතුරු හා මල් වගාවට හොඳම කාලයයි. කීටයින් අඩු නම් සිසිල් වැසි වර්ෂයක් ඉදිරියට එන බව දන්වයි.

- කුහුඹුවන් කඩිසරව කෑම සොයා ගබඩා කරයි.
- ලොම් සහිත දුඹුරු දළඹුවා අඟවන්නේ සෞඛ්‍ය සම්පන්න ශීත සෘතුවකි. ඒ ලෝම තුනී නම් චන්ඩ කුණාටු සහිත ශීත සෘතුවකි. රැහැයියන් හිඩමින් ප්‍රාණවත් හිඩින් රැව්දෙන්නේ උණුසුම දැඩි විටකය.
- කුඩා මකුළුවන් බිත්තර රකින්නේ වියන දැළ විසිතුරු වන්නේ නම් හොඳ කාලගුණයක් ඇත. සීත සෘතුව එනවිට කූඩු වියා ගනී. නූල්පට ඝන නම් වලාකුළු සහිතය. වැහිබරය,

## ගැමි සංකල්ප

සංකල්ප පරිසරය, සොබාදහම හා බැඳී ඇත. මිනිසා විශ්මිත ලෝකයේ විවිධ සංසිද්ධීන් නිසා විමතියට පත්ව ඇත.

මිහිරි නාද රටා ගීතිකා, ජන ගායනා වලින් අපේ ඉතිහාසය පිරී ඇත. මේවා කාලගුණය, පෝෂණය, සෞඛ්‍යය, ආදරය, දුක සැප හා බැඳී ඇත. වැටි වල හදන බෝග හා ගස්ද සුළං ආවරණයක් වනු ඇත. සේර, සැවැන්දරා, පෝෂ්‍යදායි පොහොරකි. සෝදාපාළුවද වලක්වයි. ගොවියාට හිරු එළිය අත්‍යාවශ්‍ය දෙයකි. ආලෝකය උණුසුම, ජල ප්‍රමාණය, සීනි, පිෂ්ඨය, ලිපිඩ, සුවඳ වර්ධනය කරයි. මේ අවශෝෂණය, සංරක්ෂණය, තත්වය, රසය, රෝග මර්ධන ශක්තිය ඇති කරයි.

සියලුම සෙවණැලි ඉවත් කළ යුතුය. රාහු සංකල්පයද සෙවණැලි වලට ඇති බියයි. ස්ථානීය සුළං, වෙළඳ සුළං වලින් වර්ෂාව හා හිරුඑළිය අපට ඇති තරම ලැබේ. සුළං මුවාවේ ඇති ප්‍රදේශවලට හොඳ ජල සම්පාදන රටාවක් ඇත. උද්වහන වැසි අකුණු ජලය සමඟ අධිපෝෂණ රටාවක් ඇති කරයි. මධ්‍යම කඳුකරය, මුහුද, දියවැල්, උන්නතාංශය අපට සෞම්‍ය දේශගුණික කලාවක් නිර්මාණය කර ඇත. ගංවතුර විශාල වනාන්තර හා කඳුවලින් ගෙනෙන පෝෂක කොටස් ගංගාධාරවලට, පිටාර තැනිවලට එක් කරයි. යටිතල රෝපණය නිසා පාංශු ඛාදනය අවම වෙයි. වියළි ශුෂ්ක ප්‍රදේශවලට ජල සම්පාදන රටා අනුගමනය කිරිම සිදුවෙමින් පවතී. අකුණු සහිත වැසි ජලය නයිට්‍රේට් අධිකය. පුර හඳට වාස්සන ජලයද අධි පෝෂණීයයි. ජලය රැඳෙන ස්ථානවල මාළු හෝ තාරා පොකුණු ඇති කළ හැකිය. ඇතැම් ගොවීන් කොහිල කොටු සාදා තිබේ.

නවීන මාදිලියේ වියළි කාලගුණය යටතේ වගා ක්‍රම (Dry wheather Gardening Systems) ප්‍රගුණ කළ හැකිය. දෙවරක් මුල්ලු කිරීමෙන්, කොළ රොඩු පිදුරු, ආවරණ යෙදීමෙන් (Mulches) ඉතා ළඟින් පැළ සිටුවීමෙන්, වාෂ්පීකරණය අවම කළ හැකිය.

ජලය සැපයීමට ජල ඉසින (Sprinklers) සවි කිරීම ඉතාම ප්‍රයෝජනවත්ය. උදෑසන හෝ සිසිල් රාත්‍රී කාලය සුදුසුය. පුරහඳට පෙර අතිශයින්ම සුදුසුය. සඳ කිරණ අධි පෝෂණයට දායකවෙයි. මනාව සකස් කරන ලද ජල රටාවක් අපට ඇත. විශාල වැව් ප්‍රතිසංස්කරණය කිරීම ජාතියේ වාසනාවකි.

කෘතිම වර්ෂාව, කෘතිම ජල සම්පාදනය, උදළුගෑමෙන් පසු කොළ රොඩු පැළ වටේට දැමීම. ජල නල භාවිතය නිසා තෙතමනය රඳවා ගැනීමට හැකිවී ඇත.

## භෞමික සාධක

පස : ලෝකය පුරාම මානව සංහතිය මිහිකතට වැඳුම් පිදුම් කරයි. සරු පස ජීව රුධිරයයි. පැළෑටි ග්‍රහණය කරයි. නිසරු මුඩුබිම් පැළෑටි නොරඳයි. සහරා වැනි කාන්තාර වල කේෂ්ම භූමි ඇත. යාපනයේ ආටිසියන් ළිං මගින් ජලය සපයා ගනී. නිවසේ රොඩු ටික, දහයියා, අළු, කොළ පිදුරු, දිරාපත් ද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය යොදා පස සරු කරගනී. ගවයින්ගේ, හාවුන්ගේ, කුකුළන්ගේ අපද්‍රව්‍යවල පෝෂණ ගුණය අධිකව රැඳී ඇත.

'මිහිකත් දෙව්වරං' දෙන්නැයි ජන ගායනාවල සඳහන් වෙයි. ඉන්දියාවේ පෘථිවි, ග්‍රීසියේ ජී - (Gaea), රෝමයේ ටෙරා (Terra) නමින් හඳුන්වයි. සියළුම ග්‍රහයින් දේවත්වයෙන් පිදුම් ලබයි. වන්දනා කරයි. ගොවීන්ගේ ආත්මය පොළව හා බැඳී ඇත. නිරෝගීවීමට සරු පස අවශ්‍යයයි. මිනිසා සහ විශ්වය එක්ව පස බුරුල් කර විශ්වයට මුදාහරින පරාවර්තිත ශක්තීන් උරාගන්නට සලස්වයි.

කෘෂිකර්මය, පවිත්‍ර මෙන්ම පූජනීයයි, ගොවියා පසෙහි ව්‍යුහය හඳුනයි. පස ගොරෝසුය, මෘදුය, අඳුරුය, බර අඩුය, සුවඳය, නැවුම් සුවඳ සිප සැනසෙයි. ගොවියාගේ මිතුරු ගැඩවිලා පස මොලොක් කර පෝෂණය කරයි. ඛණිජ ලවණ විශාල

ප්‍රමාණයක් එක්කරයි. කළු පැහැති හ්‍යුමස් පස අස්වැන්න වැඩි කරයි. විශ්ව රිද්ම රටා කාවැද්දීමට පස බුරුල් කරයි. උස් කළ පාත්තිවල පැළවලට හොඳ වයනයක් දෙයි. අඳුරු මුළුවල පුස් වලට ගැමියා බිය විය. ඇත්බානක් යන්නට වැට අයින ඉඩ හැරියේ ඒ නිසාය. ආදිකාලයේ සිටම විශ්වය හා ගැටෙන්නට පුරුදු පුහුණු විය. දේශගුණික රටා, උෂ්ණත්වය, වර්ෂාව, පුපුරායාම, ඛාදනය, භූ ලක්ෂණ වලට මෙන්ම සුළඟටද පසෙහි වයනය වෙනස් කළ හැක. වැලිපස ජලය හා පෝෂ්‍ය පදාර්ථ නොරදයි. වැලි ගල් (Sand stone) කුට්ටිවලට විද්‍යුත් චුම්භක කිරණ ගමන් කරන ඊතර (Ether) හෙවත් දිව්‍යමය දියර උරාගෙන සම්ප්‍රේෂණය කළ හැකිය.

මේ අසල පස සියළුම අල වර්ගවලට, අර්තාපල්, කැරට්වලට විශේෂයි. ආදීතමයන් දියළු සරු පස ප්‍රයෝජනයට ගත් වාසනාවන්තයින්ය. හෙල්මළු, ගංගාධාර, පිටාරතැනි, ඩෙල්ටා සරු කෙත්වලට දූන හෝ නොදූන පරිවර්තනය කළ හැකිවිය.

භෝග වගාවට රසායනික සංයෝග තරමක් අවශ්‍ය වෙයි. පස සංරක්ෂණය කිරීමට ආගමික පරිසරයක අගය වටහා ගත යුතුමය. සමබරතාවය රැකීමට ඖෂධ පැළෑටි, එළවළු, තෘණ වර්ග, මල්, වර්ණක, සුවඳ වර්ග, විෂ සහිත පැළෑටි, බිම්මල්, මිශ්‍ර භෝග, මිත්‍ර භෝග, කටුසර භෝග, වෙළඳ භෝග සියල්ලම තිබිය යුතුය. ගෙවතු වගා ආදර්ශමත්ය. කෘෂි භාෂිතයෙන් ලැබුණු ඥාණ සම්භාරය නිසා විද්‍යාඥයින්ගේ පර්යේෂණ සියල්ල විදාරණය කරගැනීමට විශාල පිටුබලයක්

ලැබිණ. හ්‍යුමස්, බර පස්, මැටි, බර අඩු පස්, ලොම් පස ඛණිජ ලවණ, හා සියළුම පෝෂක කොටස් අන්තර්ගතය. පස සෞඛ්‍ය සම්පන්න වන්නේ ආරක්ෂා කළොත් පමණි.

පසට වැදගත් සම්ප්‍රේෂණයක්ව (Transmitter) විශ්ව ශක්තීන් නිකුත් කළ හැකි අවසාදිත (Sedimentary) තට්ටුවට යටින් ඇති පාෂාණ ස්ථරය විශ්ව කිරණ ලබාගන්නා හොඳම රිසීවරයයි. ජෛන්ද්‍රීය ජීවීන් ද විශාල මෙහෙයක් කරයි. විශේෂයෙන් ගැඩවිලා (Earth worm), වට පණුවා (Nemotodes), කීඩෑවා, (Anthropods) කුහුඹුවන්, කෘමීන්, පිළවි, දිලීර, මුහුදු ශාක ඇතුළු සරළ ශාක විශාල වැදගත් මෙහෙයක් කරයි.

ශෂ්‍ය මාරුව, ආවරණ දැමීම (Mulch) මිත්‍ර භෝග, මිශ්‍ර භෝග, පස සුරැකීමට, පෝෂණයට හා ආරක්ෂාවට උදව් වෙයි. අධිකව පස පෙරළීම, තනි භෝග වගාව, රොඩු පිලිස්සීම, ජීවාණුහරණය, පලිබෝධනාශක, වල්නාශක, විෂ දුම් හෝ වායු, න්‍යෂ්ටික, දිලීර නාශක, අතිශයින්ම උග්‍ර විපාක ගෙනදී පස විනාශ කරයි. කෘතිම රසායනික පොහොර භාවිතය මීටත් වඩා විනාශකාරීය. විශ්ව කිරණ උරා ගැනීමට බාධාකරයි. බිම් කෙටීම, වැසීම තරමක් තිබීම වරදක් නොවේ.

කඳුකරයට ජෛව වැටි, හෙල්මළු සමෝච්ඡ කාණු පාංශු ඛාදනය වලක්වා සරුපස රැකගනී. ජලය උරාගැනීමට, රඳවා ගැනීමට පස බුරුල් කළ යුතුය. විශ්ව කිරණ ඇතුල්වීමට කුඩා අඩි පාරවල්, වේලි, දැමිය යුතුමය. ශීත ඍතුවේදී කුණු

කසළ, සත්ව අපද්‍රව්‍ය නිසා පෘථිවි පෘෂ්ඨය සරු වෙයි. අඟල් 3 ක් පමණ පස වැසෙන සේ මේ ආවරණය අත්‍යාවශ්‍ය අංගයකි. මෙය ඉතාම ස්වභාවික සූරකුමයි. රේක්කයකින් හැරුවිට සරු කළු පස දැකිය හැක. පාරිසරික සම්පත්, සත්ව පාලනය, භූගෝලීය සාධකවලට අනුකූලව දේශගුණයට ගැලපෙන සේ හැඩගැසීමෙන් පෝෂ්‍යදායි සරු අස්වැන්නක් ලැබිය හැකිය.

## විශ්වය හා මානවයා අතර සම්බන්ධකම්

ආදීතමයන් සතු අභිරහස් විශ්ව විද්‍යා ගවේෂණයන් සමඟ හොඳින්ම සැසඳුනි.

විශ්මිත ග්‍රහවස්තු ගැන තොරතුරු එළිදරව් වීමත් සමඟම විශ්ව ශක්තීන් මිනිස් කටයුතු හා සම්බන්ධීකරණය විය. පාරම්පරික දැනුම් සම්භාරය ආශ්‍රයෙන් විද්‍යාත්මක ගවේෂණ යොදා වගා ලිත් සකස් කෙරිණි.

අනාවැකි (Oracles): ගැමියන් අනාවැකි කියා ඇත.

- කාලගුණය : ශාන්ත වින්සන්ට් ගේ හිරු එළිය ධාන්‍ය හා වයින් ගෙනෙයි
- පෝෂණය : වෙදතුම කලකට නොඑන්න - දිනකට ඇපලයක් ගන්න, වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන් - මොණර මාළු උඩ හල්ලේ තියෙම්මා - අපට මාළු අල කොළමයි කුඩම්මා

- විෂ කෑම : මල්ලක් කදුරු කන්නෙම් විගස දොර අරූ

## සංකල්ප

ගැමියා පුරුදුව සිටියේ සොබාදහමේ හිඩටය (Natures Calls). බහිරවයා (Gnomes) අස්වැන්න සොරාගනී, යන බිය නිසා විශේෂ පුද පූජා විධිවලට අවතීර්ණ විය. කොහොඹා කංකාරිය ඉන් එකකි. බහිරවයා මුල්වල වර්ධනයට වගකියයි. අප්සරා (Nymph) වන ගංගා වලට අධිපති, පැළෑටිවල කොළ වර්ධනය ගැන සොයා බැලූ වග කියයි. කෝමළිය (Sylph) මල් සෑදූ වග කියයි.

ගිනිදෙවියා (Fire Spirit) පළතුරු ඉදෙන්නට වරම් දුන් වගයි. ගිනිදෙවියා පිදීම ඈත අතීතයේ සිටම පැවතිණි. කෘෂිකර්මයට ආගම, දේව සංකල්පය, ග්‍රහලෝක පිදීම, ගස් ගල් වලට පුද සිරිත් කිරීම ආදිවාසීන්ගේ කිරිකොරහේ සිට අද දක්වා පවතී. විශේෂයෙන් කමත් වැඩවලදී සාම්ප්‍රදායික මත (Myths) සහ ඉන්ද්‍රජාල (Magical Practices) වලට ගරු කරයි. අණ විණ, ඇස්වහ කටවහ ගැනද ශාන්තිවිධි ලෝකය පුරාම ජනප්‍රියව ඇත. ගොවීන් සිතුවේ පැළෑටි රසායනික කම්හලක් (Chemical Factory) කියාය. නයිට්‍රජන්, (Nitrogen) ෆොස්ෆරස් (Phosphorus) පොටෑසියම් (Potassium), ජලය, ශක්ති වර්ධක සීනි පිෂ්ඨය වැනි සියලුම පෝෂ්‍ය කොටස් පැළෑටි තුළ ඇත. මේ නිසා නව සංකල්ප සොයන්නට විය. කාබනික ගොවිතැනට සහ ජෛවගතික ගොවිතැනට ලෝකයේ මුල්තැන හිමිවී ඇත. වෙළඳපළේ විශාල මිලක් ද ලැබේ. වසර 9000 ක් පුරා

නිරීක්ෂණ, සිද්ධාන්ත, ශිල්පීය ක්‍රම, සංස්කෘතික අංග ආගම් හා සංකලනය කෙරිණි. ගොවි සංකල්ප හරවත් විය. සෞඛ්‍ය සම්පන්න ආහාර වේලකට කවුරුත් නැඹුරු වූහ. ප්‍රිය කළහ. හේන් ගොවිතැනේදී නයිට්‍රජන් හැර විශාල පෝෂ්‍යපදාර්ථ ප්‍රමාණයක් ගොවියාට අහිමි විය. වැඩවසම් යුගයේදී (Feudal system) ගොවීන්ට පස සරු කිරීම සඳහා විශාල වෙහෙසක් ගැනීමට සිදුවිය. යල්පැනගිය ක්‍රම (Swidden Methods) වෙනුවට නව සංකල්ප බිහිවිය.

ජීවිත රටාවට අන්තරීක්ෂ කිරණ ඇදා ගැනීම නිරායාසයෙන්ම සිදුවිය. (Cloister Farming) ආගමික ස්වරූපයක් ගත් කෘෂි කටයුතුවලට කෙමෙන් යොමුවිය. ඖෂධ පැළෑටි, එළවළු, සුවඳ වර්ග, තෘණ වර්ග, මල් පළතුරු, බිම්මල් එක්වී ආධ්‍යාත්මික දර්ශනවාදයක් ගොඩනැංවින. ලෝකයේ සෑම ගොවි බිමකම මේ සඳහා අයිනක් වෙන්විය. අපේ කුරුළු පාළුව ඉන් එකකි.

භූත විද්‍යාව, දාන මාන, සෙත් පිරිත්, යන්ත්‍ර මන්ත්‍ර, බලි බිලි, පුද පූජා පිඩුරුවලට සංස්කෘතික අංග එක්වී මංගල අවස්ථා උදාවීම ගොවියාගේ මානසික මෙන්ම ශාරීරික වර්ධනයට හේතුවිය. හැමවිටම කාලගුණය ගැනත්, හොඳ අස්වැන්නක් ගැනත් මනස මෙහෙයවන ලදී. ග්‍රහ වන්දනාවට විශේෂ තැනක් හිමිවිය.

ඉරට වැඳල ඉරු දෙවි අවසර ගනිමු
සඳට වැඳල සඳ දෙවි අවසර ගනිමු
පොළවට වැඳල මිහිකත අවසර ගනිමු
අහසට වැඳල සැම දෙවි අවසර ගනිමු

මේවා ගැමි වහරේ නිතරම භාවිත වේ. මෙසේ එයින් අන්තරීක්ෂ රිද්ම රටා ඇඳා ගෙන ශ්‍රී ලංකාවේද නැකැත් හා වගා ලිත් භාවිතය ආරම්භ විය. තාරකා විද්‍යානුකූල ලිත් භාවිතය නිසා තාරකාවන්ගේ ආශ්චර්යමත් සංසිද්ධි අඳුනා ගත හැකිවිය. ගොවියා පරිසර අධ්‍යයනයෙන් ලත් දැනුම, මෙයින් පිළිබිඹු වෙයි. ජෛවගතික වගා ලිත්වල පාරම්පරික දැනුම් සම්භාරය විද්‍යානුකූලව, ඉදිරිපත් කර තිබේ.

**සෞඛ්‍ය සම්පන්න වගා සංකල්ප.**

කාබනික හා ජෛවගතික දෙකෙහි සමාන මෙන්ම අසමානකම් ද ඇත. ජෛවගතික වගාවන්හි දී, පාරිසරික සම්පත් වලට අනුකූලව, හැඩගැසීමක් සිදුවේ. ජෛවගතික ගොවිතැන පරිසරගාමී මෙන්ම විශ්ව ශක්තීන් හා භූගත සම්පත්ද, ප්‍රයෝජනයට ගනී. විශ්වීය, වායුගෝලීය හා භූගෝලීය සාධක සියල්ල ආපෝ, තේජෝ, වායෝ, පඨවි ධාතු සමග සංකලනය කරගත යුතුමය. පැළෑටි හා සතුන් ගැනද පස ගැනද, සුවිශේෂී අවධානයක් යොමු කරයි. කායික (Physical), විශ්වීය (Ether), දිව්‍යමය (Astral), ආධ්‍යාත්මික (Spiritual), පසුබිමක් මත වගා කටයුතු සිදුකරයි. ලෝකය

පුරා මේ ක්‍රමය සාර්ථක වෙමින් පවතී. ඉහළ අගයක ප්‍රමිතියක් ද ඇත.

ශත වර්ෂාධික කාලයක් පුරා මානව උරුමයන්, රැකෙන අන්තර් සම්බන්ධකම් වර්ධනයට දායක වූ තාරකා විද්‍යාව ජ්‍යොතිෂ විද්‍යාව, කෘෂි විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, පෝෂණය යන සියල්ලම ඇතුලත්ය. කාලය, ශක්තිය, ස්වභාවික සම්පත්, ආගම, සංස්කෘතික අංග සම්ප්‍රදායානුකූල ඇදහිලි ක්‍රම එකට බැඳී තිබෙන ශක්තිමත්, ආවරණයකි.

## ආදර්ශ පර්යේෂණ මධ්‍යස්ථානය

ලංකාවේ පළවෙනි ජෛවගතික තේ පර්යේෂණ මධ්‍යස්ථානය හල්දුම්මුල්ල ගමේ ඇත. එය ලෝකයටම හොඳ ආදර්ශයකි. ආචාර්ය කීර්ති මොහොට්ටි මැතිඳුන්ගේ දැඩි උත්සාහයක ප්‍රතිඵලයකි. ලෝකයේ උසස් මෙන්ම ඉහළම වගා අගයන් සහ ඉතිහාසගත වාර්තා මේ සඳහා හිමිවී තිබේ.

ගලහ ගැමිසේවා සෙවණ මගින් 2002 සිට වාර්ෂික වගාලිත සම්පාදනය කරමින් විශාල දැනුම් සම්භාරයක් බෙදා දෙමින් විශ්ව කීර්තියට පත්වී ඇත. කාබනික සම්ප්‍රදායානුකූල නැවුම් නිෂ්පාදන පිරිසිදුය, පවිත්‍රය, ආරක්ෂා සහිතය. ඉන් ආර්ථික, පාරිසරික හා සමාජීය වාසි රැසක් ගොවියෝ සතුවෙයි. භූමි පරිහරණය සම්බන්ධව දැඩි වෙහෙසක් දැරූ නිසා ඉතා උසස් ගණයේ ගොවිබිම් බවට පරිවර්තනය වී ඇත. ආදර්ශ

ගොවිපළක් ලෙස විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා සේවා සපයයි.

## ජෛවගතික වගාව සඳහා අවශ්‍ය සමාජීය පසුබිම

- විශ්වය හා මව්බිම සම්බන්ධ දැනුම.
- වගා ලිත
- ජෛවගතික වගා සඳහා විශේෂ පැළෑටි, දිලීර නාශක
- රසය, ගුණය හා තත්ව පාලනය සඳහා පස සකස් කිරීම.
- වන ජීවින්, ස්වභාවික සෞන්දර්ය හා පරිසරය සුරැකීම.
- හොඳ පුරුදු, ආදරය, කරුණාව, සත්‍ය, ධාර්මික ගති ප්‍රගුණ කිරීම, ආචාරශීලී බව සුරැකීම.

ජෛවගතික ගොවිතැනට උනන්දු විය යුතු හේතුන් පහත දැක්වේ.

- සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ඇති කිරීම.
- මානවයා, වන ජීවින්, මත්ස්‍ය සම්පත්, වැසි වනාන්තර, මල්, පළතුරුවලට ආරක්ෂාව සැලසීම.
- ශාරීරික : පිළිකා, පීනස, වඳ බව, විකලාංග දරුවන්, අක්ෂි හා චර්ම රෝග මර්ධනය කිරීම.
- මානසික : අවිනීතකම, වෛරය, ක්‍රෝධය, සමාජ විරෝධය, පවුල් ආරාවුල් නැති කිරීම.

- සමාජයීය : ආගමික, සංස්කෘතික, කාන්සිය, මත්පැන් පාලනය කිරීම.
- පස : පස සංරක්ෂණය, ක්ෂුද්‍ර ජීවීන් හා ගැඩවිලුන්ගේ ක්‍රියාකාරීත්වය, හ්‍යුමස්, ප්‍රයෝජනවත් තෘණ වර්ග, දිලීර පාලනය.
- විශ්ව හා මානව සුසංයෝගීතා වර්ධනය.
- පෘථිවි කේන්ද්‍රයේ සංචලන හා විශ්ව රිද්ම රටා එක්කිරීම.
- වගා ලිත් භාවිතය නිසා නිවැරදි කාලසීමා සොයාගැනීම.




රූපය 11 : ගැඩවිලි දියර පොහොර (ස්මිත් 2007)




සරත් සමය : අගෝ. 25 - ඔක්තෝබර් 22
වසන්ත සමය : පෙබ 19-අප්‍රේල් 19

**රූපය 12 : ජෛවගතික දියර පොහොර (ස්මිත් 2007)**

# වගා ලිත්
# Planting Calendars

## ඓතිහාසික විකසනය

ආදි කාලයේ සිටම මිනිසා තම පරිසර අධ්‍යයනය කරමින් පරිසරයේ ක්ෂණික වෙනස්වීම් වලට තුඩුදුන් සෞරග්‍රහ මණ්ඩලය ගැන තොරතුරු සොයා බලන්නට විය. දිවාකල ආහාරය සඳහා පරිසරයට අවතීර්ණ වෙමින් රාත්‍රී කාලයේදී තරු රටා හා සඳ ගමන් නිරීක්ෂණය කරමින් දඩයමේ ගියහ. උදම්, භූ චලන, ග්‍රහණ ඇතිවිට පොළොව කම්පා වීම නිසා පැළ සිටුවීමට අහිත කර බව සොයාගත් පසු එම දවස් කෘෂි කටයුතු අත්හැරීමට පෙළඹුණි. සඳු පෘථිවියට ආසන්න වූ විට ශීත සෘතුව කෘෂි වසංගතවලට ගොදුරු වන නිසා අළු ඉසීමෙන්, දාස් පෙතිය, අබ, මිංචි වැනි සැර සුවඳ ඇති මල් වවන්නටත් පෙළඹුණි.

පැළ අඟුල් වැටුනා වගේ අවස්ථා වල්දී කෘෂි කටයුතු දවසක් පමණ අත්හරින්නට සිදුවිය. කාලීන මෝසම් වැසි හා සංවහන වැසි බලා හේන් ගොවිතැනද ගෙවතු වගාවද යල මහ කන්න දෙක වී වගාවද  ක්‍රමවත්ව සකස් කරන ලදී. ගංවතුර වැනි උවදුරුවලදී, කඳුරටද, හෙල්මළුද, ස්වභාවික පරිසර වැව් ආශ්‍රිතවද ජනාවාස ඇතිවිය.

මේ ස්වභාවික පරිසර පද්ධති තුළ ස්වයංපෝෂණය නිසා නිහිඬ නිවහල් දිවියක් ගෙවන්නට මිනිසාට මෙන්ම සතුන්ට

ද හැකිවිය. අනාදිමත් කාලයක සිටම මිනිසා පරිසරයට අවතීර්ණ වූයේ බාධක ඉවත් කිරීමට ක්‍රම සහ විධි සොයමිනි. මේ නිසා විශ්වයේ විවිධ සංසිද්ධීන් නිරීක්ෂණය කරමින් ග්‍රහ තාරකාවන්ට ගස්වැල්වලට විවිධ දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන්නට ද විය. මහින්දාගමනයත් සමග බුදුදහම කෘෂි මෙන්ම සියලුම කටයුතුවලදී සම්බන්ධීකරණය විය. පාරිසරික සමතුලිතතාවය රැකගත් අතර, ක්‍රමවත් පෝෂණ ගුණයෙන් සපිරි සමබල අහරක රස බලන්නට වාසනාව තිබිණි. සියලු කලා ශිල්පවල උපත ද ඒ නිසා සිදුවිය.

## ග්‍රහ ගමන් පිළිබඳ වාර්තා

මිනිසා විවිධ ග්‍රහ ගමන් ගැන ගස් ගල්, ලී සහ පැපිරස් පතුරු, සොහොන්, ගල්පඩි, විවිධ උපකරණවල ග්‍රහ ගමන් පිළිබඳ වාර්තා තැබීය. 1608 දී ගැලීලියෝ දුරදක්නය හදන්නටත් පෙර විශ්ව ගවේෂණය ආරම්භ විය. හොරු ඇල්ලීමට රාජ්‍ය පාලනයට, පළමුවෙන්ම නැකැත් සාදන ලදී. ඉන්පසු මේ වාර්තා (Tabulations) එක්කර ලිත් සකස් කළහ. ලෝකයේ විවිධ රටවල ලිත් සාදයි. අප දැනට භාවිතා කරන්නේ ග්‍රෙගරියන් ලිතය. සෑම රටකම ග්‍රහගමන් පිළිබඳ තොරතුරු ඇත. පෙරදිග සහ අපරදිග භාවිතය පිළිබඳ සුළු වෙනස්කම් පවතී.

## බ්‍රිතාන්‍යයේ ස්ටෝන් හෙන්ජ්

මෙම සූර්‍ය දෙවොල ජ්‍යොතිෂ පරිගණකයක් සේ සූර්‍ය නිවෘත්ති හා ග්‍රහණ අවස්ථා නිර්ණය කළේ පාෂාණ මත

පැළෑටීන් ගේ වර්ධනය සනිටුහන් කිරීමෙනි. විශ්ව රිද්ම රටා හා පැළෑටි වර්ධනය තුළ සංයෝජනය බෙහෙවින් ඇතිවග මෙයින් අනාවරණය විය. ඊජිප්තු වැසියන් සිරියස් තරුව බටහිර ක්‍ෂිතිජයෙන් මෑත්වන තුරු උද්දාමයෙන් බලාසිටියේ නයිල් මිටියාවත සරු කෙතක් කරන්නටය. ටෝකන් හා ප්ලේඩිස් තාරකා ද කෘෂි කාර්මික කටයුතු සඳහා මිනිසා විසින් යොදා ගන්නා ලදි.

ඉන්කා හා ඉන්දු යුරේෂියන්, හොවැංහෝ සභ්‍යත්වද මෙසේ සිදුවිය. "සාර භූමිය" (Fertile Cresent) සභ්‍යත්වයේ නිජබිම (Cradle of Civilization) වුයේ මේ අයුරින්ය. පීරූ රටේද ලෝක ප්‍රසිද්ධ සූර්ය දෙවොලක් ඇත. ඉන්දියාවේ ජයිපූර් වල සූර්ය චක්‍රය මිනිත්තු තුනකින් නිවැරදි ලෙස කාලය සටහන් කර ජ්‍යොතිෂය උසස් විද්‍යාවක් ලෙස මිනිස් කටයුතු කෙරෙහි යොදා ගෙන ඇත. එහි වේලාව ඉතාම නිවැරදිව සටහන් වන වග කියයි. මෙක්සිකෝවේ මායන්වරුන් විසින් සිකුරු ග්‍රහයාගේ රිද්ම රටා සන්සන්දනය කර පළමුවෙනි වගා ලිත සම්පාදනය කරන ලදී.

## විශ්මිත ග්‍රහ වස්තු

විශ්මිත ග්‍රහ වස්තු වලින් විශ්වය නිර්මාණය වී තිබේ. මන්දාකිණි (Galaxy) විශාල සංඛ්‍යාවක් සොයාගෙන ඇත. මින් එකක අපේ පෘථිවි ගෝලය පිහිටා ඇත. ග්‍රහ තාරකා (Stars) වලට ස්විය ආලෝකයක් ඇත. ග්‍රහලෝක (Planets) වලට උප ග්‍රහයින් ඇත (Satellites). මේ අතර නිහාරිකා (Nebulas), ග්‍රාහක (Asteroids), ධූම කේතු, වල්ගා තරු

(Comets), තාරකා පද්ධති (Constellations), උල්කාපාත (Meteors) ඇත. සූර්ය ග්‍රහණ (Solar eclipses), චන්ද්‍ර ග්‍රහණ (Lunar eclipses), වළාකුළු (Clouds), දේදුණු (Rainbows) වලින් චමත්කාරය. විශ්මිත ග්‍රහවස්තු වලින් දිව්‍යමය වූ තාරකාවන්ගෙන් පරාවර්තිත ආලෝක කිරණ හා රශ්මි කදම්භයන් මිහිතලය මත විසිරී යයි.

ලෝකයේ සෑම රටකම පාරම්පරික ක්‍රම සහ විධි එක හා සමානය. ඔවුන් කායික (Physical), විශ්වීය (Ether), දිව්‍යමය (Astral) සහ ආධ්‍යාත්මික (Spiritual), දුෂ්ඨ හෝ අහිංසක (Black or white magic), ආගමික (Religious) පසුබිමක ජීවත්වීමට අධික වෙහෙසක් දරා ඇත. මේ පුනරාවර්තන සංකේතාත්මක සිතුවිලි ග්‍රහලෝක 7 වටා ගෙතී ඇත. උදා: මොළය පවරා ඇත්තේ සඳුටය.

පැළෑටි අතගෑමෙන් ආදරයෙන් සාත්තු කිරීමෙන් දුර්වල ග්‍රහ කිරණ ඉවත් කිරීම කළ හැකි බව ආදිම යුගයේ සිට මිනිසා ප්‍රගුණ කරන ලෝ දහමකි. ස්වභාවධර්මයට අනුකූලව වැඩෙන පාරිසරික පද්ධති ආරක්ෂා කළ යුතු වන්නේ මේ නිසාය. මිනිසා හා විශ්වය තුළ පවතින සුසංයෝගීතාවය දැඩි කිරීමට ග්‍රහලෝක වන්දනාවට මෙන්ම ගස් ගල් වන්දනාවට ද නැඹුරු විය. පැළෑටි කටහඬට සංගීතයට පවා සංවේදී වෙයි. ලෝකයේ විවිධ රටවල ග්‍රහලෝකවලට ගස් පවා වෙන්කර ඇත. සයිබීරියාවේ කොස්මික් ගස, බටහිර මේපල් ගස, ඉන්දියාවේ කෙසෙල්, විවිධ උත්සවවලදී පුද ලබයි. ලංකාවේ බෝ, නුග ගස් මෙනි. ජර්මනියේ දී උළුහාල්

සුර දූතිකාවන් ලෙස පුද ලබන්නේ විළිරුදා පහසු කිරීමට යොදා ගන්නා බැවිනි. අප රටේද එය අගනා ඖෂධයකි.

## සෞරග්‍රහ මණ්ඩලය

විශ්වය තුළ ඇති මන්දාකිනි වලින් එකකි අපේ සෞරග්‍රහ මණ්ඩලය. මෙය අපේ සර්පිලාකාර මන්දාකිණියයි (Spiraling Galaxy). සූර්‍ය්‍යා මැදිකරගත් ග්‍රහලෝක තාරකා හා විවිධ ග්‍රහ වස්තු ඇත. මිනිත්තු 8 තත්පර 20 කදී හිරු රැස් පෘථිවි තලය මත විසිරෙයි. සඳ රැස් විනාඩි 2 කදී මිහිතලය සිසාරා පැතිරෙයි. අපට ජීවය හිරුගෙන් ලැබේ. සඳෙන් පෝෂණ ක්‍රියාවලිය ක්‍රමවත් වේ.

සියළුම ග්‍රහ වස්තු වලින් විශාල ශක්ති ප්‍රමාණයක් වායුගෝලයට මුදාහරී. ඉන්දියාවේ චාතුර්වේදී මේ විකිරණ අන්තර්ගතය 7% ක් සේ සළකයි. සූර්‍ය්‍යා මැදිකොටගත් ග්‍රහවස්තු වේගයෙන් ගමන් කරයි. මේ නිසා සර්පිලාකාර මන්දාකිනියකැයි (Spiraling Galaxy) කියති. සියළුම ග්‍රහ වස්තු හිරු වටා ඉලිප්සාකාර මාර්ගයක් ගනී. මේ ග්‍රහයින් නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවෙන සේ සලකා සියළුම ජ්‍යොතිෂ විධි සකස්කර තිබේ. රවිට ස්වීය ආලෝකයක් ඇත. එය තාරාකාවකි. සඳුට පරාවර්තිත ආලෝකයක් ඇත. පෘථිවියේ උප ග්‍රහයාය. රාහු කේතු ඡායා ග්‍රහයින්ය.

රාහු සහ කේතු ඡායා ග්‍රහයින් දෙදෙනා ජ්‍යොතිෂ විද්‍යාවේදී ග්‍රහයින් සේ සලකයි. ඉර, හඳ, බුධ, සිකුරු, ගුරු, ශනි, ප්ලුටෝ, නැප්චූන්, යුරේනස් සෞරග්‍රහ මණ්ඩලයට අයත්ය. ප්ලුටෝ

ඇතැම් විට ග්‍රාහක වළල්ලෙන් පිටත සිටී. නැප්චූන්, යුරේනස් ද දූරස්ථ ග්‍රහයින්ය. රවීට සියළුම ග්‍රහ තාරකාවන් ඇද ගැනීමේ ආකර්ෂණ බලයක් ඇත. සඳු සියළුම ග්‍රහ තාරකාවන්ගෙන් උකහාගන්නා අධි පෝෂණීය දියරයන් විසිරුවමින් මිහිපිට සියළු දෑ පෝෂණය කරයි. මුළු විශ්වයම සූර්‍යයා නිසා ජීවය ලබයි. අධික හිරු කිරණ ඇස්වලට, හමට පීඩාකාරිබව කව්රුත් දනී. හිරු එළිය නොලැබෙන විට අධික විෂ සහිත ඇල්කලොයිඩ් (Alkaloid) වල උපත සිදුවේ.

## දළ මේබලාව

සෞරග්‍රහ මණ්ඩලය වටා ග්‍රහ වළල්ලක් ඇත. මෙය දළ මේබලාවකි (Crude Belt). ග්‍රාහක වළල්ල හෙවත් නැකැත් තරු වළල්ල ලෙසද හඳුන්වයි. 1801 දී ඉතාලි ජාතික පියාසි කුජ හා ගුරු කක්ෂ අතර ග්‍රාහක සොයා ගත්තේය. සෞරග්‍රහ මණ්ඩලයට අයත් රවි, චන්ද්‍ර, බුධ, සිකුරු, සමීප (Lower Planets) ග්‍රහයින්ය. කුජ තරමක් දූරය. ගුරු, ශනි, නැප්චූන්, යුරේනස් මේ ග්‍රාහක වළල්ලෙන් පිට පිහිටා ඇති නිසා දූරස්ථ ග්‍රහයින් (Distant Planets) සේ සලකයි. ප්ලූටෝ විවිධ අවස්ථා ගනී.

## පෘථිවි ගෝලය

පෘථිවිය තම අක්ෂය වටා කරකැවීමට (Rotation) දවසක් ගතවේ. ඒ භ්‍රමණයයි. ඉර උදාවේ සිට පසුදින ඉර උදාව දක්වා කාලය ජ්‍යොතිෂ කටයුතු සඳහා දවසක් සේ යොදාගනී. මේ අතර සූර්‍යයා වටේද ගමන් කරයි. ඒ පරිභ්‍රමණයයි

(Revolution). මේ සඳහා දින 365 ¼ ක් ගනී. මිලි මීටර් 5 ක ඝනත්වයෙන් යුතු පෘථිවි තලය අන්තරීක්ෂ බලවේග උරාගන්නා කොළ වදුල මතුපිට ඇත. හේන් ගොවිතැනට ගස් කපා කැළෑ එළිකර දැමීම නිසා නග්නීකරණයට හසු වී ඇති අපේ නිසරු මුඩු බිම් දකින විට මට ඇතිවන්නේ බලවත් වේදනාවක් සහ දැඩි කම්පනයකි.

ඛණිජ ලවණ සේදීයාම නිසා පස නිසරුව ඇත. මිනිස් කටයුතුවලට මෙන්ම පස සරු කිරීමටද ග්‍රහ වස්තු උපයෝගී කර ගැනීම ඈත අතීතයේ සිටම සිදුවිය.

## රාශි චක්‍රය

$360^0$ ක මනඃකල්පිත වෘත්තයක අසාමාන්‍ය කොටස් 12 කට බෙදා රාශි චක්‍රය නිමාකර තිබේ. පෘථිවිය මධ්‍ය සේ ගෙන සූර්ය සමකයට $9^0$ ක් උතුරට හා $9^0$ ක් දකුණට වනසේ ගණනය කර තිබේ. සත්ව රූප හා මිනිස් රූප ආරෝපනය කර තාරකා පද්ධති 12 ක් ආදේශ කර රාශි චක්‍රය (Animal Cycle) යනුවෙන් හඳුන්වා දෙයි. පසු කාලීන ග්‍රීක පොත්වල මේ වෙනුවට සංකේත යොදා ඇත. මේෂයේ සිට මීනය දක්වා රාශි 12 කි. නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවන සේ සලකා සියළුම ජ්‍යෝතිෂ කටයුතු නිමකරයි. ග්‍රහ තාරකාද නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවන සේ සලකයි.

## පෘථිවි ඇලය

පෘථිවිය සූර්ය සමකයට සමාන්තරව අහස් සමකය, ක්‍රාන්තිවලය කපා යන මාර්ගය සූර්යයාට 23½$^0$ කින් ඇලව පවතී. මේ අතර පෘථිවි ඇලයත්, පරිභ්‍රමණයත් නිසා කෝණ 4 ක් සෑදේ. මේ පෘථිවියේ ප්‍රධාන දිසා හතරයි. සියළුම වෙනස්වීම් සංසන්දනාත්මකව නිරීක්ෂණය කරමින් සංසිද්ධීන්ගේ කාලානුරූපි බව සලකා කෘෂි නිෂ්පාදන වේගවත් කිරීමට සැලසුම් යොදා තිබේ.

## සමීපස්ථ ග්‍රහයින් හා දූරස්ථ ග්‍රහයින්

රුඩොල්ෆ් ස්ටයිනර්ගේ උගැන්වීමට අනුව සමීපස්ථ ග්‍රහයින්ගෙන් ප්‍රමාණය ද (Quantity) වර්ධනය ද වන බව පැහැදිළි කරයි. සමීපස්ථ ග්‍රහයින් වන ඉර, හඳ, බුධ හා සිකුරු විශාල නිෂ්පාදන ක්‍රියාවලියකට දායක වෙයි. පැළෑටි මහතින් වැඩේ. ප්‍රජනනය අධික කරයි. බුධ, සිකුරු, සඳු, කැල්සියම්, සෝඩියම්, පොටෑසියම් පසෙහි ඇති සංයුතීන් පූරණය කරයි. පැළවලට අධික ශක්තියක් දෙයි. සමීපස්ථ ග්‍රහයින්ගේ අධික කිරණ වලට හසු වූ විට පුස්, කුඩිත්තන් නියමිත කාලයට පෙර පළදාව සහ පරාග වර්ධනයට බලපාන වග පෙන්වයි. කුජ, ගුරු, ශනි, නැප්චූන්, යුරේනස් හා ප්ලූටෝ දූරස්ථ ග්‍රහයින් ය. එම ග්‍රහයින්ගේ කිරණවලින් ගුණාත්මක බව වර්ධනය වේ. දූරස්ථ ග්‍රහයින් රසය, වර්ණය, සුවඳ, පෝෂණය, මල් ඵල දරණ සමයන් හි පරිණත තත්වයට ද (Quality) දායක වෙයි.

ගුණාත්මක බව නිසා වර්ධනයේ වේගය ද, නිෂ්පාදන ක්‍රියාවලියද, අභිජනනය ද අධික වෙයි. සිලිකා මාධ්‍යක් තුළ දී මෙම ක්‍රියාවලිය සිදුවන නිසා හරක් අං පිරවූ සිලිකා පොහොර වළ පත්ලෙහි දැමීමෙන් පෝෂණ ශක්තීන් අධිකව ලබා දීමට ජෛවගතික කෘෂි රටාවන් (Biodynamic Farming) සමත් වී ඇත.

හැම පැළෑටියකම වර්ධනය සිදුවීම තාරකාවන්ගේ රිද්ම රටාවන්ට අනුකූලව සිදුවේ. පැළෑටි, සතුන්, පස, මිනිසා එක්ව පරිසර පද්ධතීන් නිර්මාණය වෙයි. දූරස්ථ ග්‍රහයින් වන නැප්චූන්, යුරේනස්, ප්ලුටෝ යන ග්‍රහයින්ගෙන් ඇතිවන දේශ ගුණික විපර්යාසයන් නිසා නිත්‍ය පැළෑටිවලට හානිද පැමිණේ. රසායනික පොහොර වලින් ප්‍රමාණය වැඩි කළත් ගුණාත්මක බව අඩුවේ.

ඔහුගේ ඉගැන්වීම්වලට අනුව ජෛවගතික කෘෂිකාර්මික කටයුතු ඇමෙරිකාව, ජර්මනිය, එංගලන්තය, නෙදර්ලන්තය, ඔස්ට්‍රේලියාව වැනි දියුණු රටවල භාවිතා කරයි. මේ නිෂ්පාදන අධි පෝෂණීය නිසා අධික මිලකින් යුක්තය. මීට හේතුව රසායනික සංයෝග සියල්ල වළක්වා ස්වාභාවික පරිසරයක වැඩෙන්නට සැලැස්වීමය. හරක් අං, ගෝන අං, රයිනෝ අං ඈත අතීතයේ සිටම ඖෂධ නිෂ්පාදනයට ද ගනී. ගෝන අං වලින් සෑදූ කොප්පු වල බෙහෙත් තැන්පත්කර ඇත. ගෝන අං කුඩු ජෙලි වර්ග සඳහා භාවිතා කර ඇත. අප්‍රිකානු රටවල වෙසෙන අය රයිනෝ අං ගලගා බීමෙන් ශක්තිය වැඩි කර රෝග නිවාරණය කරන බව අදහයි.

## ග්‍රහයින්ගේ සංක්‍රමණය

මෙම මන්දාකිනිය තුළ විවිධ ග්‍රහයින් සූර්‍යයා වටා යාමට විවිධ කාල සීමා පසු කරයි.

දූරස්ථ ග්‍රහයින් වන සෙනසුරු වර්ෂ 29.46 ක් ද, ගුරු වර්ෂ 11.86 ක් ද, කුජ වර්ෂ 1.9 ක් ද ගත කරමින් සියලුම පැළෑටි වල, විශේෂයෙන් තද අරටුව සහිත ගස්වල පෝෂණ ව්‍යුහයට දායක වෙයි. සමීපස්ථ ග්‍රහයින් වන සිකුරු දින 225 ක් ද, ප්ලුටෝ වර්ෂ 248.42 ක් ද ගනී. මෙම ග්‍රහ වස්තු නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාව බැසයයි. ගණනය කිරීමට තාරකා කාලය අනුමතය. අන්තරීක්ෂ කිරණ, වායු දහරා පරිසර පද්ධතීන් හරහා පසට උරාගනී. කැල්සියම් වායුගෝලිය සාධක ආකර්ෂණය කරගනී. ඒවා පැළෑටීන්ගේ වැඩීමට මුදාහරියි. නැප්චූන් වෂී 164.77, යුරේනස් වෂී 84.02 ගනිමින් දේශගුණයට මෙන්ම භූ චලන වලට ද බලපායි.

## ක්‍රාන්ති චලය

සූර්‍යයාට ක්‍රාන්ති චලය දිගේ රවුමක් යාමට දින 30 ක් ගනී. පෘථිවි ගෝලය සූර්‍යයාගේ ගමන් මඟට සමාන්තරව එම ක්‍රාන්ති චලය කපා යයි. මෙසේ වටයක් නිම කිරීමට දින 365¼ ක් ගනී. මේ කාල් හතර පෙබරවාරියට දින 29 ක් වන සේ අධික අවුරුද්ද සාදා ඇත. ඇලව ගමන් කිරීම නිසා කැපෙන තලවල වෙනස සායන හා නිරායන ජ්‍යොතිෂයේ වෙනසයි.

- මාර්තු 14 සිට අප්‍රේල් 14 - මීන කෝණ මාසය
- ජූනි 15 සිට ජූලි 15 - මිථුන කෝණ මාසය
- සැප්තැම්බර් 17 සිට ඔකතෝබර් 16 - කන්‍යා කෝණ මාසය
- දෙසැම්බර් 15 සිට ජනවාරි 15 - ධනු කෝණ මාසය

## පෘථිවියේ දිශා 4

මේ කැපෙන තල 4 (Four Cardinal Points) පෘථිවියේ ප්‍රධාන තුඩු හතර කෘෂි කටයුතු සඳහා අතිශයින්ම වැදගත්ය. අප රටේ කෝණවලට ඇති බිය නිසා මිනිස් කටයුතුවලින් වැළකී සිටීමට වෙහෙස ගනී. නැගෙනහිර රටවල මේ මාස හතර අශුභ කෝණ මාස සේ වෙන්කරයි. මේ කෝණ මාස වලට අනුකූලව පැරණි ජ්‍යොතිෂ සිද්ධාන්ත ගණනය කර තිබේ. කෝණ මාස නිවාස ඉදිකිරීමට සහ වෙනත් වැදගත් කටයුතුවලට නොගනී. නමුත් කෘෂිචක්‍රය තුළ කෘෂි කටයුතුවලට බාධා නොයෙදේ. කමතේ කොළ පෑගීමට අඳින කලවිටි චක්‍රවල පවා මේ කෝණ 4 සහ නැකැත් 27 ලකුණු කරයි. අභිජිත් නැකත සමඟ නැකැත් 28 ක් සේ භාවිතයට ගනී. ග්‍රහයින්ගෙන් එන සියලු උවදුරු දුරලීමට ශාන්තිවිධි ලෙස මෙසේ සාදා සෙත් ශාන්ති කරයි.

## කෘෂි චක්‍රය හා රාශි චක්‍රය

- පෘථිවි තලය හා අහස් තලය කැපීයන $0^0$ ලක්ෂ්‍යය මාර්තු 21 වසන්ත විෂුවය (Vernal Equinox) මේෂ රාශියේ ආරම්භයයි. දිවා රාත්‍රී එක සමානය.

- $90^0$ ජුනි 21 ගිම්හාන සූර්‍ය නිවෘත්තිය (Summer Solstice) කටක රාශියේ ආරම්භයයි. දිවා කාලය දිගය.

- $180^0$ සැප්තැම්බර් 22 සරත් විෂුවය (Autumnal Equinox) තුලා රාශියේ ආරම්භයයි. දිවා රාත්‍රී එක සමානය.

- $270^0$ දෙසැම්බර් 21 සිසිර සූර්‍ය නිවෘත්තිය (Winter Solstice) මකර රාශියේ ආරම්භයයි. දිවා කාලය කෙටිය. ගැමියන් මේ අවච්ඡා කාලය යැයි හඳුන්වයි.

| | | |
|---|---|---|
| සිසිර ඍතුව | - | දෙසැම්බර් 22 |
| | - | පෙබරවාරි 19 |
| වසන්ත ඍතුව | - | පෙබරවාරි 19 |
| | - | අප්‍රේල් 19 |
| ගිම්හාන ඍතුව | - | අප්‍රේල් 19 |
| | - | ජූනි 24 |

| | | |
|---|---|---|
| වර්ෂා සෘතුව | - | ජූනි 24 |
| | - | අගෝස්තු 25 |
| සරත් සෘතුව | - | අගෝස්තු 25 |
| | - | ඔක්තෝබර් 22 |
| හේමන්ත සෘතුව | - | ඔක්තෝබර් 22 |
| | - | දෙසැම්බර් 21 |

ලංකාවට සෘතු හයක් ඇත. වසන්තය-සිකුරුටද, සිසිරය-ශනිටද, ග්‍රීෂ්මය-කුජටද, වර්ෂා-සඳුටද, සරත්-බුධටද, හේමන්තය-ගුරුටද වෙන්කර තිබේ. දෙසැම්බර් 21 සූර්යා මකර රාශි ගත වූ විට පැළෑටි වර්ධනය උපරිම තලයකට එයි. මේ කාලය දෙසැම්බර් 21 සිට ජූනි 21 දක්වා ජීවින්ගේ, පැළෑටීන්ගේ ප්‍රාණවත් බව වර්ධනය වන බව විද්‍යාඥයින්ගේ මතයයි. අන්තරීක්ෂ ඔරලෝසුවක ක්‍රියාකාරි බවට මුළු විශ්වයම හසුවන වග කියයි. පැරසිල්සස්ගේ මතය වූයේ පැළෑටි සතු ජීවය රඳා ඇත්තේ ග්‍රහ තාරකා 7 තුළ බවය (The soul of the plants resides in the 7 planets) ජනවාරි 14 දා සිට රවි මකර රාශියේ හැසිරෙන කාලය පැළෑටීන් ගේ වැඩීම උපරිම තලයකට ගෙන එයි.

## පැළෑටි කාලානුරූපීව වර්ධනය වීමට මල් එල දැරීමට විශ්වීය සාධක.

- ගසක් හොඳින් කථා කළ විට ධන ප්‍රතිචාර (Positive Rays) නිකුත් කරන බව කියයි.
- ගස වටා ඇති ශක්ති පද්ධතිය විනාඩියකට 18-22 අතර සංඛ්‍යාවක් ස්පන්දනය වන බව වාර්තා වෙයි.
- පැළෑටියක් තුළ විදුලි ශක්තිය ගමන් කරයි.
- ආලෝක කිරණ විහිදේ.
- චුම්භක ශක්තිය ඇත.
- ශබ්දය දැනේ.
- විශේෂ සංවේදීතාවයන් ඇත. (Extra Sensory Perception)
- රෝග සුව කිරීමේ ශක්තිය තිබේ.
- ප්‍රතිචාර දක්වයි.
- ඇස්වහ කටවහ වදී (පුහුල් ගෙඩිය විෂ නසයි)
- කිලිවලට හසුවෙයි (බුලත් වැල මැළවීම)
- රශ්මි මාලා ඇත (Bio Plasma) සහිතය

- පැළ සිටුවන අයගේ අත් ගුණයද වැදගත්ය
- ශුභ දිශාව, වේලාව, නැකත, සුදුසු ස්ථාන අවශ්‍යයි.
- පොළව තුළ චුම්භක ශක්තීන්ගේ ව්‍යාකූලත්වයක් ඇතිවිට ගස්වැල් මළානික වේ.
- පොළව තුළ ගලායන ශක්ති ධාරා සහ චුම්භක ශක්තිය නිතර ක්‍රියාත්මකව පවතී.
- සියළුම ශාක වෙලාවට වැඩ කරයි.
- සූර්ය කාන්ත, හේන්දිරික්කා, වී මල, කඩුපුල්, රෑ දේවි, සේපාලිකා.
- පෙබරවාරි මාසයේ රබර් ගස්වල කොළ හැලේ.
- බක් මාසය - එරබදු මල්, වෙසක් මාසය - වෙසක් මල්, බිනර මාසය - බිනර මල්, ඇහැළ මාසය - ඇහැළ මල් පිපෙයි.

දෙසැම්බර් 21 හිරු මකර රාශියට පිවිස උත්තරායනයට ගමන් කරයි. ජ්‍යොතිෂයට අනුව මෙය ඉතාම පින්බර වාසනාවන්ත නැකැත් සමයයි. පෘථිවියේ මධු සමයයි. පරිසරය මල් ඵල ගැන්වී කුරුළු හඬින් නින්නාද වෙයි.

ආහාර ගබඩා පිරි ඉතිරෙයි. ජූනි 24 හිරු කටක රාශියට පිවිස දක්ෂිණායනයට ගමන් කරයි. මේ වැසි කාලයයි. වාෂ්පීකරණය අධික නිසා ඝන වනාන්තර මෙහි ඇත. මීට

හේතුව හෙණ විදුලි සහිත සංවහන වැසිය. තිරක්ෂයෙන් $0^0$ - $5^0$ දක්වා ඩොල්ඩ්‍රම්ස් නිසල වායු පටියයි. ඉන් ඈත $23½^0$ ක් උතුරට කටක නිවර්තනයයි $23½^0$ ක් දකුණට මකර නිවර්තනයයි. සමකයට ආසන්නව හූ කේන්ද්‍රීය උත්තරක්ෂාංශ $6^0$ 51 හා නැගෙනහිර දේශාංශ $82^0$ 30 සිටින ශ්‍රී ලාංකිකයනට දැඩි උණුසුමක් දැනේ. සමක වර්ගයේ උද්වහන (Convectional) වැසි මෙන්ම නිවර්තන කලාපීය දේශගුණික විපර්යාසයන් ඇති කරයි.

සූර්යයා උත්තරායනයට ගමන් කරද්දී දෙසැම්බර් 21 සිට ජූනි 22 දක්වා ජීවින්ගේ හා පැළෑටීන්ගේ ප්‍රාණවත් බව වර්ධනය කරන බව විද්වතුන්ගේ මතය විය. බටහිර විද්‍යාඥයන්ගේ මේ මතය ඉන්දියාවේ චාතුර්වේදී, විකිරණ අන්තර්ගතය 7% කින් වැඩි වන වග තීව්‍ර කළේය. මරේගේ මතය වූයේ අන්තරීක්ෂ ඔරලෝසුවක ක්‍රියාකාරි බවට මුලු විශ්වයම හසු වන වගය. මින්ට්, සුදු ලූණු, ඉඟුරු වැනි සුවඳවත් දෑ අන්තරීක්ෂ බලවේගයන් වැඩියෙන් උරා ගන්නා බව ස්ටෝල්ගේ මතය විය. ග්‍රහලෝක සංචාරකයන්ය. මේ ගමන ආරම්භ වන්නේ සූර්යයා තාරකා මණ්ඩල ඉදිරියෙන් සිටිමින්ය. ගිම්හානය - මිථුන, සරත් - කන්‍යා, සිසිරය - ධනු, වසන්තය - මීන වේ.

පැළෑටි හූ කේන්ද්‍රයට සාපේක්ෂව වායු ගෝලය හරහා අන්තරීක්ෂ කිරණ උරාගෙන වර්ධනය වේ. පෘථිවි තලය කැපී යන ප්‍රධාන දිශා 4 ට අයත් ප්‍රදේශ කෘෂිකාර්මික චක්‍රය සාදයි. විශ්වයේ මේ අසිරිමත් සංසිද්ධි විදාරණය කර, කෘෂි ව්‍යාපාර වේගවත් කිරීමට විවිධ ජාතීන් දායක වී ඇත.

ඇමෙරිකාව වැනි අපරදිග රටවල් සහ චීනය වැනි පෙරදිග රටවල ජෛවගතික කෘෂි නිෂ්පාදන සඳහා දැඩි වෙහෙසක් දරයි. විශ්වයේ රිද්මානුකූල සංචලන ගැන කරන ලද පර්යේෂණ ලෝකය පුරා ප්‍රචලිත වීමට හේතු වූයේ ගැමියන් සතු පාරම්පරික ඥාන සම්භාරය ඒ හා සංසන්දනාත්මක වූ බැවිනි. මේ නිසාම වගා ලිත් භාවිතය පූජනීය තත්වයට පත්වී ඇත.

ලෝකයේ සෑම රටකම කෘෂි හා සියලුම මිනිස් කටයුතුවලට ග්‍රහකිරණ යොදාගෙන තිබේ. වසන්ත හා සරත් විෂුවයන් හිදී රෑ දහවල් එක සමාන වේ. ගිම්හාන සූර්ය නිවෘත්තියේදී දවස දිගය. සිසිර සූර්ය නිවෘත්තියේ දී දවස කෙටිය. ගැමියන් අවච්චා කාලය යැයි හඳුන්වයි. සෘතු විපර්යාසයන් කෘෂිකාර්මික කටයුතු කෙරෙහි බෙහෙවින් බලපාන වග අපි හොඳින් දනිමු. ලංකාවට සෘතු 6 ක කාල සීමා ඇත. කැලෑ එළි කිරීම වැනි පරිසර විනාශ නිසා කාල සීමා වෙනස් විය හැකිය. කෘෂි චක්‍රය තුළ ආලය, ආදරය, සතුන්ගේ සංක්‍රමණය, මද කිපෙන කාල සීමා, පැළෑටි වර්ධනය දිළු මල් හා ඵල දැරීම, අක්‍රියවීම, කාලානුරූපී බව, ක්‍රමානුකූලව සිදුවීමට ග්‍රහ ගමන් සහ අන්තරීක්ෂ බලවේග හා කිරණ නිසා සිදුවන වග විද්‍යාඥයින් විසින් පර්යේෂණ මගින් පෙන්වා ඇත.

පැළෑටි විශ්වයේ ඇතිතාක් රස කොටස් උරාගනී. පසුව මිනිසාගේ හා සතුන්ගේ පෝෂණයට දායක වෙයි. මේ ආශ්චර්යමත් සංසිද්ධින් පාදක කරගෙන සංවර්ධන ක්‍රියාවළිය බිහිවී ඇත. සංවහන, මෝසම් හෙවත් වෙළඳ,

වාසුළි හා පිළි වාසුළි, අන්තර් මෝසම් සහ අන්තර් වාසුළි මෙන්ම බෙංගාල බොක්කේ පීඩන පෙදෙසින් අපට අධික වැසි ඇති කරයි. රට මැද වනාන්තර සහිතය. අධික උෂ්ණත්වය, උන්නතාංශය හා මුහුදේ බලපෑම නිසා පාලනය වේ.

මේ අනුව ස්වභාවික වෘක්ෂලතාවන්ට සමගාමීව අපට වගා කටයුතු සකස් කිරීමට සිදුවේ. යල මහ කන්න 2 කට වාසිදායක තත්වයක් ඇත. ජ්‍යොතිෂය අනුව චුම්භක ක්ෂේත්‍රය (Magnetic pole) නිරිත දිග සිට ඊසාන දෙසට විහිදෙන නිසා ඊසානට අප වැවිය යුතු වන්නේ ජලජ පැළෑටීන්ය. උදා : ගිණිකොණට නේළුම්, අඹ, පිහිඹිය, දේවදාර, වැනි ගස් දැඩි වියළි සුළඟින් මුවාවීමට තද අරටුව සහිත රූස්ස ගස් කොලන් වන අරළු, බුළු, නෙල්ලි හා කළුවර ද සුදුසුය.

නැගෙනහිරට වියළි ප්‍රදේශවලට කජු, සියඹලා, උගුරැස්ස, පස් පැඟිරි වැනි කටු පඳුරු වලින් සාර්ථක ප්‍රයෝජන ගත හැකිය. බටහිරට කුඩා පැළ වර්ග කහ, කෝමාරිකා, මීනී මල් වැනි වෙළඳ බෝග වර්ග ද උතුරට වියළි දේශගුණයට උචිත ධාන්‍ය වර්ග ද, උක් වැනි කුඩා පඳුරු ද සුදුසුය.

කඳුරටින් අධික අන්තරීක්ෂ කිරණ ලබා ගැනීමට පළතුරු සහ වෙළඳ වටිනාකමක් ඇති සාදික්කා, කරාබු නැටි, කොකෝවා වැනි ගස් සිටුවීම කාලීන අවශ්‍යතාවයකි. පළතුරුවලට ඉතා හොඳ උස් බිමය. ග්‍රහ කිරණ හොඳින් උරා ගනී.

## කෘෂි කටයුතු සඳහා අවශ්‍ය මූල ධාතු 4

ක්ලෝඩියස් ටොලමි "Tetra Biblios" නැමැති ග්‍රන්ථයෙහි සෑම ප්‍රබල වස්තුවකින්ම රශ්මි මාලා හෙවත් විකිරණ (Ambient Power) පැතිරී යන අයුරු පැහැදිලි කර ඇත. සියළුම ග්‍රහ වස්තු තාරකා මණ්ඩල මිනිස් සංහතිය සතුන් හා ගහ කොළ කෙරෙහි බලපාන බවත් විශේෂයෙන් ප්‍රජනනය, සංසේචනය හා වර්ධනය කෙරෙහි බලපාන වගත් නිරීක්ෂණය කර ඇත. මේ නිසා ටොලමි ග්‍රහ ගති හිතකර හා අහිතකර (Benefics & Malefics) යනුවෙන් වෙන් කළේය. ඔහු ග්‍රහ සංඥා යොදා රාශි චක්‍රය මූල ධාතු 4 කට වෙන්කර පුද්ගලාරෝපණය කරමින් ස්ත්‍රීන්ට සම කළේය. උදාඃ සිකුරු සෞභාග්‍යට හා හලාහල විෂට ද අධිපති යැයි කියා ග්‍රහ ගති හඳුන්වා දුන්නේය. පැළෑටිවල සංයුතීන් ශරීරයේ විවිධ අංශවල රෝග සඳහා යොදා ගන්නා අයුරු ද, පැහැදිලි කළේය. වගා කටයුතු සඳහා යොදා ගන්නා අයුරු කියා දුන්නේය. ඉන්පසු ඒවා මෙසේ වර්ග කළේය.

අපේ ජ්‍යොතිෂ පොත්වල නැකැත් තරු 27 ද මෙම ධාතු 4 ට ද, ආකාශ යැයි තවත් ධාතු ගණයකට ද වෙන්කර ඇත. මෙයින් බලාපොරොත්තු වන්නේ යම් දෙයක ස්වරූපය හැඳින ගැනීමය. මේ නැකැත් තරු 27 මුල්කර අප රටේ නැකැත් චාරිත්‍ර විධි අනුගමනය කරයි. කිරි වෘක්ෂ දරු ඵල ඇතිදැයි නිගමනය කරයි.

## සඳේ රිද්ම රටා

සඳ කලා අධ්‍යයනය කරමින් විද්‍යාඥයින් විවිධ මත ප්‍රකාශ කර තිබේ. ලෝකයේ සෑම රටකම පාරම්පරික ක්‍රම සහ විධි එක හා සමානය. කායික (Physical) විශ්විය (Ether) දිව්‍යමය (Astral) අධ්‍යාත්මික (Spiritual) ආගමික (Religious) පසුබිමක ජීවත් විමට අධික වෙහෙසක් දරා ඇත. විශ්මිත ග්‍රහ වස්තු තුළ විශාල මෙහෙයක් ඉටු කරන්නේ රවි හා සඳුය. සඳු රාශි චක්‍රය සිසාරා යමින් විශාල ශක්ති ප්‍රමාණයක් පරාවර්තිත රශ්මි ධාරා මගින් විශ්වයට මුදාහරී. විශාල උදම් වලදී ගුරුත්ව බලය නිසා භූමිකම්පා ද, සාගරවල සුනාමි තත්වයන් ද ඇති වේ. ගස්වල, පොතුවල අන්තර්ගත යූෂ පිරී උතුරයි. පැළ සිටුවීමට, අස්වැන්න නෙළීමට, පිරිමින්ගේ මානසික පීඩන, ස්ත්‍රීන්ගේ ඍතු වීම, උණ වගුව (Fever Curve) සඳුගේ බලපෑම අනුව සිදුවේ. විවිධ ආශාවන් හා අනුවේදනීය ක්‍රියා කලාපයන්ට සඳු අනුබල දෙයි.

ජුනි 21 සිට ජූලි 21 දක්වා සඳුගේ බලය අධිකය. සඳේ කලා අනුවද සඳට ඇති වෙනත් ග්‍රහ දෘෂ්ඨි අනුවද එක් එක් අංශවල වැඩීම විවිධ පර්යේෂණ මාර්ගයෙන් පෙන්වා ඇත. ජර්මන් ජාතිකයිනට සඳු හා සම්බන්ධ කාබනික පොහොර භාවිතය ගැන මාරියා තුංගේ සංකල්ප ප්‍රාතිහාර්යයක් විය. විශ්ව රටා ඇඳා ගැනීම පැළයක ස්වරූපය, ප්‍රමාණය හා රස පිළිබඳ රහස අනාවරණය විය. ඇ ලියු පොත් සමඟ තාරකා අනුව වගා කිරීම් (Woking with the stars) ලෝකය පුරා ජනප්‍රිය විය. ඇගේ අවධානය යොමු වු තවත් කරුණක් නම් අළුතින් හාන ලද බිමේ වර්ධන වේගය වැඩි බවය.

ඇය අස්වැන්න නෙළීමට මුල් සහ පළතුරු දිනද අනුමත කළාය. ඇය කෘෂිකර්මයට අළුත් විද්‍යාවක් එක් කළ ලෝකයේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥවරියකි.

ලිලී කොලිස්කෝ පුරහඳ චක්‍රය ගැන විශේෂ ගවේෂණයක් කළේය. වගා කටයුතු සඳහා සඳෙහි බලපෑම චක්‍ර 5 කට බෙදා වෙන් කර කෘෂි කටයුතු සඳහා විශේෂ අවධානයක් ගන්නා ලෙස නිර්දේශ කළේය. රාශියෙන් රාශියට දින 1½ සිට 3 ක් ඇතුලත සඳු රාශි චක්‍රය හරහා යමින් සියළුම ග්‍රහ වස්තුන් ගෙන් මුදාහරින විවිධ ශක්තීන් උරාගනී. ඇය සතු මේ ආකර්ෂණීය බව කදිමය. වැසි බිංදුවේ සිට ජල තරංග දක්වා ඇගේ මෙම අසීමිත බලය රැදී තිබේ. සෙම, දරු උපත්, අධික ඵල දැරීම, බෝ කිරීම, අනාගතය කීම, මානසික ආවේග පාලනය වන්නේ සඳුගෙනි.

දවල් 12.00 ට වී මල් පුබුදින්නා සේ සඳ රැසට ද කුමුදු, රැ දේවි, කඩුපුල් මල් පිපෙයි. මේ ක්‍රියාවලිය ප්‍රහර්ෂණයයි (Ecstatic). නැකැත් තරු 27 ක් සහ රාශි චක්‍රය ඉදිරියෙන් සඳු ගමන් කර ඒ ඒ තාරකා මණ්ඩලවල සියළුම ශක්තීන් උරාගන්නා බව නිරීක්ෂණයෙන් අවබෝධ කරගත් විවිධ විද්‍යාඥයින් නැකැත් අනුව සියළුම වැඩ කටයුතු සැලසුම්කර ඇත. සඳ අලුත් රාශියකට යාමේදී පැය 2 ක් පෙර හා පැය 2 ක් පසුව වගා කටයුතු නොකළ යුතු යයි නිර්දේශ කර ඇත. සෑම රටකම ලංකාවේ මෙන්ම දිවා රාත්‍රී දෙකම කෘෂි කටයුතු සඳහා යොදා ගනී. රාත්‍රියට ඇට වර්ග පැළවෙන්නට දමන්නේ ඉක්මණින් පැළවීමටය. ලංකාවේ වී යහන් කිරීමට

හා කමත් වැඩ සඳහා රාත්‍රී කාලය යොදා ගැනීමෙන් අස්වැන්න වැඩි වන බව පිළිගනී.

- **සිනොඩික් මාසය (Synodic month) - දින 29.5 කි.**

සඳෙහි ප්‍රධාන කලා 4 පෝය 4 සේ සැලකේ. නව සඳ රවී හා සංවතී (Conjunction) වීම සහ සප්තම (Opposition) වීමට වැඩි පුර දින 2 ක් එකතු කර ඇත. නව සඳු දින 3 කදී ලස්සන චන්ද්‍ර වංකයක් සේ පායයි. දින 7 කදී පළවෙනි කාර්තුවට පිවිසෙන හඳ දෙළොස් ගුණයකින් බැබළේ. ඉන්පසු අඳුරු අර්ධයද ආලෝකමත් වේ. පුරහඳට පැය 48 කට පෙර වැපිරීම ඉතා ශුභය.

නව සඳ මුල් අල්ලා ගැනීම ඉක්මන් කරයි. අනවශ්‍ය පැළ හා වල් ඉවත් කිරීමට හොඳම කාලයයි. පුර හඳට පොහොර හා බෙහෙත් විසිරීම ශුභයි. සඳු කටකයේ සිටීයදී ගසේ පොත්ත විශ්ව ශක්තීන් විශාල ලෙස උරාගනී. වර්ධන වේගය, බෝ කිරීම, උපත් අධික වීම සීඝ්‍රයෙන් සිදුවේ. සත්ව පාලනයට ඉතා කදිමය.

ආලෝකයත් සැහැල්ලු බවත්, අඳුරත්, ගුරුත්වයත් අතර නිතර ගැටුමක් ඇත. පුරහඳට පරිවෘත්තියේ විශාල ක්‍රියාකාරිත්වයක් හා අවශෝෂණයක් සිදුවේ. ඇට වගී වේගයෙන් පැළවෙයි. පුර හඳ දවස ආවේගශීලි බව වැඩි නිසා ඇට වැපිරීම පැළ සිටුවීම අවිනිශ්චිතය.




රූපය 13.1. පුර සඳ චක්‍රය.

රුඩොල්ෆ් ස්ටයිනර්ගේ ඉගැන්වීම්වලට අනුව ඵල හට ගැනීමට විශාල ශක්ති ප්‍රමාණයක් පෘථිවිය සිසාරා යයි. ස්ත්‍රීන්ගේ ඔසප් චක්‍රය මේ හා බැදේ. පීතෘ හිරුගෙන් පෝෂණීය දියරයන් සඳ දේවිය, පෘථිවි මවට ගෙනත් දෙයි. එසේම සියළුම තාරකා මණ්ඩල ඉදිරියෙන් යමින් මවක මෙන් ඇය අපව පෝෂණය කරන්නීය. නව සඳ අඳුරුය. අව සඳට හා පුර සඳට රේඩියෝ තරංග පැහැදිලිව විශ්වය පුරා පැතිරයයි. පැළෑටිවලට ද අධික ශක්ති ප්‍රභවයක් ලබාදෙන බව විද්‍යාඥයින්ගේ මතයයි.

- **ඇනෝමලිස්ටික් මාසය (Anomalistic month) - දින 27.5 කි.**

සඳ පෘථිවිය වටා යාමේදී සඳුගේ කක්ෂය ඉලිප්සාකාර වී වෘත්තාකාර නොවීමක් සිදුවේ. මෙය පෘථිවි දුරස්ථය (Apogee) සේ හඳුන්වයි. ජූලි 4 වන විට ඉතා දුරින් (Aphelion) සිටී. ඈත සිටින කාලය ගිම්හානයයි. මේ වෙලාවට පැය 2 ක් පෙර හා පසුව වගා කටයුතු නොකරයි. වියළිගතිය අධික නිසා අල වගාවලින් හොඳ අස්වැන්නක් ලැබිය හැකිය. ඇට වැපිරිමට, පැළ සිටුවීමට, ගලවා නැවත සිටුවීමට නුසුදුසු බව අවධාරනය කරයි. උදම් 20% කින් ඉහළ නගී. පැළෑටි වලට හිරිහැර සිදුවේ. මේ අතර වෙනත් ග්‍රහ කැළඹීම් සිදුවන අවස්ථාවල පැය 12 ක් පෙර හා පසුව වගා කටයුතු නොකළ යුතුය. මේ ගමනට සඳු දින 2 ක් ගනී. මේ කාලය තුළ ප්‍රසාරණය සිදුවේ.




රූපය 13.2 ඇනෝමලිස්ටික් චක්‍රය

පෘථිවියට ඉතාම ආසන්නව සඳු සිටින කාලය (Perigee) ය. මේ සඳහා සඳු දින 2½ ක් ගනී. මේ සීත සෘතුවයි. පැය 12 ක් පෙර හා පැය 12 ක් පසුව වැඩ නොකිරීමට නිර්දේශ කරයි. පැළැටි කෘමි වසංගතවලට හසුවේ. පැල අගුල් වැටුනා (Bolt) හා සමාන වෙයි. සඳ පෘථිවි සමිපකයේ සිටින විට ජලය විසිරීයාම වේගවත්ය. මාසයක් තුළ මෙවැනි අවස්ථා 2 ක් සිදු වුවහොත් අධික තෙතමනය නිසා පුස් හා කුඩිත්තන් වැඩිවෙයි. පැළ කුණුවෙයි. පළතුරු විනාශ වෙයි. නගින උදම්, උණු ලාවා, ජල තරංග, ගස්වල පොතු තුළ ප්‍රසාරණය (Expansion) අධිකය. සඳු සමීපව සිටින විට අධික වැසි ඇති වී පැළ මහතින් වැඩි වේ. බෝංචි, අර්තාපල්, කැරට්, රාබු සිටුවීමට ශුභ යැයි කියයි. ජනවාරි 4 සඳු පෘථිවියට ඉතාම ළංවෙයි. මේ නිසා සංකෝචනය (Contraction) අධික වෙයි.

- **තාරකා මාසය (Sidereal month) - දින 27.3 කි.**

සඳු දින 1½ - 3 ක් එක රාශියක රැඳේ. මල්, කොළඹ මුල්, පළතුරු ඇට සියල්ලටම හොඳම කාලයයි. ලෝකයේ හැම කෙනෙක්ම මේ කාලය තුළ පැළ සිටුවයි. පැළ නිරෝගී වේ. මී මැස්සන් කඩිසරව හැසිරෙන සමයයි. රවි, කුජ, ගුරු, ශනි ප්‍රබලව පැළෑටි වර්ධනයට දායක වේ. පොහොර හා මඩ අළු මිශ්‍රණ රෝගී ගස්වලට යෙදීමට හොඳම කාලයයි.



රූපය : 13.3. තාරකා චක්‍රය

- **ඩ්‍රැකොනික් මාසය (Draconic month) - දින 27.06**

සඳු $5^0$ උතුරට හා $5^0$ ක් දකුණට දඟර ගසා යන කාලයයි. නඟින හා බහින නෝඩ අවස්ථාවයි. මේ අපේ රාහු කේතු සංකල්පයයි. ග්‍රහණ සිදුවන සීමාවයි. පුර සඳු නෝඩයක සිටි විට චන්ද්‍ර ග්‍රහණයක් සිදුවේ. නව සඳු නෝඩයක සිටි විට සූර්ය ග්‍රහණයක් සිදුවේ. $0^0$ - $180^0$ අතර සඳු ක්ෂණිකව වැහැරී යන සමය (Waning) තුළ ආරෝහණ නෝඩ ඇතිවේ.

පුර හඳට (Waxing) ආරෝහණ අවරෝහණ නෝඩ දෙකම සිදුවේ. සූර්ය සුළං ඇති වී විනාශකාරි තත්වයක් මවයි. සඳු හා ශනි සප්තම වු විට 180$^{0}$ උසස්ම තත්වයේ නිරෝගී ඇට පැළවිම ආරම්භ කරයි. ෆ්‍රාන්ස් රූලිං සිලිකා 501 ඉසීමට නිර්දේශ කරයි.




රූපය : 13.4 ඩ්‍රැකොනික් චක්‍රය

සරු අස්වැන්නක් ලැබීමට, පුස් ඉවත් කිරීමට, ඇට වැපිරිමට, දුම් ගස්සා විෂ නැසීමට හොඳම කාලයයි. රෝගීන්ට වෙද හෙදකම් කිරීමටද කදිමය. රසායනික ද්‍රව්‍ය වලද ක්‍රියාකාරි බව අධික වේ. උදෑසන ඇට වැපිරිමට, වල් පැලෑටි නාශක ඉසීමට ඉතා හොඳය. කෘමි හා දිලීර උවදුරු වහා ඉවත් වේ. නොරිස් ජියස් කළු පුස් ඉවත් කිරීමට මේ කාලය නිර්දේශ කරයි. අමතර ශක්ති ප්‍රභවයන් වර්ෂාව තුළින් ලැබේ. සඳු, බුධ, සිකුරු, කුජ, කැල්සියම් විසි කරයි. යුරේනස්, ප්ලුටෝ, නෙප්චුන් සිලිකාවල ක්‍රියාකාරිත්වයට නව පණක් දෙයි.

මාරියා තුං හා ස්ටයිනර් ඕස්ට්‍රේලියාවේ දි කළ පරීක්ෂණ තුළින් අන්තරීක්ෂ කිරණ විශාල ප්‍රමාණයක් පොළොවට හා මුල්වලට උරා ගන්නා බව සොයා ගෙන ඇත.

ග්‍රහණවල දී පෙර හා පසු පැය 12 බැගින් වැඩ අත්හල යුතුයි නිර්දේශ කරයි. සඳු සහ අනෙක් ග්‍රහ වස්තූන් සූර්ය කක්ෂ තලයට නැම්මක් ඇති වේ. මේ කක්ෂ තලය කපා යන තුඩු (Nodes) නමින් හඳුන්වයි. සෑම ග්‍රහවස්තුවක්ම සූර්යා වටා යන ගමනේ දී නෝඩ 2 ක් ඇති වේ. මෙවැනි අවස්ථාවක ග්‍රහණයක් ඇති නොවුවත් නෝඩයක් පැළෑටිවලට හානි සිදු කරණ වග ඇග්නස් ෆයිෆ් (Agnes Fyfe) පෙන්වා දෙයි.

මෙහිදී සැඟවීම හෙවත් සංවර්තය (Conjunction) නම් මායා බලයක් උද්ගත වෙයි. සඳුගේ සංවර්තයක දී හෝ චතුරශ්‍රයක දී සඳුගේ දඟර 3 ක් හෝ 4 ක් එක වසරක් තුළ සිදුවෙන බව තාරකා විද්‍යාඥයින් කියයි. සති 3 ක් පමණ කාලය මරණ සංඛ්‍යාවද අධික වෙයි. ජී. වොච්ස්මත් ගොවීන්ට මේ කරුණු හොඳින් අවබෝධ කර දී තිබේ. ප්‍රබල ශක්ති ව්‍යුහයන් ගැන සලකා බැලීමෙන් විපුල ප්‍රයෝජන ගත හැකිය. පසෙහි කාබනික ව්‍යුහය උසස්ම අයුරින් ඇති විටක තාරකාමය බලවේගයන් ද හොඳින් උරාගනී. ගොම පොහොරවල මේ ශක්තිය හොඳින් ඇත.

චන්ද්‍ර ග්‍රහණයක් (Lunar eclipse) හෝ සූර්ය ග්‍රහණයක් (Solar eclipse) ඇතිවේ. මෙවැනි අවස්ථාවල වගා

නොකරයි. පැය 24 ක් උච්චම අවස්ථාව (Climax) ආරෝහණ නෝඩයකි. (Ascending node).

චන්ද්‍ර නෝඩයකදී සඳු, ඉර පෘථිවිය එකම කේන්ද්‍රයක දර්ශනය වෙයි. අවරෝහණ නෝඩයකදි (Descending node) මෙවැනි සංකේතයක් හිමිවේ (☋). ආරෝහණ නෝඩයකදී () මෙවැනි සංකේතයක් හිමිවේ. මේ රාහු කේතු සංකල්පයයි. සඳුගේ නෝඩයක දී පැය 2 ක් පෙර හා පසුව වැඩ නැවැත්වීමට නිර්දේශ කරයි. බුධ, සිකුරු නෝඩවල දී ද පැය 24 ක් වැඩ අත්හළ යුතුය. කුජ නෝඩවලදී ග්‍රහ කැලඹීම් අවස්ථාවල පමණක් පැය 24 ක් කෘෂි වැඩ නැවැත්විය යුතුය. මෙවැනි නෝඩ අවස්ථා ඉතා දරුණුය.

රාහු කේතු ගැන නැගෙනහිර රටවල මෙන්ම බටහිර රටවලද මහත් ආන්දෝලනයක් ඇත. මේ නිසා ඇමෙරිකාවේ 'ස්ටෙලා නැචුරා' (Stella Natura) සහ ජර්මනියේ ජෛවගතික ඇට වැපිරීම සහ වගා ලිත (Biodyanamic sowing and Planting Calendar) වැනි වගාලිත් සහ එංගලන්තයේ රෆායල් ද, ඉන්දියාවේ ලහිරිද ලිත්වල නෝඩ සඳහන් කරයි.

සඳු ක්‍රාන්ති වලයේ $5^0$ ක් උතුරටත් $5^0$ ක් දකුණටත් දඟර (Zig-Zag) ගමනක යෙදෙයි. මේ චන්ද්‍ර දඟර (Moon wobbles) නමින් හඳුන්වයි. උතුරට ආරෝහණ (Ascending) හා දකුණට අවරෝහණ (Descending) ගමනක යෙදෙයි. විශ්වීය පිඹුරන් සේ (Celestial python) සේ හඳුන්වයි.

රාහු (Dragon's head) කියාද කේතු (Dragon's tail) කියාද ව්‍යවහාරයේ ඇත. නෝඩ වායු ධාරා (Draught) වළක්වයි. උදම් ඇති කරයි. ඇට පැළවීමට හා පැළ වැඩීමට බාධා කරයි. හෙණ විදුලි අවස්ථාවල දී ද හානිකර තත්වයන් ඇති වුවත් අකුණු ජලය ඛණිජ ලවන අන්තර්ගතය නිසා පැළෑටිවලට හිතකර බව කියයි. ජල තරංගවලට අනුකූලව මුහුදු ගමන් ද සකස් විය. ජර්මනියේ මාරියා තුං දැඩි වෙහෙසක් දරා සඳ ගමන් වලට අනුකූලව පැළෑටි වර්ධනය සිදුවන වග අවධාරණය කරයි. අප රටේ මෙන් ජර්මනියේ ද පුර හඳට ගස් නොකපයි. හඳට පුදින ගොයම බොල්වන වග ගැමියන් දනී. මේ නිසා කල් යල් බලා වපුරයි.

- **නිවර්තන මාසය (Tropical month) - දින 27.02**

සඳු ක්ෂිතිජයේ පහළම අවස්ථාවේ වෘශ්චික හා ධනු රාශි වල සිටී. මෙය හඳේ බැසීමයි. හඳ යටින් යාම ◡ කියයි. ඉහළම ස්ථානයට නැග යාම වෘෂභ හා මිථුන රාශි වලදී සිදුවේ. හඳ උඩින් යාම ◠ කියයි. මෙවැනි සඳගමන් අතුළත් කර වගා ලිත් සැකසීම ලෝකයටම සහනයක් විය. ගිම්හානයේදී සඳු උච්චයට නැග, සිසිරයේ ක්ෂිතිජයේ දී පහළටම බැස යයි. සඳු තම අක්ෂය වටා යමින් පෘථිවිය වටා එක රවුමක් යාමට ගත කරන කාලය සූර්යයා තම අක්ෂය වටා රවුමක් යාමට පූර්ණ වර්ෂයක් ගනී. ගිම්හානයේ දි හිරු දීර්ඝ කාලයක් ගත කරන අතර, සිසිරයේදි කෙටි කාලයක් ගනී.

සඳු චන්ද්‍ර වංකයක් සේ දැකිය හැක. සෘතු විපර්යාසයන් හිදි මේ ප්‍රාතිහාර්යය අහසේ හොඳින් දැකිය හැකිය.




රූපය : 13.5 නිවර්තන චක්‍රය

පරිසරය ඉතා දැකුම්කළු ස්වරූපයක් ගනී. විදාරණ ශක්තීන් අධිකය. විශ්ව ශක්තීන් විශාලම ප්‍රමාණයක් දිව්‍යමය ආශිර්වාදයක් සේ වායු ගෝලයේ ඉහළ ස්ථරයන් හරහා පෘථිවියට ගලාවිත් නව ජීවයක් දෙයි. ක්ෂීණ සඳු අල හා මුල්වලට අධික ශක්ති ප්‍රභවයක් ඇතුල් කරයි, සරත් හා සිසිරයේදී සැවැන්දරා වැනි මුල් ගන්නා පැළෑටිවලට හොඳ කාලයකි. නගින සඳ පොහොර හොඳින් උරා ගන්නට සලස්වයි. කඳ, අතු, රිකිලි, කොළ, යුෂවලින් පිරි යයි. රිකිලි කැපීමට කප්පාදු කිරීමට පැළ නැවත සිටුවීමට ඉතා හොඳය. කාල සීමාවක් සේ නිර්දේශිතය.

සූයර්‍ය මකර හා කටක නිවර්තන අතර දෝලනය වන කාලය උත්තරාධි ගෝලයේදී ජූනි 21 ගිම්හාන සූයර්‍ය නිවෘත්තිය (Summer Solstice) හිරු මිථුන රාශියේ උච්චම නැග්මේ සිටී. දෙසැම්බර් 21 සිසිර සූයර්‍ය නිවෘත්තිය (Winter Solstice) අවම බැසීමක ධනු රාශියේ සිටී. උතුරේ නැග්ම වසන්තය හා ගිම්හානයයි.

සඳ හිරු මෙන් 12 ගුණයක නැගීමක් ගනී. සඳ කටක රාශියෙන් මකර රාශියට යයි සති දෙකකදී. සියළු පැළෑටි වල උපරිම වර්ධනයක් සිදුවේ. බසින අවස්ථාවන්හි දී උත්තරාධි ගෝලයේ නොවැම්බර් දෙසැම්බර් මාස වලදී පැළවල මුල් සනව වැඩෙන්නට පටන් ගනී. දක්ෂිණාධි ගෝලයේ මාර්තු මැයි අතර කාලයයි. 21 දෙසැම්බර් ශිසිර සූර්‍ය නිවෘතියයි. ඒ තුළ පැළෑටි වර්ධනය උපරිමයට සිදුවේ. සඳුගේ නැගීම උපරිම තලයකට යනවිට විස්තාරණය (Expansion) හා අවම තලයකට යනවිට සංකෝචනය (Contraction) අතර වායු කැළඹීම නිසා කාලගුණික වෙනස්කම් ඇති කරයි. සමක ඩොල්ඩ්‍රම්ස් වායු පටිය හරහා යද්දී නිසල වෙයි. නගින සඳ 501 මිශ්‍රණ යෙදීමට හා රිකිළි බද්ධ කිරීමට සහ ගස් කප්පාදු කිරීමට කදිමය. වැසි සමයේදී අධික දියර ගලායාම නිසා අවශ්‍ය තෙතමනය රැඳේ. සඳ පහළ සිටින සමය පසේ ක්‍රියාකාරිත්වය අධිකය. මේ නිසා පසේ ඕජෝ ගුණයද වැඩි කරයි. ජෛවගතික 500 ද්‍රාවන ඉසීමට සුදුසු කාලයයි. පොහොර නිෂ්පාදනයට, පැළ ගලවා සිටු වීමට කදිමයි.

සුදුසුම සන්ධ්‍යා කාලයයි. පැළ මුල් වේගයෙන් අල්ලා ගනී. මාරියා තුං සියළුම ඇට වගී වැපිරීමට සඳ පහළ තලයක සිටියදී නිර්දේශ කරයි. සඳ උඩින් යන විට උදම් උපරිමයට නගී. පැළ අධිකව විශාල වෙයි. සඳ ක්ෂිතිජයේ පහළ සිටින සමය අහස වළාකුළු සහිතය. වැසි හට ගනි. ජල වාෂ්ප කැටි ගැසෙයි. සඳු මුදුන් වත්ම උදම් නගී. සඳේ ස්වභාවය සතුන් ද ඉවෙන් මෙන් හඳුනා ගනී. හවස 3.00 සිට පාන්දර 3.00 දක්වා තුෂාරය ඇත. මේ පලා වගී ඔසු පැළ නෙලීමට හොඳම වෙලාවයි. උදේ පැළ ගලවා සවස සිටවීම ඉතා කදිමයි. වසර 18.6 ක දී සඳ උතුරින් $5^0$ ක් ද, දකුණින් $5^0$ ක් ද නිවර්තන අතරින් මතුවෙයි. ගංවතුර හෝ නියඟයක් ඇති විය හැකි බව අනෙක් ග්‍රහ බලපෑම් මත සිදුවෙයි.

අපට වගාලිතක් අවශ්‍ය වන්නේ ඇයි ?

- පැළෑටි වලට විශ්ව ශක්තීන්ගේ බලපෑම හඳුනා ගැනීමට
- විවිධ කෘෂි අවශ්‍යතාවයන් සඳහා ශුභ වේලාවන් තෝරා ගැනීමට
- දේශගුණික විපර්යාසයන් හඳුනාගැනීමට
- විශ්වීය (Cosmic), වායුගෝලීය (Atmospheric), භූගෝලීය (Terrestrial) සාධකවලට අනුකූලව සුදුසු වේලාව, දිනය, කාලය හඳුනා ගැනීමට.

# ජ්‍යොතිෂය, වෛද්‍ය විද්‍යාව හා බැඳුණු විධිමත් පෝෂණය
# Astro Medical Significances and Nutrition

මානවයා පරිසරය හා ගැටෙන්නට වුදා සිටම අසිරිමත් විශ්වයේ විවිධ සංසිද්ධීන් නිසා පැළෑටි සතුන් හා මිනිස් කටයුතුවලට ඒ හා බැඳුණු සම්බන්ධය අධ්‍යයනය කරන්නට විය. දවල් පිපෙන මල් රාත්‍රියට නොපිපෙන බැව් දුටහ. නිශාචාරයින්ගේ වෙනස හඳුනා ගත්හ. ඔවුහු පාරිසරික සමතුලිත තාවය රැකෙන සේ පරිස්සමින් ස්වාභාවික සම්පත් පරිහරණය කළහ. ඒ නිසා ස්වයංපෝෂණය නිරායාසයෙන්ම ඇතිවිය. කල්යත්ම ඔවුන් කැලෑ කපා හේන් දවා හැරයාම නිසා මුඩු බිම් අධික විය. වැසි හා සුළඟින් ඇතිවූ පාංශු ඛාදනය ඛණිජ ලවණ ඌණතාවයන්ට මුල පිරුණුවිය. ජලාශ්‍රිත ජනාවාස ගංවතුර වැනි ව්‍යසන නිසා උස් කඳු මුදුන්වලට තල්ලු විය.

ආදිවාසීන් පරිසරය හා විශ්ව සම්බන්ධකම් ගැන ආකල්ප තුළ තදින් එල්බගෙන සිටි නිසා බාධක අඩුකර ගැනීමට හැකිවිය. පරිසරයට අනුරූපීව හැඩගැසීමට ගොවි යුගයේ අගභාගය වන විට මිනිසා දැනුවත්ව තිබුණි.

කල්යල් බලා ගොවිබිම් සකසා වැට නියර ආරක්ෂා කර ඇට වපුරා පැළ සිටුවීමට උනන්දු විය. අමු මෙනේරි, කුරක්කන්, වී මෙන්ම අල, බතල ද සිටුවිය. වියළි කාලය අස්වැන්න නෙළා වේලා ගබඩා කරන්නට වෙහෙස විය.

ඔවුහු කුඩා අඩි පාරවල්, කාණු, ලියදි, ගල්වැටි සාදා සෝදා පාළුව අවම කරගත්හ. ග්‍රහ කිරණ උරා ගැනීම සඳහා ගස් කපා ඉවත් කෙරිණි. ආගම, කෙම්, පහන් ක්‍රම සම්බන්ධීකරණය කරන ලදී. ඖෂධ පළතුරු, බිම්මල්, දර, පස්ගෝ රස, මස් සඳහා ගෙවත්ත සකස් කෙරිණි. තරමක් දුරින් සත්ව ගාල් නිර්මාණය විය. මිරිදිය, කරදිය හා කිවුල් දිය ධීවර සම්පත් ප්‍රෝටීන අවශ්‍යතාවයන් සඳහා යොදා ගත්හ.

නැකැත් භාවිතය සඳහා මුල්තැන ලැබිණි. විශ්ව ශක්තීන් ඇඳා ගත් හොඳම පසුබිම කමතේ කලවිටි චක්‍රයයි. ජ්‍යොතිෂ මිනිසා නිර්මාණය කර ඉන් රෝග හඳුනා ගැනීම, ප්‍රතිකාර විධි හා කාල නීර්ණය ක්‍රමවත් කෙරිණි. ඖෂධ පිළියෙළ කිරීමට පමණක් නොව අස්වනු නෙලීමටද, කාලය වැදගත් විය. උදා: නියඟලා වැනි විෂ සහිත අල හඳුනාගෙන රාත්‍රියේදී විෂ හරණය වන බැව් දැනගත්හ. හිරු එළියට වේලීම නැවැත්වීමට පාන්දර හෝ සන්ධ්‍යා කාලය තුළ පැළෑටි එකතු කිරීමට යොමු විය. කෘතිම පොහොර, කෘමිනාශක, පළිබෝධ නාශක, වල්නාශක යෙදීම නිසා ජල උල්පත්වලට ඉමහත් තර්ජන එල්ල විය. තවද විදේශීය ආක්‍රමණ නිසා ඇති වූ පාරිසරික හානිය විශාල ව්‍යසනයකි.

පානීය ජලය විෂ විය. ජලජ ශාක ආහාරයට නුසුදුසු තත්වයකට පත්වී ඇති බව නොරහසකි. පරිසරයට හැඩ ගැසෙන්නේ කෙසේද? ලෝකය පුරා ඇති පාරම්පරික දැනුම් සම්භාරයන් ඒකරාශී කොට පරිසර හානිය අවම කිරීමට

කටයුතු කරමින් සිටිති. විශ්වයේ ඇති සියලුම සංසිද්ධින් විදාරණය කෙරිණි.

උදම්, භූ චලන, අකුණු, ස්වාභාවික පොහොර වැනි දේ පැළෑටි වර්ධනය සඳහා යෙදවීය. හඳේ පමණක් නොව සියලුම ග්‍රහ තාරකාවන් මුදා හරින ශක්ති කදම්භයන් පැළෑටි වර්ධනයට මෙන්ම විනාශයටද හේතු විය. ශනිගෙන් නියං කාලය ද නැප්චූන්, යුරේනස් වැනි ග්‍රහ තාරකාවන්ගෙන් වායු ධාරා කැළඹී අහිතකර දේශගුණික තත්වයන් සිදුවන බැව් හඳුනාගත්හ. ඉන්පසු වගා ලිත් විශ්ව තොරතුරු ආශ්‍රිතව සකස් විය.

සූර්‍යයා උත්තරායනයට පිවිසීමෙන් අපට මල්බර එලබර වසන්ත සමය උදා කරවීය. රවි ජනවාරි 14 සිට පෙබරවාරි 14 දක්වා උපරිම වර්ධන වේගයක් ඇති කරවීම නිසා අධි පෝෂණීය කෘෂි නිෂ්පාදනවලට යොමු වීම සුදුසුය. මේ සඳහා ග්‍රහ කිරණ අනුසාරයෙන් කරනු ලබන කාබනික හා ජෛවගතික කෘෂි කාර්මික ක්‍රම භාවිතය හඳුනා ගෙන ඇත. මේ ක්‍රමවලින් නිෂ්පාදිත ආහාර වල අධික මිලකට අලෙවි වන්නේය. ඊට හේතුව ඒ හා බැඳි අධි පෝෂණීය ආහාර නිෂ්පාදන වස විෂ වලින් අවම වීමය. මන්දපෝෂණය හා දුෂ්පෝෂණය මේ තුළින් පිටු දැකීමට උත්සාහ දරමු.

පෙර අපර දෙදිගම ජ්‍යොතිෂ විද්‍යාව තාරකා විද්‍යාව නිසා පෝෂණය විය.

බැබිලෝනියන් සහ ඊජිප්තු විද්‍යාඥයන්ගේ ගවේෂණ නිසා දර්ශනවාදයද, වෛද්‍ය විද්‍යාවද, පෝෂණ විද්‍යාවද දියුණු විය. මෙලොතිසීස් විද්‍යාවට අනුව, තාරකා සහ රාශි 12 ශරීරයේ කොටස් නිවේදනය කරන සේ ජ්‍යොතිෂ මිනිසා සකස් කළහ. ඒ අනුව ප්‍රතිකාර ක්‍රම වෛද්‍ය වෘත්තීන් හි එක් අංගයක් බවට පත්විය.

ජ්‍යොතිෂය විද්‍යාවක් ලෙස ප්‍රසාදයට ලක්වූයේ කැසියෝපියා (Woman with the child) තරුව නිසාය. මහේන්ජදාරෝ, හරප්පා, ඉන්දු යුරේසියන් සභ්‍යත්ව තුළ මෙන්ම උත්තර භාරතීය ධන්වන්තරී වැනි විවිධ ඍෂිවරුන්ගෙන් විශාල දැනුම් සම්භාරයක් මේ සඳහා ලැබිණි. ග්‍රහ කිරණ දුර්වල වූ විට නොයෙක් රෝගාබාධවලට ලක් වන බැව් දැන සිටියහ. මෙය ගහ කොළ සතා සිව්පා හා මිනිස් සංහතියටද පොදු ලෝක දර්ශනයකි.

වාත (Wind)ඃ සඳු, බුද, සිකුරු හා ශනි පීඩිත වීමෙන්ද, පිත (Bile)ඃ රවි, කුජ, ගුරු, ශනි ගෙන් පීඩිත වීමෙන්ද, සෙම (Phlegm)ඃ ගුරු පීඩිත වීම නිසා අධිකවද, රවි සිකුරු හා සඳු පීඩිත වීමෙන් සාමාන්‍ය වශයෙන්ද සිදුවන වග සොයාගත්හ. විශිෂ්ට සංස්කෘතීන්ගේ උපත මෙන්ම, පෙර අපර දෙදිගම විද්‍යාත්මක ගවේෂණයන් නිසා ජ්‍යොතිෂ විද්‍යාව දියුණු විය. ඒ නිසා කෘෂිකාර්මික කටයුතු සහ වෛද්‍ය විද්‍යාව පෝෂණය විය.

මේ සමගම පෝෂණ විද්‍යාව ගැන දැඩි අවධානයක් යොමු විය. මිනිසාගේ දෛනික කටයුතුවලට නව ජීවයක් ලැබිණි.

නූතන විද්‍යාඥයින්ගේ මතය ආහාරවලට අමතරව උදේ 9 - 10 දක්වා හිරු එළිය, මිහිරි සංගීතය හා දැකුම්කළු පරිසරයක්ද, අවශ්‍ය බවය. උදා :- පාරජම්බුල කිරණ ප්‍රෝ විටමින් D, විටමින් D බවට පරිවර්තනය කර හමේ පෝෂණ ක්‍රියාවලිය ක්‍රමවත් කරයි. අස්ථිවල මනා වර්ධනයටද දායක වී අස්ථි විකෘතිතා වලක්වයි. බිළිඳුන්ගේ අක්ෂි ක්‍රමවත් ලෙස වර්ධනය වීම හිරු එළිය පහසු කරයි. රවි උෂ්ණය, ආලෝකය, ජීවය, ශක්තිය මෙන්ම මිනිසාට, සතුන්ට හා පැළෑටිවලට වර්ණක ද සපයයි. මිනිසාගේ හමේ ඇති වර්ණය මෙලනීන් (Melanin) එවැනි එකකි. අළුත උපන් දරුවන්ගේ සෙංගමාලය (Jaundice) සුව කිරීමට විකල්පයක් සේ හිරු එළියට යොමු කරයි. අස්ථි විකෘතිතා ඇති දරුවන්ට හිරුඑළියේ සෙල්ලම් කිරීමට අවවාද කරයි, අධික ලෙස හිරු එළියේ සිටීමෙන් චර්ම පිළිකා ද සෑදීමට ඉඩ තිබේ.

විද්‍යාත්මක ගවේෂණ

- සීනෝ ක්.පූ. 420 දී මිනිසාගේ පැවැත්මට විශ්වයේ බලපෑම කොතෙක් දුරට, පාදකවී ඇත්දැයි රාශි චක්‍රය (Animal Cycle) ගොඩනැංවීමෙන් පෙන්නුම්කරයි. 15 වන සියවසේදී ග්‍රහ වස්තූන් ආරෝපණය කර ජ්‍යොතිෂ මිනිසා නිර්මාණය කළ බව ක්‍රිස්ටි මරේ සහ ඈන් සැන්ඩර්ස් විස්තර කරයි.
- මේ නිසා වෙදකම් කිරීමේ විවිධ අවස්ථාද, නිළ ස්ථානද, රෝග නිර්ණයද, සත්ව කොටස් සහ ඔසු පැළ යෙදූ ප්‍රතිකාර ක්‍රමද බිහි වී ඇත.

- විද්‍යාඥයින්, මිනිසා (Microcosm), විශ්වය (Macrocosm) තුළින් උකහා ගත් ආවේගයන් අනුබද්ධ කර ජ්‍යොතිෂ මිනිසා (Meganthropus) නිර්මාණය කළහ. මනෝ සංකල්පයන් මතු කර ගැනීමට පුද්ගලාරෝපණය ද කළෝය. අප උපත ලබන මොහොතේ දී රවිගෙන් ජීවය, සඳුගෙන් ප්‍රේමය, චමත්කාර හා අලස බව ද අපට ආවේණික වන බැව් විශ්වාස කරයි.

- බුදුරජාණන් වහන්සේ ආහාර ගත යුතු පිළිවෙළ ලෙස ආයුෂ (Long life), වර්ණ (Complexion), සැප (Comfort), බල (Energy) සහ ප්‍රඥා (Wisdom) වර්ධනය ඇති කරවන බව දේශනා කළ සේක.

- බෙට්සි චැසන් (1998) ශරීරයේ ක්‍රමවත් වැඩීමට ලැබෙන පෝෂණ කොටස් ගැන වැඩි අවධානයක් යොමු කිරීම අගය කරයි. පැළෑටිවල අන්තර්ගත ඛණිජ ලවණ වර්ධනය ඇති කරන අතර, ආහාරවල ඇති කාබෝහයිඩ්රේට්, ප්‍රෝටීන හා මේදය ඉන්ද්‍රිය පද්ධතිය තුළ දී ශරීර ශක්ති බවට පරිවර්තනය වන වග පෙන්වා දෙයි. සතුන් ආහාර ගන්නේ ජීවත්වීම සඳහාමය. මිනිසා ඒවා මානසික සංවර්ධනය සඳහා ද පාවිච්චි කළහ. ළදරු ආහාරවල ලුණු අතිශයින්ම අඩුකර ඇත. ඊට හේතුව මොළයේ හා ශරීරයේ ක්‍රියාකාරීත්වයට ලුණු වැඩිවීම හානිකර බැවිනි. මේ නිසා රුධිරයේ ලුණු මට්ටම ඉතා අඩුවෙන් පවත්වා ගත යුතුය.

- සිබ්ලි 1828 දී භෞතික විද්‍යාව හා ගුප්ත විද්‍යාව "The key to physics and the occult science" ගැන ලියූ පොතෙහි ජ්‍යොතිෂය, ආගම හා බැඳුණු වෛද්‍ය ක්‍රම ගැන සඳහන් කළේය.

- සර් විලියම් හර්ෂල් (1738 - 1822) "Astro Medical Text" හීද මේ සම්බන්ධයෙන් පැහැදිලි විවරණයක් කර ඇත.

- ස්වාන්ටේ ඇරනියස් (1859 - 1927)සිය කෘති වලද විශ්ව නීතිය(Planetary Law) ප්‍රකාශනය කරමින් සඳ, කාලගුණය පැළෑටි, මිනිසා හා සතුන් කෙරෙහි බලපාන අයුරු, "Astrology and Diet" පොතෙහි කළ විවරණයට නොබෙල් ත්‍යාගයකින් පිදුම් ලැබුවේය.

- ජපන් ජාතික මැකී ටකාටා 1941 දී මිනිස් ලේ පරීක්ෂා කර හිරු ලප මිනිස් සිරුරු කෙරෙහි බලපාන අයුරු විකසනය කළේය.

- ක්ලොඩියස් ටොලමි (100 - 178) ග්‍රහ සංඥා යොදා රාශි චක්‍රය ධාතු සතරකට වෙන්කර පුද්ගලාරෝපණය කරමින් ස්ත්‍රීන්ට සම කළේය. උදාඃ සිකුරු සෞභාග්‍යයට හා හලාහල විෂට ද අධිපති යැයි කීවේය. පැළෑටිවල සංයුතීන් ශරීරයේ විවිධ අංශවල රෝග සඳහා යොදාගන්නා අයුරු ද පැහැදිලි කළේය.

මේ නිසා ටොලමි ග්‍රහ බලවේග හිතකර හා අහිතකර (Benefics and malefics) යනුවෙන් වෙන් කළේය.

ටොලමි "Tetra Biblios" නැමැති ග්‍රන්ථයෙහි සෑම ප්‍රබල වස්තුවකින්ම රශ්මි මාලා හෙවත් විකිරණ (Ambient power) පැතිරි යන අයුරු පැහැදිලි කර ඇත. විශේෂයෙන් ප්‍රජනනය, සංසේචනය හා වර්ධනය කෙරෙහිද මෙම ග්‍රහ කිරණ දායක වෙයි. භූත හතර සහ රාශි චක්‍රයට අනුකූලව පැළෑටිවල කොටස් වර්ධනය සිදුවේ.

- තේජෝ ගණය - මේෂ, සිංහ, ධනු
  (Fruit Trigon) - පලතුරු හා ඇට
- පඨවි ගණය - වෘෂභ, කන්‍යා, මකර
  (Root Trigon) - මුල්
- වායෝ ගණය - මිථුන, තුලා, කුම්භ
  (Flower Trigon) - මල්
- ආපෝ ගණය - කටක, වෘශ්චික, මීන
  (Leaf Trigon) - කොළ

- ක්‍රි.පූ. 370 දී එක්සොඩස් වගා ලිතක් සකස් කළේය. පෙරදිග ජ්‍යොතිෂ පොත්වල නැකැත් තරු 27, ආපෝ, තේජෝ, වායෝ, පඨවි ධාතු 4 ද ආකාශ ධාතුවට ද ඇතුළත් කර ඇත. නැකැත් 27 තුළ ඇති කිරි වෘක්ෂවලින් විවාහ පොරොන්දම් බැලීමේදී දරුඵල ඇත්දැයි තීරණය කරයි.

- ➢ මෙම භූත 4 හා සම්බන්ධ වූ සාධක 3 :

  අන්තරීක්ෂ සාධක - (Cosmic factors)

  භූගෝලීය සාධක - (Terrestrial factors)

  වායුගෝලීය සාධක - (Atmospheric factors)

  කෘෂිකාර්මික කටයුතුවලට දායක වන වග ඔවුන්ගේ මතයයි.

- ජ්‍යොතිෂඥයින් මිනිස් සිරුර, රාශි චක්‍රය මෙන් ත්‍රිකෝණ හතරකට වෙන් කළහ.

  ජීවිත අපේක්ෂාවන් සතර (Four goals of life)

  - ➢ ධර්ම (Duty) : 1, 5, 9 රාශි
  - ➢ අර්ථ (Wealth) : 10, 2, 6 රාශි
  - ➢ කාම (Sensual) : 7, 11, 3 රාශි
  - ➢ මෝක්ෂ (Liberation) : 4, 8, 12 රාශි

1, 7 අයිති ත්‍රිකෝණ ජීවිතයේ පැවැත්මට ද 4, 10 අයිති ත්‍රිකෝණ ජීවිතයේ විනාශයට ද හේතු වේ.

- බුදුරජාණන් වහන්සේ මීට අමතරව විශ්වයේ පැවැත්ම නියාම පහකට වෙන් කර හඳුන්වා දුන් සේක.

  - ➢ උතු නියාම (Seasonal law)
  - ➢ බීජ නියාම (Biological law)

- කම්ම නියාම (Ethical law)
- ධර්ම නියාම (Universal law)
- චිත්ත නියාම (Psychological law)

මේ අනුව ධර්ම නියාමය (Universal law), විශ්ව නියාමය, විශ්ව රිද්මය (Universal rhythm) හෙවත් සීමා බන්ධන (Limitation law) කියාද හඳුන්වයි. බටහිර විද්‍යාඥයන්ගේ මතය වූයේ කාලය (Rhythm), ස්වරූපය (Form), ග්‍රහයින්ගේ සාපේක්ෂ පිහිටීම (Space configuration) නිසා සිදුවන ලෙස කියා ඇත.

- රුඩොල්ෆ් ස්ටයිනර් කියන්නේ ජීවිතය රිද්මයයි (Life rhythm), භාව කම්පනය හා මරණය ජීවිතයේ විරාමයයි (Pulse and death is cessation of rhythm) කියාය. ලෝකයේ සියල්ල පවතින්නේ අන්තරීක්ෂ රිද්ම රටා (Universal rhythm) පාදක කරගනිමිනි. එය Cosmic order යන විශ්ව නියාමය සේ සලකයි. මේ නියාමය සුළිග, ගින්දර හා ගස්වැල් වල පැවැත්මට අතිශයින්ම බලපායි. මේ විශ්ව නීතියට අපි හැඩ ගැසිය යුතුය. අප ගන්නා ආහාරවල පෝෂණ ගුණ විශ්ව ශක්තීන්ගෙන් ඇතිවන සංඝටක ලෙස ඔහු විවරණය කළේය. ග්‍රහ කිරණ පෝෂණ ක්‍රියාවලිය ශක්තිමත් කරන නිසා කෘෂිකාර්මික කටයුතුවල දී ග්‍රහ කිරණ ලැබෙන්නට සැලැස්විය යුතු බැව් ද පෝෂණයට මුල්තැන දීම කළයුතු බව ද ස්ටයිනර් අවධාරණය කරයි. ඊට හේතුව ඕජෝ ගුණය අන්තරීක්ෂ ශක්තීන් උරාගෙන ආහාර මගින්

මිනිස් සිරුරේ විවිධ ඉන්ද්‍රියයන් කරා ගෙන යාමය. කාබනික හා ජෛවගතික නිෂ්පාදන මෙම ක්‍රියාවලියේ දී සුවිශාල මෙහෙයක් ඉටු කරයි.

රුඩොල්ෆ් ස්ටයිනර් දූරස්ථ ග්‍රහයින්ගේ කිරණවලින් පෝෂණවල ගුණාත්මක බව (Quality) ද, සමීපස්ථ ග්‍රහයින්ගෙන් පෝෂකවල ප්‍රමාණය ද (Quantity) වර්ධනය වන බැව් සඳහන් කරයි. මේ අතර පොළොවෙන් කැල්සියම්, පොටෑසියම් සහ සෝඩියම් උරා ගෙන පැළෑටිවලට අධික ශක්තියක් ද ලබා දෙයි. ගුණාත්මක බව නිසා පෝෂණය, සුවිඳ, මල් හා එල හටගනී. ප්‍රමාණාත්මක බව හා වර්ධනයේ වේගය ද, නිෂ්පාදන ක්‍රියාවලියද වැඩි වෙයි. දූරස්ථ ග්‍රහයින් වන නැප්චූන්, යුරේනස්, ප්ලූටෝ යන ග්‍රහයින්ගෙන් දේශගුණික විපර්යාසයන් නිසා නිත්‍ය පැළෑටිවලට හානිද පැමිණේ.

රසායනික පොහොර වලින් ප්‍රමාණය වැඩිකළත් ගුණාත්මක බවෙහි දෝෂ අඩුවීමට පුළුවන. මෙය රුඩොල්ෆ් ස්ටයිනර්ගේ ඉගැන්වීමය. ඔහුගේ ඉගැන්වීම් වලට අනුව ජෛවගතික කෘෂිකාර්මික කටයුතු ඇමරිකාව, ජර්මනිය, එංගලන්තය, නෙදර්ලන්තය, ඔස්ට්‍රේලියාව වැනි දියුණු රටවල් භාවිතා කරයි. සමීපස්ථ ග්‍රහයින්ගේ අධික කිරණවලට හසු වූ විට පුස්, කුඩිත්තන් නියමිත කාලයට පෙර එළදාව සහ පරාග වර්ධනය වෙනස්වන බව පෙන්වයි.

- තැලස්, (ක්‍රි.පූ. 639-546) සූර්ය චක්‍රයේ ප්‍රභවයන්, සාරෝස් චක්‍ර නමින් හඳුන්වයි. ඉන් නිකුත්වන සූර්ය සුළඟ නිසා ඍතු භේදයට බලපාන අයුරු සොයා ගත්තේය. ආර්ථික විෂමතාවයන් සහ ළදරු රෝග, අක්ෂි හා චර්ම රෝගවලට පැළෑටිවලට මෙන්ම බලපාන බව පැහැදිලි කළේය.

- පැරසිල්සස්, (ක්‍රි.පූ. 1492-1541) ස්විස් ජාතික වෛද්‍යවරයකු හා රසායන විද්‍යාඥයෙකි. ඔහුගේ තීරණය වූයේ තාරකා විද්‍යාව හා ජ්‍යොතිෂ විද්‍යාව වෛද්‍යවරු විසින් ප්‍රගුණ කළ යුතු වගයි. ජ්‍යොතිෂ නිබන්ධ ''Astrological Treatises'' පොත ලිවීමෙන් පසු ග්‍රහ තාරකාවන්ගේ බලපෑම ප්‍රසිද්ධියට පත්විය. පැරසිල්සස් ගේ තීරණය වූයේ වෛද්‍යවරුන් විසින් ජ්‍යොතිෂ විද්‍යාව වෛද්‍ය විද්‍යාවෙහි වැඩි ඵල නෙළා ගැනීම පිණිස ප්‍රගුණ කළ යුතු බවයි.

  ජ්‍යොතිෂඥයින් බුධ ග්‍රහයා වෛද්‍ය සංකේතය (Medical emblem) ලෙස භාවිත කළ බැව් මරේ විසින් රචිත ව්‍යවහාරික ජ්‍යොතිෂය "The practical astrologer" නැමැති පොතෙහි සඳහන් කර ඇත. පැරසිල්සස්ගේ සංකල්පය වූයේ පැළෑටි සතු ජීවය රඳා පැවතුනේ රවි, චන්ද්‍ර, කුජ, බුද, ගුරු, ශුක්‍ර, ශනි යන ග්‍රහ තාරකා හත (The soul of the plants resides in the seven planets) තුළ බවය.

- ඛණිජ ලවණ ඇති මුල් : සිතෙහි හා ස්නායු පද්ධතියේ රෝග සඳහා ද,
- රසදිය : පෙනහලු හා හෘද රෝග සඳහා ද

  මල්, ගෙඩි, පරාග සහ සුවඳ වර්ග : ආහාර මාර්ගයේ දෝෂ හා ප්‍රජනන ක්‍රියාවලිය සඳහා ද
- ලුණු : චින්තනය සඳහා ද,
- සල්ෆර් : ශක්තියද, ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරීත්වය සඳහා ද

උදව්වන අයුරු ලෝකය පුරා ප්‍රචලිත විය. රාබු ගස (Horse Raddish) කදිම උදාහරණයක් සේ සැලකීය.

පැරසිල්සස්, පැළෑටිවලට ග්‍රහ වස්තූන්ගෙන් නික්මෙන විද්‍යුත් චුම්බක කිරණ මගින් පැළෑටි තුළ රස කොටස් නිෂ්පාදනය වන වග මෙසේ පෙන්වයි.

- ලවණ (Salt) : ලවණ නිසා මුල්වල වර්ධන වේගය හෙවත් අවක්ෂේපණය (Precipitation) හා කැටි ගැසීම හෙවත් ස්ඵටීකරණය (Crystallization) සිදුවෙයි. ලවණ මිදීම හෙවත් කැටි ගැසීමද (Freezing) උකු වීම හෙවත් සංඝනීකරණය ද (Condensation) අධික වන වග තීව්‍ර කරයි.
- රසදිය (Mercury): රසදිය නිසා ස්වසනය (Respiration), අවශෝෂණය (Assimilation),

පරිවෘත්තිය (Transport Function) ක්‍රියාවලියන් විශේෂයෙන් කොළ සහ කඳෙහි වැඩීම වස්සාන සමයේදී මෙන්ම ගිම්හානයේ මුල් අවදියේ වේගවත් වන වග නිර්ණය කරයි.

- ගෙන්දගම් (Sulphur) : මුදු මොලොක් මල් හා පළතුරුවල සුවඳ,, වර්ණය, පරාග, පැළෑටි හා කොළ තුළ විසිරුවා හැරීම ගෙන්දගම් නිසා සිදුවේ.

- චාතුර්වේදී, 2001 වසරේදී ග්‍රහ ශක්තීන්ගේ විකිරණ අන්තර්ගතය 7% කින් වැඩිවන වග පැහැදිළි කළේය. මේ නිසා සූර්යයා උත්තරායනයට ගමන් කරද්දී දෙසැම්බර් 22 සිට ජුනි 22 දක්වා ජීවීන්ගේ හා පැළෑටීන්ගේ ප්‍රාණවත් බව වර්ධනය කරන බව විද්වතුන්ගේ මතය විය.

- මරේ 1992 දී අන්තරීක්ෂ ඔරලෝසුවක ක්‍රියාකාරි බවට මුලු විශ්වයම හසුවන වග අනාවරණය කළේය. මීට හේතුව කාලානුරූපව සියල්ල සිදුවීම නිසා අපි ඊට අනුකූලතාවය දැක්විය යුතුය.

- ස්ටෝල් 1974 දී මින්ට්, සුදු ළූණු, ඉඟුරු වැනි සුවඳවත් දෑ අන්තරීක්ෂ බලවේගයන් වැඩියෙන් උරා ගන්නා නිසා ආහාරවලට අධික රසායනික සංයෝග එකතු කරවන බව කීවේය. ග්‍රහ කිරණ නිසි අයුරු ව්‍යාප්ත නොවූ විට පැළෑටි පටක තුළ අසාමාන්‍ය වැඩීමක් සනිටුහන් කරයි. උදාඃ විෂ සහිත ඇල්කලොයිඩ් සහ (Alkaloids),

කළුවර අඳුරු මුලු වල ඇතැම් නයිට්‍රජන් අධික පැළෑටි උපදී. මේවායින් සමහරක් අධික මිල ඇති ඖෂධ මෙන්ම මොළයට අහිතකර විෂද්‍රව්‍ය නිපදවයි. මොර්ෆීන් (Morphine), ක්වීනින් (Quinine), ඇට්‍රෝපේන් (Atropine), කොකේන් (Cocaine) හා සොක්‍රටීස් මරණයට පත් කළ හෙම්ලොක් (Hemlock), ඉන් කිහිපයකි.

හිරු එළිය හොඳින් නොවැටෙන ස්ථානවල නිල් මොණරැස්ස, කඳුලැස්ස, බාඳුරා වැනි පැළෑටි හටගනී. ඒවා නයිට්‍රජන් සතුන්ගෙන් උරා ගනී. නයිට්‍රජන් අධික වූ විට පැළෑටි තුළ කෘමීන් සහ කුඩිත්තන් වර්ධනය වී පැළ විනාශ කරයි. අඳුරු තිත් සහිත සතුන් පිරුණු බිම් මල් ආහාරයට නුසුදුසු වුවත් ට්‍රෙහලෝස් (Trehalose) නමැති ඖෂධීය සීනි නිෂ්පාදනය කරයි. කෑමට සුදුසු බිම්මල් දියවැඩියා රෝගීන්ට දිව්‍ය ඖෂධයක් සේ සලකයි. නයිට්‍රජන් තුලනයට ද ඉතා ශුභයි. දිවා රෑ දෙකම පැළෑටිවල වර්ධනය සිදුවෙයි.

නයිට්‍රජන් අන්තරීක්ෂ බලවේගයන් සහ ජීව මූලයන් එක් කරන මැදිහත්කරුවෙක් වී කොළවලට හරිත වර්ණය දෙන්නේ ක්ලෝරොෆිල් (Chlorophyl) වලින්ය. ෆොස්ෆරස් - හොඳ මල්ද, සීනි පරිවෘත්තියද ප්‍රෝටීන් අධික ඇට සහ ගෙඩි ද නිපදවයි. පොටෑසියම් - මුල් වර්ධනය සඳහාද දායක වේ. පැළෑටි උරාගන්නා නයිට්‍රජන්, ඇමයිනෝ අම්ල බවට පත්කර ඒවා ප්‍රෝටීන් බවට පරිවර්තනය කරයි.

- ග්‍රෝහ්මන් (1960-1925) සහ සටයිනර් වැනි විද්වතුන් අධි පෝෂණය සඳහා ජෛවගතික කෘෂිකාර්මික නිෂ්පාදන නිර්දේශ කරයි. පැළෑටිවල ප්‍රෝටීන් පරිවෘත්තිය අකාර්මික වීමෙන් යූරික් අම්ලය සයනයිඩ් බවට පත්වේ. නයිට්‍රජන් සෘණ හා ධන තුලන දෙකම අහිතකරයි. හිරු එළිය දැඩි ලෙස ලැබෙන විට විෂ සහිත පැළෑටි නිපදවීම මර්දනය වේ. මින් විෂ වර්ග බොහොමයක් මිනිස් සිරුරට බෙහෙවින් අහිතකරය. මොළය විකෘති කර අපස්මාරය, අසාතය, මුළාව, නිර්වින්දනය, ස්නායු දුර්වල වීම වැනිදේ ඇතිවිය හැක.

උදාඃ ඇට්‍රොපින් (Atropine), හැදීමට ගන්නා අත්තන ශාකය, යකාගේ හොරණෑව (Devil's trumpet) යනුවෙන් හඳුන්වන්නේ මේ නිසාය.

හිරු එළිය නොලද විට ගෙඩිවල සෑදෙන දීප්තිමත් කළු, දම් හා ලෝහිත වර්ණයෙන් යුතු ගෙඩි වර්ග විෂ සහිතය. සමහර ඒවා අප්‍රසන්න, දැඩි සැර ගඳකින් යුක්තය. මීට අමතරව පැළෑටිවල දැඩි විකෘතිතා ද සිදුවේ. උසස්ම ගණයේ පෝෂණ ක්‍රියාවලියක් සඳහා අප ගන්නා ආහාර මඟින් ග්‍රහ කිරණ සහ ගෝලීය ආවේජනයන් (Rejuanations) මිනිස් සිරුර තුළට පරිවර්තනය කරගන්නේ, ජීරණ පද්ධතිය මඟිනි. අන්තරීක්ෂ කිරණ උරාගැනීමට සිලිකා මාධ්‍ය තුළ සකස් කරනු ලබන පොහොර සංයෝගයන් නිසා පසෙහි සරු බව අධික වේ. පැළෑටි හා සතුන් ආහාර මගින් මෙම

පෝෂණීය කොටස් උරාගෙන වැඩේ. මේ නිසා ශාක භාවිතයෙන් මිනිසාට පෝෂණ ක්‍රියාවලිය සමතුලිතව ද තබාගත හැකිය.

- ජෙනිකින් එංගලන්තයේ විසූ පෝෂණ විද්‍යාඥයෙකි. 1972 දී ලේ ධාතුවට ඛණිජ ලවණ තුලනයක් තිබීම අගනේ යැයි අවධාරණය කළේය. පෘථිවියේ මතුපිට හා යට ග්‍රහ ශක්තීන් පැළෑටි තුළට ගබඩා කරගන්නා අයුරු ඔහු පෙන්වා දෙයි. අධික පෝෂණ ගුණ හා කායික මානසික ශක්ති වර්ධක හා චිකිත්සක ආහාර තුළ අන්තර්ගතය. පළතුරු අන්තරීක්ෂ ශක්තීන් හා සන්නිවේදන කම්පනයන් බෙහෙවින් උරා ගනී. දුර්වලකම් මග හරවා ගැනීමට හිරු රාශි 12 තුළ හැසිරෙන කාල සීමා තුළදී ඒ ඒ ලග්න වලට විශේෂිත ඛණිජ ලවණ වර්ග පෝෂණ ඌණතා අඩුකිරීම සඳහා සොයා ගෙන ඇත.

එක් එක් ලග්න තුළ රවි සිටි රාශිය බලා ජෙනිකින් වෙන වෙනම ආහාර ගතයුතු පිළිවෙළ සොයා ගන්නා ලදී.

උදා :- මේෂ රාශිය තුළ රවි සිටියදී උපත ලද අයට (CELL SALT (Kali phosphoricum) පොටෑසියම් වැඩිපුර අවශ්‍ය බව ඔහු තීරණය කළේය. මේ ක්‍රමයෙන් අධ්‍යනය කිරීමද ඉතාම වාසිදායකය. බෙහෙත් පැළ සිටුවීම හා සංරක්ෂණය මෙන්ම කේන්ද්‍ර සෑදීම තුළින්ද උපන්

වේලාවේ සිට ඇති විය. හැකි රෝගාබාධ හැකිතාක් දුරට වළක්වා ගැනීමට උපදෙස් දීම ද කළ හැකිය.

ජෙනිකින්ගේ මතය වූයේ පරිස්සම්වීම සුව කිරීමට වඩා හොඳ බවය. (Prevention is better than cure) ප්‍රභාසංශ්ලේෂණයේ දී මිනිසුන් හා සතුන් බැහැර ලන අපද්‍රව්‍ය පැළෑටිවල ව්‍යූහය තැනීමට පරිහරණය කරන මූල ද්‍රව්‍යයයි. විශ්වයේ ඇතුළත හා පිටත ඇති, ශක්ති කදම්භ සියල්ලම එකිනෙකට සම්බන්ධය. විශ්ව නීතිය අනුව, අප ස්වභාව දහමට අයත් නීති පද්ධතිය තුළ සිරවී සිටින්නෙමු. ග්‍රහ කිරණ දුර්වල වූ විට රෝගාතුර වේ. සුභ ග්‍රහකිරණ ඇති විට නිරෝගී වේ. පැළෑටි සතුන් මෙන්ම මිනිසා ද, ග්‍රහ කිරණවලට අනුකූලව හැඩගැසිය යුතුය. ඊට විරුද්ධවූ විට ලාභවලට වඩා අලාභ සිදුවිය. ලෝකය පුරා කෘෂිකාර්මික කටයුතු මෙන්ම වෙදහෙදකම් වල උන්නතිය ඒ ලෙසින්ම සිදුවිය. ඇලෝපති ක්‍රමය, හෝමියෝපති ක්‍රමය, යුනානි, සින්දූරම්, රස, ආයුර්වේදය ඊට අයත්ය. රත්තරං, රිදී, යකඩ, ගෙන්දගම් වැනි ලෝහ හා අලෝහ, ගෝන, රයිනෝ, අං කුඩුද, බැටළු බඩවැල්, හරක් ඇටකුරු වැනිදේ බෙහෙත් ක්‍රමවලට යොදා ගනු ලැබීය. මීට අමතරව ශාක හා සත්ව තෙල්ද කස්තුරිද වටිනා ඖෂධ සේ පාවිච්චි කරනු ලැබීය. තාරකා විද්‍යානුකූල වෛද්‍ය සංකල්පයන්ගේ (Astro Medical Significances) අපේක්ෂිතයන් වන්නේ නිරෝගී නව පරපුරක් බිහි කිරීමට අතදීමය. විවිධ ශාන්තිකර්ම හා ආගමික වතාවත්ද මේ

සඳහා දායක වේ. සියල්ලටම වඩා ජ්‍යොතිෂ විද්‍යාව හා බැඳුණු පෝෂණ විද්‍යාව ගැන අවධානය යොමු කළ යුතුය. කැඳ වර්ග, විවිධ කොළ තැම්බූ වතුර අළුත් පළතුරු, එළවළු, අල වර්ග, බිත්තර, මස් මාංශ පස්ගෝරස, ක්‍රමානුකූලව සකස් කරගැනීම සඳහා දැනුවත් විය යුතුය.

ග්‍රහ කිරණ අනුව ආහාර සැකසීම, (Planetary Cooking) වලට හොඳ ඉතිහාසයක් ඇත. 16 වැනි සියවසේදී, පළවෙනි හෙන්රි රජ සමය මේ සඳහා ස්වර්ණමය යුගය යැයි සැලකේ. ඔහු බිසෝවරුන් 6 දෙනෙකු සමග විවාහ වුවත්, දරු සම්පතක් නොලද අයෙකි. මේ නිසා ජ්‍යොතිෂය අනුව ආහාර සැකසීම සඳහා විශාල මුදලක්ද වැය කළේය. සෑම ආහාර වේලකටම මේසයේ ප්‍රධාන සැරසිල්ල වූයේ මාළු වලින් සැකසූ කටුස්සෙකි. අධික ලෙස මත්පැන් භාවිතය නිසා පැතුම් සියල්ල නිෂ්ප්‍රභා විය. පෙර හා අපරදිග අධ්‍යාපනික හා පර්යේෂණාත්මක ගවේෂණ තුළින් ආහාර හා පෝෂණයට (Astrology and Diet) විශේෂත්වයක් දෙන ලදී. වඳ බව නැති කිරීමට බෙලි, මල් හා ගෙඩි, කජු, වෙරළු, නාමල් රේණු, මුං ඇට, බොහෝ විට යොදා ගනී.

- ස්ටෝල් (1979) පෝෂණ ඌණතා නිසා ස්නායු දුර්වලතාවය, මානසික රෝග, ගැහෙන හිසරදය, විෂාදය, විශේෂයෙන් හිසේ සහ මුහුණේ ස්නායු සාර්ධනය, බෙලහීනකම, අවසාදය, පටක තුළ අසාමාන්‍ය වැඩීම,

පක්ෂාගාතය, අජීර්ණය වැනි රෝගාබාධ ඇතිවිය හැකි බව කියා ඇත. මීට අමතරව නිවාස ඉදිකිරීමේ දී ග්‍රහ කිරණ හොඳින් වැඩෙන්නට සැලසීමද කළ යුතුය. ජර්මනියේ (Mid guard) නමින් හැඳින්වූ මැද මිදුල සහිත ගෙවල් පදිංචියට ඉතා සුභයැයි කියති. අකුණු වැළැක්වීමට නිරිත දිග සිට ඊසානට ඇති චුම්භක ක්ෂේත්‍රයන්ගෙන් අනතුර අවම කිරීමද කළ හැකිය. නිවසේ අවට හා ගෙවතු වල පිහිටීම අනුව මනාව බිම් සකස් කිරීම කෘමි වසංගත වැලැක්වීමට ද නිරෝගී වීමට ද හේතුවේ. මිනීමල්, *(Vinca rocea)*, කැක්ටස් (Cactus) වැනි විෂ වායු සහිත පැළ වර්ග නිවාස අසලින් ඉවත් කළ යුතුය. හිරු එළියේ මෙන්ම සඳ එළියේ ද ආහාර සැකසීමට උනන්දු වූයේ ග්‍රහ කිරණ වල ඵල ලබා ගැනීමටය.

ගෙවතු වගාවට සුදුසු පරිදි බිම් සකස් කිරීමද සෞභාග්‍ය දෙන නවග්‍රහයින්ට හා නැකැත්වලට අදාල ගස් වැල් රෝපණයද අනවශ්‍ය අනතුරු රෝගවලින් පරිස්සම් වීමට වගාකළ හැකිය. ආදීම මිනිසා විශ්ව ශක්තීන් සියල්ල ලබාගැනීමට පුරුදුව සිටියේ ස්වභාවදහමට අනුකූලව විය හැකිය. වී දියලීම, ධාන්‍ය වර්ග හා ඇට වර්ග පැළමුල් ඇදීමට හැර තැබීම නිසා සිසිල් සඳ රැස්වලින් බීජ ප්‍රරෝහණය ඉක්මන් කිරීම සිදුවිය.

මුං ඇට මොරෙයියන් ඇදුණු කල අධික පෝෂණයෙන් යුක්තය. එහි බී විටමින් වර්ග වර්ධනය වීමක් ඇතිවේ. ශාක ආහාර සහ ධාන්‍ය වර්ගවල සෝඩියම් අඩුවත්,

පොටැසියම් මනාව ඇති නිසා අධික රුධිර පීඩනය (High Blood Pressure) සමනය කරයි. සතුන්ගේ රසායන සංයුතිය ප්‍රෝටීන් මත රැඳෙයි. පැළෑටි පසෙන් සහ වර්ෂා ජලයෙන් නයිට්‍රජන් මූලාශ්‍රයෙන් ප්‍රෝටීන් නිපදවයි. බැක්ටීරියා මුල්වලට නයිට්‍රජන් උරාගැනීමට උපකාරී වෙයි.

සෞඛ්‍ය පාලනය වන්නේ විශ්ව කිරණ මගින්ය. සඳ ඇති රැයට විශාල ශක්ති ප්‍රමාණයක් මිහිමත විසිර යයි. මිනිස් සිරුරේ නිරෝගී බවට ත්‍රිවිධ ලක්ෂණ වන වාත (Air), පිත (Bile), සෙම (Mucus) බලපාන වග පිළිගනී. හිරු, සඳු, වාතය ලෝකයේ තිරසාර පැවැත්මට අත්‍යවශ්‍ය අංගයන්ය.

රෝග හඳුනාගැනීමට උපන් ලග්නය හෝ තත්කාල ලග්නය බෙහෙවින් ප්‍රයෝජනයට ගතහැකිය. ලග්නයක ග්‍රහ තාරකාවන්ගේ පිහිටීම මත රුචි අරුචිකම් මෙන්ම පෝෂණ ක්‍රියාවලිය සම්බන්ධවද තොරතුරු අනාවරණය කළ හැකිය. ඕජෝ ගුණය (Vital Forces) විශ්ව තරංගවලින් සහ ආහාරවලින් ලැබේ. උපත ලබන විට තාරකාවන්ගේ බලපෑම අනුව සිතුම් පැතුම් මෙන්ම ආහාර රුචියද වෙනස් වේ. ග්‍රහයින් එක් රාශියක සිට තවත් රාශියකට යන විට රුචිය වෙනස් වෙයි.

රවි සිංහ හෝ මේෂ රාශිය තුළ සිටින විට විශාල ශක්ති ප්‍රමාණයක් මුදා හරී. ඉක්මණින් ශක්තිය දහනය වේ. කුසගිනි ඇතිවී සිරුර මහත්වේ. කුසගිනි අඩුවිට සිරුර සිහින්ව මානසික හා ශාරීරික නිරෝගී බව ඇතිකරයි. රවි වෙනත් ග්‍රහයින්ගෙන් පීඩිතවූ විට ආහාර දිරවීම ද වෙනස්වෙයි.

සහන ඔසුවලට හුරුවීමෙන් අනවශ්‍ය කරදර ඇතිවීමට ඉඩතිබේ. සමතුලිතතාවය රැකගැනීමට සමබල බොජුනක් ගැනීමට සිදුවේ. ස්වභාවික ආහාරවල පෝෂක කොටස් ශරීරය රුචි අන්දමට පිහිටා ඇත. පසෙන් අවශ්‍ය ඛණිජ ලවණ පැළෑටිවලට ලැබේ. ඛණිජ ලවණ අස්ථි හා රුධිර වර්ධනයට මෙන්ම සිරුරේ අනෙක් අවශ්‍යතාවයන්ද සපුරයි.

යකඩ අඩුවූවිට ලේ වල රක්තාණු අඩුවේ. පැරසිල්සස් කියන්නේ සිරුර ඛණිජ ලවණ අත්‍යවශ්‍ය යන්ත්‍රයක් බවය. භාවනා කරන අයට සිරුර ක්‍රමවත්ව පාලනය කරගත හැකි බව කියයි. ආහාර පරිවෘත්තිය පාලනය කර මනස මෙන්ම සිරුරද නිරෝගීව තබාගැනීමට පුළුවන. විශ්ව තරංගවලින් අතිශයින්ම ප්‍රබල ශක්ති ධාරා උපවිඥානයට තීරණ ගැනීමට, විධාන කිරීමට, ඉල්ලීමට සැලසුම් කරයි. ඉන් අපේ පවස නිවෙයි. රෝගීන්ට හාළදරුවන්ට දිරවීමට පහසු ආහාර අවශ්‍ය වේ. විශේෂයෙන් බඩවැල්වල තානය රැකගැනීමට කෙඳිමය ආහාර උපකාරී වේ.

# ස්වාභාවික පරිසර පද්ධති තුළ වැවෙන ආහාර හා පෝෂ්‍ය පදාර්ථ

| භෝගයේ නම | ඖෂධීය ගුණ | පෝෂණීය ගුණ |
|---|---|---|
| ඇඹුල් ඇඹිලිය | උදරාබාධ, අර්ශස්. | තන්තු, විටමින් C |
| අක්කපාන | මුත්‍ර රෝග, උදරාබාධ | ප්‍රෝ විටමින් A සහ C |
| ඇළල | සර්ප විෂ, අධි රුධිර පීඩනය, දියවැඩියාව | කැල්සියම්, පිෂ්ඨය, විටමින් C |
| අත්තික්කා | මදුමෙහය, අර්ශස්, රත්පිත, කම්බුල්ගාය | ප්‍රෝ විටමින් A සහ C, යකඩ |
| බෙලි | අම්ලපිත්ත, වමනය, අර්ශස්, පාචනය, ශරීරයේ ගඳ, වඳබව | ප්‍රෝ විටමින් A සහ C, තන්තු, ප්‍රෝටීන් |
| බිලිං | | ඔක්සැලික් අම්ලය තන්තු, විටමින් C |
| මුස්සැන්ද | සෙංගමාලය, සර්ප විෂ | ප්‍රෝ විටමින් A සහ ඛණිජලවණ |
| දිවුල් | අර්ශස්, උදරාබාධ, විෂ නැසීමට | විටමින් C පොටෑසියම් |
| එළබටු | සෙම, ශ්වසන රෝග | යකඩ, ප්‍රෝ විටමින් A |

| | | |
|---|---|---|
| ගස් නිවිති | ව්‍රණ, තුන්දොස් සමනය, කිරිමවුන් | ප්‍රෝ විටමින් A, B, C, කැල්සියම් |
| ගැට කරවිල | අර්ශස්, දියවැඩියාව, අධි රුධිර පීඩනය, ග්‍රහණී රෝග, සමේ රෝග, නීරක්තය, පණු රෝග, වස විෂ | තන්තු, යකඩ, පොටෑසියම් |
| ගැටතුඹ | අක්ෂි රෝග, සර්ප විෂ, සෙංගමාලය, නිදන් රෝග, අතීසාරය, පණුරෝග, වාත රෝග, ආහාර රුචිය. | යකඩ, ප්‍රෝ විටමින් A |
| ගෙඳ පලා | අර්ශස්, ආහාර රුචිය වඩයි. | ප්‍රෝ විටමින් A, B, යකඩ |
| ගොරකා | පණු ගෙඩි, ඉදිමුම, මුඛ රෝග, හෘද රෝග, සෙම, කැඩුම් බිඳුම්, මුත්‍රා ගල්. | විටමින් C ඔක්සැලික් අම්ලය |
| ගොටුකොළ | මස්තිෂ්ක, අපස්මාර රෝග, ලේ වඩයි, මොළය වර්ධනය, මළ බද්ධය, පීනස, ඉදිමුම | ප්‍රෝ විටමින් A, B, යකඩ, සින්ක් |

| | | |
|---|---|---|
| හාතාවාරිය | මුත්‍ර රෝග, අපස්මාරය. | ප්‍රෝ විටමින් A, C, තන්තු, පිෂ්ඨය |
| හුලංකීරිය | උදරාබාධ, අතීසාරය | පිෂ්ඨය, තන්තු |
| ඉඳ ලෝලු | පිලිකා මර්ධනය | ප්‍රෝටීන්, විටමින් B |
| ඉරමුසු | කර්ණ, චර්ම, මුත්‍ර රෝග, රත්පිත, ප්‍රමේහය, අර්ශස්, ලේ පිරිසිදු කරයි, කුසගිනි වඩයි. දාහය නැති කරයි. | ඛණිජ ලවණ. |
| තම්පලා | මළ මුත්‍ර පාලනය, තුන්දොස් සමනය, විෂ නාශකයි. ලේ පිරිසිදු කරයි. රක්ත ප්‍රදරය. පාණ්ඩුව, වමනය, ශ්වසන රෝග, මච්කිරි. | යකඩ, කැල්සියම්, ෆොස්ෆරස්, ප්‍රෝ විටමින් A, B, C, තන්තු |
| තෙබු | මළ බද්ධය, අර්ශස්, අධි රුධිර පීඩනය, පණු රෝග, චර්ම රෝග, අතීසාරය | ප්‍රෝ විටමින් A, තන්තු, යකඩ |

| | | |
|---|---|---|
| තෝර | රක්ත, අර්ශස්, කුෂ්ඨ, කෘමි, අක්ෂි රෝග, මළ බුරුල් කරයි, ශරීර වර්ණය, ආමාශ දෝෂ, මේදය දිය කරයි, මධුමේහය | ප්‍රෝ විටමින් A, යකඩ, තන්තු |
| තුඹ කරවිල | අර්ශස්, දියවැඩියාව, වස විස, අධි රුධිර පීඩනය, සමේ රෝග, නීරක්තය, පණු රෝග, වස විස | තන්තු, යකඩ. |
| තිබ්බටු | මාන්දම, දියවැඩියාව, අක්ෂි හා ග්‍රහණි රෝග | සෙලනියම් |
| තිත්ත තිබ්බටු | කෘමි හා අක්ෂි රෝග, දියවැඩියාව | ප්‍රෝ විටමින් A, තන්තු, යකඩ |
| වැල් දොඩම් | අධි රුධිර පීඩනය, ක්ලාන්තය | ප්‍රෝ විටමින් A,C තන්තු, යකඩ. |
| වැල් කොහිල | අර්ශස්, මළ බුරුල් කරයි, ආහාර ජීර්ණය ක්‍රමවත් කරයි. | ප්‍රෝ විටමින් A,C තන්තු |
| වෙල් අලකොළ | හමේ රෝග, අර්ශස් | ප්‍රෝ විටමින් A, තන්තු, |

| | | |
|---|---|---|
| වැලි හතු | | ප්‍රෝටීන්,විටමින්, |
| වැල් පෙනළ | මී විෂ, තැල්ම, අතීසාරය, අණ්ඩ වායුව | ප්‍රෝ විටමින් A,C තන්තු |
| සාරණ | රත්පිත, රක්තහීනතාවය | තන්තු, යකඩ |
| නීරමුල්ලිය | නින්ද නොයාම, වාත හෘද රෝග, දාහය වෘක්ක රෝග, කාන්තා ප්‍රජනනය, අශ්මරි | ප්‍රෝ විටමින් A, තන්තු |
| නෙල්ලි | ශ්වේත ප්‍රදරය, ප්‍රමේහ රෝග, වාත රක්ත, චර්ම රෝග | විටමින් C, තන්තු |
| රණවරා | දියවැඩියාව, මුඛ තුවාල | ප්‍රෝ විටමින් A, යකඩ |
| බටු | අර්ශස්, මළ බුරුල් කරයි. ආහාර රුචිය වඩවයි. | ප්‍රෝ විටමින් A,C යකඩ |
| සියඹලා | කැස්ස, ඇදුම, රක්ත අතීසාරය, අග්නි, මුත්‍රා ගල් සෑදීම වලක්වයි. මාන්දම | ටාටරික් අම්ලය, තන්තු, විටමින් C, B |
| කලුකම්බෙරියා | මානසික රෝග, නින්ද, සෙම, ඉදිමුම, මාන්දම, ආමවාතය, වාත රක්ත | තන්තු, ප්‍රෝ විටමින් A, යකඩ |

| | | |
|---|---|---|
| කන්හතු | හෘද රෝග | විටමින් B<br>සංකීර්ණ ප්‍රෝටීන් |
| කරපිංචා | අරුචිය, උදර රෝග,<br>උගුරේ රෝග,<br>අජීර්ණය, අතීසාරය,<br>රුධිර මේදය,<br>ආමවාත, සර්ප විෂ | කැල්සියම්, යකඩ<br>ප්‍රෝ විටමින්<br>A,B,C තන්තු |
| කුර තම්පලා | රක්ත ශ්‍රාවය, ප්‍රදර<br>රෝග, ශ්වේත ප්‍රදරය | යකඩ ප්‍රෝ<br>විටමින් A,<br>කැල්සියම්, තන්තු |
| කටු එරබදු | පණු රෝග, මළ<br>බද්ධය, සෙම, දද,<br>කුෂ්ඨ | යකඩ ප්‍රෝ<br>විටමින් A,B |
| කටු අනෝදා | මුත්‍ර රෝග, අම්ලපිත්ත | විටමින් C |
| කැකිරි | මුත්‍ර රෝග | ප්‍රෝ විටමින් A,<br>ඛණිජ |
| කිතුල් පිටි | තුවාල සුව කරයි විෂ<br>නසයි. මුත්‍ර රෝග<br>පීනස්, ඇදුම, කුසගිනි<br>වඩයි, සිරුර වඩයි | විටමින් B, C<br>පිෂ්ඨය |

## පරිසර දූෂණය

පිළිකා, විකලාංග දරුවන් බිහිවීම, වන්ද්‍යීකරණය, සර්ප දෂ්ඨ, වකුගඩු ආසාදන, මී උණ, මැලේරියා, දියවැඩියාව, මුත්‍රාගල්, අධික රුධිර පීඩනය, අක්ෂි හා චර්ම රෝග වැනි විවිධ සෞඛ්‍ය හා සමාජ ගැටළු මතුවෙමින් පවතී. නව විද්‍යානුකූල සංකල්පවලට යොමුවීමේදී දැනට උද්ගතව ඇති පාරිසරික හානිය වලක්වා සමතුලිතතාවය රැකෙන පරිදි කෘෂි කටයුතුවල නියුතු වෙන්නට ගොවීන්, දරුවන්, උපදේශක මහතුන් දැනුවත් කළ යුතුය. තාරකා විද්‍යාඥයින්ගේ ගවේෂණ නිසා ජ්‍යොතිෂය විද්‍යානුකූල විෂයයක් ලෙස පිළිගැනීමක් ඇතිවී තිබේ. අස්වාභාවිකව වැඩෙන ඛණිජ ලවණ හා විටමින් බහුල එළවළු හා පළතුරු අද පරිභෝජනයට නුසුදුසුය. රසායනික පොස්පේට් පොහොර යෙදීමෙන් වගාකරනු ලබන වී හා එළවළු වැනි බහුලව අනුභව කරන ආහාර නිසා මේ රටේ ඇතිවිය හැකි රෝග බොහෝය. රසායනික පොස්පේට් පොහොර සමග කැඩ්මියම් වැනි විෂදායී ලෝහ ශරීරගත වීමෙන් මුත්‍රාරෝග ඇතිවීමට පුළුවන.

කෘෂිකර්මයට හා බීමට ගන්නා ජලයෙහි ෆ්ලුවොරයිඩ්, ඇළුමිනියම්, ඊයම්, කැඩ්මියම්, රසදිය, තඹ, දිලීර වැනි විෂ ද්‍රව්‍ය ශරීර ගතවීමෙන් දැනටමත් ගොවීන් අසරණ තත්වයට පත්වී ඇත. කල්පිටියේ නිල්දරු උපත් ගැන ඔබ අසා ඇත. මීට හේතුව වෙල්පහු වතුර ගලාවිත් එහි අන්තර්ගත කෘෂි රසායන සංයෝග පැළෑටි මඟින් උරාගන්නා බැවිනි. යාපනයේ කැල්සියම්, කඳුරට නයිට්‍රේට්, වියළි ප්‍රදේශවල

කැඩ්මියම්, කළුතර වැනි ප්‍රදේශවල අයඩින් ඌණතාවය අතිශයින්ම බරපතල ගැටළු ඇති කරවන බව නිතර වාර්තා වෙයි.

විෂ අධ්‍යයන විද්‍යාවට අනුකූලව පර්යේෂකයින්ගේ දැඩි විමසුමට ලක්වී ඇති ආහාරවල පළිබෝධනාශක අතිශයින්ම බියකරු විපත් උදාකරමින් පවතී. හදිසි අවස්ථා, රැකියා හා විවිධ උත්සව නිසා ද ක්ෂණික ආහාරවලට පුරුදු වී ඇත. වර්ණ කාරක, රස කාරක, කල්තියා ගැනීම සුරක්ෂිත කරන, රසායනික සංයෝග ප්‍රමිතිකරණයට අනුකූල නොවූ විධියට පාවිච්චි කිරීම නිසා ආහාර කෑමට නුසුදුසු බවට පත්වී ඇත.

වෛද්‍ය සංකල්ප.

පෘථිවියේ ඇති පැළෑටි තුළින් ඛණිජ ලවණ අපට ලැබේ. සත්ව ප්‍රෝටීන් සතුන්ගෙන් ද, ශාක ප්‍රෝටීන් පැළෑටීන්ගෙන් ද ලැබේ. පැළෑටි තුළ ඇති ඇමිනෝ අම්ල සංයුතීන් අපේ ප්‍රෝටීන් ඌණතාවයන් සපුරයි. අකුණු ගැසීමෙන් වර්ෂා ජලයෙන් පසට නයිට්‍රජන් එකතුවන අතර ජලයෙන් පසට නයිට්‍රජන් එකතුවන අතර මුල් මගින් හා පසේ බැක්ටීරියා මගින් ශාක තුළට නයිට්‍රජන් එකතු කරනු ලබයි. කාබනික සංයුතීන් ශාකවල මල්වලට සුවඳ හා වර්ණය ලබාදෙයි. අපේ ප්‍රධාන ආහාරය බත් නිසා සහල් අධික ලෙස පෑහීමෙන්, සේදීමෙන් ඛණිජ ලවණ, විටමින් ඉවත් වේ. අධි මානසික බලය ඇති විට සිරුරෙන්ද ශක්ති තරංග නිකුත් කළ හැකිය.

විශ්ව ශක්තීන් හා චුම්භක අනුනාද ප්‍රතිරූපණය හෙවත් කාන්දම් කම්පනීය බලය සහිත ශක්ති තරංග (Magnetic Resonance Imaging) ඇතිවිට එසේ සිදුවේ.

සිරුරේ ප්‍රෝටෝනවල න්‍යෂ්ටිය චුම්භක අනුනාද මගින් ප්‍රතිබිම්භ සාදා ගැනීමට ශක්ති තරංග බාධවකින් තොරව අවශ්‍ය වේ. විශ්ව ශක්තීන් විශාල ප්‍රමාණයක් පැළෑටි වර්ධනය උරා ගැනීමට සුභ කිරණ සහිත දින වගා කටයුතු සඳහා යොදා ගන්නේ මේ නිසාය. යමෙක් උපත ලබන විට ඇතිවන ග්‍රහ බලපෑම් මත ජීවිත රටාව තීරණය වෙයි. කේන්ද්‍රයක් පරීක්ෂා කළ විට වාසනා මහිමයන් මෙන්ම රෝග තත්වයන්ද හඳුනාගත හැකිය. විශ්වයෙන් එන ඕජෝ ගුණ සපිරි ශක්ති (Vital Forces) සහ ආහාර ශරීරයට නව ජීවයක් දෙයි. ස්වභාවික සමබල දෑ සියල්ල ඇත. සිරුරට ශක්තිය ලබා ගැනීමට, වර්ධනයට, ආරක්ෂා කිරීමට ආහාර අවශ්‍ය වේ.

අස්ථි හා ලේ සෑදීමටත්, සිරුරේ වෙනත් අවශ්‍යතා සපිරීමටත් සමබල ආහාරයක් අවශ්‍යයයි. යකඩ අඩු වූ විට නීරක්තිය ඇතිවේ. ආහාරයක් ආහාර මාර්ග තුළදී විවිධ අවස්ථා පසු කරයි. ඝනවීම හෙවත් අවක්ෂේපණය (Precipitation), කැටි ගැසීම හෙවත් ස්ඵටීකරණය (Crystalization) සහ පරිශෝධනය හෙවත් උත්කර්ෂණය (Sublimation) යන අවස්ථා 3 ක් පසුකරන බව ජෙනිකින් සඳහන් කරයි. භාවනානුයෝගියෙකුට ශාරීරික ක්‍රියාකාරකම් විධිමත්ව හසුරුවා ගන්නටත් තවද ශරීරයේ යහපත් රසායනික

සමතුලිතතාවයන් තබාගැනීම පුළුවන. පිරිසිදු වාතය ද සිරුරට නව ජීවයක් දෙයි.

ආහාර දහනය වීමෙන් පසු ලැබෙන ශක්තිය ඉන්ද්‍රියන් මෙන්ම ස්නායු පද්ධතියද සුරැකිව තබා ගැනීමට උපකාරී වේ. ඖෂධ රෝග පාලනය කළත් අනර්ථකාරීය. ඇතැම් ඖෂධ මත්වෙන සුළුය. අසාමාන්‍ය අසාත්මිකතාවයන් ඇතිකරයි. අධික දුම්පානය, මත්ද්‍රව්‍ය, ආඝ්‍රාණය හිංසාකාරීය. කෘතීම ආහාර සුදුකළ හාල්, සුදු සීනි, සීමා කළ යුතුමය. රස හා වර්ණ ගැන්වූ ආහාර ද එසේමය. ව්‍යාකූල හෙවත් වික්ෂේප ඇතිවේ. විශ්වීය අපේක්ෂිත සැලසුම් අතිශයින්ම ප්‍රබලය. උප විඥාණය නිරායාසයෙන්ම තීරණය, විධානය, අවධාරණය කර කුසගිනි නිවා සිතැඟි ඉටුකර ගනී.

අපි රෝගී වූ විට ආහාර රටාව වෙනස් කරයි. කුඩා දරුවන්ට ලුණු හා ඛනිජ ලවණ අඩු පහසුවෙන් දිරවිය හැකි ආහාර දෙයි. ගැබිණි මව්වරුන්ට වෛද්‍ය ප්‍රතිකාරවලට අනුකූලව අධිපෝෂණීය ආහාර දෙයි. කම්කරුවන්ට වැඩි ශක්තියක් අවශ්‍ය වේ. වැඩෙන දරුවන්ට වර්ධක ආහාර ඉතාම අවශ්‍යයයි. ස්නායු පද්ධතිය, පටක හා අස්ථිවල මනා ක්‍රියාකාරීත්වය ලේ ධාතුවේ සමතුලනයක් පවත්වා ගත යුතුය. රෝග උපසමන කාලයේ පහසුවෙන් දිරවිය හැකි ආහාර අවශ්‍යය. පෝෂ්‍යදායී ආහාරයක් දිය යුතුය.

ලේ ධාතුව කුඩා කේශනාළිකා දිගේ යමින් සිරුර ක්‍රමවත්ව තබාගනී. රුධිරය කැටිගැසීමෙන් ලේ ගමනය අපහසුවී සංකූලතා ඇති වේ. සිමෝනයිට් නැමැති විද්‍යාඥයා උණ

හා සෙම්ප්‍රතිශ්‍යාව සිරුරේ අනවශ්‍ය දේ බැහැර කිරීමට උපකාරී වන බව අවධාරණය කරයි. සිරුරට කැල්සියම් අවශ්‍ය විට එය ශරීරයේ ගලායන ලේ වලින් හා ජීර්ණ වූ ආහාරවලින් ලබා ගනී. කාබනික ව්‍යූහයක වැඩුණු ආහාර පරිසරයට හිතකාමී නිසා වස විසෙන් අඩුය.

- ශක්තිජනක ආහාර : ජීවය පවත්වා ගැනීමට, ශරීර උෂ්ණත්ව පාලනයට, ශ්‍රාව නිපදවීමට, අළුත් සෛල හා පටක වර්ධනයට, විෂබීජ මර්ධනයට, චලනයට සහ වැඩ කිරීමට උපකාරී වේ.

- වර්ධක ආහාර : සිරුරේ සහ මානසික වර්ධනය සඳහා අවශ්‍ය වේ.

- ආරක්ෂක ආහාර : සිරුරේ සහ මනසේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වේ.

- අපට අවශ්‍ය ප්‍රධාන පෝෂක :

  - ජලය
  - කාබෝහයිඩ්රේට් - පිෂ්ඨය, සීනි සහ තන්තු
  - මේදය - සංතෘප්ත හා අසංතෘප්ත, තෙල්
  - ප්‍රෝටීන් - සත්ව හා ශාක
  - විටමින්
  - ඛණිජ ලවණ

- ආහාර පරිවෘත්තිය මගින් ශක්ති ප්‍රමාණය නිපදවා ප්‍රධාන වශයෙන් කාබන්ඩයොක්සයිඩ් වායුව හා ජලය නිපදවා ගනී.
- ශක්ති අවශ්‍යතා කිලෝජූල් (KJ) වලින් මැන ගනී.
- සෑම ආහාරයක්ම අඩුවීම ද වැඩිවීම ද සිරුරට අහිතකරය
- අධික මේද හා සීනි පරිභෝජනය විශේෂයෙන් අහිතකරය
- ප්‍රෝටීන් ද ධන හා සෘණ තුලන දෙකම හානිකර නිසා මනා පාලනයක් තිබිය යුතුය.
- පෝෂක කොටස් ශක්ති ප්‍රභව මෙන්ම ශරීර ව්‍යුහය පිළියෙළ කිරීමට යොදා ගනී.
- ග්ලූකෝස්, ඇමිනෝ අම්ල, මේද අම්ල සහ ග්ලිසරෝල් ශරීර ව්‍යුහය සැකැස්මට උපකාරී වේ.
- විටමින් A D E K මේද වලද විටමින් B සහ C ජලයේද ද්‍රාවණය වේ. අයනික යකඩ උරාගැනීමට C විටමින් උදව් කරයි.
- කාබෝහයිඩ්රේට් වලින් ශක්තිය ලබාගැනීමට B විටමින් උපයෝගී වේ.
- කෙඳි හෙවත් තන්තුවලින් මළ බද්ධය අඩු කරයි. ජීර්ණ පද්ධතියේ පිළිකා වැනි රෝග අඩුකරයි. ලේවල මේද සහ කොලෙස්ටරෝල් අඩුකරයි. අධික බර අඩුකරයි. දියවැඩියාව පාලනය කරයි.
- වයස, රෝග තත්වය පමණක් නොව දේශගුණයටද ඦ කියාවට ද අනුකූලව ආදායමට ඔරොත්තු දෙන මිල අඩු පිරිසිදු ආහාර තෝරා ගත යුතුය.

## ජ්‍යොතිෂ මිනිසා හා ශරීර කොටස්

1. මේෂ - හිස
2. වෘෂභ - මුහුණ, බෙල්ල, කට, කන්
3. මිථුන - උරහිස්, පපුවේ උඩ කොටස
4. කටක - පපුව, පෙනහළු, හදවතේ උඩ කොටස
5. සිංහ - බඩ, පෙකණියෙන් උඩ කොටස
6. කන්‍යා - පහත බඩ, බඩවැල්, ගර්භාෂය, ඩිම්බ කෝෂ
7. තුලා - උකුළ වකුගඩු
8. වෘශ්චික - ප්‍රජනන කේන්ද්‍රීය
9. ධනු - වෘෂණ කෝෂ, තට්ටම්
10. මකර - තට්ටම්, දණ හිස්, කළවා පහළ කොටස
11. කුම්භ - කකුල්
12. මීන - පාද, වළලුකර



රූපය 14. රාශි චක්‍රය සහ මිනිසා අතර සම්බන්ධතා



රූපය : 15 විශ්ව ශක්තීන් සහ මිනිසා අතර, අන්තර් සම්බන්ධතා



රූපය 16. ජ්‍යොතිෂ මිනිසා




රූපය 17 : විශ්වය සහ මිනිසා




රූපය : 18 රාශි චක්‍රය සහ සිරුරේ කොටස්,

1. හිස, මුහුණ, සමේ පැහැය
2. බෙල්ල, කථාව, උගුර, සෙම, ප්‍රජනන ඉන්ද්‍රිය
3. ඇස්, උරහිස්, කන්
4. පපුව, කකුල්, පිට කොන්ද, රුධිර සංසරණය
5. බඩ, දණහිස්, කොඳු ඇට පෙළ
6. ආහාර ජීර්ණ පද්ධතිය, ප්‍රත්‍යුත්පාදනය
7. කට, දිව, පෙකණිය, පාද, අත්
8. ලිංගේන්ද්‍රිය, අර්ශස්, රෝග නිවාරණය, මරණය, තපස් ජීවිතය.
9. කම්මුල්, පපුව, දණහිස්, හිස, කකුල්
10. පාද, පපුව, නාසය, ශිරා ගැට
11. පාද, උරහිස්, සෙම, ලිංගේන්ද්‍රිය
12. ඇස්, කන්, ගුද මාර්ගය, උරහිස්

## රෝග හඳුනා ගැනීම

යමෙකු උපදින විට නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවන ජන්ම පත්‍රය (Horoscope), රෝගී තත්වයක් ගැන විමසන අවස්ථාවේදී උදාවන තත්කාල රාශි චක්‍රය (Horary Astrological Chart) තුළින්ද රෝග හඳුනා ගත හැකිය. තාරකා විද්‍යාව, ජ්‍යෝතිෂ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, රස විද්‍යාව එක් කළ විද්‍යාඥයින් විසින් රෝග හඳුනාගෙන ප්‍රතිකාර කළ බව ඓතිහාසික තොරතුරුවලින් නිගමනය කළ හැකිය. ඌණතා රෝග හඳුනාගෙන රෝගය, හේතුව, කාලය, ප්‍රතිකාරය ක්‍රමවත්ව කළ හැකි විය. (Horse Radish) පැළෑටිය කදිම නිදසුනකි. වෛද්‍ය ප්‍රතිකාර සඳහා සියළුම කොටස් ප්‍රයෝජනයට ගනී.

- මුල් - ඛනිජ ලවණ (Chemical Salt) හිසේ හා ස්නායු පද්ධතියේ රෝග සමනය කරයි.
- කොළ හා නැටි - රසදිය (Mercury) පෙනහළු සහ හෘදයේ ලේ ක්‍රමවත් කරයි.
- මල් - ගෙන්දගම්, (Sulphur) සුවඳ, පරාග ජීර්ණ පද්ධතිය හා ප්‍රජනන ක්‍රියාවළිය ක්‍රමවත් කරයි.

## ග්‍රහයින් දුර්වල වූ විට ඇතිවන රෝග

උපදින මොහොතේ ග්‍රහ චාරය අනුව සෑම ග්‍රහයෙක්ම හොඳ හා නරක දෙකම සිදු කරයි. ඒ අනුව ආහාර රුචිය පවා වෙනස් විය හැක. එන්සයිම හෙවත් උත්තේජක (Enzyme)

මඟින් අප ගන්නා ආහාර ජීරණය සිදුකරයි. කේන්ද්‍රයක තුළින් මේ සියළුම අවස්ථා ද, රෝගී බවද, මන්දපෝෂණය, වඳ බව වැනි අවස්ථා ද හඳුනාගත හැකිය.

උදා :- ශනි, බුධ එක්වූ විට උත්පාදක ශක්තිය අඩුකරයි.

- රවි : හෘද රෝග, අස්ථි වේදනා, ලේ දෝෂ, අක්ෂි හා වාත රෝග.

- සඳු : මානසික හා ශාරීරික අසමතුලිත බව, ඔසප් චක්‍රයේ අක්‍රමිකතා, වඳ බව, රුධිර සංසරණයට බාධක, ඉදුමුම, තයිරොයිඩ්, අපස්මාරය, පාචනය, සරම්ප, බඩේ කැක්කුම, වකුගඩු, උගුරේ ආසාදන, වකුගඩු රෝග, බඩවැල් ආසාදන, ක්ෂය රෝගය, ඇපෙන්ඩිසයිටිස්, මානසික ආතතිය, පණුරෝග, අංශභාගය, ඩිම්බ කෝෂවල අක්‍රමිකතා, දරු උපත්, හිංසාකාරී දරු උපත්, ශාරීරික විෂමතා.
- කුජ : ශක්තිය දුර්වලවීම, රෝග බෝවීම, අධික කෝපය, රතුවන් රක්තානු හිඟවීම, ස්නායු දුර්වලතා, ජනනේන්ද්‍රිය අක්‍රමිකතා, ශල්‍ය කර්ම, තුවාල, නිල් දරු උපත්,

- බුධ : අධික කෝපය, ගොළුබව, කලා කුසලතා දුර්වලතා වීම, අමතක වීම, ස්නායු පද්ධතියේ රෝග, පටක වර්ධනයේ අක්‍රමිකතා, ගෙඩි, රෝග සුවවීම ප්‍රමාද වීම, බිහිරි බව, හිසරදය, ක්ලාන්තය, අර්ශස්, දියවැඩියාව.

- ගුරු : හෝමෝන ක්‍රියාකාරීත්වයේ ගැටළු, ලේ අපිරිසිදුවීම, රෝග නිවාරණය දුර්වල වීම, කොලෙස්ටරෝල්, මොළය විකෘති වීම, උණ සන්නිපාතය, පාචනය, දත් රෝග, ප්ලූරසි, පීනස, හෙපටයිටිස්, දියවැඩියාව, වාත රෝග, අනාරක්ෂිත බව
- සිකුරු : ගැස්ට්‍රයිටිස්, කලා කුසලතා දුර්වල වීම, මත්පැන් වලට ඇබ්බැහිවීම, වකුගඩු රෝග, දියවැඩියාව, ගලගණ්ඩය, සෙම්ගෙඩි, ලිංගාශ්‍රිත රෝග, රෝගී දරුවන්
- ශනි : කන් රෝග, මුත්‍රාශ රෝග, අස්ථි දුර්වලතා, චර්ම රෝග, කොඳු ඇට පීඩන, පිත්තාශ රෝග, ඇලදිව රෝග, දන්ත විකෘතිතා, හිස්කබලේ රෝග, ධමනි තදවීම, දරු ඵල අහිමිවීම, අංශභාගය,
- රාහු : මානසික රෝග, මොලයේ රෝග, දත් ඇඹරීම, ගෙඩි, පිලිකා, අධික කෝපය, මත්ද්‍රව්‍ය භාවිතය, දුම්බීම
- කේතු : භූත දෝෂ, වාත රෝග, උණ, වසංගත, හමේ රෝග, ප්ලූරසි, සෙම.
- යුරේනස් : මානසික රෝග, කෙණ්ඩා පෙරළීම, ඔසප් නැවතීම ඒ හා සම්බන්ධ දුර්වලතා, අධි රුධිර පීඩනය, හෘද රෝග, අංශභාගය, තරුණ වියට පත්වීම.
- නැප්චූන් : පේනකීම, අත්භූත දේ, වස විස පරිහරණය, කොඳු ඇටවල ආබාධ, සියදිවි හානි කරගැනීම, දෘෂ්ඨි විතානයේ දෝෂ.
- ප්ලූටෝ : මානසික විකෘතිතා, ශෛල වර්ධනයට බාධා, සිත දුර්වල වීම.




රූපය 19 : නව ග්‍රහ මණ්ඩලය

## පෝෂණය

- ධාන්‍ය හා පිෂ්ඨය සහිත එළවළු : හොඳම ශක්ති ජනක ආහාරයන්ය. එළවළු හා අල වර්ග B විටමින්, යකඩ සහ කැල්සියම් වැනි ඛනිජ ලවණ අන්තර්ගතය. නිවුඩු සහිත ධාන්‍යවලද කෙඳිමය කොටස් ඇත. සුදු හාල් පිටි, තිරිඟු පිටි පාන්, අර්ථාපල්, කුරක්කන් පිටි, මඤ්ඤොක්කා වැනි ආහාරවල පිෂ්ඨය අධිකය.

- පළතුරු සහ එළවළු : වැදගත් ඛනිජ ලවණ, විටමින් A, C සහ D ඇත. වතුර ස්වල්පයක් එක්කර කෙටි කාලයක් තැම්බීමෙන් විටමින් ආරක්ෂා වෙයි.

- මස්, මාළු හා විකල්ප : ප්‍රෝටීන්, විටමින්, යකඩ වැනි ඛනිජ ලවණ අධිකය.

- කිරි සහ කිරි නිෂ්පාදන : ප්‍රෝටීන්, විටමින් B 12, A සහ D, කැල්සියම් වැනි ඛනිජ ලවණ

- මේද, තෙල්, සීනි : මාජරින්, බටර්, එළඟි තෙල්, පොල්, එළවළු තෙල්, ශක්තිය දෙන ආහාරය. මේදයේ දියවෙන විටමින් සහ මේද අම්ල උරා ගනී, සීනි සිරුරට අවශ්‍ය නැත.

පළවෙනි කොටස් හතරෙන් වැඩිපුර ආහාර තෝරා ගැනීමේදී එදිනෙදා පවුලේ අවශ්‍යතාවයන් ගැනද සැලකිළිමත් විය යුතුය. විශේෂයෙන් වයස් සීමාවන්ට, රෝගීන්ට, ගැබිණි මව්වරුන්ට, කිරිදෙන මව්වරුන්ට,

ආහාර වෛද්‍ය උපදෙස් මත වෙනස් කළ යුතුය. පවුලේ අවශ්‍යතාවයන්ට අනුකූලව ගෙවත්ත නිර්මාණය කරගැනීම අත්‍යාවශ්‍ය දෙයකි.



1. නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවෙන රාශි චක්‍රය සහ ග්‍රහ තාරකාවන් උපත ලද මොහොතේම දරුවාගේ ජීවිතය විවරණය කරයි. හොඳ හෝ නරක දෙකම කේන්ද්‍රයක් තුළින් හඳුනා ගත හැකිය.



2. ගැහැණු දරුවෙකුගේ ප්‍රථම මල්වරය සඳු, කුජ, රාහු, සිකුරු ග්‍රහයින් හය වන රාශියට බලපෑම් ඇති මොහොතක සිදුවේ. ඉන්පසු ග්‍රහ අපල දුරුකර වාසනාවන්ත දරු සම්පත් ලබාදී නිරෝගී දිවි පෙවෙතකට යොමු කිරීමට කිරි ඇති නිසා කොස් ගසක් යටදී සුබ මොහොතින් ඖෂධ දියර වලින් නාවනු ලබයි.



3. සෙනසුරු, ගුරු, රාහු, කුජ ග්‍රහයින් පීඩිත වූ විට දරුණු විපත් අනතුරු වලට ලක්වේ.

4. සඳු, ශනි, කේතු වැනි ග්‍රහයින් විශේෂයෙන් අට වැනි රාශිය පීඩාකරන මොහොතක මරණය සිදුවේ.

රූපය 20. ජීවිතයේ විවිධ අවස්ථා හතරක්

# කතුවරිය ගැන

''විශ්ව ශක්තීන් පැළෑටි සහ පෝෂණය'' නම් වූ මෙම කෘතිය විමලා දේවනාරායන මහත්මියගේ දෙවන කෘතියයි. ඇයගේ ප්‍රථම කෘතිය "Cosmic Influences on Healthy Crop Production" නමින් 2007 වර්ෂයේදී, ප්‍රකාශයට පත් විය. ඇගේ දෙවන කෘතිය ශ්‍රී ලංකාවේ ගැමියන්ට, උගතුන්ට මෙන්ම සාමාන්‍ය පාඨකයා අරභයා ලියන ලද්දකි. ආදී මානවයා සතු දැනුම, දේශීය ආහාර තාක්ෂණය, අසිරිමත් විශ්වය සහ ජ්‍යොතිෂ විද්‍යාව හා බැඳුණු කෘෂි තාක්ෂණය, විශ්ව ශක්තීන් හා පැළෑටි, කෘෂි ජෛව විවිධත්වය, දේශීය ආහාර හා මානව පෝෂණය, වගා ලිත, ජ්‍යොතිෂය, වෛද්‍ය විද්‍යාව හා බැඳුණු විධිමත් පෝෂණය, යන පරිච්ඡේදවලින් සමන්විත මෙම ග්‍රන්ථය සරළ සමාජයේ සිට සංකීර්ණ සමාජය දක්වා මිනිසා, සතුන් හා ශාක පරිසරයත් ජ්‍යොතිෂයත් අතර අන්තර් සම්බන්ධතාවය සාක්ච්ඡා කිරීමට දැරූ ප්‍රසන්න උත්සාහයක් ලෙස සඳහන් කළ හැකිය.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මයේ යෙදී සිටින ගැමියන්ගේ දැනුම් සම්ප්‍රදායට විශාල අඩු පාඩුවක්ව තිබූ විශාල හිඩැසක් මෙම කෘතිය මගින් සම්පූර්ණ කරයි. එනම්, ශාක ලෝකය හා විශ්ව ශක්තීන් අතර සම්බන්ධතාවයයි. අපගේ පැරැන්නන් ඔවුන්ගේ කෘෂි ජීවිතයේදී භාවිත කළ යාතු කර්ම සහ ඒවායේ අර්ථයත්, සාම්ප්‍රදායික ජීවන මාර්ගත් වශයෙන් කෘෂිකර්මයේ යහ පැවැත්මට කළයුතු භාවිතයනුත්, පිළිබඳව පෙර අපර දෙදිග දැනුම යම්තාක් දුරකට සංග්‍රහකිරීමට මෙම කෘතිය සමත්වී තිබේ. ඇයගේ මෙම ප්‍රසංසනීය උත්සාහයට සුභ පතමි.

**මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්.**
**සමාජ විද්‍යා අංශය,**
**පේරාදෙණිය විශ්ව විද්‍යාලය.**

පාරම්පරික දැනුම, සිරිත් විරිත්, පාරිසරික ගොවිතැන, ජෛවගතික, කාබනික ගොවිතැන, මානව සෞඛ්‍යය යනාදි අංශවල බොහෝ අංග කලක සිට අප විසින් විද්‍යාත්මක අධ්‍යයනයට යොමු කර ඇත. ඒ අතුරින් වැදගත් කාර්යක්ෂම ක්‍රම (Best practices) දේශීය කෘෂි කර්මාන්තයේ උන්නතියට, තිරසාරත්වයට හා පරිසර හිතකාමී ලෙස පරිහරණයට යොමු කරවීමටද හැකිවී ඇත. ලෝකයේ දියුණු රටවල මේ පිළිබඳ ඇතිවී ඇති උනන්දුව හා අවශ්‍යතාවය කෙසේද යත් මෙවන් උපක්‍රම තුළින් නිපදවූ කෘෂි නිෂ්පාදන (Value added products) වලට ඉහළ මිළක් (Primium Price) ජාත්‍යන්තර වෙළඳ පොලේ හිමිවීමෙන් ඉස්මතු වී පෙනේ. තවද, පර්යේෂණ තුළින් ප්‍රචලිත කිරීම් වස් නවීන කෘෂිකර්මාන්තයේ (Conventional Agriculture) විකල්ප අංශ (Alternate Agriculture) එකී දැනුම පෝෂණයට තාක්ෂණික හා මූල්‍ය ආධාර ද බහුලය. මෙසේ වුවද, ශ්‍රී ලාංකික ප්‍රජාව අතර මේ සම්බන්ධව උනන්දුව සහ දැනුම අල්ප බව අකමැත්තෙන් වුවද ප්‍රකාශ කළ යුතුය.

මෙවන් අවධියක, විමලා දේවනාරායනයන් විසින් එළිදක්වන විශ්ව ශක්තීන් පැළෑටි සහ පෝෂණය ග්‍රන්ථය තුළින් ද අප දකින්නේ ඇයගේ සුවිශේෂී දැනුම් සම්භාරයෙන් එක්තරා තෝරාගත් මිටක් සිංහල භාෂාව තුළින් ශ්‍රී ලාංකීය ජනයාගේ දැනුම උදෙසා ඉදිරිපත් කර ඇති බවයි. පරිසරය, විශ්වය, ජ්‍යොතිෂය, දේශගුණය හා කෘෂිකර්මය පොදු ජන ජීවිතයේදී කෙසේ වැදගත් වේද, නිරෝගී හා පෝෂ්‍යදායි ආහාරයක් තුළින් සෞඛ්‍ය සම්පන්න ජනතාවකට මග පෙන්වන්නේ කෙසේද? පරිසරය හා ජෛව විවිධත්වය සුරකිමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තිරසාරත්වය කරා යොමු කරවන්නේ කෙසේද යනාදිය බෙහෙවින් ඉස්මතු කර ඇත. ආසියාකරය

තුළ ශ්‍රී ලංකාව දේශීයත්වය අගයන, කෘෂිකර්මය, සෞඛ්‍යය, පාරිසරික හා ජල කළමනාකරණය, වාස්තු විද්‍යාව යන අංශවල පාරම්පරික දැනුමෙන් පිරි හා සශ්‍රීකත්වය, සෞභාග්‍යය හා තිරසාරත්වය පෙරදැරි කරගත් ජාතියක් බව ඉතිහාසයෙන් හොඳාකාරව පෙනේ. එසේ වුවද, කාලයත් සමග විදේශිකයන්ගේ විවිධ බලපෑම් හා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය හා ආශ්‍රිත එකී හැකියාවන් හා අවශ්‍යතාවයන් වෙනත් මගට යොමුවී ඇත. මෙය 60 දශකයේ හරිත විප්ලවය (Green Revolution) තුළින් ශීඝ්‍ර කෘෂි ආර්ථිකයකට පෙර නිමිති කියමින් නවීන කෘෂිකර්මාන්තයේ රසායනික පොහොර, කෘමිනාශක, උත්තේජක හා වර්ණක ආදියේ භාවිතය හා නවීන කෘෂි යන්ත්‍ර උපකරණවලට යොමුවීම හරහා තවදුරටත් ක්ෂීරණයට ලක්වීමට තුඩුවී ඇත. තවද, විවෘත ආර්ථික රටාව තුළ වෙළඳාම හා ලාභය පෙරදැරි කරගත් සමාජ රටාවකට යොමුවීමෙන් මෙම කෘතියේ සඳහන් බොහෝ අංග අප රටෙන් ගිලිහී ගොස් ඇත. තවද, අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ඉතිහාසය, පාරම්පරික දැනුම හා සමාජ අධ්‍යයනය යනාදි විෂයයන් ඉවත්වීමත්, ඒ වෙනුවට විකල්ප, ආක්‍රමණික, විදේශීය හා නව ප්‍රවණතාවයන් එළි දැක්වීමත් කැපී පෙනේ. පොදු ජනතාවගේ අවශ්‍යතා ඉහළ යන අධ්‍යාපන, ආදායම් හා සමාජ මට්ටම් තුළින් හුදෙක් කෙටිකාලීන අවශ්‍යතා කෙරෙහිද නැඹුරුවී ඇත. එකී ඍණාත්මක නැඹුරුතාවයන් සමාජය තුළින් වෙනස්කරවා ගැනීමට දෙවන සහ තෙවන පරම්පරාවලට නොමැති දැනුම සම්ප්‍රේෂණයේ කඩිනම් අවශ්‍යතාවය හොඳාකාරව පිළිබිඹු වේ. විමලා දේවනාරායනයන් මේ සම්බන්ධව ඇයගේ දැනුම හා අත්දැකීම් විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන හා ප්‍රතිපත්ති සකස් කරන විද්වතුන් අතර සාකච්ඡාවට හා පර්යේෂණවලට හැකිතාක් යොමු කර ඇත. එසේම මේ හා බැඳි ආශ්‍රිත

ග්‍රන්ථ සංසන්දනාත්මකව අධ්‍යයනයකට ඇය නොපසුබට වී ඇත. එවන් ව්‍යායාමයක ප්‍රතිඵලයක් ලෙස "Cosmic Influences on Healthy Crop Production" යන ග්‍රන්ථයේ සංචිතය අප හොඳාකාරව දකිමු. එය හුදෙක් දේශගුණික විපර්යාස, පාරිසරික අසමතුලිතතා හා සමාජයීය හායනය යනාදී අහිතකර හේතු තුලින් ලාංකික කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතියට හා තිරසාරත්වයට අහිතකරව බලපාන සාධක මගහැරවීමෙන් නිසිමගට යොමුකරවා ගැනීමට උත්සාහ දරා ඇති බවද පෙනේ.

මෙම ග්‍රන්ථයේ අඩංගු කරුණු පාඨක ඔබ විසින් තව දුර අසා දැනගැනීම, වැඩිපුර සොයාබැලීම වෙනත් පාර්ශව සමග සහයෝගයෙන් පරිහරණය කිරීම හා විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම කෙරෙන්නේ නම් එය මෙවන් මහඟු මෙහෙවරක් ඉටු කළ විමලා දේවනාරායනයනට සිදුකරන කළගුණ සැලකීමක් වන්නේය.

**ආචාර්ය කීර්ති මොහොට්ටි,**

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය හා

විකල්ප කෘෂිකාර්මික ක්‍රම පිළිබඳ කමිටු සාමාජික,

ජාතික විද්‍යා පදනම,    2010 නොවැම්බර් 22 දින

පසුගිය වර්ෂ ගණනාවක් තුළ ජ්‍යොතිෂය අනුව ජෛවගතික ගොවිතැනේ වගාලිතක් ගැමි සේවා සෙවණ විසින් නිකුත් කරන ලදී. මෙය අපගේ වාර්ෂික කාබනික ගොවිතැන සම්බන්ධව පවත්වන ලද දස දින වැඩමුළුවත් සමග සාමාන්‍යයෙන් නිකුත් කරයි. මෙයට STELLA NATURA යන ඇමෙරිකානු කැලැන්ඩරයට අනුව පිළියෙළ කර ඇත. මෙම කැලැන්ඩරය නිකුත්කිරීමට එංගලන්තයේ ලීඩ්ස් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය රිචඩ් තෝන්ටන් ස්මිත් මහතාගේ අනුග්‍රහයද ලබාගෙන ජ්‍යොතිෂවේදී විමලා දේවනාරායන මහත්මිය කැලැන්ඩරයේ ජ්‍යොතිෂ කරුණු අපට සකස් කර දීමෙන් අනතුරුව අප විසින් මෙය පිළියෙළ කර ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම කැලැන්ඩරයේ කොළ වවන දින, පළතුරු වවන දින, අල වවන දින සහ මල් වවන දින වෙන් වෙන් වශයෙන් වර්ෂයේ මාස දොළහ තුළ වගා කළයුතු කාලය දවසේ පැය ගණන් අනුව සකස් කර ඇත. මෙම කැලැන්ඩරය භාවිතා කරන අය මෙහි වැදගත්කම හා ඔවුන් එයින් ලබාගත් ප්‍රතිඵලයන් පිළිබඳව අපව දැනුවත් කිරීම තුළින් අපි මහත් සතුටක් ලබන්නෙමු. මෙය පිළියෙල කිරීමට උදව් කළ ජ්‍යොතිෂවේදිණී විමලා දේවනාරායන මහත්මියට අපගේ කෘතඥතාවය පුදකරන්නෙමු.

**රංජිත් ද සිල්වා**

ගැමි සේවා සෙවන, ගලහ.

2010-11-20

ලොව උතුම්ම සත්වයා ලෙස හඳුනාගෙන ඇති මානව සත්වයාගේ ක්‍රියාකාරකම් විවිධ විෂම ගති ලක්ෂණයන්ගෙන් යුක්තය. මෙවන් විවිධ ගති ලක්ෂණ සහිත ලොව උතුම්ම සත්වයා ලෙස හඳුන්වනු ලබත්. අනාදිමත් කාලයක සිට මානව සත්වයා අනුවර්තනය, පරිවර්තනය හා වැඩි දියුණු වෙමින් සමාජ ගතවී ඇත. අතීතයේත් වර්තමානයේත් මෙම ක්‍රියාවලිය සිදුවී ඇති අතර අනාගතයේදී ද එය එසේම වනු ඇතැයි සිතමි.

විශේෂයෙන් තම ජීවිත පවත්වාගෙන යාමේදී මූලික අවශ්‍යතා සපුරාගැනීමට අධික වෙහෙසක් දැරීමට අපගේ ආදී මුතුන් මිත්තන්ට සිදුවී ඇත. වර්තමානයේ මෙය වඩාත් සංකීර්ණ වී ඇත. නිවාස ඉදිකිරීමේදී ගොවිතැන් කටයුතු කිරීමේදී ඇතුළු සියලුම කටයුතු සඳහා විශ්ව ශක්තියේ බලපෑම අඩුවැඩි වශයෙන් සිදුවී ඇත.

විශ්ව ශක්තිය මහා බලවතෙකි. ඒ හා සම්බන්ධ විග්‍රහයන් කිරීම සංකීර්ණ වූවත් 'විශ්ව ශක්තීන් පැළෑටි සහ පෝෂණය' නැමති ග්‍රන්ථය තුළින් විමලා දේවනාරායන මහත්මිය විශ්ව ශක්තිය තුළින් කෘෂිකාර්මික කටයුතු සහ මානව පෝෂණය සඳහා බලපාන ආකාරය විග්‍රහ කිරීමට ගෙන ඇති උත්සාහය ඉතාමත් අගය කළ යුතුය. 'ආදී මානවයා සතු දැනුම' නැමති පරිච්ඡේදය තුළින් වසර මිලියන හතරකට පෙර සිට සිදුවී ඇති මානව පරිණාමයත් අපේ පැරැන්නන් විශ්ව ශක්තීන් භාවිතා කරමින් ජීවිත පවත්වාගෙන ගිය ආකාරයත් පිළිබඳ මනා විග්‍රහයක් කර ඇත.

ප්‍රවීන ජ්‍යොතිෂවේදිනියක් මෙන්ම විවිධ විෂයන් සම්බන්ධව උපදේශිකාවක් වන විමලා දේවනාරායන මෙම ග්‍රන්ථය

තුළින් අනාගතයේ ඇතිවිය හැකි නොපෙනෙන සමාජ ගැටළු කිහිපයක් විග්‍රහ කිරීමට උත්සාහ දරා ඇත. විශේෂයෙන්ම මානව පෝෂණය සඳහා අවශ්‍ය ආහාර සපයා ගැනීමේදී අපගේ ආදිතමයන් අනුගමනය කර ඇති ක්‍රමෝපායන් කෘෂිකර්මයේදී, භාවිත වන පොහොර පිළිබඳව 'කෘෂි ජෛව විවිධත්වය දේශීය ආහාර හා මානව පෝෂණය' නැමති පරිච්ඡේදය තුළින් මනා විග්‍රහයක් කර ඇත.

කෘෂිකර්මාන්තය සිය ජීවනෝපාය කරගෙන ජීවත්වූ අපේ ආදිතමයන් ඒ සම්බන්ධයෙන් භාවිතා කරන ලද ක්‍රමෝපායන් විශ්ව ශක්තීන් පදනම් කරගෙන ඇත. ජ්‍යොතිෂය විද්‍යාත්මක පදනමක් මත මිනිසාගේ දෛනික කටයුතුවලට යොදාගැනීමක් නිසා නව ජීවයක් ලබාඇති බවත්, ග්‍රහ වස්තූන්ගේ බලපෑම් නිසා විශ්මිත ලෙස පරිසරය වෙනස් කළ හැකි බවත් 'විශ්ව ශක්තීන් හා පැළෑටි' නැමති පරිච්ඡේදයෙන් විග්‍රහයක යෙදී ඇත.

අසිරිමත් විශ්වයේ සිදුවන විවිධ සංසිද්ධීන් සොයනට වෙහෙසවී ඇති අපගේ ආදිතමයන් ඒ හා සම්බන්ධ සිද්ධීන් අවබෝධ කරගැනීමට දැඩි උත්සාහයක යෙදී ඇත. පැළෑටි සතුන් හා මිනිස් ක්‍රියාකාරකම් වලට විශ්ව ශක්තීන් පාදක වී ඇති ආකාරය පිළිබඳව විද්‍යාත්මක විග්‍රහය යෙදී ඇති බව 'ජ්‍යොතිෂ වෛද්‍ය විද්‍යාව හා බැඳුණු විධිමත් පෝෂණය' නැමති පරිච්ඡේදයෙන් විද්‍යාත්මක විග්‍රහයක් කිරීමට උත්සාහ ගෙන ඇත.

ඉර හඳ ඇතුලු ග්‍රහ තාරකාවන්ගේ බලපෑම කෘෂිකාර්මික කටයුතු කිරීමේදී ඉතා සියුම් ලෙස යොදා ගෙන ඇති ආකාරය පිළිබඳව විද්‍යාත්මක විග්‍රහයක යෙදෙන දේවනාරායන මැතිණිය, මුළු මහත් විශ්වය තුළ සිදුවන

ක්‍රියාකාරකම් පිළිබඳ සටහනක් 'ජ්‍යෝතිෂය හා බැඳුණු කෘෂි තාක්ෂණය' තුළින් මිනිස් මනසට තේරුම් යන ආකාරයට ඉදිරිපත් කර ඇත.

'කෘෂි ජෛව විවිධත්වය දේශීය ආහාර හා මානව පෝෂණය' නැමති පරිච්ඡේදය පුරාම විග්‍රහ වන්නේ රටට ජාතියට අවශ්‍යම කාරණයකි. කෘෂි භෝග වගාව මානව සත්වයාට හිතකර ආකාරයට ක්‍රියාත්මක කර ඇති අතර එකී, ක්‍රමෝපායක් සහ ඒ තුළින් නිෂ්පාදනය වන ආහාරත්, මානව සත්වයාගේ පෝෂණය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳවත්, තබන ලද සටහන අපූර්වත්වයක් ගනී. පෙර සංසාර පුරුදු මතුවෙමින් විවිධ ක්ෂේත්‍රයන්හි පතුලටම කිඳා බැසීමේ නුවණකින් සහ තීක්ෂණ බුද්ධි බල මහිමයකින් ක්‍රියාකරන විමලා දේවනාරායන මහත්මිය විසින් මානව සමාජයේ උන්නතිය සඳහා නිර්මාණය කර ඉදිරිපත් කරන ලද මෙම ග්‍රන්ථය එතුමියගේ නිවන් දොර විවර කරගැනීමට හේතු වාසනා වේවා. මානව දයාවෙන් පිරිපුන් මෛත්‍රීය උතුරා යන සිතකින් කරන ලද, මෙම නිර්මාණය සමාජයේ බහුතරයකට තම ජීවිත ඒකාලෝක කරගැනීමට හේතුවනු ඇත. මෙවැනි පොත් තව තවත් නිර්මාණය කර සුවිශාල සමාජ මෙහෙවරක් කිරීමට අවශ්‍ය ශක්තියත් ධෛර්යයත් ඔබතුමියට ලැබේවායි මෛත්‍රී සහගත සිතින් යුතුව ප්‍රාර්ථනා කරමි.

**පරිසරවේදී හා විශ්ව ගවේෂී- එන්. අඹේපිටිය.**

විමලා දේවනාරායන මහත්මිය ජ්‍යොතිෂ ශාස්ත්‍රයේ මනාව පළපුරුදු, පලාපල හා පොරොන්දම් බැලීමේ සහජ දක්ෂතාවයන් පෙන්නුම් කරන කාන්තාවක් ලෙස මම දකිමි. ඈ බොහෝ වෙහෙස දරා, මගේ අනුදැනුම ඇති ව "ජ්‍යොතිෂය, වෛද්‍ය විද්‍යාව හා විධිමත් පෝෂණය" නමින් පරිච්ඡේදයක් නවතම ලිඛිත ජ්‍යෝතිෂ ග්‍රන්ථයට ඇතුළත් කර ඇත.

මෙම ග්‍රන්ථය විශේෂයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශ පන්ති වල ඉගෙනුම ලබන, ජ්‍යොතිෂය ගැන උනන්දුවක් දක්වන දරුවන්ට හා විශ්ව ශක්තිය ගොවිතැනෙහි උපරිම ලෙස යෙදවීමට බලාපොරොත්තුවන ගොවීන්ට ඵලදායී කෘතියක් ලෙස හඳුන්වා දිය හැක. මෙම ග්‍රන්ථය උත්පත්තියේ සිට මරණය දක්වා ජීවිත කාලයේ දී ග්‍රහයන් බලපාන අයුරු හොඳින් පෙන්වා දී ඇත. මෙම කෘතිය සම්පූර්ණ වශයෙන් ගත්කල විශ්ව ශක්තීන් මිනිසා සහ ඔහු සමීප ව සිටින පණ ඇති හා පණ නැති දෑ සමඟ ගැටෙන ආකාරය ද එයින් මිනිසාගේ පැවැත්ම සඳහා උපයෝගී කරගන්නා ක්‍රම හා පිළිවෙලවල් ද පැහැදිලි කර ඇත.

**සම්මාන මහාචාර්ය පී.ඒ.ජේ. පෙරේරා**
වෛද්‍ය පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. Anonymous (1993). Astrology Planets & Birth Signs, Astrology and Diets (E), Tophi Books, Ramboro, London.

2. අතපත්තු, ආර්.බී. (2002), විශ්වය අපට පෙනෙන ග්‍රහලෝක හා තරු (සි), එම්.ඩී. ගුණසේන සහ සමාගම.

3. Chathurvedi B.K. (Undated). Health & Astrology (E) Ranjees Chowdhry, Goodwill Publishing House, Rajendra Place, New Delhi.

4. දේවනාරායන විමලා, ජ්‍යොතිෂය අනුව ජෛවගතික ගොවිතැනේ වාර්ෂික වගාලිත් 2002 සිට ඉදිරියට, ගැමිසේවා සෙවන, ගලහ.

5. Dewanarayana, Wimala. (2007), Cosmic Influences on health Crop Production. Post Graduate Institute of Agriculture, University of Peradeniya.

6. Doreen Alles, (1997). Traditional Foods & Cookery Down the Ages.

7. ගාමිණී හිටිනායක ආචාර්ය, රංජිත් ද සිල්වා සහ ඉන්දික විතානගේ, (2009) පාරිසරික ගොවිතැන් පද්ධති සහ තාක්ෂණික ක්‍රම, කෘෂි පීඨය, විශ්වවිද්‍යාලය,පේරාදෙණිය.

8. හෙට්ටිගොඩ. එච්.එස්. (1989). ජීවිතය හා ග්‍රහයෝ (සි) තුසිත පොත්හල, ගාල්ල.

9. Hills, K. (2003 - 2010) Stella Natura - Bio Dynamic Agricultural Planting Calender (E), Kimberton Hills, Circle Graphics, Inc, Eagleville, P.A. America.

10. Jenkin, Richard A. (1972) Astrology & Diet (E), Health Science Press, Rushinton, Sussex, England.

11. කාබනික පොහොර භාවිතය, (සි), (දින නැත), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

12. Murray, D.C. (1992), The Practical Astrologer, (E), Tiger Books. International, London.

13. නෙස්ටූර් එම්, (1981) මිනිසාගේ සම්භවය, ප්‍රගති ප්‍රකාශන මන්දිරය,මොස්කව්.

14. Sanders, M.A. (1981), Astrology (E), Park Lane Press, London.

15. Smith Richard Thornston's (2002-2003), Lectures on Working with the Stars, (E), At the Galaha Gami Seva Sevana and at the P.G.I.A. University of Peradeniya.

16. Smith Richard Thornston's (2007) DEE Offset printers, Kandy, Dalugama, Kelaniya.

17. Smith Richard Thornston's (2009), Cosmos Earth and Nutrition, The Biodynamic Approach to Agriculture, Sophia books, Hillside House, RH 185 ES, Square Forest Row.

18. Storl, W.D. (1979), Culture and Horticulture, A Philosophy of Gardening, Part I. (E), Biodynamic Publication, U.S.A.

19. ස්වාභාවික පරිසර පද්ධති තුළ වැවෙන ආහාර හා පෝෂ්‍ය පදාර්ථ,ජෛව විවිධත්ව මධ්‍යස්ථානය, ජල ටැංකිය පාර, හිඳගොඩ, බදුල්ල.

20. Thun, Maria, (1990), Work on the Land and the Constellations, (E), Lanthern Press, Englend.

21. Thun, Maria. (Undated), The Showing and Planting Annual Calendars, Working with the Stars (E), Verling , Germany and Floris Books, Edingburg.

# ආශ්‍රිත ග්‍රන්ථ සවිස්තරාත්මකව

1. ආදී මානවයා සතු දැනුම
❖ ආ : ග්‍ර : 12 සහ පුවත්පත් වාර්තා

2. දේශීය ආහාර තාක්ෂණය
❖ ආ : ග්‍ර : 12 පිටු අංක 105 සහ පුවත්පත් වාර්තා

3. අසිරිමත් විශ්වය හා ජ්‍යොතිෂ විද්‍යාව
❖ සතියේ දින හත -ආ : ග්‍ර : 12 පිට

4. ජ්‍යොතිෂය හා බැඳුණු කෘෂි තාක්ෂණය
❖ වෘක්ෂ වන්දනාව, ජනකතා හා පුවත්පත් ඇසුරෙනි.

5. විශ්ව ශක්තීන් හා පැළෑටි
❖ රාශි චක්‍රය ආ : ග්‍ර : 12 පිටු අංකය 11 - 22

❖ සූර්ය ශක්තිය - ස්මිත් දේශන (2002)

❖ ත්‍රිවිධ මානවයා - ආ : ග්‍ර : 17 පිටු අංක 214 - 215

ස්මිත් දේශන (2009)

❖ ත්‍රිවිධ ශාකය - ස්මිත් දේශන (2009)

❖ ස්වර්ණමය අනුපාතය ආ: ග්‍ර : 18 පිටු අංක 217
❖ තන්තු වල අනුක්‍රමිකතාවය- ආ : ග්‍ර : 18 පිටු අංක 215-248

- ❖ විද්‍යාඥයින් සම්බන්ධ තොරතුරු - ආ ඃ ග්‍ර ඃ 12 - 14

- ❖ විකිරණ අන්තර්ගතය - ආ ඃ ග්‍ර ඃ 12 පිටු අංක 114, 03 පිටු අංක 18

- ❖ ගෙන්දගම්, රසදිය, ලවණ - ආ ඃ ග්‍ර ඃ 10

- ❖ ග්‍රහයින්ගේ බලපෑම - ආ ඃ ග්‍ර ඃ 12 පිටු අංක 80 - 99

- ❖ පැළෑටීන්ගේ ආකර්ෂණය - ආ ඃ ග්‍ර ඃ 18 පිටු අංක 206 - 230

- ❖ විද්‍යාත්මක සංකල්ප - ආ ඃ ග්‍ර ඃ 18 සහ 12

6. කෘෂි ජෛව විවිධත්වය දේශීය ආහාර හා මානව පෝෂණය - ස්මිත් දේශන (2007) - ආ ඃ ග්‍ර ඃ 07

- ❖ පාරිසරික ගොවිතැනේ පදනම - ස්මිත් (2007)

- ❖ ශාක සංරක්ෂණය - ආ ඃ ග්‍ර ඃ 05

7. කෘෂි කටයුතු සඳහා අවශ්‍ය සාධක තුන සහ සතර මහා ධාතු

- ❖ ස්මිත් දේශන (2002)

- ❖ විශ්වීය සාධක - ආ ඃ ග්‍ර ඃ 18 පිටු අංක 197 - 286

- ❖ වායුගෝලීය සාධක - ආ ඃ ග්‍ර 18 පිටු අංක 231 - 248

❖ භූගෝලීය සාධක - ආ ඃ ග්‍ර ඃ 18 පිටු අංක 249 - 276

❖ සතර මහා ධාතු - ආ ඃ ග්‍ර ඃ 18 පිටු අංක 45 - 55

❖ ස්මිත් දේශන (2002) - ආ ඃ ග්‍ර ඃ 16 පිටු අංක 142, ආඃ ග්‍ර ඃ 04 වාර්ෂික ජෛවගතික වගාලිත්,

❖ විශ්ව ශක්තීන්ගේ සංයෝජන - ආ ඃ ග්‍ර ඃ 18 පිටු අංක 56 - 192, 220, 364

❖ සඳ කලා අනුව භෝග වගා කළ යුතු අයුරු - ස්මිත් දේශන (2002), ආ ඃ ග්‍ර ඃ 18

❖ සෞඛ්‍ය සම්පන්න වගා සංකල්ප ස්මිත් දේශන - 2002 සිට මේ දක්වා - ආ ඃ ග්‍ර ඃ 18

❖ ගැඩවිලි දියර පොහොර - ස්මිත් දේශන (2007), ආ ඃ ග්‍ර ඃ 18 - පිටු අංක 71 - 72

❖ ජෛවගතික දියර පොහොර - ස්මිත් දේශන (2007), ආඃ ග්‍ර ඃ 18 පිටු අංක 109 -116

8. වගා ලිත්

❖ ස්මිත් දේශන (2002) - ආ ඃ ග්‍ර ඃ 18

❖ පුර සඳ චක්‍රය ස්මිත් 2002 - ආ ඃ ග්‍ර ඃ 18 පිටු අංක 138

❖ ඇනොමලිස්ටික් චක්‍රය ආ : ග්‍ර : 18 පිටුව 203-

❖ තාරකා චක්‍රය ආ : ග්‍ර : 18 පිටුව 139

❖ නිවර්තන චක්‍රය ආ : ග්‍ර : 18 පිටුව 205

❖ ඩ්‍රැකොනික් චක්‍රය ආ : ග්‍ර : 18 පිටුව 204

❖ ජ්‍යොතිෂ මිනිසා ආ : ග්‍ර : 12 පිටුව 18, ආ : ග්‍ර : 14 පිටු අංක 11, ආ : ග්‍ර : 18 පිටු අංක 21, ආ : ග්‍ර : 08 පිටු අංක 92-94

❖ විශ්ව ශක්තීන් සහ මිනිසා අතර අන්තර් සම්බන්ධතා (සම්පත පුවත්පත ඇසුරෙනි)

❖ රාශි චක්‍රය සහ මිනිසා අතර සම්බන්ධය විශ්වය සහ මිනිසා ආ : ග්‍ර : 18 පිටුව 61

❖ නවග්‍රහ මණ්ඩලය - ආ : ග්‍ර : 08 පිටු අංක 98 - 100

❖ රාශි චක්‍රය සහ සිරුරේ කොටස් - ආ : ග්‍ර : 07 පිටු අංක 92 - 95, ආ : ග්‍ර 12 පිටු අංක 18, 14 පිටු අංක 11, 18 පිටු අංක 21, 08 පිටු අංක 92 - 94

Printed by R. S. ENTERPRISES

ISBN 978-955-98583-1-7